# වාර්ෂික වාර්තාව
# 2016




මධ්‍යම පරිසර අධිකාරිය

මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය

# දැක්ම

***විශිෂ්ට සේවාවක් තුලින් "***

***පිවිතුරු***

***හරිත පරිසරයක් "***

# මෙහෙවර

"මනා සම්බන්ධීකරණය, ප්‍රවර්ධනය,

මහජන සහභාගීත්වය, නීති ක්‍රියාත්මක කිරීම,

නිසි තාක්ෂණික මැදිහත්වීම්

සහ

පරිසර අධ්‍යාපනය හා දැනුවත්කිරීම් මඟින්

පරිසරයේ ගුණාත්මක බව සුරකින

සහ

හසුරුවන ජාතියේ පෙර ගමන්කරු"

# පෙරවදන

2016 වර්ෂය සඳහා වූ මෙම වාර්ෂික වාර්තාව මෙම අධිකාරියේ අංශ / ඒකක 15 ක, පළාත් කාර්යාල 09 ක අධ්‍යක්ෂවරුන්, ඒකක ප්‍රධානීන් හා පරිසර සභාව විසින් සපයනු ලැබූ තොරතුරු මත සම්පාදනය කරන ලදි. තවද, මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විශේෂ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය හා අදාල තොරතුරු මෙහි අන්තර්ගත වී ඇත. මෙම වාර්ෂික වාර්තාවේ ප්‍රධාන කාර්යාලයේ ඒ ඒ ප්‍රධාන අංශ / ඒකකයන්හි හා පළාත් කාර්යාල වල ප්‍රගතිය පිළිවෙලින් වාර්තා වී ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 වන වගන්තිය ප්‍රකාර හා යහ පාලන ගුරු උපදෙස් අනුව මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික ප්‍රගතිය, වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාව ප්‍රසිද්ධියට පත් කළ යුතු අතර, පාර්ලිමේන්තුවට ද ඉදිරිපත් කළ යුතුය.

මෙම වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා ඒ ඒ අංශ / ඒකක/ පළාත්කාර්යාල ප්‍රධානීන් හා ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විසින් අවශ්‍ය තොරතුරු සපයා දෙමින්, දෙනු ලැබූ අගනා සහයෝගය හා දායකත්වය සම්බන්ධයෙන් ඔවුනට ස්තූතිය පිරිනැමීම සඳහා සැලසුම් හා පසුවිපරම් ඒකකය මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගන්නෙමු.

සැලසුම් හා පසුවිපරම් ඒකකය

# මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමාගේ පණිවුඩය

මධ්‍යම පරිසර අධිකාරියෙහි 2016.12.31 වර්ෂයෙන් අවසන් වන වසර සඳහා අධිකාරියෙහි විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශනය, මධ්‍යම පරිසර අධිකාරියෙහි එක් එක් අංශයන් යටතේ ප්‍රගතිය සහ විගණකාධිපති තුමාගේ වාර්තාව ඔබ හට මෙලෙස පිළිගැන්වීමට ලැබීම මා ලද භාග්‍යයක් ලෙස සලකමි.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ ඇති වී ඇති සීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලියෙහි දී පරිසර සංරක්ෂණය පිළිබඳ කටයුතු කරන ප්‍රධානතම ජාතික ආයතනය වන මධ්‍යම පරිසර අධිකාරිය වර්තමානය වන විට ඉතා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරමින් සිටී.

2016 වර්ෂයේ දී නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සහ මධ්‍යම පරිසර අධිකාරියේ නීති උපදේශකවරයා සමඟ පැවති සාකච්ඡා වලින් අනතුරුව පරිසර බලපෑම් ඇගයීම් ඒකකය, පරිසර බලපෑම් ඇගයීම් නියෝග, නියමිත ව්‍යාපෘති ලැයිස්තුව සහ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන ලැයිස්තුව සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලද අතර අනුමැතිය ලබාදුන් ව්‍යාපෘති විධිමත් ලෙස පසුවිපරම් කිරීම සඳහා ව්‍යාපෘති යෝජකගෙන් පරිසර කළමනාකරණ සැලැස්ම (Environment Management Plan) ලබා ගැනීමේ නව නියෝගයන් ද පරිසර බලපෑම් ඇගයීම් නියෝගයන්ට ඇතුලත් කිරීමට කටයුතු කරන ලදි. එසේම, අදාල පාර්ශවකරුවන් සහ මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල වල නිලධාරීන් සම්බන්ධ වී නියමිත ව්‍යාපෘති ලැයිස්තුව සහ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුමත ආයතන ලැයිස්තුව නැවත සකස් කරන ලදි.

වර්තමානයෙහි කර්මාන්තශාලා වලින් පිටවන අපද්‍රව්‍ය ප්‍රධාන ජල ප්‍රභේදයන්ට මුදා හැරීම තුළින් ප්‍රධාන ජල ප්‍රභේද දූෂණය වීම මහජනයා මුහුණ දෙන ප්‍රධාන ගැටළුවකි. එම නිසා, මධ්‍යම පරිසර අධිකාරියෙහි රසායනාගාරය මඟින් වාර්තා කරන ලද වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජල ප්‍රභේදයන්ගේ ජල නියැදි එකතු කිරීම හා විශ්ලේෂණය කිරීම සිදු කරන ලදි. විවිධ ජල මූලාශ්‍රයන්හි මතුපිට හා භූගත ජල තත්වයන් පරීක්ෂා කිරීමට දෛනික පසුවිපරම් කටයුතු හා නීතිමය අවශ්‍යතාවයන් සඳහා මෙන්ම, පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලියේ දී ජල නියැදින් හි කාර්මික අපසන්දන ප්‍රමාණය විශ්ලේෂණය සඳහා ද ජල නියැදි ලබා ගැනීම හා විශ්ලේෂණය කිරීම සිදු කරනු ලැබේ.

පරිසර පනත යටතේ මේ වන විට හඳුනාගෙන ලැයිස්තුගත කර ඇති ජල මූලාශ්‍ර / ජල පෝෂක ප්‍රදේශ පරිසර ආරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය විසින් මේ වනවිටත් ආරම්භ කර ඇත. මෙයට අමතරව හොරණ හා ඉංගිරියේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල හා බදුල්ල දිස්ත්‍රික්කයෙහි පවතින ජල මූලාශ්‍ර පරිසර ආරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට මේවන විටත් පියවර ගෙන ඇති අතර, එයට අමතරව දියඇලි 547 ක් ඇතුලත් ලැයිස්තුවක් පිළියෙල කර ඇති අතර එම දියඇලි ජාතික පරිසර පනත යටතේ පරිසර ආරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර ඇත.

මෙම කෘත්‍යයන්ට අනතුරුව පරිසර අංශය සම්බන්ධයෙන් වන පර්යේෂණ පිළිබඳව වසර ගණනක සිට පවතින හිඩස අවම කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සේවයේ නියතු නිලධාරීන්ගෙන් සමන්විත බහුවිධ පර්යේෂණ කණ්ඩායමක් පිහිටවන ලද අතර වර්තමානයේ මතභේදයට තුඩු දී ඇති කටුපොල් වගාව හඳුන්වා දීමෙන් භූගත ජල මට්ටම කෙරෙහි ඇතිවන බලපෑම් පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා පර්යේෂණ යෝජනාවක් සකස්කොට ඇත.

වර්තමාන ශ්‍රී ලංකාව තුල ඉලෙක්ට්‍රොනික උපකරණ සඳහා වූ ඉල්ලුම සැලකිය යුතු ලෙස ඉහළ යාම නිසා එක්රැස්වන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රමාණය ඉහළ යාම ගැටළුවක් ලෙස පසුගිය වර්ෂයේ හඳුනාගෙන ඇත. නිවාස ආශ්‍රිතව ඒකරාශී වී ඇති ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය හා එම අපද්‍රව්‍ය එකතු කිරීමට අදාල පහසුකම් සැපයීම සඳහා වූ ජාතික අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ සතියක් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016 ඔක්තෝම්බර් මස 24 දින සිට 30 වන දින දක්වා පවත්වන ලදි.

මහජනතාවගේ පරිසර සංරක්ෂණය හා පරිසරයේ වැදගත්කම පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම අප අධිකාරියේ වගකීම වන අතර එය ඉටු කිරීම සඳහා පරිසර දැනුවත් කිරීමේ හා අධ්‍යාපනික වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදි. මීට අමතරව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ දී ජුනි 05 වන දින "වනජීවී සම්පත් නීති විරෝධී ලෙස අලෙවි කිරීමට එරෙහි වෙමු" තේමාව යටතේ ලෝක පරිසර දින ප්‍රධාන වැඩසටහන පවත්වන ලදි.

නිවාස, ව්‍යාපාරික ස්ථාන සහ පොදු ස්ථානයන් ආශ්‍රිතව අපද්‍රව්‍ය එක්රැස් කිරීම පළාත් පාලන ආයතනයන්හි අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පැවරී ඇති ප්‍රධාන වගකීමකි. එහෙත් ඊට අවශ්‍ය යටිතල පහසුකම් නොමැතිවීම නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රධාන ගැටළුවක් ලෙස හඳුනාගත හැක. ඒ අනුව, මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ නව කොම්පෝස්ට් අංගන 06 ක් ද, ජීව වායු ඒකක 03 ක් ද, එක් කසළ

දාහකයක් ද, එක් අඩු පිරිවැය කසළ දාහකයක් ද, එක් ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයක් සහ ප්ලාස්ටික් පොලිතින් අපද්‍රව්‍ය ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් පළාත් පාලන ආයතනයන් හි ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා ඉදි කිරීමට කටයුතු සිදු කරන ලදි. මෙයට අමතරව, ගාල්ල, යාපනය, පොළොන්නරුව සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන්හි සනීපාරක්ෂක කසළ රඳවනයන් 04 ක් ඉදි කිරීම සඳහා සංචිත අපද්‍රව්‍ය ප්‍රමාණය පිළිබඳ විශ්ලේෂණයක් සකස් කර ඉදිකිරීම ආරම්භ කිරීමට කටයුතු සකස් කරමින් පවතී.

ඉහතින් දක්වන ලද සුවිශේෂී කෘත්‍යන් මධ්‍යම පරිසර අධිකාරියෙහි, තාක්ෂණික හා ව්‍යාපෘති අංශයන් යටතේ ඉතා සාර්ථකව සිදු කරන ලද අතර අප ආයතනයේ තාක්ෂණික නොවන අංශයන් වන මානව සම්පත් සංවර්ධන, පරිපාලන, මුදල්, අභ්‍යන්තර විගණනය, සැලසුම් සහ තොරතුරු තාක්ෂණ අංශයන් මඟින් ද සුවිශේෂී දායකත්වයන් මධ්‍යම පරිසර අධිකාරියේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා පිරිනමන ලද බව ප්‍රකාශ කර සිටිමි.

අවසාන වශයෙන් මෙම වසර තුල මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවීමේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා ඉතා කැපවීමෙන් හා උනන්දුවෙන් සිය යුතුකම් නොපිරිහෙලා ඉටු කරමින් ඒ සඳහා සහාය ලබාදුන් අධ්‍යක්ෂක ජනරාල් ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටිමි. තවද, අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ලය සහ පරිසර සභාව මඟින් අධිකාරියේ දියුණුව උදෙසා ලබාදෙන සහාය, උපදෙස් පිළිබඳ මා ඉතා කෘතඥ වෙමි. එමෙන්ම, පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්, අතිරේක ලේකම් සහ සමස්ථ නිලධාරීන් විසින් මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යයන් සාර්ථක කර ගැනීමට ලබාදෙන සහයෝගය සහ උපදෙස් සම්බන්ධයෙන් අප අධිකාරියේ සමස්ථ කාර්යය මණ්ඩලය වෙනුවෙන් මාගේ ඉමහත් කෘතඥතාවය පිරිනමමි.

අවසාන වශයෙන් අධිකාරියේ කටයුතු සඳහා ලබාදුන් අගනා උපදෙස් හා මග පෙන්වීම් පිළිබඳ ගරු පරිසර ඇමති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මාගේ ස්තුතිය පුදකර සිටිමි.

සභාපති

මධ්‍යම පරිසර අධිකාරිය

# මධ්‍යම පරිසර අධිකාරියේ ආයතනික ව්‍යුහය



## මධ්‍යම පරිසර අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

**මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි මහතා** (B.A., M.A., Pg. Dip., M. Sc., PhD)

**සභාපති**

**කේ.එච්. මුතුකුඩආරච්චි මහතා** (විද්‍යාවේදී ,විද්‍යාපති)

අධ්‍යක්ෂ ජනරාල්

**ඉංජි. ජේ.එම්.යූ. ඉන්ද්‍රරත්න මහතා** (විද්‍යාවේදී (ඉංජිනේරු) (ගෞරව), ශාස්ත්‍රපති, වරලත් ඉංජිනේරු, FIE(SL), MIE (Aus.))

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (**මා.ස.සං.**,** පරිපාලන හා මුදල්)

**යූ.කේ.ඩී.ජී. ජයසිංහ මහතා** (විද්‍යාවේදී, විද්‍යාපති)

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (**පරිසර කළමනාකරණ හා ඇගයීම්)

**එම්.ජේ.ජේ. ප්‍රනාන්දු මහතා** (විද්‍යාවේදී, විද්‍යාපති, පශ්චාත් ඩිප්ලෝමාව (**RS & GIS**))

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (**පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම්)

**ආචාර්ය ආර්.එම්.එස්.කේ .රත්නායක මහතා** (විද්‍යාවේදී )විශේෂ,( දර්ශනශූරී )පේරාදෙනිය වි.වි ,වරලත් රසායනඥ ,(.රසායන විද්‍යා ඩිප්ලෝමාව)

**වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්** (පරිසර දූෂණ පාලන)

**එම්.කේ.එස්. නානායක්කාර මහතා** (වාණිජවේදී (ගෞරව), ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජික, වරලත් ගණකාධිකරණ ආයතනයේ ආවසරික)

**අධ්‍යක්ෂ** (මුදල්)

**කාන්ති ද සිල්වා මිය** (විද්‍යාවේදී, විද්‍යාපති)

**අධ්‍යක්ෂිකා (**පරිසර බලපෑම් ඇගයීම්)

**එම්.එස්.ඒ.ඊ. තිස්මල්පොල මහතා** (නීතිඥ, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා)

**අධ්‍යක්ෂ (**මා.ස.සං./ රාජකාරී ආවරණ**,** පරිපාලන)

එම්.ඒ.ඒ.එන්. හේමකුමාර මහතා (විද්‍යාවේදී, විද්‍යාපති)

**අධ්‍යක්ෂ (**භූගෝලීය තොරතුරු තාක්ෂණය)

**නීල් පෙරේරා මහතා** (ශාස්ත්‍රවේදී ආර්ථික විද්‍යා (විශේෂ), ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යා), කළමනාකරණ පිළිබඳ ඩිප්ලෝමාව)

**අධ්‍යක්ෂ (පරිසර අධ්‍යාපන හා දැ.කි.)**

**මනූජා විමලසේන මිය** (නීතිවේදී උපාධිය (ශ්‍රී ලංකා), නීතීඥ, ප්‍රසිද්ධ නොතාරිස් (සිංහල / ඉංග්‍රීසි), දිවුරුම් කොමසාරිස්, සමාගම් ලේකම්)

**අධ්‍යක්ෂිකා (නීති)**

**ටී.එම්.ඒ.එස්.කේ. රුද්‍රිගු මහතා** (විද්‍යාවේදී, විද්‍යාපති (වන විද්‍යාව))

**අධ්‍යක්ෂ** (ස්වභාවික සම්පත් කළමනාකරණ සහ පසු විපරම්)

**වසන්තා විජේසිංහ මිය** (විද්‍යාවේදී (රසායන විද්‍යාව, ගෞරව), විද්‍යාපති (විශ්ලේෂණ රසායන විද්‍යාව) **M.I.chem.**, වරලත් රසායනඥ)

**අධ්‍යක්ෂිකා (රසායනාගාර සේවා)**

**ජී.ඒ. වීරසුන්දර මහතා** (විද්‍යාවේදී, දර්ශනපති)

**අධ්‍යක්ෂ** (අපද්‍රව්‍ය කළමනාකරණ)

**ආර්. වල්පොල මහතා** (ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති (සමාජ විද්‍යාව))

**අධ්‍යක්ෂ** (පිළිසරු ව්‍යාපෘතිය)

**කුමාරි කුලතිලක මිය** (ශාස්ත්‍රවේදී)

**අධ්‍යක්ෂිකා (සැලසුම් හා පසුවිපරම්)**

**සුනිල් ද සිල්වා මහතා** (විද්‍යාවේදී, පශ්චාත් ඩිප්ලෝමා (තොරතුරු තාක්ෂණය) , විද්‍යාපති (පරිගණක තාක්ෂණය), MBCS, CITP)

**වැඩ සටහන් සම්පාදක / විශ්ලේෂක**

**ඩී. විතානගේ මිය** (විද්‍යාවේදී, විද්‍යාපති (පරිසර කළමනාකරණය), පශ්චාත් ඩිප්ලෝමා (පරිසර විද්‍යාව))

**අධ්‍යක්ෂිකා** (කාර්මික සම්බන්ධතා)

**ඒ.සී.පී. දාබරේ මිය** (ශාස්ත්‍රවේදී, වරලත් පුස්තකාලයාධිපති, ශාස්ත්‍රපති)

**ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපතිනි**

**යූ. විතානාරච්චි මිය** (විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන), ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජික, වරලත් ගණකාධිකරණ ආයතනයේ ආවසරික, **HDM**)

**අභ්‍යන්තර විගණක**

**කේ.ජී.ටී.එන්. කිරිඇල්ල මහතා** (විද්‍යාවේදී, විද්‍යාපති)

**අධ්‍යක්ෂ** (මධ්‍යම පළාත)

**කේ.ඒ.පී. වැලිකන්නගේ මහතා** (විද්‍යාවේදී, විද්‍යාපති, ශාස්ත්‍රපති, පශ්චාත් ඩිප්ලෝමාව (පරිසර විද්‍යාව), මානව සම්පත් කළමනාකරණය හා අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව)

**අධ්‍යක්ෂ** (සබරගමුව පළාත)

**එම්. සිවකුමාර් මහතා** (විද්‍යාවේදී, විද්‍යාපති)

**අධ්‍යක්ෂ** (නැගෙනහිර පළාත)

**එච්.එස්.ප්‍රේමචන්ද්‍ර මහතා** (විද්‍යාවේදී ගෞරව (විශේෂ), විද්‍යාපති, වරලත් පරිසරවේදී, **M.I.Biol, MIEPSL, MPMI (US)**)

**අධ්‍යක්ෂ** (ගම්පහ දිස්ත්‍රික්කය)

**එන්.එස්.ගමගේ මහතා** (විද්‍යාවේදී, දර්ශනපති)

**අධ්‍යක්ෂ** (බස්නාහිර පළාත)

සුසන්ත වෙදගේ මහතා (විද්‍යාවේදී, විද්‍යාපති)

**නියෝජ්‍ය අධ්‍යක්ෂ** (ඌව පළාත)

**සමන්තා මලේපතිරණ මිය** (විද්‍යාවේදී, විද්‍යාපති)

**නියෝජ්‍ය අධ්‍යක්ෂිකා (දකුණු පළාත)**

**ජී.එම්.කේ. පෙරේරා මහතා** (විද්‍යාවේදී, විද්‍යාපති (වන විද්‍යාව)), **පශ්චාත් ඩිප්ලෝමා** (පරිසර විද්‍යාව)

**නියෝජ්‍ය අධ්‍යක්ෂ (**උතුරු මැද පළාත)

**විජිතා සත්‍යකුමාර් මිය** (විද්‍යාවේදී, විද්‍යාපති (ස්වභාවික සම්පත් කළමනාකරණ), පශ්චාත් ඩිප්ලෝමා (පාරිසරික විද්‍යාව))

**වැ.බ./ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා** (උතුරු පළාත)

**ඩී.එම්.කේ. දිසානායක මහතා** (විද්‍යාවේදී, විද්‍යාපති)

**වැ.බ./ නියෝජ්‍ය අධ්‍යක්ෂ (**වයඹ පළාත)

# පටුන

පෙරවදන ........................................ ii

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමාගේ පණිවුඩය ........................................ iii

පටුන ........................................ viii

වගු ලැයිස්තුව ........................................ x

රූප ලැයිස්තුව ........................................ xiii

1.0 මධ්‍යම පරිසර අධිකාරිය ........................................ 1

1.1. හැඳින්වීම ........................................ 1

2.0. අධිකාරියේ වගකීම් සහ කාර්යයන් ........................................ 6

3.0. පරිසර දූෂණ පාලන අංශය ........................................ 10

3.1 පරිසර දූෂණ පාලන ඒකකය ........................................ 10

3.2 රසායනාගාර සේවා අංශය ........................................ 17

3.2.1 වායු සම්පත් කළමනාකරණ සහ පසුවිපරම් ඒකකය 17

3.2.2 ජල තත්ත්ව සහ පසුවිපරම් අංශය 20

4.0. පරිසර කළමනාකරණ සහ ඇගයීම් අංශය ........................................ 28

4.1 පරිසර බලපෑම් හා ඇගයීම් (ප.බ.ඇ) ඒකකය ........................................ 28

4.2. ස්වභාවික සම්පත් කළමනාකරණ හා පසුවිපරම් ඒකකය ........................................ 37

4.3 පර්යේෂණ හා සංවර්ධන ඒකකය ........................................ 47

5.0 නීති ඒකකය ........................................ 54

6.0 පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශ ........................................ 57

7.0 සැලසුම් හා පසුවිපම් ඒකකය ........................................ 62

8.0 පැමිණිලි ඒකකය ........................................ 64

9.0 තොරතුරු තාක්ෂණ ඒකකය ........................................ 69

10.0 අභ්‍යන්තර විගණන ඒකකය ........................................ 71

11.0 මධ්‍යම පරිසර අධිකාරියේ විමධ්‍යගතකරණ වැඩ පිළිවෙල ........................................ 72

11.1 මධ්‍යම පරිසර අධිකාරියේ බලය පළාත් කාර්යාල වෙත විමධ්‍යගතකරණය කිරීම. ........................................ 72

11.2. පළාත් පාලන ආයතන වෙත බලතල විමධ්‍යගත කිරීම ........................................ 72

11.3 දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීම් කමිටුව (DELEC) ........................................ 72

12.0 මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීයකරණ වැඩ පිළිවෙල ........................................ 74

12.1. හැඳින්වීම ........................................ 74

12.2 පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාපටිපාටිය ........................................ 74

12.3 නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම ........................................ 75

12.4. පරිසර දූෂණය, ඉන් ඇතිවන පීඩාව සහ ස්වාභාවික සම්පත් අධිපරිභෝජනය සම්බන්ධ මහජන පැමිණිලි විසඳීම. ........................................ 77

13.0 මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති. ........................................ 81

13.1 “පිළිසරු” ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ....81
14.3 පාසල් පරිසර නියමු වැඩසටහන ....97
13.3 මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරයන් බල ගැන්වීම සහ එමගින් දිවයින පුරා සිදු කරනු ලබන පසු විපරම් ක්‍රියාවලියේ ශක්‍යතාවය ප්‍රවර්ධනය කිරීම ....103
13.4 ශ්‍රී ලංකායේ ඝන අපද්‍රව්‍ය බැහැරලීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ....105
13.5 ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජලාශ වල ජල තත්ව පසුවිපරම් කිරීමේ හා මධ්‍යම පරිසර අධිකාරියේ බලාත්මක කිරීමේ කාර්ය මණ්ඩලය බලගැන්වීමේ JICA ව්‍යාපෘතිය. ....113
14.0 ආයතනික යහපාලන වාර්තාව ....118
15.0 මානව සම්පත් සංවර්ධන, පරිපාලන හා මුදල් අංශය ....120
15.1 මානව සම්පත් සංවර්ධන ඒකකය....120
15.2 මානව සම්පත් කළමනාකරණ ඒකකය ....122
15.3 මුදල් ඒකකය....125
16.0 විගණකාධිපති වාර්ථාව ....170

# වගු ලැයිස්තුව

Table 1 පරිසර සභාවේ සාමාජිකයා ..... 2
Table 2 පරිසර කළමනාකරණය හා ආරක්ෂණය පිළිබඳ විද්වතුන් ..... 3
Table 3 ස්වේච්ඡා සංවිධාන වල නියෝජිතයන් ..... 4
Table 4 රැස්වීම් පිළිඹද විස්තර ..... 4
Table 5 2016 වසරේදී නිකුත් කරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගණන ..... 10
Table 6 2016 වසරේදී එකඟතාවය ලබාදුන් කර්මාන්ත මාණය ..... 11
Table 7 පැමිණිලි විමර්ශණය කිරිම ..... 11
Table 8 විස්තරාත්මක පසුවිපරම් වැඩසටහන් ..... 12
Table 9 රන් සම්මාන ලේඛනය ..... 13
Table 10 ප්‍රගති සාරාංශය - 2016 ..... 14
Table 11 2016 වර්ෂය තුල තාක්ෂණික උපදේශක / සහාය කටයුතු ..... 18
Table 12 සැපයූ සේවාවන් ..... 18
Table 13 වායු තත්ත්ව පරාමිතීන් පරීක්ෂා කිරීම ..... 19
Table 14 කර්මාන්ත අප ජල සාම්පල පරීක්ෂාව ..... 20
Table 15 2016 වසරේ පරිසර බලපෑම් ඇගයීම් නියෝග යටතේ, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මගින් අනුමැතිය ලබා දෙන ව්‍යාපෘති නාම ලේඛනය ..... 28
Table 16 පරිසර බලපෑම් ඇගයීම් නියෝග යටතේ ප්‍රතික්ෂේප කරන ලද ව්‍යාපෘති ..... 29
Table 17 පරිසර අනුමැතිය ලබාදීම සඳහා අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන වෙත මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ලබාදුන් ව්‍යාපෘති ..... 30
Table 18 පරිසර බලපෑම් ඇගයීම් අංශය මගින් ක්‍රියාත්මක වෙමින් පැවැති ව්‍යාපෘති නාම ලේඛනය ..... 30
Table 19 2016 වසර තුලදී පසුවිපරම් කරන ලද ව්‍යාපෘති පහත දැක්වේ. ..... 33
Table 20 සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානවල ප්‍රායෝගික වැඩසටහන් පැවැත්වීම ..... 57
Table 21 8. ප්‍රවෘත්ති හා මාධ්‍යය නිවේදන ..... 59
Table 22 පලාත් සහ දිස්ත්‍රික් මට්ටමින් ලැබුන පැමිණිලි පිළිබඳ විස්තර ..... 64
Table 23 පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාපටිපාටිය පලාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම ..... 74
Table 24 නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම ..... 76
Table 25 2016 වසර තුලදී හසුරුවන ලද පැමිණිලි ..... 77
Table 26 මූලික පාරිසරික පරීක්ෂණ (IEE) / පරිසර බලපෑම් ඇගයීම (EIA) නියමයන්ට අනුකූලව 2016 වසර තුළදී අනුමත වූ ව්‍යාපෘති ලැයිස්තුව. ..... 79
Table 27 2016 වසරේදී ලැයිස්තුගතකොට නැති ක්‍රියාකාරකම් සඳහා ලබාදුන් පාරිසරික නිර්දේශ ලැයිස්තුව. 80
Table 28 කොම්පෝස්ට් අංගන පසු විපරම් සටහන 2016 ..... 83
Table 29 දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද ක්‍රමවත් කිරීමේ සැසිවාර පිළිබඳ විස්තර/ ප්‍රගති සමාලෝචන සැසිවාර ..... 86
Table 30 2016 වසර තුළ ප්‍රතිපාදන ලබාදුන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් ..... 87
Table 31 පළාත් පාලන ආයතන වෙත ලබා දුන් උපකරණ ..... 89

Table 32 ජංගම අපද්‍රව්‍ය එකතුකිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ ප්‍රගතිය ........ 90
Table 33 දෙමුහුම් පොහොර ව්‍යාපෘතියෙහි ප්‍රගතිය ........ 90
Table 34 2016 වසර තුළ බෙදා හරින ලද කොම්පෝස්ට් බඳුන් සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය බඳුන් ........ 91
Table 35 සනීපාරක්ෂක කසළ රැඳවුම් සහ අඩු වියදම් කසළ දාහක ඉදිකිරීමේ ප්‍රගතිය ........ 92
Table 36 පළාත් පාලන ආයතන සේවකයින් සහ වෙනත් අය සඳහා ලබා දුන් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ........ 92
Table 37 2016 වසර තුළ පැවති තනතුරු හා පත්කිරීම් ........ 93
Table 38 මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ වූ ක්‍රියාකාරකම් තුළ මූල්‍ය ප්‍රගතිය ........ 94
Table 39 පුනරුදය ජාතික පාරිසරික වැඩසටහන යටතේ ප්‍රතිපාදන භාවිතා කිරීමේ ප්‍රගතිය ........ 96
Table 40 දිවයිනේ මුළු පාසල් සංඛ්‍යාව 10042 (සිංහල හා දෙමළ) ........ 97
Table 41 2015 වර්ෂයේ පරිසර නියමු ද්‍රව්‍ය නිෂ්පාදනයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ. ........ 97
Table 42 නායකත්ව පුහුණු වැඩසටහන ........ 98
Table 43 පරිසර නියමු ගුරු පුහුණු වැඩසටහන් ........ 98
Table 44 විදුහල්පති පුහුණු වැඩසටහන් ........ 99
Table 45 දැනුවත්කිරීමේ වැඩසටහන් ........ 100
Table 46 2016 වර්ෂයේ දී පරිසර ළමා සමාජ ද්‍රව්‍ය නිෂ්පාදනයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වාර්තා විය ........ 101
Table 47 ව්‍යාපෘති කාර්ය මණ්ඩලය ........ 110
Table 48 මූල්‍ය ප්‍රගති වාර්තාව -2016 ........ 111
Table 49 දේශීය පුහුණු වැඩසටහන් ........ 120
Table 50 2016 වසර සඳහා බඳවා ගැනීම් / උසස් වීම් / ඉල්ලා අස් වීම් / තනතුරු හැරයාම් සහ විශ්‍රාම ගැනීම් ........ 122
Table 51 “පිළිසරු” ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ........ 123
Table 52 ඝණ අප ද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ජාතික ව්‍යාපෘතිය ........ 124
Table 53 මධ්‍යම පරිසර අධිකාරියට ලැබූ ප්‍රදානයන් ........ 127
Table 54 : STATEMENT OF FINANCIAL PERFORMANCE ........ 129
Table 55 : STATEMENT OF FINANCIAL POSITION ........ 131
Table 56 : CASH FLOW STATEMENT ........ 134
Table 57 : Note 4 A ........ 138
Table 58 : Note 4B ........ 140
Table 59 : Note 5 ........ 144
Table 60 : Note 6 ........ 145
Table 61 : Note 7 ........ 145
Table 62 : Note 8 ........ 146
Table 63 : Note 9 ........ 146
Table 64 : Note 10 ........ 147
Table 65 : Note 11 ........ 148

Table 66 : Note 12 ........ 149
Table 67 : Note 13 - Programme Activities ........ 149
Table 68 : Note 14 ........ 152
Table 69 : Note 15 ........ 153
Table 70 : Note 16 ........ 153
Table 71 : Note 17 ........ 155
Table 72 : Note 18 ........ 156
Table 73 : Note 19 ........ 157
Table 74 : Note 20 ........ 158
Table 75 : Note 21 ........ 158
Table 76 : Note 22 ........ 159
Table 77 : Note 23 ........ 164
Table 78 : Note 24 ........ 167
Table 79 : Note 25 ........ 167

# රූප ලැයිස්තුව

Figure 0-1 සියළු රසායනාගාර වල 2016 ප්‍රගතිය. ........ 21
Figure 0-2 ප්‍රාදේශීය රසායනාගාර විවිධ පාරාමිතීන් සඳහා 2016 දී රැස් කල සාම්පල ගණන ........ 21
Figure 0-3 වාණිජමය සාම්පල වලින් මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාර 2016 දී උපයාගැනීම ........ 22
Figure 0-4 ජාතික සතිය තුලදී පොලිතීන් ප්ලාස්ටික් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස්කිරීමේ අවස්ථාවක්. 25
Figure 0-5 අවිධිමත් ලෙස ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කරන්නන් සඳහා පැවති වැඩමුළුව ........ 25
Figure 0-6 ස්වභාවික සම්පත් කළමනාකරණය පිළිබඳව විස්තරාත්මක පොත් පිංච අත් පත්‍රිකා........ 38
Figure 0-7 පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා සකස්කල සිතියම් ........ 46
Figure 0-8 කැලණි ගංගා ෙද්‍රාණිය ........ 46
Figure 0-9 මහනුවර දිස්ත්‍රික්කයේ බාදනයට ලක්වූ ඉඩම් ........ 48
Figure 0-10 නුවරඑළිය දිස්ත්‍රික්කයේ බාදනයට ලක්වූ ඉඩම් ........ 48
Figure 0-11 2016 වසර තුල දූෂක කර්මාන්තවල පිහිටීම ........ 49
Figure 0-12 මහනුවර, රත්නපුර සහ යාපනය දිස්ත්‍රික් පාරිසරික පැතිකඩ ........ 51
Figure 0-13 නිල්වනෙපත ෙසාබාෙතත ........ 59
Figure 0-14 පාසැල් පුස්තකාල ස්ථාපිත කිරීම. ........ 60
Figure 0-15 ඒකක සහ පලාත් කාර්යාල ෙවත ලැබුන පැමිණිලිවල ව්‍යාප්තිය ........ 65
Figure 0-16 ඒකක සහ පලාත් කාර්්යාල ෙවත ලැබුණු සහ විසඳු පැමිණිලි ........ 68

# 1.0 මධ්‍යම පරිසර අධිකාරිය

## 1.1. හැඳින්වීම

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ 1981 ස්ථාපිත කරනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරිය 2016 වන විට වසර 35 ක් සම්පූර්ණ කරයි. පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර අමාත්‍යාංශය මඟින් ඇති කරනු ලැබූ පරිසර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ආයතන වලින් එකකි. 2015 වාර්ෂික වාරතාව මඟින් 2015 වසර තුල මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය සාධනය හා මහා භාණ්ඩාගාරයේ අරමුදල් හා විදේශ මූල්‍යාධාර යොදවමින් පළාත් කාර්යාල 09, දිස්ත්‍රික් කාර්යාල 15 හා එක් සම්බන්ධීකරණ කාර්යාලයෙහි ක්‍රියාකාරකම් සහ 2015 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘතීන්ගේ ළඟා කරගත් කාර්ය සාධනය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සපයනු පිණිස එම වර්ෂය තුල සාක්ෂාත් කරගත් සාර්ථකත්වය මෙන්ම අසාර්ථකත්වය පිළිබඳ තක්සේරුවක් ද පෙන්නුම් කරයි.

## 1.2. අරමුණු

මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය මත 1980 අංක 47 දරන පාරිසරික පනත පිළිවෙලින් 1988 අංක 56 දරන පාරිසරික පනත යටතේ සහ 2000 අංක 53 දරන පනත යටතේ සංශෝධනය කරන ලදි. 1980 ජාතික පාරිසරික පනත පහත සඳහන් ප්‍රධාන බලතල වලින් සමන්විත වේ.

ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික ආරක්ෂණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා පරිසරයේ අනතුරුදායක මෙන්ම, අනතුරුදායක වීමට ඉඩ තිබෙන අපද්‍රව්‍ය මුදා හැරීම, තැන්පත් කිරීම හෝ වෙනත් දූෂණ මාර්ග වල ස්වභාවය, ප්‍රමාණය, අන්තර්ග්‍රහණය සහ බලපෑම් විධිමත් කිරීම, පවත්වාගෙන යාම හා පාලනය කිරීම

පාරිසරික බලපෑම් ඇගයීම් උපයෝගී කරගෙන, ක්‍රමවත්ව ඇගයීමට ලක් කරන ලද පාරිසරික ගැටළු මඟින් පරිසරයට හිතකාමී සංවර්ධනයන් තහවුරු කරමින් රටේ ස්වභාවික සම්පත් පද්ධතිය ආරක්ෂා කිරීම

පරිසරය ආරක්ෂා කිරීමෙහිලා මහජන සහයෝගය සහ සහභාගීත්වය ලබාගැනීම. විශේෂයෙන් පාසල් ළමුන්ගේ සහයෝගය ලබාගැනීම අරමුණු කොට දේශීය, ජාතික මෙන්ම භූගෝලීය පරිසර ගැටළු පිළිබඳ මහජනයා දැනුවත් කිරීම

අනුග්‍රාහක පිරිස් වැඩි දෙනෙකුට සේවය සලසමින් පරිසර ආශ්‍රිත තොරතුරු සහ දත්ත සපයන මධ්‍යම මධ්‍යස්ථානයක් සේ ක්‍රියා කිරීම

## 1.3. බලතල, කාර්ය සහ රාජකාරී

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතෙහි සඳහන් බලතල, කාර්ය හා රාජකාරී වලින් මධ්‍යම පරිසර අධිකාරියේ දැනටතම අවධානය පහත සඳහන් ප්‍රධානතම බලතල, කාර්ය සහ රාජකාරී වලට යොමු කරයි.

ජාතික පාරිසරික පනතේ විධිවිධාන හා ඒ යටතේ සාදන ලද නියෝග හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

දූෂණ ඇතිවීමේ හේතූන්, එහි ස්වභාවය, ප්‍රමාණය සහ එය වැලැක්වීමෙහිලා සමීක්ෂණ හා විමර්ශන පැවැත්වීම සහ ඊට සමාන සමීක්ෂණ සහ විමර්ශන පවත්වන්නා වූ වෙනත් තැනැත්තන්ට හෝ ආයතනවලට සහාය වීම සහ සහයෝගය දීම

පාරිසරික පරිහානියේ යම් අංශයකට අදාලව පරීක්ෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම හෝ එවැනි පරිහානි වැලැක්වීම සහ පරිසරය ආරක්ෂා කිරීමට ද, වැඩි දියුණු කිරීමට ද උපමානයන් වර්ධනය කිරීම.

පරිසරය වැඩදායී ලෙස උපයෝගී කර ගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා ද, එහි තත්වය පවත්වාගෙන යාම සඳහා ද ප්‍රමිති, න්‍යායන් සහ උපමානයන් නිශ්චය කිරීම

පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය සම්බන්ධයෙන් වූ යම් අංශ පිළිබඳව වාර්තා සහ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම

පරිසරය ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම හා අධ්‍යාපනය ලබාදීම

1988 හා 2000 වර්ෂ වලදී ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීමෙන් මධ්‍යම පරිසර අධිකාරියට බලතල පැවරිනි. අනෙකුත් දේ අතර, මෙම සංශෝධනය මඟින් මධ්‍යම පරිසර අධිකාරියට පැවරෙන ප්‍රධාන බලතල පහත දැක්වේ.

පරිසරයට දූෂ කාරකයන් පිට කිරීම සිදු වන අවස්ථා වලදී එම කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කර ඇති ප්‍රමිති හා මිනුම් දඬු වලට අනුකූලව නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ එසේ කිරීමට නියම කිරීම

පරිසරය කෙරෙහි අහිතකර බලපෑම් ප්‍රබල ලෙස ඇති වන්නා වූ යම් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙරාතුව ඒවා විසින් පාරිසරික බලපෑම් ඇගයීම් කළ යුතු යැයි නියම කිරීම

නිශ්චිත කටයුතු ලෙස පරිසරයට අපද්‍රව්‍ය මුදාහරින, තැන්පත් කරන හෝ පිටකරන කටයුතු ගැසට්

කිරීමට සහ මෙම පනතේ සඳහන් උපමාන සහ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමටත්, අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍ර නොමැතිව කිසිම පුද්ගලයෙකු කිසිම නිශ්චිත කටයුත්තක් නොකිරීම තහවුරු කිරීම.

## 1.4. අධිකාරියේ සාමාජිකයෝ

ජාතික පාරිසරික පනත යටතේ පැවරී ඇති බලතල යටතේ පරිසර විෂය භාර අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් අධිකාරිය සමන්විත වේ. ඉන් දෙදෙනෙක් පරිසර විෂය පිළිබඳ ප්‍රමාණවත් විශේෂඥතාවක් හා සුදුසුකම් ඇත්තන් විය යුතු අතර, ඉන් එක් තැනැත්තෙක් පාරිසරික කළමනාකරණය පිළිබඳ මනා පරිපාලන කුසලතාවයක් හා ඒ පිළිබඳ පළපුරුද්දක් ඇත්තෙකු විය යුතුය. මේ තිදෙනා අතුරින් එක් අයෙකු අධිකාරියේ සභාපති වන්නේ ය.

අතිගරු ජනාධිපතිතුමා විසින් 02.02.2015 වැනි දින මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි මහතා මධ්‍යම පරිසර අධිකාරියේ සභාපත්වරයා ලෙස පත්කරන ලදි. එමෙන්ම, අජිත් ද කොස්තා මහතා 09.03.2015 වැනි දින ද, වෛද්‍ය කේ. හසිත් අරවින්ද මහතා 30.01.2015 ද පත්කරණු ලැබූ අතර මහා භාණ්ඩාගාරය නියෝජනය කිරීම සඳහා 04.03.2015 වැනි දින ආර් අනුෂියානාදන් මහත්මිය පත් කරන ලදි.

එතැන්සිට පහත නම් සඳහන් සාමාජිකයිනගෙන් ගෙන් එය සමන්විත වේ.

මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි මහතා - සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය

අජිත් ද කොස්තා මහතා - සාමාජික

වෛද්‍ය කේ. හසිත් අරවින්ද මහතා - සාමාජික

ආර් අනුෂියානාදන් මහත්මිය - මහා භාණ්ඩාගාර නියෝජිත

මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වන කේ. එච්. මුතුකුඩආරච්චි මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස පනතින් ලැබී ඇති බලය අනුව කටයුතු කරයි.

ගත වූ වසර තුල පරිසර කළමනාකරණයට අදාලව අධිකාරිය මෙහෙයවමින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11ක් පවත්වන ලදි.

## 1.5 පරිසර සභාව

හැඳින්වීම

සංශෝධිත පරිදි වූ 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව පරිසර සභාව පිහිටුවන ලදි.

පරිසර සභාවේ ප්‍රධාන කාර්ය භාරය

ඉහත සඳහන් පනත අනුව පරිසර සභාව සතු ප්‍රධාන කාර්ය භාරයන් පහත පරිදි වේ.

මධ්‍යම පරිසර අධිකාරියේ වගකීම්, බලතල, කාර්ය හා කර්තව්‍ය සම්බන්ධයෙන් වූ කාරණය පිළිබඳව අධිකාරියට සාමාන්‍ය යෙන් උපදෙස් දීම සහ

අධිකාරිය විසින් සභාවට යොමු කරන ලද යම් කාරණා පිළිබඳව අධිකාරියට උපදෙස් දීම

පරිසර සභාවේ ව්‍යුහය

සංශෝධිත පරිදි 1980 අංක 7 දරණ ජාතික පරිසර පනතෙහි සඳහන් පරිදි පරිසර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන්ගෙන් පරිසර සභාව සමන්විත වේ. පසුගිය 2016 වසර තුල දී පහත දැක්වෙන ආකාරයට පරිසර සභාවේ 12 වන සැසිය පැවැත්වුණි.

12 වන සැසිය

ගරු පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා (2014) හා ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා (2015) විසින් පහත දැක්වෙන සාමාජිකයින් පරිසර සභාවේ 12 වන සැසිය සඳහා පත් කරන ලද අතර එම සාමාජික මහත්ම මහත්මීන් 12වන සැසි වාරය අවසන් වන ඔක්තෝබර් මාසය තුල පවත්වන ලද රැස්වීම දක්වා සිය සාමාජිකත්වය දරන ලදි

Table 0.1 පරිසර සභාවේ සාමාජිකයා

| | පරිසර සභාවේ සාමාජිකයාගේ නම | නියෝජනය වන අමාත්‍යාංශය |
|---|---|---|
| 1 | ඩබ් පී එම් ජී ආර් ශාන්ත කුමාර මුහන්දිරම් මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඉඩම්)<br>ඉඩම් අමාත්‍යාංශය |
| 2 | එන් පී වී සී පියතිලක මහතා | අතිරේක ලේකම් (පාලන හා මුදල්)<br>කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 3 | එම්. ඒ. අල්ලාම් මහතා | අතිරේක ලේකම් (පාලන) |

| | පරිසර සභාවේ සාමාජිකයාගේ නම | නියෝජනය වන අමාත්‍යාංශය |
|---|---|---|
| | | කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය |
| 4 | කේ සුභද්‍රා වල්පොල මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පළාත් පාලන)<br>පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය |
| 5 | ජේ. ජී. එල්. සුලක්ෂන ජයවර්ධන මහතා | අධ්‍යක්ෂ (සංවර්ධන)<br>විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය |
| 6 | එච්. එම්. කේ. ජේ. බි. ගුණරත්න මහතා | අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන)<br>ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය |
| 7 | වෛද්‍ය සරත් අමුණුගම මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා)<br>සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 8 | මොන්ටි රණතුංග මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ව්‍යාපෘති කළමණාකරණ දෙපාර්ත්මේන්තුව)<br>ශ්‍රී ලංකා මහ බැංකුව |
| 9 | කේ එච් මුතුකුඩආරච්චි මහතා | අධ්‍යක්ෂ ජනරාල්<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>**ලේකම් /පරිසර සභාව** |

**TABLE 0.2** පරිසර කළමනාකරණය හා ආරක්ෂණය පිළිබඳ විද්වතුන්

| | | |
|---|---|---|
| 1 | මහචාර්ය ඩබ් එම් ඩී බී වන්නිනායක මහතා | මහාචාර්ය<br>ජ්‍යෙ ෂ්ඨ සාගර ජෛව විද්‍යාඥ<br>සාගර විශ්ව විද්‍යාලය |
| 2 | ආචාර්ය නිර්මලී පල්ලෙවත්ත මිය | අංශ ප්‍රධානි, සත්ත්ව විද්‍යා අංශය, කොළඹ විශ්ව විද්‍යාලය |
| 3 | ආචාරය සුධීරා රන්වල මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශාක විද්‍යා අංශය, කොළඹ විශ්ව විද්‍යාලය |
| 4 | ජගත් ගුණවර්ධන මහතා | නීතිඥ හා පරිසරවේදී<br>(සභාපති/පරිසර සභාව) |

**TABLE 0.3** ස්වේච්ඡා සංවිධාන වල නියෝජිතයන්

| | | |
|---|---|---|
| 1 | නිව්ටන් ගුණරත්න මහතා | හිටපු සභාපති<br>ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව |
| 2 | ශ්‍යාමෙන් විදානගේ මහතා | වැඩසටහන් සම්බන්ධිකාරක<br>පරිසරය සංරක්ෂණය සඳහා වූ අන්තර් ජාතික සංගමය |
| 3 | ඩග්ලස් තිසේරා මහතා | අධ්‍යක්ෂ කඩොලාන වැඩසටහන<br>කුඩා මත්ස්‍ය පදනම |
| 4 | තිලක් කාරියවසම් මහතා | සභාපති. පරිසර සංරක්ෂණ භාරය |

**TABLE 0.4** රැස්වීම් පිළිබඳ විස්තර

| **පවත්වන ලද රැස්වීම්** | **පවත්වන ලද මාසය** | **දිනය** |
|---|---|---|
| 23 වන රැස්වීම | ජනවාරි | 21 |
| 24 වන රැස්වීම | පෙබරවාරි | 18 |
| 25 වන රැස්වීම | මාර්තු | 17 |
| 26 වන රැස්වීම | අප්‍රේල් | 22 |
| 27 වන රැස්වීම | මැයි | 19 |
| 28 වන රැස්වීම | ජූනි | 23 |
| 29 වන රැස්වීම | ජූලි | 21 |
| 30 වන රැස්වීම | අගෝස්තු | 18 |
| 31 වන රැස්වීම | සැප්තැම්බර් | 22 |
| 32 වන රැස්වීම | ඔක්තෝබර් | 28 |

**පවත්වන ලද රැස්වීම්**

2016 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් මස දක්වා රැස්වීම් වාර 10 (දහයක්) පමණ පවත්වන ලදි. එම විස්තර පහත සඳහන් පරිදි වේ

**සාකච්ඡා කළ කරුණු**

- තලවිල කිරල ශාකය පිළිබඳ ස්ථානීය පරීක්ෂණයක් සිදුකර එය ආරක්ෂා කිරීමට අදාළ ඉදිරි කටයුතු සිදු කිරීම.
- අනවසර කුඩා පරිමාණ විදුලි බල ව්‍යාපෘතිය නිසා වැනසෙන සිංහරාජ වනාන්තරය
- ආරණ්‍ය සේනාසන භූමි ආරක්ෂා කිරීම
- පරිසරය හා ගැටෙන තීරණාත්මක අවස්ථා වලදී අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින් ප්‍රතිපත්ති මෙහෙයවමින් පුරෝගාමී ආයතනයක් ලෙස කටයුතු කිරීම
- කුඩා පරිමාණ විදුලි බලාගාර
- මොරගොල්ල විදුලි බලාගාරය
- කොස්කුලන විදුලි බල ව්‍යාපෘතිය
- මොරගොල්ල විදුලි බලාගාර යෝජනා ක්‍රමයේ දී ගඩයන් පරිස්ථාපනය පිළිබඳ විදුලි බල මණ්ඩලය ක්‍රියාකර ඇති ආකාරය සාකච්ඡා කිරීම
- නැවුරබ් ආයතනය මගින් සිදුවන පරිසර විනාශය
- යාපන කලපුවට කුණු කසල බැහැර කිරීම
- කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය
- බැද්දගාන ප්‍ර දේශයේ කෝට්ටේ ශ්‍රී ජයවර්ධන පුර අභයභූමියේ රක්ෂිත ඉඩමක අනවසරයෙන් ගොඩකර ක්‍රීඩා පිටියක් තැනීම
- වලව්වත්ත වතුරාන බුලත්සිංහල ප්‍රදේශය පවතින සුවිශේෂී තත්වය සලකා බලා මතු පරපුර වෙනුවෙන් සංරක්ෂණය කිරීම
- මුන්දලම මුක්කුතුඩුව වැලි කැණීම පිළිබඳව
- මන්නාරම ප්‍ර දේශයේ සුළං විදුලි බලාගාරය පිළිබඳව
- සලපයාරු කළපුව හෝටල් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කිරීම
- මහජනතාව දැනුවත් කිරීම සඳහා රූපවාහිනි වැඩසටහන් හරහා සම්බන්ධ වීම
- පුත්තලම අයිලිය නම් වන්නාතරය නීති විරෝධි ලෙස හෙලි කිරීම
- රුවන්පුර අධිවේගි මාර්ගයෙන් හානිවිය හැකි වනාන්තර
- බොල්ගොඩ ආශ්‍රිත ගැටළු
- අත්වැල්තොට කුඩා විදුලි බලාගාර ව්‍යාපෘතිය
- වයඹ පළාත් පරිසර ප්‍රඥප්තියට අදාල ගැටළු සාකච්ඡාව

# 2.0. අධිකාරියේ වගකීම් සහ කාර්යයන්

මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් තාක්ෂණික වශයෙන් විශේෂිත වූ ක්ෂේත්‍ර 04 ක් පාදක කොට ගෙන, ආයතන ව්‍යුහය සමන්විත වේ.

- පරිසර දූෂණ පාලන අංශය
- පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශය
- පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය
- මානව සම්පත් සංවර්ධනය, පරිපාලන හා මුදල් අංශය

පරිසර කළමනාකරණ අංශයෙහි ඉමහත් පළපුරුද්දක් සහිත අධ්‍යාපනික සහ වෘත්තීමය දැනුමක් ලත් නිලධාරීන් මෙම අංශයන්හි ප්‍රධානීන් ලෙස කටයුතු කරනු ඇත.

**පරිසර දූෂණ පාලන අංශය**

පරිසර දූෂණ පාලන අංශය යටතේ පිහිටුවන ලද ඒකක තුනෙහි කාර්යයන් පහත පරිදි වේ.

පරිසර දූෂණ පාලන ඒකකය

- ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා පරිසර එකඟතාවය ලබාදීම (නව පරිසර නිර්දේශ හා පරිසර ආරක්ෂණ බලපත්‍ර)
- විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම සඳහා ස්ථාන නිර්දේශයන් ලබාදීම
- විදුලි සංදේශ කුළුණු සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීම
- පරිසර දූෂණය සම්බන්ධ මහජන පැමිණිලි විසඳීම.
- ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාදාමයට සහභාගීවීම.
- පරිසර දූෂණය පාලනය සඳහා තාක්ෂණික පහසුකම් සැපයීම
- මානව හිමිකම් කොමිසමේ සහ උසාවියේ ප්‍රවීණ සාක්ෂිකරුවන් ලෙස පෙනී සිටීම හා පාර්ලිමේන්තු කමිටු, මානව හිමිකම් කමිටුව හා උසාවි සඳහා තාක්ෂණික වාර්තා සැපයීම
- දූෂණය පාලනය සඳහා කාර්යක්ෂම නව උපාය මාර්ග ක්‍රම හා මෙවලම් හඳුන්වා දීම

**අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය**

- උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ නීති හා රෙගුලාසි හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම
- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම
- අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ප්‍රධාන ව්‍යාපෘති සැලසුම් හා පසුවිපරම් කිරීම
- අනුකූලතා පසුවිපරම් කිරීම
- කසළ කළමනාකරණය සඳහා තාක්ෂණ න්‍යාමන ක්‍රම ප්‍රවර්ධනය කිරීම
- බහුජාතික පාරිසරික සම්මුතීන් ක්‍රියාත්මක කිරීම (බාසල් සම්මුතිය - රොටර්ඩෑම් සම්මුතිය)
- කර්මාන්ත ගැටළු කළමනාකරණය
- කාර්මික රසායනික ද්‍රව්‍ය කළමනාකරණය
- කසළ කළමනාකරණ ව්‍යාපෘතීන් - ක්‍රියාකාරකම් සඳහා පාරිසරික අනුමැතිය ලබා ගැනීමට සහයෝගය ලබා දීම
- නීතිය ක්‍රියාත්මක කරවීම සඳහා තාක්ෂණික සහයෝගය ලබා දීම
- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නියම ව්‍යාපෘති ඇති කිරීම
- මහජන පැමිණිලි විමර්ශනය
- අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධ අධ්‍යාපනික සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සහයෝගය ලබා දීම
- කසළ කළමනාකරණ ව්‍යාපෘති අධීක්ෂණය
- නිකුත් කරන ලද නිර්දේශය පසුවිපරම් කිරීම
- අනෙකුත් ආයතන වල කසළ කළමනාකරණය ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික යෙදවුම් ලබාදීම

**වායු තත්ව සහ ජල තත්ව රසායනාගාර ඒකකය**

- මධ්‍යම පරිසර අධිකාරියේ අනෙකුත් අංශ සහ දිස්ත්‍රික් කාර්යාල සඳහා අවශ්‍ය විශ්ලේෂණ සේවා සැපයීම
- පාරිසරික තත්ව / ප්‍රමිති පසුවිපරම් කිරීම
- තෝරාගත් ස්ථාන වල ජල හා වායු තත්ව පසුවිපරම් කිරීම
- වායු, ශබ්ද, කම්පන හා ජල තත්ව පිළිබඳ පාරිසරික පර්යේෂණ හා සමීක්ෂණ කටයුතු සිදු කිරීම
- ශබ්දය, වායු තත්ව සහ ජල තත්ව පිළිබඳ රෙගුලාසි සකස් කිරීම

**පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශය**

පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශය ඒකක තුනකින් සමන්විත වේ.

**පරිසර බලපෑම් ඇගයීම් ඒකකය**

- මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම
- පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම
- පරිසර බලපෑම් ඇගයීමේ හා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය හා සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පරිසර බලපෑම් ඇගයීම හා මූලික පාරිසරික පරීක්ෂණයන්ට අදාළ ගුරු උපදෙස් සකස් කිරීම
- උපාය මාර්ගික පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම

**ස්වභාවික සම්පත් කළමනාකරණ ඒකකය**

- පරිසර බලපෑම් ඇගයීම් හා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියට අයත් නොවන ව්‍යාපෘති සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම
- ව්‍යාපෘති පසුවිපරම් කටයුතු සිදු කිරීම
- ස්වභාවික සම්පත් හායනය පිළිබඳ මහජන පැමිණිලි විභාග කිරීම
- ස්වභාවික සම්පත් සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පාරිසරික ආරක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම
- ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගුරු උපදෙස් නිකුත් කිරීම

**පර්යේෂණ හා සංවර්ධන ඒකකය**

- භූගෝලීය තොරතුරු ආශ්‍රයෙන් දත්ත රැස් කිරීම
- පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- දිස්ත්‍රික් පැතිකඩ සඳහා සිතියම් පිළියෙල කිරීම
- පාරිසරික පර්යේෂණ සම්බන්ධීකරණ සහ පර්යේෂණ වල ප්‍රතිඵල ලබාදීම

**පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය**

- මුද්‍රිත මාධ්‍ය, ඉලෙක්ට්‍රොනික මාධ්‍ය සහ කණ්ඩායම් සන්නිවේදන මාර්ග හරහා පරිසරය පිළිබඳ අධ්‍යාපනය ලබාදීම හා දැනුවත් කිරීම
- ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් පුහුණු වැඩමුළු සහ ප්‍රදර්ශන පැවැත්වීම
- මහජනතාව වෙත පාරිසරික තොරතුරු ලබාදීම
- රාජ්‍ය නොවන සංවිධාන වෙත අවශ්‍ය සහයෝගය ලබාදීම හා ලබාගැනීම
- පාරිසරික දිනයන් සැමරීම
- සොබාකෙත මධ්‍යස්ථාන ඇති කිරීම හා ක්‍රියාත්මක කිරීම

**ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය**

- පාරිසරික තොරතුරු රැස් කිරීම හා වැඩිදියුණු කිරීම
- පුස්තකාල ජාලය හා ජාලයට අයත් නොවන පුස්තකාල සම්බන්ධීකරණය
- ජාතික පාරිසරික තොරතුරු අවශ්‍ය සියළු දෙනාට එම තොරතුරු ලබාදීමට පහසුකම් සැලසීම

**ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය**

- සියළුම වැඩ සටහන් සම්පාදකයන් සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සැපයීම
- මධ්‍යම පරිසර අධිකාරිය හා පාරිසරික අමාත්‍යාංශය විසින් පවත්වන ලද සියළු වැඩ සටහන් ශ්‍රව්‍ය දෘශ්‍ය ආවරණය කිරීම
- අධ්‍යාපනික හා දැනුවත් කිරීම් සඳහා වීඩියෝ පටි සැකසීම
- වීඩියෝ පට සැකසීම සඳහා පහසුකම් සැපයීම

**මානව සම්පත් සංවර්ධන, පරිපාලන සහ මුදල් අංශය**

මානව සම්පත් සංවර්ධන, පරිපාලන හා මුදල් අංශය, මානව සම්පත් සංවර්ධන, පරිපාලන හා මුදල් යන ඒකක තුනකින් සමන්විත වේ.

**මානව සම්පත් සංවර්ධන ඒකකය**

- මානව සම්පත් කළමනාකරණ සැලසුම් සකස් කිරීම
- තෝරා ගැනීම, බඳවා ගැනීම සහ උසස්වීම් ලබාදීම
- පුහුණු වැඩ සටහන් වෙත කාර්ය මණ්ඩලය යොමු කිරීම
- පුද්ගල කාර්ය සාධන ඇගයීම
- පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සහ දේශීය / විදේශීය පුහුණුවීම් සඳහා සුදුසු නිලධාරීන් යොමු කිරීම
- කාර්ය මණ්ඩල සාමාජිකයන් හට සිදු වූ අසාධාරණකම් සොයා බලා ඒ වෙනුවෙන් කටයුතු කිරීම
- මානව සම්පත් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම

**පරිපාලන ඒකකය**

- මිලදී ගැනීම්, අත්පත් කර ගැනීම් සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තුව
- සේවා එකඟතා නිකුත් කිරීම හා අළුත් කිරීම
- රක්ෂණ පහසුකම් සඳහා ප්‍රවර්ධන පහසුකම් ලබාදීම
- ආයතනික සෞඛ්‍ය ආරක්ෂණය සහ සුභසාධනය
- සාමාන්‍ය පරිපාලනය

**මුදල් ඒකකය**

- වාර්ෂික ආදායම් / වියදම් සකස් කිරීම හා අවසන් මුදල් වාර්තා ඉදිරිපත් කිරීම
- අවසන් ප්‍රගති වාර්තා සකස් කිරීම හා මාසික ආදායම් / වියදම් පාලන වාර්තාව සකස් කිරීම
- වැටුප් හා වෙනත් ගෙවීම් පිළිබඳ වාර්තා සකස් කිරීම හා ගෙවීම
- ව්‍යාපෘති ගිණුම් පවත්වාගෙන යාම
- ඵලදායී ගෙවීම්

**නීති ඒකකය**

- ජාතික පාරිසරික පනත යටතේ නීති කෙටුම්පත් සංශෝධනය හා නව නීති රෙගුලාසි පැනවීම
- ජාතික පාරිසරික පනත බලාත්මක කිරීම හා රෙගුලාසි ගැසට් කිරීම
- පරිසර පනත යටතේ 12 වන වගන්තිය සහ 24 වගන්ති යටතේ නියෝග නිකුත් කිරීම
- නිකුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍ර අත්හිටුවීම / අවලංගු කිරීම හා ප්‍රතික්ෂේප කිරීම
- ආයතන කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් වගන්ති 23 S යටතේ නියෝග නිකුත් කිරීම
- පරිසර ආරක්ෂණ බලපත්‍ර කොන්දේසි අනුමත කිරීම හා අධිකරණයට වාර්තා ඉදිරිපත් කිරීම
- මධ්‍යම පරිසර අධිකාරිය ගොනු කළ හා මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව ගොනු කළ නඩු කටයුතු සඳහා අධිකරණයේ පෙනී සිටීම
- අමාත්‍යාංශයේ පැවැත්වෙන විමර්ශන හා ඇපැල් විභාග සඳහා පහසුකම් සැපයීම
- අධිකරණ නෛතික කටයුතු සඳහා ලිපිලේඛන සැකසීම
- පාරිසරික ව්‍යවස්ථා නීතිකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම හා සම්පත් දායකයන් ලෙස ද කටයුතු කිරීම
- පාරිසරික නෛතික කටයුතු පිළිබඳ අනෙකුත් අංශ හා ආයතනයන්ට උපදෙස් ලබාදීම
- ගිවිසුම් කෙටුම්පත් කිරීම හා අනුමත කිරීම
- පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පොලිස් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම

**සැලසුම් හා පසුවිපරම් ඒකකය**

- මූලික දත්ත රැස්කිරීම, අවශ්‍ය දත්ත සහ දත්ත ප්‍රභවයන් හඳුන්වාදීම සහ දත්ත ප්‍රභවයන් හා දත්ත රැස්කරන ක්‍රම සම්බන්ධ කිරීම
- මධ්‍යම පරිසර අධිකාරියේ සංයුක්ත සැලැස්ම සකස් කිරීම
- මධ්‍යම පරිසර අධිකාරියේ සංයුක්ත සැලැස්ම, වාර්ෂික සැලැස්ම හා මධ්‍යකාලීන වැඩ සටහන් මත පදනම්ව ඒ ඒ ප්‍රතිපාදන යටතේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම
- පසුවිපරම් කිරීම පිළිබඳ සැලසුම් සකස් කිරීම
- මධ්‍යම පරිසර අධිකාරියේ විවිධ අංශ සහ දිස්ත්‍රික් / පළාත් කාර්යාල අතර සම්බන්ධීකරණය පවත්වාගෙන යාම
- ඇගයීම් සංවිධානය කිරීම
- ප්‍රගති වාර්තා සකස් කිරීම සහ වෙනත් අදාල ආයතන වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම
- වාර්ෂික වාර්තාව සකස් කිරීම
- මධ්‍යම පරිසර අධිකාරියේ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය පිළිබඳ දේශීය - විදේශීය මූල්‍යාධාර ආයතන, පුද්ගලක අංශයේ අදාල ආයතන හා වෙනත් අදාල ආයතන දැනුවත් කිරීම

**පැමිණිලි ඒකකය**

- පාරිසරික ගැටළු, හානි හා උපද්‍රව සම්බන්ධ මහජන හා ආයතනික පැමිණිලි ලබාගැනීම
- එකී ගැටළු අදාල ආයතන වලට යොමු කිරීම හා ඒ සම්බන්ධව කටයුතු කිරීම

**අභ්‍යන්තර විගණන ඒකකය**

- ගණකාධිකරණ හා අභ්‍යන්තර පාලන ක්‍රියා පිළිවෙල පිළිබඳ සමාලෝචනය
- මූල්‍ය හා මිනුම් තොරතුරු විමර්ශනය කිරීම
- ආයතනයේ මෙහෙයුම් කටයුතු වල ආර්ථික බව, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව පිළිබඳ මූල්‍ය හා මූල්‍ය නොවන පාලනයන් පිළිබඳ ප්‍රගති සමාලෝචනය කිරීම
- ආයතනයේ අභ්‍යන්තර හා බාහිර නීති රෙගුලාසි, කළමනාකරණ ප්‍රතිපත්ති හා මඟ පෙන්වීම් ක්‍රියාත්මක කෙරෙන්නේදැයි පරීක්ෂා කිරීම

- කළමනාකරණය විසින් ව්‍යවස්ථානුකූලව පවරන ලද විශේෂ විමර්ශණ

**පළාත් කාර්යාල**

- පාරිසරික කළමනාකරණය සම්බන්ධ පහත සඳහන් කාර්යයන් පළාත් කාර්යාල වෙත පවරා දී ඇත.
- මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් / දිස්ත්‍රික් කාර්යාල වල කාර්යභාරය
- යෝජිත සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම
- නව කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම
- කර්මාන්ත සඳහා නියමිත කටයුතු / පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීම (පළාත් පාලන ආයතන වෙත බලය පවරා නොමැති)
- පළාත් පාලන ආයතන වෙත බලය පවරන ලද ක්‍රියාවලීන් සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය සහ පළාත් පාලන ආයතන අතර සම්බන්ධීකරණය, පසුවිපරම් කටයුතු සිදුකිරීම සහ අවශ්‍යතාවය අනුව තාක්ෂණික උපදෙස් ලබාදීම
- ස්වභාවික සම්පත් කළමනාකරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- මූලික පාරිසරික පරීක්ෂණයට / පරිසර බලපෑම් ඇගයීමට ලක් නොවන එනම්, මැණික් ගැරීම, ඉඩම් ගොඩ කිරීම, ගස් කැපීම වැනි ව්‍යාපාර සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය ලබාදීම
- පාරිසරික අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- පරිසරය සම්බන්ධ ප්‍රාදේශීය මට්ටමින් පැවැත්වෙන රැස්වීම් හා කාර්යයන් සඳහා මධ්‍යම පරිසර අධිකාරිය නියෝජනය කරමින් සහභාගී වීම
- රජයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා මූලික සංවිධාන, වෙනත් ස්වේච්ඡා ආයතන, කර්මාන්ත හා වෙළෙඳ සංගම්, පාසල් සහ තරුණ සංවිධාන අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම
- දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, ගම් මට්ටමින් හා පාසල් මඟින් ක්‍රියාත්මක වන පාරිසරික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම
- පරිසර කළමනාකරණයට අදාල ප්‍රාදේශීය මට්ටමින් තොරතුරු / දත්ත රැස්කිරීම, දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම
- මධ්‍යම පරිසර අධිකාරියේ පස් අවුරුදු වැඩ සටහනට අනුකූලව පළාත් හා දිස්ත්‍රික් කාර්යාල සඳහා වාර්ෂික ක්‍රියාත්මක වැඩ සටහන් සකස් කිරීම

**අධිකාරියේ කාර්ය සාධනය**

පහත පරිච්ඡේදයෙන් ඒ ඒ අංශ, ඒකක හා පළාත් කාර්යාල වලින් 2015 වසර තුල ඉටු කරන ලද කාර්ය සාධනයන් විග්‍රහ කෙරේ.

# 3.0. පරිසර දූෂණ පාලන අංශය

## 3.1 පරිසර දූෂණ පාලන ඒකකය

### 3.1.1 ජාතික පාරිසරික පනත සඳහා අඩුවක්ව පවතින පරිසර තත්ව සඳහා වන නීති ප්‍රතිපාදන සැකසීම හා පවතින නීති සංශෝධනය කිරීම.

පරිසර දූෂණ පාලන අංශය යටතේ පවතින පරිසර දූෂණ පාලන ඒකකය පරිසරය දූෂණය වැලැක්වීම හා පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම දරයි. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා පරිසර දූෂණ පාලන ඒකකය නව ක්‍රමවේද සකස් කර හඳුන්වාදීමත්, මෙම කටයුතු පිළිබඳව විධිමත් පසුවිපරම් සිදු කිරිමත් සිදු කෙරේ.

ඉහත ක්‍රියාකාරකම් වඩාත් පහසු ලෙස ක්‍රියාත්මක කිරිම සඳහා ප්‍රධාන විෂයපථ කාණ්ඩ හතරකට ගොනු කරන ලදී.

නියාමනය සහ පසුවිපරම්

ප්‍රතිපත්ති ප්‍රවර්ධනය

තාක්ෂණික පහසුකම් සැපයීම.

පරිසර දූෂණ පාලනය සඳහා විශේෂ වැඩ සටහන්.

### 3.1.2 පාරිසරික තත්ව විධිවිධාන කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම.

#### 3.1.2.1 පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම.

1533/16 හා 2008.01.25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ පළකර ඇති නියමිත ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීමේ ක්‍රමවේදය පරිසර දූෂණ පාලන අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

කර්මාන්ත මඟින් සිදුවන පරිසර දූෂණ තත්වයන් ප්‍රායෝගිකව අධ්‍යනය කිරීමෙන් අනතුරුව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගතයුතු නියමිත ක්‍රියාකාරකම් ගැසට් නිවේදනයේ කාණ්ඩ “අ’’ “ආ’’ සහ “ඇ’’ වශයෙන් ලැයිස්තු ගතකර ඇත. ඒ අනුව “අ’’ කාණ්ඩයට අයත් මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත 80 ක්ද “ආ” කාණ්ඩයට අයත් මධ්‍ය පරිමාණ දූෂකාරක කර්මාන්ත 33 ක්ද “ඇ ”’ කාණ්ඩයට අයත් සුළු පරිමාණ දූෂකාරක කර්මාන්ත 25 ක්ද මෙම ලැයිස්තුවට අයත් වේ. “අ” සහ “ආ” කාණ්ඩයට අයත් කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල මඟින් සිදුකරනු ලබන අතර “ඇ” කාණ්ඩයේ කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය අදාල පළාත් පාලන ආයතන මඟින් සිදුකරනු ලැබේ.

පරිසර දූෂණ පාලන අංශය මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත සඳහා ක්‍රමික දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබන අතර, ඒවා සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේදී විධිමත් අංකන ක්‍රමයක් භාවිතා කිරීම මගින් එම තොරතුරු ක්‍රමානුකූලව දත්ත ජාලයට ඇතුලත් කිරීම කරනු ලැබේ.

**TABLE 0.5 2016** වසරේදී නිකුත් කරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගණන

| | |
|---|---|
| නව පරිසර ආරක්ෂණ බලපත්‍ර අංක | 1447 |
| අලුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍ර අංක | 2899 |
| පසුවිපරම් | 159 |

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යාපෘතින් සඳහා පාරිසරික එකඟතාව ලබාදීම.

ආයෝජන මණ්ඩල පනතේ කාණ්ඩ අංක 17 ට අනුව, ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්ත/ව්‍යාපෘති සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ලබාදීමෙන් අනතුරුව අදාල පරිසර ආරක්ෂණ බලපත්‍රය ආයෝජන මණ්ඩලය මගින් නිකුත් කරනු ලැබේ. ඒ අනුව ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ කර්මාන්ත/ ව්‍යාපෘති සඳහා එකඟතාවය ලබාදීමේදී එම ක්‍රියාකාරකම් වල පරිසර දූෂණ පාලනය සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් පරිසර දූෂණ පාලන අංශය මඟින් සිදුකරනු ලබයි.

2016 වසර තුලදී ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යාපෘති/ කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීම සහ ස්ථානගත කිරිමට යෝජිත ව්‍යාපෘතින් සඳහා එකඟතාවය ලබාදීම පහත පරිදි වේ.

**TABLE 0.6 2016 වසරේදී එකඟතාවය ලබාදුන් කර්මාන්ත මාණය**

| | |
|---|---|
| නව පරිසර ආරක්ෂණ බලපත්‍ර සංඛ්‍යාව | 40 |
| අළුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍ර සංඛ්‍යාව | 337 |
| ස්ථාපිත කිරීමට නියමිත නව ව්‍යාපෘතින් සඳහා එකඟතාවය ලබාදීම | 99 |
| කර්මාන්ත පසුවිපරම් | 80 |

3.1.3 පැමිණිලි විමර්ශණය කිරිම සහ පසුවිපරම් කිරීම.

මහජන පැමිණිලි විමර්ශණය කිරීම හා කර්මාන්ත කටයුතු මඟින් සිදුවන පරිසර දූෂණ පාලනය පිළිබඳ ඇගයීම් වාර්තා (අපජල තත්ව වාර්තා, ශබ්දය හා කම්පනය රසායනාගාර මිනුම් වාර්තා) පිළිබඳ විමර්ශණය කිරීම පරිසර දූෂණ පාලන අංශය මඟින් සිදු කරනු ලැබේ. ආයෝජන මණ්ඩලයේ අනුමත කර්මාන්ත වලට අදාලව ලැබෙන පැමිණිලි සහ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් සෘජුවම යොමුකරන අනෙකුත් විශේෂ පැමිණිලි විමර්ශණය කිරීම පරිසර දූෂණ පාලන ඒකකය විසින් සිදුකරනු ලබයි.

**TABLE 0.7 පැමිණිලි විමර්ශණය කිරිම**

| පැමිණිලි | BOI කර්මාන්ත | BOI නොවන කර්මාන්ත |
|---|---|---|
| ලැබුණු පැමිණිලි | 25 | 03 |
| පරීක්ෂාකර ක්‍රියාමාර්ග ගත් | 08 | 01 |
| අදාල ආයතන වෙත යොමුකළ | 16 | 02 |

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ කර්මාන්ත ස්ථානගත කොට ඇති අපනයන සැකසුම් (Export Processing Zone) කලාප 12 ක් දිවයින තුළ ඇත. පරිසර බලපෑම් ඇගයීම් සිදුකොට පිහිටුවන ලද මෙම කලාපයන්හි පවතින කර්මාන්ත මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත ලෙස ගැසට් නිවේදනයට අනුව සඳහන් කළහැක. ඒ අනුව මෙම කර්මාන්ත කලාපයන්හි පරිසර දූෂණ පාලනය පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදය හරහා මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර දූෂණ පාලන ඒකකය මඟින් සිදුකරනු ලැබේ. තවද මෙම කර්මාන්ත මඟින් පරිසරයට මුදාහරින අපජලය සහ විමෝචනය කරන දූෂකාරක පාලනය සහ අවම කිරීමේ අරමුනින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කරනු ලබන අතර, ඒ සඳහා අඛණ්ඩ පසුවිපරම් කටයුතු සිදුකරනු ලැබේ.

පරිසර දූෂණ පාලන ඒකකය මඟින් මල්වත්ත, හොරණ, වතුපිටිවල, මීරිගම, අවිස්සාවේල්ල, බියගම, කටුනායක හා කොග්ගල අපනයන කලාප පරික්ෂා කර ඇත. එමෙන්ම මල්වත්ත, හොරණ හා වතුපිටිවල අපනයන කලාප සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර ඇත.

3.1.2.2.2 විස්තරාත්මක පසුවිපරම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරිම.

දිවයින පුරා පවතින අ සහ ආ කාණ්ඩයේ කර්මාන්ත ආවරණය වන පරිදි පරිසර දූෂණ පාලන ඒකකය මඟින් පසුවිපරම් වැඩසටහනක් ක්‍රියාත්ක කරන ලදී. එහිදි පසුවිපරම් කරන ලද දිස්ත්‍රික්ක සහ කර්මාන්ත සංඛ්‍යාවන් පහත දැක්වේ.

**TABLE 0.8** විස්තරාත්මක පසුවිපරම් වැඩසටහන්

| දිස්ත්‍රික්කය | පසුවිපරම් කළ කර්මාන්ත ගණන | දිස්ත්‍රික්කය | පසුවිපරම් කළ කර්මාන්ත ගණන |
|---|---|---|---|
| අම්පාර | 03 | යාපනය | 06 |
| මහනුවර | 18 | මාතලේ | 11 |
| කළුතර | 17 | කුරුණෑගල | 02 |
| ගම්පහ | 16 | මඩකලපුව | 02 |
| වවුනියා | 02 | රත්නපුර | 06 |
| මන්නාරම | 02 | කෑගල්ල | 05 |
| කොළඹ | 12 | ත්‍රිකුණාමලය | 03 |
| ගාල්ල | 05 | හම්බන්තොට | 04 |
| නුවරඑළිය | 06 | බදුල්ල | 02 |
| අනුරාධපුර | 02 | මොනරාගල | 02 |
| පුත්තලම | 02 | පොළොන්නරුව | 29 |
| මුළු ගණන | | | 159 |

3.1.3 පරිසර තත්ත්වය දියුණු කිරීම හා හදිසි තත්ත්වයන්ට මුහුණ දීම සඳහා වෙනත් පාර්ශවයන් දැනුවත් කිරීම.

පරිසර දූෂණ පාලන ඒකකයේ නිලධාරීන් පරිසර බලපෑම් ඇගයීම සම්බන්ධව තාක්ෂණික කමිටු වල සාමාජිකයන් ලෙස ක්‍රියා කරයි. මෙම ඒකකයේ නිලධාරීන් 2016 වර්ෂයේ දී එවැනි තාක්ෂණික කමිටු 30 කට සහභාගි වී ඇති අතර, ඒකාබද්ධ ක්ෂේත්‍ර පරික්ෂණ 15 කට සහභාගි වී ඇත.

3.1.3.3 කර්මාන්ත ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික පහසුකම් සැලසීම.

අ) පරිසර දූෂණ පාලනය සඳහා තාක්ෂණික විශේෂඥ උපදේශක ආයතන හා රසායනාගාර වාර්ෂිකව විමර්ශණය කිරීම හා යාවත්කාලීන කිරීම.

කර්මාන්තශාලා වලින් සිදුවන පාරිසරික දූෂණ තත්ත්වයන් මෙම අධිකාරිය මඟින් අනුමත තත්ත්වයන්ට අනුකූල වන පරිදි පාලනය කරගැනීමට කර්මාන්තකරුවන්ට අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම් උපදෙස් හා විශේෂඥ සහාය ලබාගැනීමට පහසුකම් සැලසීම සඳහා රසායනාගාර/ තාක්ෂණික විශේෂඥ/උපදේශක ආයතන මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කර එම ලේඛන වාර්ෂිකව යාවත්කාලීන කරනු ලැබේ.

මෙහි අරමුණ වනුයේ කර්මාන්තකරුවන්ට අඩු වියදමකින් වඩා ඵලදායී තාක්ෂණික සේවාවක් ලබාදීම මඟින් පාරිසරික හානිය අවම කර ගැනීමයි. මෙහිදි රසායනාගාර පහසුකම් සලසන ආයතන වලට මෙන්ම උපදේශන සේවා සපයන්නන්ට ද තම ආයතනයේ අඩුලුහුඩුකම් නිවැරදි කර ගනිමින් වඩා පුළුල් සේවාවක් සැපයීමට හැකි වේ.

මේ අනුව 2016 වසර සඳහා රසායනාගාර 32 ක් සහ තාක්ෂණික විශේෂඥ ආයතන 53 ක් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන ලදී. එම ඉල්ලුම් පත් ඇගයීමෙන් හා ව්‍යාපෘති පසුවිපරම් කිරීමෙන් පසු රසායනාගාර 28 ක් හා තාක්ෂණික විශේෂඥ ආයතන 51 ක් මධ්‍යම පරිසර අධිකාරියේ 2016 වසර සඳහා ලියාපදිංචි කර ඇත. තවද මෙම ආයතන මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය මඟින් ප්‍රසිද්ධ කර ඇති අතර, අදාල තොරතුරු සහිත

පත්‍රිකා මුද්‍රණය කොට කර්මාන්තකරුවන් වෙත බෙදාදීමට කටයුතු කර ඇත. 2016 වර්ෂයෙහි ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත් කැඳවීම ප්‍රචාරණය කිරීම ඉංග්‍රීසි, සිංහල හා දෙමළ යන භාෂා තුනෙන්ම 2016 වර්ෂයේ අවසාන කාර්තුවේදී සිදුකරන ලදී.

3.1.3.5 පාරිසරික සංවේදී කලාප තුළ මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ දූෂකාරක කර්මාන්ත පිහිටුවීම පිළිබඳ තීරණය කිරීම සඳහා වූ කමිටුව.

අපනයන සැකසුම් කලාප සහ කර්මාන්තපුර වලින් පිටත මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ දූෂකාරක කර්මාන්ත ස්ථානගත කිරීම් තීරණය කිරීම සඳහා තාක්ෂණික කමිටුවක් ස්ථාපනය කරන ලදී. මෙය නව කර්මාන්ත ස්ථානගත කිරීම සම්බන්ධව තීරණ ගන්නා ඉතා වැදගත් තාක්ෂණික කමිටුවකි. මෙම කමිටුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, කර්මාන්ත අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය සහ මධ්‍යම පරිසර අධිකාරිය යන ආයතන වල විධායක මට්ටමේ තාක්ෂණික නිලධාරීන්ගෙන් සමන්විත වේ.

කොළඹ ප්‍රදේශයේ ජල ඉල්ලුම සපයන අඹතලේ පොම්පාගාරයට ජලය කැලණි ගඟෙන් ලබාගන්නා නිසා කාර්මික අපද්‍රව්‍ය වලින් කැලණි ගඟ දූෂණය වීම අවම කිරීම මෙම කමිටුවේ ප්‍රධාන අරමුණ විය. නමුත් දැනට මෙම කමිටුව මඟින් කැලණි ගංගා ද්‍රෝණියට බාහිරින් පිහිටුවා ඇති විශාල අපජල ප්‍රමාණයක් පිටකරන මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ කර්මාන්ත පිළිබඳවද අවධානය යොමුකර ඒවා සඳහා ද අවශ්‍ය උපදෙස් හා නිර්දේශ ලබාදීම සිදුකරනු ලබයි.

පරිසර දූෂණ පාලන අංශය 2016 වසර තුළදී එවැනි රැස්වීම් 10 ක් පැවැත්වූ අතර, කර්මාන්තකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 63 ක් ඇගයීම සිදුකරන ලදී.

3.1.3.7 ජනාධිපති පරිසර සම්මාන වැඩ සටහන

ජනාධිපති පරිසර සම්මාන වැඩ සටහන මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පරිසර හිතකාමී ලෙස කටයුතු කරන ව්‍යවසායකයන් හට පිරිනමනු ලබන එකම සම්මානය වේ. පරිසර හිතකාමී ලෙස පවත්වාගෙන යනු ලබන පුද්ගලික සහ රාජ්‍ය අංශයේ ව්‍යවසායකයන් ඇගයීම මෙම වැඩ සටහනේ මුඛ්‍ය පරමාර්ථය වේ. මෙම වැඩ සටහන හරිත ශ්‍රී ලංකාවක් කරා යන ගමනට මහඟු පිටිවහලක් වන අතර, කර්මාන්ත ප්‍රජාව පරිසර සුරැකීමේ මහඟු සත්කාරයට දායක කර ගැනීමේ ප්‍රායෝගික ක්‍රමයක් ද වේ. මෙහි මූලික පරමාර්ථය කර්මාන්තකරුවන් හා විවිධ සේවා සපයන්නන් පසුබිපරම් මත පදනම් වූ පරිසර දූෂණය පාලනය හා පරිසර කළමනාකරණ ක්‍රමෝපායන් සඳහා දිරිගැන්වීමත්, එමගින් පාරිසරික ප්‍රමිති හා උපමාන කරා ළඟාවීම මෙන්ම තිරසාර පරිසරයක් කරා කර්මාන්ත ප්‍රජාව රැගෙන යාමත් ය.

2016 වසරේ දී ජනාධිපති පරිසර සම්මාන වැඩ සටහන සඳහා අංශ 16 ක් යටතේ අයදුම්පත් කැඳවන ලදී. ඒවා අතර කර්මාන්ත අංශ 10 ක් කසළ කළමනාකරණ ව්‍යාපෘති හා පළාත් පාලන ආයතන, රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා පාසල් ද ඇතුලත් විය. මෙහිදි රන් සම්මාන 03ක්, රිදී සම්මාන 13 ක්, ලෝකඩ සම්මාන 16 ක් හා කුසලතා සම්මාන 18 ක් ප්‍රදානය කෙරිණි. ඒ අනුව අයදුම්පත්‍ර 350 ක් ලද අතර, පළපුරුදු හා විද්වත් විනිශ්චය මණ්ඩලය මගින් ඒවා ඇගයීමට භාජනය කරන ලදී. විද්වත් විනිශ්චය මණ්ඩලය මගින් අවසානයේදී ජයග්‍රාහකයින් 50 ක් ඉහත සම්මාන සඳහා තෝරාගන්නා ලදී.

මෙම සම්මාන උළෙල 2016 ඔක්තෝබර් මස 18 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සිදුකරන ලදී. මීට අමතරව ආරාධිත අමුත්තන් 1600 ක් ද මේ සඳහා සහභාගී වන ලදී.

**TABLE 0.9** රන් සම්මාන ලේඛනය

| අංකය | අංශය | නම | ස්ථානය |
|---|---|---|---|
| 01 | ඇඟලුම් | මාර්ස් ඇක්ටිව් ලීනියා ඉන්ටිමෝ පුද්ගලික සමාගම | බියගම අපනයන ප්‍රවර්ධන කලාපය. |
| 02 | හෝටල් | බාබෙරින් ආයුර්වේද රිසෝට් හෝටලය. | වැලිගම |
| 03 | කසළ කළමනාකරණ ව්‍යාපෘති හා පළාත් පාලන ආයතන | ගල්ගමුව ප්‍රාදේශීය සභාව | ගල්ගමුව |

**3.1.3.8 රසායනික අනතුරු වලක්වා ගැනීමේ ව්‍යාපෘතිය**

රසායනික අනතුරු හා ව්‍යසන බොහොමයක් නිසිපරිදි සිදුකළ, පෙර සූදානම් මඟින් හා පසුවිපරම් මඟින් වලක්වාගත හැක. මේ සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් හා තත්ත්වයන් පවත්වාගෙන යාම සඳහා එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනේ ආධාර ඇතිව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

2016 වර්ෂය තුළදී පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මල්ටිලැක් ආයතනයේ කළමනාකාරිත්වය සඳහා වැඩමුළුවක් පැවැත්වීම.

මල්ටිලැක් ආයතනයේ රසායනික අනතුරු වැලැක්වීම සම්බන්ධ වැඩමුළුවක් පැවැත්වීම.

කළුතර දිස්ත්‍රික්කයේ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සඳහා රසායනික කර්මාන්ත සම්බන්ධව ක්ෂේත්‍ර පරික්ෂණ සිදුකිරීම පිළිබඳව වැඩමුළුවක් පැවැත්වීම.

කොළඹ දිස්ත්‍රික්කයේ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සඳහා රසායනික කර්මාන්ත සම්බන්ධව ක්ෂේත්‍ර පරික්ෂණ සිදුකිරීම පිළිබඳව වැඩමුළුවක් පැවැත්වීම.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සඳහා අපජල පිරිපහදු කිරීමේ පද්ධති හා රසායනික අනතුරු පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම.

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර නිලධාරීන්ට හා ජේ. පරිසර නිලධාරීන්ට වැඩමුළුවක් පැවැත්වීම.

පුහුණු වැඩමුළු රැස්වීම් සහ ඉදිරිපත් කිරීම.

පරිසර දූෂණ පාලනය සම්බන්ධව පුහුණු වැඩමුළු පැවැත්වීම හා දැනුම හුවමාරු කරගැනීම අත්‍යාවශ්‍ය අංගයක් වන අතර, මේ සම්බන්ධව පරිසර දූෂණ පාලන අංශය මඟින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මෙහිදී ඉදිරිපත් කිරීම් හා දේශන 20ක්, වැඩමුළු 14 ක් , රැස්වීම් 35 ක් සඳහා පරිසර දූෂණ පාලන ඒකකය කටයුතු කරන ලදී.

**පරිසර දූෂණ පාලන ඒකකය**

**TABLE 0.10** ප්‍රගති සාරාංශය **- 2016**

| ක්‍රියාකාරකම්, | ප්‍රගතිය | | විශේෂිත කරුණු |
|---|---|---|---|
| | භෞතික | මූල්‍ය | |
| 1. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම - ආයෝජන මණ්ඩලයට අයත් වන | | | |
| නව කර්මාන්ත හා පාරිසරික නිර්දේශ | 99 | සම්පූර්ණ මුදල් වෙන්කිරීම පරිසර දූෂණ පාලන අංශය සඳහා 2016 වර්ෂයේදී රු.750,000/- | ක්‍රියාත්මක කිරීම සඳහා යන වියදම ආයෝජන මණ්ඩලය විසින් දරනු ලබයි. |
| කර්මාන්ත වල පාරිසරික ආරක්ෂණ අළුත් කිරීම සඳහා පාරිසරික එකඟතා | 433 | | |
| නව කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා පාරිසරික එකඟතා | 59 | | |
| පසුවිපරම් කිරීම | 142 | | |
| 2. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම - BOI නොවන | | මෙම මුදලින් රු.750,000/- ක් පරිසර දූෂණ පාලන අංශය මඟින් වැය කරන ලදී. | |
| පැමිණිලි | | | |
| ආයෝජන මණ්ඩලයේ නොවන | | | |
| ලැබෙන පැමිණිලි | 50 | | |
| ක්ෂේත්‍ර පරීක්ෂණ | 12 | | |
| යොමුකළ | 38 | | |

| ක්‍රියාකාරකම්, | ප්‍රගතිය | | විශේෂිත කරුණු |
|---|---|---|---|
| | භෞතික | මූල්‍ය | |
| | | | |
| ආයෝජන මණ්ඩලය ලැබුණු පැමිණිලි<br>ක්ෂේත්‍ර පරීක්ෂණය කල<br>යොමු කල පැමිණිලි | 59<br>58<br>20 | | |
| **3. උපදේශන ආයතන ලැයිස්තුව යාවත්කාලීන කිරීම සහ රසායනාගාර ලැයිස්තුව යාවත් කාලීන කිරීම.** | | | |
| රසායනාගාර ලියාපදිංචිය සඳහා ලැබුණු අයදුම් පත් | 32 | | |
| උපදේශන ආයතන ලියාපදිංචිය සඳහා ලැබුණු අයදුම් පත් | 53 | | |
| තෝරාගත් රසායනාගාර | 29 | | |
| තෝරාගත් උපදේශන ආයතන | 46 | | |
| **4. විශාල හා මධ්‍ය පරිමාන කර්මාන්ත සම්බන්ධ පැවැත්වූ රැස්වීම.** | | | |
| පැවැත්වූ රැස්වීම. | 10 | | |
| ඇගයීම සිදු කල කර්මාන්ත | 63 | | |
| නිර්දේශ කල | 47 | | |
| ප්‍රතික්ෂේප කල | 16 | | |
| **5. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අංකනය කිරීම.** | | | |
| නිකුත් කල"අ" කාණ්ඩයේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර | 1791 | | |
| නිකුත් කල"අ" කාණ්ඩයේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීම. | 2531 | | |
| **6. වැඩමුළු** | | | |
| ඉදිරිපත් කිරීම් / දේශන | 20 | | |
| වැඩමුළු | 12 | | |
| රැස්වීම් | 40 | | |
| 8. EIA තාක්ෂණික කමිටු සඳහා සහය වීම. | 25 | | |
| **1. ජාතික හරිත සම්මාන 2016**<br>රන් සම්මාන | 03 | | වියදම් දැරීම මහ |

| ක්‍රියාකාරකම්, | ප්‍රගතිය | | විශේෂිත කරුණු |
|---|---|---|---|
| | භෞතික | මූල්‍ය | |
| රිදී සම්මාන | 13 | | භාණ්ඩාගාරය මඟින් |
| ලෝකඩ සම්මාන | 16 | | |
| කුසලතා සම්මාන | 18 | | |
| 2. ජනාධිපති පරිසර සම්මාන | 12 | | |
| 3. හරිතාභිමානී සම්මාන | 03 | | |
| 4. හරිත දරුවෝ සම්මාන | 09 | | |
| 5. ජනාධිපති පදක්කම් | 41 | | |
| 9. රසායනික අනතුරු වැලැක්වීමේ පෙර සූදානම් ව්‍යාපෘතිය. | | | |

# 3.2 රසායනාගාර සේවා අංශය

## 3.2.1 වායු සම්පත් කළමනාකරණ සහ පසුවිපරම් ඒකකය

වායු සම්පත් කළමනාකරණ සහ පසු විපරම් ඒකකය රසායනාගාර සේවා ඒකකයේ එක් අංශයක් වන අතර මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර දූෂණ පාලන අංශය යටතේ ක්‍රියාත්මක වෙයි. මෙම ඒකකය ඉටු කරන ලද කාර්යයන් වල සාරාංශ ප්‍රගතිය පහත දක්වා ඇත.

වායු සම්පත් කළමනාකරණ සහ පසු විපරම් ඒකකයේ 2016 වර්ෂයේ ඉටු කරන ලද කාර්යයන් හා එහි ප්‍රගතිය

නියෝග සැදීම, නියෝග සංශෝධනය හා නියෝග පරිපාලනය

### 3.2.1.1.1 ස්ථානීය ප්‍රභව විමෝචන පාලන නියෝග

**ශ්‍රී ලංකාවේ සංසරණ වායුවේ ගුණාත්මක තත්වය පාලනය කිරීම සඳහා ස්ථාවර ප්‍රභව වලින් පිටවන විමෝචන පාලනය අත්‍යවශ්‍ය වන අතර මධ්‍යම පරිසර අධිකාරිය ස්ථාවර ප්‍රභව වලින් පිටවන විමෝචන පාලනය සඳහා ස්ථානීය ප්‍රභව විමෝචන ප්‍රමිති සකසා අවසන් කර ගැසට් කිරීම සඳහා භාර දී ඇත.**

### 3.2.1.1.2 1996 අංක 1 දරන ජාතික පාරිසරික (ඝෝෂා පාලන) නියෝග සංශෝධනය කිරීම.

ශබ්ද දූෂණය පාලනය කිරීම වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයක් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය ජාතික පාරිසරික (ඝෝෂා පාලන) නියෝග සංශෝධනය කිරීම සිදු කරමින් සිටින අතර 2017 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට බලාපොරොත්තුවේ.

### 3.2.1.3 අධිවේගී මාර්ග වලින් සිදුවන ශබ්ද දූෂණ පාලන නියෝග

ධාවනය සඳහා මුදල් ගෙවන මහා මාර්ග වලින් සිදුවන ශබ්ද දූෂණය අවම කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය ජාතික පාරිසරික (අධිවේගී මාර්ග ශබ්ද දූෂණය පාලන) ප්‍රමිති සකසා අවසන් කර ගැසට් කිරීම සඳහා භාර දී ඇත.

යෝජිත බේස් ලයින් මාර්ගයට උඩින් ඉදි කිරීමට සැලසුම් කර ඇති මාර්ගය මඟින් සිදු විය හැකි ශබ්ද දූෂණය පාලනය සඳහා උපාය මාර්ග

යෝජිත බේස් ලයින් මාර්ගයට උඩින් ඉදි කිරීමට සැලසුම් කර ඇති මාර්ගයෙන් සිදු විය හැකි ශබ්ද දූෂණය පාලනය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය එම මාර්ගය සැලසුම් කිරීමේදී යොදා ගැනීම සඳහා ශබ්ද මට්ටම් සඳහා මාර්ගෝපදේශ ප්‍රමිති සකසා ඇත.

### 3.2.1.4 පොදු ප්‍රවාහන සේවා බස් රථ ඇතුලත ශබ්ද දූෂණය පාලනය

පොදු ප්‍රවාහන සේවා බස් රථ ඇතුලත ගමන් ගන්නා මගීන්ට සිදුවන ශබ්ද පීඩාව හඳුනා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය අධ්‍යයනයක් සිදු කරන ලද අතර ඒ සඳහා බස් 100 ක පමණ ඇතුලත ශබ්ද මට්ටම මැනීම සිදු කර ඇත. එම දත්ත පදනම් කර ගෙන එම පීඩාව අවම කිරීම සඳහා අදාල ආයතන වල සහාය ලබා ගෙන මාර්ගෝපදේශ මාලාවක් සකස් කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය තීරණය කර ඇත.

### 3.2.1.5 වාහන නලා නියෝග ක්‍රියාත්මක කිරීම.

වාහන නලා ශබ්දය සහ වාහන නලා නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි හේතුවෙන් සහ වාහන නලා නියෝග ක්‍රියාත්මක කිරීම රජයේ අපේක්ෂාව අනුව සිදු නොවූ බැවින් එම නීතිය ක්‍රියාත්මක කරවීම සඳහා මහා මාර්ග වලදී වාහන නලා හඬ මැනීමේ වැඩසටහන් 06 ක් මඟින් වාහන 300 ක පමණ නලා හඬ මැනීම සිදු කරන ලදී. එම තොරතුරු පදනම් කර ගෙන වඩා ප්‍රශස්ත මට්ටමින් අදාල නීති නියමිත ආයතන මඟින් ක්‍රියාත්මක කිරීම සවි බල ගැන්වීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ සහාය ඇතිව අතිගරු ජනාධිපතිතුමාගේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මෙම කරුණ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීම අරඹා ඇත.

### 3.2.1.6 පාරිසරික ගුණාත්මක දත්ත එකතු කිරීම. - සංසරණ වායු තත්වය පසු විපරම් කිරීම.

1. කොළඹ නගරයේ සංසරණ වායු ගෝලයේ තත්ත්වය මිනුම් කිරීම සඳහා කොළඹ කොටුව දුම්රිය ස්ථානය අසළ පිහිටා ඇති පරීක්ෂණ මධ්‍යස්ථානයේදී රසායනික විශ්ලේෂණ (Wet Chemical) ක්‍රම භාවිතා කරමින් සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) සහ නයිට්‍රජන් ඩයොක්සයිඩ් ($NO_2$) සාන්ද්‍රණ මිනුම් කරන ලදී.
2. ඒ අනුව 2016 වර්ෂයේදී $SO_2$ සහ $NO_2$ සාම්පල 63 ක් එකතු කර විශ්ලේෂණය කරන ලදි.

**TABLE 0.11 2016 වර්ෂය තුල තාක්ෂණික උපදේශක / සහාය කටයුතු**

| අංකය | තාක්ෂණික උපදේශක / සහාය සේවා කටයුත්ත | සේවා කටයුතු සංඛ්‍යාව |
|---|---|---|
| 3.1 | EIA / IEE තාක්ෂණික ඇගයීම් කමිටු වලට සේවා සැපයීම. | 12 |
| 3.2 | අභ්‍යන්තර මිලදී ගැනීමේ ක්‍රමවේදයට සහාය වීම. | 08 |
| 3.3 | අනෙකුත් ආයතන වල තාක්ෂණික කමිටුවට නම් කල නියෝජිතයින් ලෙස සේවා සැපයීම. | 03 |
| 3.4 | කර්මාන්ත වලින්, ව්‍යාපෘති යෝජකයන්ගෙන් සහ අනෙකුත් ආයතන වලින් ලැබෙන තාක්ෂණික වාර්තා ඇගයීම. | 09 |
| 3.5 | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ වැඩසටහන සඳහා තාක්ෂණික සහය සැපයීම. | 21 |
| 3.6 | EIA / IEE ව්‍යාපෘති සඳහා මූලික දත්ත මැනීම. | 03 |
| 3.7 | තාක්ෂණික රැස්වීම් සහ සාකච්ජා | 12 |
| 3.8 | තාක්ෂණික වාර්තා සැකසීම. | 03 |
| 3.9 | හැකියා වර්ධන වැඩසටහන් සඳහා සම්පත් දායකයින් | 17 |
| 3.10 | විශ්ව විද්‍යාල සිසුන් සඳහා කෙටි කාලීන වැඩසටහන් | 03 |
| 3.11 | උසාවියේ විශේෂඥ සාක්ෂි සැපයීම. | 08 |

### 3.2.1.8 ව්‍යාපෘති සංකල්ප දියුණු කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

පුනරුදය වැඩසටහන යටතේ ලංකාවේ ගොඩනැගිලි ඇතුලත පවතින වාතයේ සත්‍ය තත්වය හඳුනා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ව්‍යාපෘතියක් සකසා ඇත. ජනාධිපති ලේකම් කාර්යාලය අවුරුදු 03 ක ව්‍යාපෘතියක් සඳහා රු. මිලියන 61 ක මුදලක් ලබා දී ඇති අතර පළමු අවුරුද්දේ කාර්යයන් සාර්ථකව අවසන් කර ඇත. රුපියල් මිලියන 07 ක් වටිනා මිනුම් උපකරණ ලබා දෙමින් ව්‍යාපෘතිය මගින් වායු සම්පත් කළමනාකරණ හා පසු විපරම් ඒකකය ශක්තිමත් කර ඇත.

කර්මාන්ත සම්බන්ධව අනුකූලතාව සහ පැමිණිලි විමර්ශනය සම්බන්ධයෙන් කටයුතු කිරීමට තාක්ෂණික මඟ පෙන්වීම සහ සහාය ලබා දීම.

කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, පැමිණිලි විමර්ශනය හා නීතිමය කටයුතු සඳහා මෙන්ම වානිජ මට්ටමින්ද වායු සම්පත් කළමනාකරණ හා පසු විපරම් ඒකකය මඟින් ශබ්ද මට්ටම් සහ වායු තත්ත්ව මැනීම සිදු කෙරේ.

**TABLE 0.12 සැපයූ සේවාවන්**

| අංකය | මිනුම් කටයුතු මගින් සේවා සැපයීම. | | සැපයූ සේවා සංඛ්‍යාව |
|---|---|---|---|
| 6.1 | ශබ්ද මට්ටම් මැනීම | දිවා කාලය | 108 |
| 6.2 | | දිවා හා රාත්‍රී | 46 |
| 6.3 | සමපූර්ණ අවලම්භිත අංශුමය ද්‍රව්‍ය මිනුම් | | 18 |

| අංකය | මිනුම් කටයුතු මගින් සේවා සැපයීම. | සැපයූ සේවා සංඛ්‍යාව |
|---|---|---|
| 6.4 | ඇස්බැස්ටස් ෆයිබර් මිනුම් | 10 |
| 6.5 | හදිසි විපත් වලට අදාල වායු තත්ත්ව මිනුම් | 03 |
| 6.6 | අනෙකුත් මිනුම් | 04 |

### 3.2.1.9 මාලේ ප්‍රකාශනයේ කටයුතු ක්‍රියාත්මක කරන ජාතික ආයතනය ලෙස ක්‍රියා කාරිත්වය.

මාලේ ප්‍රකාශනයේ ක්‍රියාකාරකම් වලට අදාල වූ දකුණු ආසියානු රට රටවල දේශ සීමා හරහා සිදුවන වායු දූෂණ තත්ත්ව එහි බලපෑම සහ වායු දූෂණ තත්ත්ව වැළැක්වීමේ සහ පාලනය කිරීමේ කටයුතු සිදු කිරීමේදී මාලේ ප්‍රකාශනයේ කටයුතු ක්‍රියාත්මක කරන ජාතික ආයතනය ලෙස මධ්‍යම පරිසර අධිකාරිය එම කටයුතු සිදු කරනු ලබයි. මෙම වැඩසටහනට අදාල වූ රට රටවල දේශ සීමා හරහා වූ වායු දූෂණ තත්ත්වයන් පිළිබඳව අධ්‍යයනයක් වායු සම්පත් කළමනාකරණ හා පසු විපරම් ඒකකය මගින් අනුරාධපුර දොරමඩලාව භූමියේදී සිදු කරනු ලබයි.

**TABLE 0.13** වායු තත්ත්ව පරාමිතීන් පරීක්ෂා කිරීම

| අංකය | විස්තර | සාම්පල ගණන | | |
|---|---|---|---|---|
| 7.1 | දොරමඩලාව භූමියේ වායු තත්ත්ව පරාමිතීන් පරීක්ෂා කිරීම. | $SO_2$ | $NO_2$ | $PM_{10}$ |
| | | 40 | 40 | 41 |

මාලේ ලේකම් කාර්යාලය විසින් ඉන්දියාවේ නවදිල්ලියේදි පැවැත්වූ පස්වෙනි ක්‍රියාකාරි කමිටුවට මධ්‍යම පරිසර අධිකාරිය ක්‍රියාකාරීව සහභාගි වීය.

මධ්‍යම පරිසර අධිකාරිය මාලේ ලේකම් කාර්යාලය හා එක්ව මාලේ ප්‍රකාශනයේ 15 වන අන්තර් රාජ්‍ය රැස්වීම (IG15) 2016 ඔක්තොම්බර් මාසයේදී කොළඹදී පවත්වන ලදී.

### 3.2.1.10 පාරිසරික සේවා සැපයීම මඟින් ආදායම් උපයා ගැනීම

වායු සම්පත් කළමනාකරණ හා පසු විපරම් ඒකකය 2016 වර්ෂය තුලදී රු. 2,641,121.34 ක ආදායමක් මිනුම් කටයුතු මගින් උපයා ගෙන ඇති අතර කරන ලද මිනුම් වලින් අඩක් පමණ මුදල් අයකිරීමකින් තොරව සිදු කර ඇත.

## 3.2.2 ජල තත්ත්ව සහ පසුවිපරම් අංශය

පරිසර පනතෙන් පරිසරය දූෂණය පාලනය කරන ප්‍රධාන මෙවලම වන්නේ පරිසර ආරක්ෂණ බලපත්‍රයයි. පනතේ A ,B හා C කොටසේ ඇති ක්‍රියාකාරකම් සඳහා පරිසර අධිකාරියෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතුය.පරිසර දූෂණ පාලන අංශය යටතේ ඇති ජල තත්ව රසායනාගාරය මගින් මේ සඳහා කාර්මික අපසන්දන වල තත්වය මුළු දිවයිනේම පරික්ෂා කිරීමට යොදවා ගනු ලබන අතර ඉන් දිවයිනේ පරිසර කලමණාකරනය හා සංරක්ෂණයට කාර්මික අපසන්දන හා මතුපිට ජලයේ තත්ව වාර්තා සැපයීම මගින් සිදු කරයි.

2016 වසරේදී රසායනාගාර ජල හා අපසන්දන සාම්පලය 1363 විවිධ පරාමිතීන් සඳහා විශ්ලේෂණය කරන ලදී. මෙයට පරිසර ආරක්ෂණ බලපත්‍රය සඳහා ලබාගත් සාම්පල වාණිජමය සාම්පල හා පසුවිපරම් සඳහා හා නීතිමය අවශ්‍යතා සඳහා විශ්ලේෂණය කල සාම්පල හා මතුපිට ජලාශ හා භූගත ජල සාම්පලද ඇතුලත්ය.

කර්මාන්ත ක්ෂේත්‍ර පරීක්ෂණය කරනුයේ දිවයින පුරා කාර්මික අපසන්දනය රැස් කිරීම සඳහාය. මෙම සාම්පලය පහත සඳහන් විවිධ අවශ්‍යතා සඳහා සිදු කරනු ලබයි.

**TABLE 0.14** කර්මාන්ත අප ජල සාම්පල පරීක්ෂාව

| සාම්පල රැස්කිරීමේ අවශ්‍යතාව | සාම්පල ගණන |
|---|---|
| පරිසර ආරක්ෂණ බලපත්‍රය | 66 |
| නීතිමය | 20 |
| පැමිණිලි | 83 |
| පසු විපරම් | 239 |
| වෙනත් | 210 |
| වාණිජමය කාර්මික අපසන්දනය | 740 |
| **මුළු ගණන** | **1363** |

වගුව 01- 2016 දී රැස්කල කාර්මික අපසන්දන ගණන.

### 3.2.2.1 ප්‍රාදේශීය රසායනාගාර පිහිටුවීම හා මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාර බලාත්මක කිරීම.

ප්‍රාදේශීය රසායනාගාර හතක් හා එක් දිස්ත්‍රික් රසායනාගාරයක් ගම්පහ නිරතුරු විශ්ලේෂණය කරන පරාමිතීන් විශ්ලේෂණයට අවශ්‍ය මූලික පහසුකම් ඇතිව ස්ථාපනය කරන ලදී. රසායනාගාර ස්ථාපනය කිරීම 2014 දී ආරම්භ කෙරුණි.සමහර රසායනාගාර තාක්ෂණික කාර්ය මණ්ඩලය නැති නිසා විධිමත්ව ක්‍රියා නොකිරිනි.සියළු රසායනාගාර 2015 හා 2016 දී මූලික පරාමිතීන් විශ්ලේෂණය සඳහා බලාත්මක කෙරිනි.සියළු රසායනාගාර වල වැඩ කටයුතු 2016 දී ක්‍රියාත්මක විය.රසායනාගාර බලාත්මක කිරීම සඳහා වන ව්‍යාපෘතියේ මුදල් යොදවා වායු තත්ව හා ශබ්ද මට්ටම් විශ්ලේශණය කරන අංශය අඩ වශයෙන් බලාත්මක කෙරිනි.මෙම ව්‍යාපෘතියේ මිලියන 26ක් වායු තත්ව විශ්ලේශණ රසායනාගාරය බලාත්මක කිරීමට යෙදවීමට හැකි විය.මෙම උපකරණය භාවිතයට පුහුණුව අවශ්‍ය වේ.




**FIGURE 0-1** සියළු රසායනාගාර වල **2016** ප්‍රගතිය.




**FIGURE 0-2** ප්‍රාදේශීය රසායනාගාර විවිධ පාරාමිතීන් සඳහා **2016** දී රැස් කල සාම්පල ගණන




FIGURE 0-3 වාණිජමය සාම්පල වලින් මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාර 2016 දී උපයාගැනීම

### 3.2.2.2 රසායනාගාර ප්‍රතීතන ක්‍රියාවලිය.

2016 දී ISO 17025 ට අවශ්‍ය සියළු ලේඛණ සැදීමට රසායනාගාරයට හැකි විය.තත්ව අත් පොත සැදීම සම්පූර්ණ කිරීමට හැකි විය.මෙහි සමහර ක්‍රියාවලි දැනට පටන් ගෙන ඇත.මෙයට ප්‍රතීතනය ලබා ගැනීමට යන පරීක්ෂණ වල තත්ව පාලනය හා තත්ව සහතික වැඩකටයුතු ඇතුලත්ය.මීට අමතරව ISO 17025 සඳහා අවශ්‍ය කලමණාකාර හා තාක්ෂණික අඩුපාඩු සොයා බැලීම සඳහා එක් අභ්‍යන්තර විගණනයක් සිදු කෙරිණි.2016 දී ISO 17025 සම්බන්ධයෙන් රසායනාගාර කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් බොහොමයක් සිදු කෙරිණි.

### 3.2.2.3 ජල තත්ව පසුවිපරම් අංශය මගින් කෙරුන වෙනත් කටයුතු.

#### 3.2.2.3.1 දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී වීම.

රසායනාගාර කාර්ය මණ්ඩලය 2016 වසරේ දී විවිධ මට්ටම් වල මහජනතාව සඳහා ජල දූෂණය හා ඊට අදාළ විෂයන් සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් වලට සහභාගී විය. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය යටතේ ඇති පවිත්‍ර ගංගා වැඩසටහන මගින් සිදු කල පාසැල් ළමුන් හා සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් තුනක් පැවැත්විණි. රසායනාගාර කාර්ය මණ්ඩලය ජල තත්ව පරීක්ෂණය ගැන හා අදාළ කරුණු පිළිබඳව දැනුවත් කිරීම මඟින් රසායනාගාර කාර්ය මණ්ඩලය සහය විය.

මොරටුව විශ්ව විද්‍යාලයේ ඉල්ලීමකට අනුව රසායනාගාර කාර්ය මණ්ඩලය ජාත්‍යන්තර සිසුන් සඳහා ඒක් දිනක පුහුණු වැඩසටහනක් පැවැත්විණි.මෙහිදී මෙම සිසුන් සඳහා ජල හා කාර්මික අපසන්දන විශ්ලේෂණය පිළිබඳ දැනුම ලබා දුනි.

#### 3.2.2.3.2 අනෙකුත් කටයුතු

මෙම වසර තුල රසායනාගාරයට අධිවේගී මාර්ග ව්‍යාපෘති වල EIA ක්ෂේත්‍ර පරීක්ෂණ කිහිපයකට සහභාගී වීමට හැකි විය.ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතිය හා කරමාන්තපුර ස්ථාපනය කරන ව්‍යාපෘතිය හා විෂය ප්‍රමානය කිරීමේ රැස්වීම් හා නඩු කටයුතු මේවායි. රසායනාගාර කාර්ය මණ්ඩලය පරිසර දූෂණ පාලන අංශය මගින් ක්‍රියාත්මක කරන රසායනාගාර හා උපදේශන සේවා ආයතන ඇගයීම සඳහාද සහභාගී විය.

### 3.2.2.4 දිවයිනේ ප්‍රධාන ජලාධාර පසුවිපරම් වල ප්‍රගතිය.

**මතුපිට ජල තත්ව පසුවිපරම**

ජල තත්ව පසුවිපරම් වැඩසටහන් කිහිපයක්ම මධ්‍යම පරිසර අධිකාරිය මගින් සිදු කරයි.කැළණි ගඟ ,මා ඔය , බෙන්තොට ගඟ,හා දඩුගම් ඔයේ ජල තත්ව පසුවිපරම් කිරීම මාසිකව සිදු කරයි. කාර්ය මණ්ඩලයේ අඩුව නිසා 2016 මුළු පසුවිපරම් වැඩසටහනම සම්පූර්ණ කිරීමට නොහැකි විය.හැකි වුයේ කැළණි ගඟේ හා බෙන්තොට ගඟේ පසුවිපරම් සම්පූර්ණ කිරීමට පමණි. සම්පල රැස්කරන ස්ථාන හා පරාමිතීන් ගණන කැළණි ගඟේ වැඩි විය.

පහත වගුවෙන් සමහර ජලාධාර වල සොයා ගැනීම පෙන්නුම් කරයි.

**කැළණි ගඟ**

2016 තුලදී කැළණි ගඟ ඉහළ ගංගා ද්‍රෝණියේ සාම්පල ස්ථානද පරීක්ෂා කෙරිණි.තවද සෑම සාම්පල ස්ථානයක් සඳහාම පරීක්ෂා කරන පරාමිතීන් ගණනද වැඩි කෙරිණි. මෙයට මුළු කඨිනත්වය සල්ෂේට්, ඇමෝනියා,වර්ණය,මුළු අවලම්බිත අංශු ප්‍රමාණය හා තෙල් හා ග්‍රීස් ප්‍රමාණය ඇතුලත්ය.මෙම පරාමිතීන් වල විචලනය මතුපිට

ජල තත්ව ප්‍රමිතිය හා සැසදිමේදී විචලායක් නොදක්වයි.අවුරුද්ද පුරාම.

දියවූ ඔක්ෂිජන් ප්‍රමාණය,බොරතාව හා විද්‍යුත් සන්නායකතාව( EC) හැර අනෙක් පරාමිතීන් වල පැහැදිලි විචලායක් නොපෙන්වන අතර ඒවා මධ්‍යම පරිසර අධිකාරියෙන් යෝජිත මතුපිට ජල තත්ව ප්‍රමිතිය ඇතුලත පවතී.

විද්‍යුත් සන්නායක තාවයේ පැහැදිලි වැඩි වීමක් ගඟේ පහත ප්‍රදේශ වල සිදුවන මැණික් ගැරීම් හේතුවෙන් ගඟේ පතුල හැරීම නිසා මුහුදු ජලය ගඟට ගලා ඒම නිසා සිදු වේ.

ප්‍රභවය පැහැදිලි නැති දූෂණය අවුරුද්ද පුරා පැහැදිලිව පෙනේ.පස සෝදා යෑම හා ජල පෝෂක ප්‍රදේශයේ තුරුලතා කැපීම හා නොයෙක් ගංඟා ඉවුරේ සිදුවෙන ඉදිකිරීම් හා කැණීම් කටයුතු නිසා කැළණි ගඟේ බොරතාවය අවුරුද්ද පුරා පෙන්වයි.

**මා ඔය**

භෞතික පරාමිති වල පැහැදිලි වෙනස්කම් නොපෙන්වයි. වැඩි වන එකම පාරාමිතින් වන්නේ මල කෝලි ආකාර බැක්ටීරියා ප්‍රමාණය හා බොරතාවයයි. එය ප්‍රභවය හැදිනිය නොහැකි දූෂක ,ගෘහස්ත කැලි කසල සෝදාගෙන යෑම නිසා සිදු වේ.

**බෙන්තොට ගඟ**

මල අපද්‍රව්‍ය වලින් වන දූෂණය බෙන්තොට ගඟේ සියළු තෝරාගත් ස්ථාන වල අවුරුද්ද පුරා පෙන්නුම් කරයි.. බොරතාවය සෑම විටම යෝජිත මතුපිට ජල තත්ව ප්‍රමිතියට වඩා වැඩිය.

**දඬුගම් ඔය**

රසායනාගාරයට 2016 දී තාක්ෂණික නිලධාරීන් නොමැති බැවින් මෙම වැඩසටහන සිදු කිරීමට නොහැකි විය.

## 3.3 අපද්‍රව්‍ය කළමනාකරණ ඒකක

2016 වර්ෂයේ ක්‍රියාත්මක සැලසුමෙන් හඳුනාගත් පරිදි උපද්‍රවකාරි අපද්‍රව්‍ය සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාලව

අ) උපද්‍රවකාරි අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

ආ) අන්තර්ජාතික සම්මුතීන්ට අදාල කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකිරීම හා

ඇ) ඝන අපද්‍රව්‍ය හා උපද්‍රවකාරි අපද්‍රව්‍ය කලමනාකරණයට අදාල ව්‍යාපෘති/ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන කටයුතු ඉටු කිරීමේ වගකීම මධ්‍යම පරිසර අධිකාරියේ අපද්‍රව්‍ය කළමනාකරණ අංශයේ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය වෙත පැවරි ඇත.

### 3.3.1 ශ්‍රී ලංකාව තුල උපද්‍රවකාරි අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

උපද්‍රවකාරි අපද්‍රව්‍ය කලමණාකරණ රෙගුලාසි (අංක 1534/18 දරන 2008 පෙබරවාරි 01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය) ක්‍රියාත්මක කිරීමේ එක් කොටසක් ලෙස 2016 වසර තුල නිකුත් කරන ලද මුළු බලපත්‍ර සංඛ්‍යාව 153කි.

මීට අමතරව මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වල නිලධාරීන්ට තාක්ෂණික සහාය සපයනු වස් බස්නාහිර, මධ්‍යම හා වයඹ පලාත් කාර්යාල නිලධාරීන් සඳහා සායනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ තාක්ෂණික වැඩමුළු 2ක් ද පවත්වන ලදි.

### 3.3.2 බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම

#### 3.3.2.1 කර්මාන්ත සඳහා බාසල් සම්මුතියේ B ලැයිස්තුගත අපද්‍රව්‍ය ආනයනය කිරිම

ශ්‍රී ලංකාව 1992.08.28 දින සිට උපද්‍රවකාරි අපද්‍රව්‍ය ප්‍රවාහනය හා අපහරණය සඳහා වූ බාසල් සම්මුතියට එලබ ඇති අතර එතැන් පටන් මධ්‍යම පරිසර අධිකාරිය ශ්‍රී ලංකාව තුල මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය ලෙස පත් කොට ඇත.මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරිම සඳහා පාරිසරික හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික සම්බන්ධීකරණ කමිටුව එතෙක් මෙරට උපද්‍රවකාරි අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා අවශ්‍ය තාක්ෂණික කරුණු වලට අදාල නිසි තීරණ ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියට අවශ්‍ය සහය ලබාදීම සඳහා තාක්ෂණික ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කොට ඇත.මෙම කමිටුව විසින්ප්‍රධාන ලෙස බාසල් සම්මුතියෙන් B ලැයිස්තුගත අපද්‍රව්‍ය ආනයනය කොට අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් ආරම්භ කිරිමට යෝජිත කර්මාන්ත සඳහා නිර්දේශයන් ලබාදීම සිදුකරනු ලබයි.(බාසල් සම්මුතියේ A ලැයිස්තුගත අපද්‍රව්‍ය මෙරටට ආනයනය කිරිම කැබිනට් අමාත්‍ය තීරණයක් විසින් තහනම් කොට ඇත.)

ආනයනයන් හා අපනයනයන් පාලනය කිරිමේ පනත යටතේ උපද්‍රවකාරි රසායනික ද්‍රව්‍ය හා අපද්‍රව්‍ය ආනයනය සම්බන්ධයෙන් වූ රෙගුලාසි 2013 ජූනි 05 දිනැති ගැසට් නිවේදනයෙන් ප්‍රකාශයට පත් කර ඇත.මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරිමට අදාලව 2015 වර්ෂයේදි අනුමැතීන් 185 ක් නිකුත් කර ඇත.

#### 3.3.2.2 දේශාන්තර උපද්‍රවකාරි අපද්‍රව්‍ය ප්‍රවාහනය

බාසල් සම්මුතියේ ශ්‍රීලංකාව තුල ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2015 වසරේදි බාසල් සම්මුතියේ A ලැයිස්තුගත අපද්‍රව්‍ය මෙරට දේශසීමා හරහා ප්‍රවාහනයට අනුමැතීන් 08 ක් ද මෙරටින් අපනයනය සඳහා අනුමැතීන් 10 ක් ද ලබා දිඇත.

#### 3.3.2.3 රසායනික ද්‍රව්‍ය කළමනාකරණය

රසායනික ද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීම යටතේ රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා පාරිසරික නිර්දේශයන් 43 ක්ද, ඇතැම් රසායන ද්‍රව්‍ය ආනයනය සඳහා අනුමැතීන් 169 ක්ද නිකුත් කරන ලදි.

රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සඳහා ක්‍රියාත්මක සැලැස්මක් සමග ජාතික රසායනික පැතිකඩ පිළියෙල කිරීමත් සිදුකරන ලදි.

### 3.3.3 රොටඩෑම් සම්මුතිය ක්‍රියාත්මක කිරීම

රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සඳහා 2016 වර්ෂයේදී පූර්ව දැනුම් දීමේ අනුමැතීන් 5 ක් නිකුත් කිරීම සහ තාක්ෂණික උපදේශක කමිටු රැස්වීම් 3ක් පැවැත්වීම සිදු කරන ලදි. එහිදී ඇස්බැස්ටස් ආනයනය හා භාවිතය පාලනය කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් යොමු කරන ලදි. තවද කැබිනට් අනුමැතිය අනුව විශේෂඥ කමිටුවක් ඇස්බැස්ටස් කළමනාකරණය සඳහා පත් කරන ලදි.

ස්ටොක්හෝම් සම්මුතිය ක්‍රියාත්මක කිරිම

ජාතික ක්‍රියාත්මක කිරීමේ සැලසුම් හා දිගුකල් පවත්නා රසායනික අපද්‍රව්‍ය ලැයිස්තුගත කිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදෙන ලදි.

**ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය**

### 3.3.4 පුනරුදය වැඩසටහන යටතේ ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන්

#### 3.3.4.1 පුනරුදය වැඩසටහන යටතේ මිලියන 4ක මුදලක් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය

**කළමනාකරණය සඳහා වෙන් කරනු ලැබිණ. ඒ අනුව ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් 2ක් ක්‍රියාත්මක කරන ලදි.**

### 3.3.4.2 පොලිතීන් ප්ලාස්ටික් හා ඉලෙක්්‍රොනික අපද්‍රව්‍ය තුරන් කිරීමේ ජාතික සතිය

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව මහජනතාවගේ අවධානය යොමු කරනු වස් සහ ගෘහස්ථ මට්ටමින් එක්රැස්වී ඇති ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරිම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මග පෙන්වීම යටතේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය හා පොලිතීන් ප්ලාස්ටික් අපද්‍රව්‍ය තුරන්කරලීමේ ජාතික සතියක් 2016 ඔක්තෝබර් 24 දින සිට 30 දින දක්වා ප්‍රකාශයට පත් කරන ලදි. මෙම සතිය තුලදී ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ටොන් 427 ක් හා සංයුක්ත ප්‍රතිදීප්ත විදුලිබල්බ 80000ක් පමණ එක්රැස් කිරීමට සමත්විය. එමෙන්ම මෙම එක් විදුලි බල්බයක රසදිය මිලිග්‍රෑම් 2-5 ත් අතර ප්‍රමාණයක් පවතින අතර ඒවා පරිසර හිතකාමී ලෙස ප්‍රතිචක්‍රීකරණ පහසුකමකට යොමුකිරීමට හැකිවිය






**FIGURE 0-4** ජාතික සතිය තුලදී පොලිතීන් ප්ලාස්ටික් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස්කිරීමේ අවස්ථාවක්

### 3.3.4.3 අවිධිමත් ලෙස ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කරන්නන් විධිමත් කිරීම

දිවයින තුල ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය සැලකිල්ලට ගැනීමේදී එය විධිමත් හා අවිධිමත් ලෙස ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කරන්නන්ගෙන් සමන්විත බව පෙනියයි. එහිදී සැලකිය යුතු මට්ටමින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතුකිරීම හා වෙන්කිරීම අවිධිමත් ලෙස එකතුකරනන්නන් හරහා සිදුවෙයි. මෙම ක්‍රියාවලිය ප්‍රාථමික මට්ටමේ ස්වභාවයක් ගන්නා බැවින් ඉන් සෞඛ්‍යයට හා පරිසරයට සිදුවන බලපෑම ඉතා ඉහලය.

මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින් මධ්‍යම පරිසර අධිකාරියේ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය විසින් අවිධිමත් ලෙස ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතුකරන්නන් විධිමත් කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගන්නා ලදි. එහිදී මුද්‍රිත මාධ්‍ය ඔස්සේ අයදුම්පත් කැඳවමින් වුන් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍යා පියවර ගන්නා ලදි.

ඔවුන් දැනුවත් කිරීම සඳහා විශේෂඥ දැනුමැති අයගේ සහභාගිත්වයෙන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය විසින් පවත්වන ලදි.





**FIGURE 0-5** අවිධිමත් ලෙස ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කරන්නන් සඳහා පැවති වැඩමුළුව

### 3.3.4.4 ශ්‍රී ලංකාව තුල ඉලෙක්ට්‍රොනික හා විද්්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ තත්ව වාර්තාව

2008 වර්ෂයේදි සිදු කරන ලද ජාතික ක්‍රියාත්මක සැලැස්ම හැරුණු විට විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සවිස්තරාත්මකවූත් යාවත්කාලීන දත්තයන්

නොමැති වූ බැවින් විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පහසුකම් ස්ථාපිත කිරීම සඳහා බාධාවක්ව පැවතිණි. එබැවින් මේ සම්බන්ධයෙන් අධ්‍යනයක් උපදේශකවරයෙකුගේ සහය ඇතිව සිදු කරන ලදී.

මෙම අධ්‍යනයට අදාල වාර්තාවට අනුව වාර්ෂිකව මුදා හැරෙන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රමාණය 2010 වර්ෂයේදි මෙට්‍රික් ටොන් 10000 ක් වන අතර 2030 වර්ෂයේදි මෙට්‍රික් ටොන් 43000 ක් ලෙස හතර ගුණයකින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පරිඝනක අපද්‍රව්‍ය වල ක්‍රමාණුකූල වැඩිවීමක් පෙන්නුම් කරන අතර එය 2030 වසරේදි මෙට්‍රික් ටොන් 6067 ක් ලෙස ප්‍රමුඛ අපද්‍රව්‍යක් ලෙස මුදා හැරීම සිදු වන අතර රූපවාහිනි යන්ත්‍රවල මුදාහැරීමේ අඩු වර්ධනයක් පෙන්නුම් කරනුයේ දැනටමත් ඒවා ශ්‍රී ලංකා වෙළඳපොල තුල සංතෘප්තව පවතින බැවිනි. 2030 වන විට එහි මුදාහැරීම මෙට්‍රික් ටොන් 5732 ක් ලෙස ගණන් බලා ඇත.

### 3.3.5 දැනුවත් කිරීමේ අත්පත්‍රිකා පිළියෙල කිරීම

අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වූ දැනුවත් කිරීමේ අත්පත්‍රිකා 18000ක් ඉංග්‍රීසි හා සිංහල මාධ්‍යයෙන් පිළියෙල කරන ලදි.

### 3.3.6 තුනී පොලිතීන් රෙගුලාසිය ක්‍රියාත්මක කිරීම

ජාතික පාරිසරික පනතේ නියෝග යටතේ ගරු පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යතුමන් විසින් ප්‍රකාශයට පත් කරන ලද 2006 ඔක්තෝම්බර් 10 දිනැති අංක 1466/5 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් මයික්‍රෝන 20 හෝ ඊට අඩු පොලිතින් හෝ ආශ්‍රිත නිෂ්පාදන, නිෂ්පාදනය, අලෙවිය හා භාවිතය තහනම් කරන ලදී. මෙම වර්ෂය තුලදී අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය සහ ප්‍රාදේශිය කාර්යාල මගින් තුනී පොලිතින් වැටලීම් 946 ක් දිවයින පුරා සිදු කරන ලද අතර මෙම රෙගුලාසිය කඩ කරන ලද වෙළඳුන් 80 කට නීතිමය පියවර ගැනීම සඳහා කටයුතු කරන ලදී.

### 3.3.7 ඒකාබද්ධ පොලිතීන් ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

පුනරුදය වැඩසටහන යටතේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ උපදෙස් පරිදි මිලියන 37 ක මුදලක් ඒකාබද්ධ පොලිතීන් හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය වෙත වෙන් කරන ලදි.

මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් 2016 වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලදි.

1) දිවයින තුල පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය පාලනය කිරීම සහ පරිසර හිතකාමී නිෂ්පාදන හඳුන්වා දීම සඳහා අමාත්‍යමණ්ඩල සන්දේශයක් ඉසිරිපත් කරන ලදි.

2) පොලිතීන් හා ප්ලාස්ටික් ආනයනය කරන්නන්හා නිෂ්පාදනය කරන්නන් මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීම හා ලියාපදිංචිය

3) පොලිතීන් හා ප්ලාස්ටික් එකතු කරන්නන් හා ප්‍රතිචක්‍රීකරණය කරන්නන් මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීම හා ලියාපදිංචිය

4) පොලිතීන් හා ප්ලාස්ටික් කළමනාකරණයට සම්බන්ධ පාර්ශවයන්ගෙන් සැදුම්ලත් මෙහෙයුම් කමිටුවක් පිහිටුවීම සහ ප්ලාස්ටික් මනා ලෙස කළමනාකරණය සඳහා මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම

5) ජෛව භායනයට ලක්වන පොලිතීන් හා ප්ලාස්ටික් නිෂ්පාදනය කරන්නන් හා ජෛව භායනයට ලක්නොවන ප්ලාස්ටික් සඳහා දේශීය අමුද්‍රව්‍යයන්ගෙන් නිෂ්පාදිත විකල්ප නිෂ්පාදන නිපදවන්නන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීම

6) දිරාපත්නොවන ප්ලාස්ටික් සඳහා දිරාපත් වන පොලිතීන් හා දේශීය අමුද්‍රව්‍ය වලින් කෙරෙන විකල්ප නිෂ්පාදන හඳුන්වාදීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

7) දිරාපත් නොවන ප්ලාස්ටික් සඳහා පරිසර හිතකාමීනිෂ්පාදන හඳුන්වාදීම සඳහා එවැනි භාණ්ඩ නිෂ්පාදනය කරනුලබන්නන් සමග සෘජුව සම්බන්ධතා ඇති රාජ්‍ය ආයතනයන්හි ඉහල නිලධාරීන් සමග රැස්වීම් පවත්වන ලදි.

8) පරිසර හිතකාමී භාණ්ඩ ඇතුලත් ප්‍රදර්ශනයක් ජාතික ශිල්ප සභාවේ සහාය ඇතිව පවත්වන ලදි..

9) 2016 සැප්තැම්බර් මස 16 වැනි දිනෙන් ආරම්භ වූ පොත් ප්‍රදර්ශනය තුල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුමක් හඳුන්වාදී ක්‍රියාත්මක කරන ලදි.

10) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාලය තුලදී පොලිතීන් වැටලීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කරන ලදි.

තවද නව රෙගුලාසි පනවමින් පළමු පියවර යටතේ පොලිතීන් කෑම ඔතන කොළ හා පොලිතීන් මළු තහනම් කිරීමටත් ඉන් අනතුරුව සැරසිලි සඳහා පොලිතීන් යොදා ගැනීම තහනම් තිරීමටත් පොලිස්ටයිරීන් කෑම පෙට්ටි ආදිය තහනම් කිරීමටත් ඒ අතර වාරයේදී ජෛවභායනයට

ලක්වන ප්ලාස්ටික් වෙළඳපොලට හඳුන්වාදීමටත් යෝජනා වීය.මීට අමතරව පොලිතීන් හා ප්ලාස්ටික් වෙනුවට විකල්ප පරිසර හිතකාමී ද්‍රව්‍ය හා ජෛවහායනයට ලක්වන ද්‍රව්‍ය යොදාගැනීම පිළිබඳව අධ්‍යාපනික හා දැනුවත් කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් දින දෙකක ප්‍රදර්ශනයක් පැවැත්වීමත් සංවාද මණ්ඩපයක් පැවැත්වීමටත් කටයුතු කරන ලදි.

# 4.0. පරිසර කළමනාකරණ සහ ඇගයීම් අංශය

## 4.1 පරිසර බලපෑම් හා ඇගයීම් (ප.බ.ඇ) ඒකකය

### 4.1.1 නියමිත ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සිදු කිරීම

පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ ප්‍රධාන නියාමක කාර්යභාරය වනුයේ සැලකිය යුතු පාරිසරික බලපෑම් අවම කිරීමේ අදහසින් සියළුම නියමිත ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ පරිපාලන ක්‍රියාදාමය පවත්වාගෙන යාමයි. මෙම කාර්යභාරයට විෂය ප්‍රමාණය කිරීමේ රැස්වීම් හා තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම්, පරිසර බලපෑම් ඇගයීම් වාර්තා සඳහා නිර්ණේය විෂයයන් සැකසීම, පරිසර බලපෑම් ඇගයීම් වාර්තා ඇගයීම, මහජන සහභාගීත්වය සඳහා අවකාශ ලබාදීම හා ඉන් අනතුරුව ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදීම හා පසුවිපරම් කිරීම යන කරුණු ඇතුලත්වේ.

2015 වසර තුලදී ව්‍යාපෘති 72 ක් සඳහා ජාතික පාරිසරික පනතේ IV ඇ වගන්තිය යටතේ අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය වූ අතර, එම ව්‍යාපෘති පරිසර බලපෑම් ඇගයීමේ නියෝග යටතේ ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ අනුව, ව්‍යාපෘති 18 ක් ක්‍රියාත්මක කිරීම සඳහා පාරිසරික අනුමැතිය ලබාදුන් අතර ව්‍යාපෘති 3 ක් සඳහා අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලැබීය. ව්‍යාපෘති 51 ක් අනුමැතිය අපේක්ෂාවෙන් ක්‍රියාත්මක වෙමින් පවතී.

පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සිදු කිරීම අවශ්‍ය ඇතැම් ව්‍යාපෘති, ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය නියාමනය සඳහා නම් කරන ලද ව්‍යාපෘති අනුමත කරන ආයතන වෙත යොමු කරන ලදි. කෙසේ වෙතත් මෙම ආයතන තීරණ ගැනීමට පෙර මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ලබා ගැනීම අවශ්‍ය විය.

**TABLE 0.15 2016** වසරේ පරිසර බලපෑම් ඇගයීම් නියෝග යටතේ, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මගින් අනුමැතිය ලබා දෙන ව්‍යාපෘති නාම ලේඛනය

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප.බ.ඇ/ මු.පා.ප |
|---|---|---|
| 1. | යෝජිත වයඹ පළාත් ඇළ මාර්ග ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 2. | ත්‍රිකුණාමල තාප බලශක්ති ව්‍යාපෘතිය (මෙ.වො. 2 x 250) | ප.බ.ඇ |
| 3. | ඉහළ ඇලහැර ඇළ මාර්ග ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 4. | නව දෙව කැළණි පාලම් ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සතුව පවතින විකරණශීලී මූලද්‍රව්‍ය බැහැරලීමේ පහසුකම් දැනට පිහිටා තිබෙන භූමියේම තව දුරටත් ශක්තිමත් කරමින් ඉදිකිරීම) | ප.බ.ඇ |
| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප.බ.ඇ/ මු.පා.ප |
| 5. | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (කඩවත සිට දඹුල්ල දක්වා) | ප.බ.ඇ |
| 6. | යෝජිත බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 7. | කැළණි ගඟේ යෝජිත ලවන බාධකය ඉදිකිරීමේ ව්‍යාපෘතිය - අඹතලේ (අනුමැතිය දීර්ඝ කිරීම) | ප.බ.ඇ |
| 8. | සියඹලාන්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වත්තේගම හා මඩුගම ස්ථානවල පිහිටුවීමට යෝජිත ඒකාබද්ධ සීනි කර්මාන්ත ව්‍යාපෘතිය | ප.බ.ඇ |

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප.බ.ඇ/ මූ.පා.ප |
|---|---|---|
| 9. | ඉදි කිරීම් කර්මාන්තයට අවශ්‍ය වැලි ලබා ගැනීම සඳහා අක් වෙරළ මුහුදු වැලි කැණීමේ ව්‍යාපෘතිය කෙරවලපිටිය | ප.බ.ඇ |
| 10. | මා ඔය හරහා පොල්ගහවෙලදී ඉදිකිරීමට යෝජිත අඩක් ජලයේ ගිලී පවතින වේල්ල | ප.බ.ඇ |
| 11. | නඩුකුඩා සිට මන්නාරම දක්වා යෝජිත කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 12. | රන්වල ඔය කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය - මාලිබොඩ, දැරණියගල | ප.බ.ඇ |
| 13. | මහඔය - ලන්සිගම වෙරළ තීරයේ වෙරළ සම්පත් කළමනාකරණ සැලසුම සඳහා අවශ්‍ය වැලි ලබා ගැනීමට අක්වෙරළ මුහුදු වැලි ලබා ගැනීමේ ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 14. | යෝජිත පහළ උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය (යෝජිත තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය) | ප.බ.ඇ |
| 15. | යෝජිත තරුපහේ හෝටලය - වීරවිල (අනුමැතිය දීර්ඝ කිරීම) | ප.බ.ඇ |
| 16. | යෝජිත බොරළු කැණීමේ ව්‍යාපෘතිය - අන්දරවැව කැලේ, හම්බන්තොට (දක්ෂිණ අධිවේගී මාර්ගයේ දිගුව සඳහා) | ප.බ.ඇ |
| 17. | ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වලින් වටිනා ලෝහ නිස්සාරණය කිරීමේ යෝජිත ව්‍යාපෘතිය - කටුනායක අපනයන සැලසුම් කලාපය අදියර iv | ප.බ.ඇ |
| 18. | යෝජිත මාලිබොඩ කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය | ප.බ.ඇ |

**TABLE 0.16** පරිසර බලපෑම් ඇගයීම් නියෝග යටතේ ප්‍රතික්ෂේප කරන ලද ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප.බ.ඇ/ මූ.පා.ප |
|---|---|---|
| 1. | කොළඹ නගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 2. | පින්නගොල්ල කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය - බඩල්කුඹුර | මූ.පා.ප. |
| 3. | කුඹල්ඔලුව කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය - කොත්මලේ | මූ.පා.ප. |

**TABLE 0.17** පරිසර අනුමැතිය ලබාදීම සඳහා අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන වෙත මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ලබාදුන් ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප.බ.ඇ/ මූ.පා.ප |
|---|---|---|
| 1. | කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය<br>(ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය -වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව) | ප.බ.ඇ |
| 2. | යෝජිත සොෆියා කොළඹ නගර ව්‍යාපෘතිය - අංක 295/2954, ගාලුපාර, කොල්ලුපිටිය, කොළඹ 03 (ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය -නාගරික සංවර්ධන අධිකාරිය) | මූ.පා.ප |
| 3. | යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය , ස්ලේව් දූපත<br>(ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය -නාගරික සංවර්ධන අධිකාරිය) | මූ.පා.ප |
| 4. | දිග්ගල්ල කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය<br>(ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය) | මූ.පා.ප. |
| 5. | කිවුල කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය<br>(ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය) | මූ.පා.ප. |
| 6. | අංකන්ද කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය<br>(ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය) | මූ.පා.ප. |

**TABLE 0.18** පරිසර බලපෑම් ඇගයීම් අංශය මගින් ක්‍රියාත්මක වෙමින් පැවැති ව්‍යාපෘති නාම ලේඛනය

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප.බ.ඇ/ මූ.පා.ප |
|---|---|---|
| 1 | බෝගහ හේන කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය - බුලත්සිංහල | ප.බ.ඇ |
| 1. | යෝජිත ඝන අපද්‍රව්‍ය මගින් බලශක්තිය නිපදවීමේ ව්‍යාපෘතිය, දොම්පේ - ගම්පහ දිස්ත්‍රික්කය | ප.බ.ඇ |
| 2. | බදුල්ලේ නව දේශීය ගුවන් තොටුපලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 3. | යෝජිත සම් පදම් කිරීමේ හා සම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත සංකීර්ණයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය - මඩකලපුව | ප.බ.ඇ |
| 4. | යෝජිත අන්තර්ජාතික යෝග හා ආයුර්වේද මධ්‍යස්ථානය - හන්තාන, මහනුවර | ප.බ.ඇ |
| 5. | යෝජිත අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය - හීනපන්දල, ගාල්ල | ප.බ.ඇ |
| 6. | මාතර සිට මත්තල දක්වා වූ අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ දුන්දෙණිගම ආසන්නව පිහිටුවීමට යෝජිතව තිබූ අන්තර්හුවමාරු මධ්‍යස්ථානය අපරැක්ක දක්වා වෙනස් කිරීම. | ප.බ.ඇ |
| 7. | කන්තලේ සීනි කර්මාන්තය නැවත පිහිටුවීම සඳහා වූ යෝජිත ව්‍යාපෘතිය | ප.බ.ඇ |

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප.බ.ඇ/ මූ.පා.ප |
|---|---|---|
| 8. | කොළඹ නගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය විකල්ප ව්‍යාපෘති භූමිය - අරුවක්කලු | ප.බ.ඇ |
| 9. | පුත්තලමේ ඉදිකිරීමට යෝජිත දේශීය ගුවන්තොටුපොල | ප.බ.ඇ |
| 10. | යෝජිත පයිනස් ගස් ඉවත් කිරීමේ සහ දූරියන් වගාවක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය - හයින්පෝඩ් වත්ත, නාවලපිටිය. | ප.බ.ඇ |
| 11. | යෝජිත ආර්පිකෝ සුපිරි සංකීර්ණය, සහාධිපත්‍ය සංකීර්ණය - අංක 297, කටුගස්තොට පාර, මහනුවර. | ප.බ.ඇ |
| 12. | යෝජිත මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - පොතුහැර සිට ගලගෙදර දක්වා | ප.බ.ඇ |
| 13. | යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය - ගන්නොරුව පාර, පේරාදෙණිය | ප.බ.ඇ |
| 14. | යෝජිත සබරගමු අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 15. | යෝජිත ග්‍රෑන්ඩ් පැලස් තරු පහේ හෝටලය - ගුරුදෙණිය, මහනුවර | ප.බ.ඇ |
| 16. | යෝජිත වන් ඉලවන් ආයුර්වේද හෝටලය - රැකව, තංගල්ල | ප.බ.ඇ |
| 17. | කිරුලපන හන්දියේ සිට මැලිබන් හන්දිය දක්වා බේස්ලයින් මාර්ග දිගුව ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 18. | දෙමටගොඩ සිට රාජගිරිය දක්වා ඉහළින් ඉදිකිරීමට නියමිත මාර්ග ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 19. | යෝජිත සෙමි ඉංජිනියර් බිම් පිරවුම - ජා ඇල, ඒකල | ප.බ.ඇ |
| 20. | මාතර අදියර iv ජල සම්පාදන ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 21. | යෝජිත යාපනය නගර මළාපවහන පද්ධතිය | ප.බ.ඇ |
| 22. | යෝජිත බුලත්ගම  කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය, අඹගමුව | ප.බ.ඇ |
| 23. | කුරුණෑගල සිට හබරණ දක්වා යෝජිත දුම්රිය මාර්ග ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 24. | යෝජිත සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 25. | යෝජිත නිළ සෙවන නිවාස ව්‍යාපෘතිය - කුණ්ඩසාලේ, මහනුවර | ප.බ.ඇ |
| 26. | මෙට්‍රික්ටොන් මිලියන 10 ක ධාරිතාවයකින් යුතු තෙල් පිරිපහදු මධ්‍යස්ථානය | ප.බ.ඇ |
| 27. | මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය | ප.බ.ඇ |
| 28. | හොරණ පර්ත් වතුයායේ ස්ථාපනය කිරීමට යෝජිත අපනයන සැකසුම් කලාපය - අදියර ii (සංශෝධිත ව්‍යාපෘතිය) | ප.බ.ඇ |
| 29. | යෝජිත ආයෝජන ප්‍රවර්ධන කලාපය - සූරියවැව | ප.බ.ඇ |

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප.බ.ඇ/ මූ.පා.ප |
|---|---|---|
| 30. | තේ වගාවක්, මිශ්‍ර භෝග වගාවක් සහ ගව පාලනය පවත්වාගෙන යෑම සඳහා පයිනස් ගස් ඉවත් කිරීමේ යෝජිත ව්‍යාපෘතිය - හයින්ෆෝඩ් වත්ත, නාවලපිටිය | ප.බ.ඇ |
| 31. | යෝජිත අප ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | ප.බ.ඇ |
| 32. | කොළඹ පිටත වටරවුම් මාර්ගය, මධ්‍යම අධිවේගී මාර්ගයට කඩවතදී සම්බන්ධ කිරීමට යෝජිත අන්තර් හුවමාරු මධ්‍යස්ථානය | ප.බ.ඇ |
| 33. | කළු ගඟේ ඉදිකිරීමට නියමිත ලවණ බාධකය | ප.බ.ඇ |
| 34. | අක්වෙරළ මුහුදු වැලි කැණීමේ ව්‍යාපෘතිය - කෙරවලපිටිය අතිරේක පරිසර බලපෑම් ඇගයීම් වාර්තාව (කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වැලි ලබා ගැනීම) | ප.බ.ඇ |
| 35. | යෝජිත සීනි - පුනර්ජනන විදුලිබලය සහ එළකිරි සුළු ගොවිමහතුන්ගේ ගෙවතු ගොවිපල මගින් ඒකාබද්ධව නිෂ්පාදනය කිරීමේ බිබිලේ සංවර්ධන ව්‍යාපෘතිය | මූ.පා.ප. |
| 36. | නගර සංවර්ධන නව ව්‍යාපෘතිය - නුවරඑළිය | මූ.පා.ප. |
| 37. | යෝජිත ඉහල කොස්කුලන කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය | මූ.පා.ප. |
| 38. | යෝජිත මාලිබොඩ කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය (මෙ.වො. 2) | මූ.පා.ප. |
| 39. | යෝජිත සොනක්මා කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය | මූ.පා.ප. |
| 40. | යෝජිත නාරම්පනාව කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය, මැදදුම්බර | මූ.පා.ප. |
| 41. | යෝජිත ගොරොක් ඔය කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය, කොත්මලේ | මූ.පා.ප. |
| 42. | ඉහළ සමලනවැව කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය, බලංගොඩ | මූ.පා.ප. |
| 43. | යෝජිත තරුපහේ හෝටල් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සඳහා ඉදිකරනු ලබන කාර්ය මණ්ඩල ව්‍යාපෘතිය , වීරවිල - | මූ.පා.ප. (අතිරේක) |
| 44. | යෝජිත ගනේගල කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය, බදුල්ල | මූ.පා.ප. |
| 45. | යෝජිත හාලිඇල කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය, බදුල්ල | මූ.පා.ප. |
| 46. | ලොග්ගල් ඔය කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය, බදුල්ල | මූ.පා.ප. |
| 47. | හල්ග්‍රන් ඔය කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය, වලපනේ | මූ.පා.ප. |
| 48. | යෝජිත සෝයා බෝංචි සහ කපු වගා කිරීම සහ සැකසුම් කිරීමේ ව්‍යාපෘතිය, කැටැන්වැව, හම්බන්තොට | මූ.පා.ප. |
| 49. | යෝජිත බල්ලකෙටුව කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය, හාලිඇල, බදුල්ල | මූ.පා.ප. |

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප.බ.ඇ/ මු.පා.ප |
|---|---|---|
| 50. | යෝජිත ඉහල නෙළුව කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය, නෙළුව, ගාල්ල | මු.පා.ප. |

මීට අමතරව සංකීර්ණ පාරිසරික ගැටළු රහිත තෝරාගත් නියමිත ව්‍යාපෘති සඳහා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට මධ්‍යම පරිසර අධිකාරියේ පලාත් කාර්යාල වෙත බලය පවරා ඇත. මෙම ව්‍යාපෘතිවලට අදාල කටයුතු කරගෙනයාමේදී අවශ්‍ය සහාය සහ මග පෙන්වීම පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මගින් ලබාදී ඇත.

එමෙන්ම අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත, ඔවුන්ට යොමු කර තිබෙන ව්‍යාපෘතිවලට අදාලව පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය සහාය ලබාදී ඇත.

### 4.1.2 අනුමැතිය ලද ව්‍යාපෘති පසුවිපරම් කිරීම

ව්‍යාපෘති අනුමත කිරීමේදී දෙනු ලබන කොන්දේසිවලට යටත්ව ව්‍යාපෘති නිසි අයුරින් ක්‍රියාත්මක වන්නේ දැයි සහතික කිරීම සඳහා පරිසර බලපෑම් ඇගයීම් ඒකකය දැනටමත් අනුමැතිය ලබාදුන් ව්‍යාපෘති පසුවිපරම් කරනු ලැබීය. පහත සඳහන් ව්‍යාපෘති පසුවිපරම් කිරීම, ද්වි මාසික රැස්වීම් සහ ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් නොකඩවා සිදු කරනු ලැබීය.

**TABLE 0.19 2016** වසර තුලදී පසුවිපරම් කරන ලද ව්‍යාපෘති පහත දැක්වේ.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම |
|---|---|
| 1. | කොග්ගල ඉකෝ ෆයිව් ස්ටාර් විලා රිසෝට් ව්‍යාපෘතිය - මල්කබාන, කොග්ගල |
| 2. | පොල්පිටිය, පන්නිපිටිය කි.වෝ. 230 සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය |
| 3. | කොළඹ පිටත අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (කෙරවලපිටිය සිට කඩවත දක්වා) |
| 4. | මාතර සිට කතරගමට යෝජිත දුම්රිය මාර්ග ව්‍යාපෘතිය - පළමු අදියර |
| 5. | මාස් රෙදිපිළි කර්මාන්ත උද්‍යානය - තුල්හිරිය |
| 6. | බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය, ගිණිගත්හේන |
| 7. | ඇතාමල ඇල්ල කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය |
| 8. | නාය ගඟ කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය |
| 9. | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය |
| 10. | මානකොල කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය |
| 11. | අනුරාධපුර, ඔයාමඩුවෙහි ස්ථාපිත කිරීමට යෝජිත වෙඩි බෙහෙත් කම්හල |
| 12. | මාවනාන කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය |
| 13. | මාතර සිට මත්තල දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය |

| අනු අංකය | ව්‍යාපෘතියේ නම |
|---|---|
| 14. | යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය |
| 15. | යෝජිත වව්නියාව හරහා මන්නාරම සිට අනුරාධපුරය දක්වා කි.වො. 132 සම්ප්‍රේෂණ රැහැන් මාර්ගය |
| 16. | යෝජිත තරුපහේ හෝටලය - වීරවිල |
| 17. | ගලතු ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය - අටබාගේ |
| 18. | ඉලුක්පැලැස්ස කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය |
| 19. | කෙහෙල්ගමු ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය - අදියර II |
| 20. | කබරගල කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය |
| 21. | දඹුලු ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය |
| 22. | නුවර අපජලය කළමනාකරණ ව්‍යාපෘතිය |
| 23. | “ප” ආරු ජලාශය හරහා මතුපිට ජලය නිස්සාරණය කිරීම - වව්නියාව |
| 24. | අසුපිණි ඇල්ල කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය - අරණායක |
| 25. | දෙයියන්වෙල කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය - අරණායක |
| 26. | කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| 27. | මොරපිටිය කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය |
| 28. | යෝජිත සහාධිපත්‍ය නිවාස සංකීර්ණය අංක 51/2, ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවත, මහනුවර |
| 29. | මත්තල සිට මාතර දක්වා යෝජිත අධිවේගී මාර්ග ව්‍යාපෘතිය |
| 30. | යෝජිත කළු ගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය |
| 31. | යෝජිත මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය |

පහසු ක්‍රියාකාරීත්වය සඳහා දැනට පවතින පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ නීති, නියෝග සහ කාර්ය පටිපාටි ක්‍රමවත් කිරීම හා වැඩි දියුණු කිරීම.

### 4.1.3 පරිසර බලපෑම් ඇගයීම් රෙගුලාසි සංශෝධනය කිරීම

නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සහ මධ්‍යම පරිසර අධිකාරියේ නීති උපදේශකවරයා සමග පැවති සාකච්ඡාවලින් අනතුරුව පරිසර බලපෑම් ඇගයීම් ඒකකය, පරිසර බලපෑම් ඇගයීම් නියෝග, නියමිත ව්‍යාපෘති ලැයිස්තුව සහ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන ලැයිස්තුව සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදි. අනුමැතිය ලබාදුන් ව්‍යාපෘති විධිමත් ලෙස පසුවිපරම් කිරීම සඳහා ව්‍යාපෘති යෝජකගෙන් පරිසර කළමනාකරණ සැලැස්මක් ලබා ගැනීමේ නව නියෝගයන්ද පරිසර බලපෑම් ඇගයීම් නියෝගයන්ට ඇතුළත් කිරීමට කටයුතු කරන ලදි. අදාල පාර්ශවකරුවන් සහ මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාලවල

නිලධාරීන් සම්බන්ධ වී නියමිත ව්‍යාපෘති ලැයිස්තුව සහ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන ලැයිස්තුව නැවත සකස් කරන ලදි. මෙම සියලුම ලේඛන ප්‍රකාශයට පත් කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි.

### 4.1.4 පාරිසරික බලපෑම් ඇගයීම පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය හා අනෙකුත් කාර්යමණ්ඩලයේ නිපුණතාවය වැඩි දියුණු කිරීම

වාර්තාගත කාලය තුළ, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් වැඩමුළු කිහිපයක් පවත්වන ලදි.

අ). මධ්‍යම පරිසර අධිකාරියෙහි නිලධාරීන් හා අනෙකුත් ව්‍යාපෘති අනුමත කරන ආයතන සඳහා මහාචාර්ය දේවක වීරකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු විශේෂඥ කණ්ඩායමක් විසින් සිදු කරන ලද පාරිසරික ප්‍රවාහ පිළිබඳ අධ්‍යයනයේ සොයා ගැනීම් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම. මෙම අධ්‍යයනයේ නිශ්චිත අරමුණ වනුයේ වෙලි/ අමුණු සාදන අවධියේසිට පවත්වාගෙන යා යුතු පාරිසරික ජල ප්‍රවාහ තීරණය කිරීම සඳහා නිර්ණායක හා මාර්ගෝපදේශ මාලාවක් සකස් කිරීමයි.

ආ). මධ්‍යම පරිසර අධිකාරියෙහි උතුරුමැද, ඌව සහ මධ්‍යම පළාත් කාර්යාල හා ගම්පහ දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරීන් සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය/ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ අදාල කරුණු සාකච්ඡා කිරීමට වැඩමුළු 4 ක් පැවැත්වීම.

ඇ). නිර්ණේය විෂයයන් (ToR) සැකසීම පිළිබඳ වැඩමුළුවක් පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ නිලධාරීන්හට පැවැත්වීම.

ඉ). ආසියානු සංවර්ධන බැංකුව හා එක්ව මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් හා අනෙකුත් අදාල ආයතන සඳහා පරිසර කළමනාකරණ සැලැස්මක් සැකසීම පිළිබඳව දින දෙකක පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.

### 4.1.5 උපාය මාර්ගික පරිසර ඇගයීම් ක්‍රියාත්මක කිරීම

#### 4.1.5.1 උපාය මාර්ගික පාරිසරික ඇගයීම හා අදාල නීති ඇතුළත් වන පරිදි ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම

ජාතික පාරිසරික පනත තුළ උපාය මාර්ගික පාරිසරික ඇගයීම සඳහා වන නව විධි විධාන ඇතුළත් කිරීම සඳහා අනුමැතිය ඉල්ලා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සැකසීම හා එය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

#### 4.1.5.2 බස්නාහිර පළාත් මහ නගර සැලසුම් සඳහා සිදුකරනු ලබන උපාය මාර්ගික පාරිසරික ඇගයීම

පරිසර බලපෑම් ඇගයීම් ඒකකය බස්නාහිර පළාත් මහ නගර සැලසුම් ව්‍යාපෘතිය සමග එක්ව බස්නාහිර පළාත් මහනගර සැලසුම් සඳහා උපාය මාර්ගික පාරිසරික ඇගයීමක් සිදු කිරීම අරඹන ලදි.

පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මෙම අධ්‍යයනයේ නිර්ණේය විෂයයන් (ToR) කෙටුම්පත් කිරීම සඳහා සහයෝගය දක්වන ලදි. මෙම උපාය මාර්ගික පාරිසරික ඇගයීම විශේෂඥ දැනුම් ඇති කණ්ඩායමක් විසින් සිදු කරන ලද අතර, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මගින් කෙටුම්පත් වාර්තාව සමාලෝචනය කර අවසන් වාර්තාව සකස් කිරීම සඳහා අදහස්/ නිරීක්ෂණ බස්නාහිර පළාත් මහනගර සැලසුම් ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කරන ලදි.

#### 4.1.5.3 ශ්‍රී ලංකාවේ ජල සම්පත් කළමනාකරණ සහ වාරිමාර්ග සංවර්ධන සැලැස්ම සඳහා සිදුකරනු ලබන උපාය මාර්ගික පාරිසරික ඇගයීම.

පරිසර බලපෑම් ඇගයීම් ඒකකය වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා එක්ව ජල සම්පත් කළමනාකරණය හා සංවර්ධන සැලැස්ම සඳහා උපාය මාර්ගික පාරිසිරක ඇගයීමක් සිදු කිරීමට කටයුතු ආරම්භ කර ඇත. මධ්‍යම පරිසර අධිකාරිය විසින් උපාය මාර්ගික පරිසර බලපෑම් ඇගයීම සඳහා නිර්ණේය විෂයයන් සැකසීමට තාක්ෂණික සහාය ලබාදුන් අතර, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සුදුසු විශේෂඥ දැනුම සහිත සමාගමක් තෝරා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන කමිටු රැස්වීම සඳහා ද සහභාගී වන ලදි. මෙම අධ්‍යයනය මේ වන විට සිදු වෙමින් පවතී.

### 4.1.6 අනෙකුත් ක්‍රියාකාරකම්

#### 4.1.6.1 ජනාධිපති පරිසර සම්මාන වැඩසටහන සඳහා දායක වීම

හොඳම පරිසර හිතකාමී ගොවිපල (විශාල හා කුඩා පරිමාණ) සහ හොඳම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය තේරීමට දායක වීම මගින් පරිසර බලපෑම් ඇගයීම් ඒකකය ජනාධිපති පරිසර සම්මාන වැඩසටහන සඳහා ඵලදායී දායකත්වයක් ලබාදෙන ලදි. අයදුම්පත් හා ලකුණු ලබා දීමේ පටිපාටිය සැකසීම, අයදුම්පත් පරීක්ෂා කිරීම, තෝරාගත් අයදුම්පත් සඳහා වූ ක්ෂේත්‍ර චාරිකාවලට සහභාගී වීම යනාදිය සඳහා පරිසර බලපෑම් ඇගයීම් ඒකකයෙහි නිලධාරීන් සම්බන්ධ විය.

#### 4.1.6.2 UN-REDD වැඩසටහන සඳහා දායක වීම.

ශ්‍රී ලංකාවේ වන හායනය හා වන විනාශය සඳහා දායක වන හේතූන් ඵලදායීව ආමන්ත්‍රණය කිරීම සඳහා UN-REDD+ වැඩසටහන මගින් සකසනු ලබන ජාතික UN-REDD+ උපාය මාර්ග සකස් කිරීමට ක්‍රියාකාරීව සහභාගී වන ලදි. මෙම උපායමාර්ග සැකසීම, ක්‍රියාත්මක කිරීම සඳහා වූ පුළුල් උපාය මාර්ගික ක්‍රියාකාරකම් සැලැස්මක්

තීරණය කිරීම සඳහා විවිධ රජයේ ආයතනවල සහභාගීත්වයෙන් වන භායනය හා වන විනාශය අදාලව දැනට පවතින උපායමාර්ග, නීතිරීතිවල ඇති හිඩැස් පිරවීමේ අධ්‍යයනවලින් යුතු වැඩමුළු මාලාවකින් යුක්ත වූවකි.

වත්මන් පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය හා උපායමාර්ගික පාරිසරික ඇගයීමේ ක්‍රියාවලි ශක්තිමත් කිරීම සඳහා ඇති අවශ්‍යතාවය හිදැසක් ලෙස ඉස්මතු වූ අතර, ඒ අනුව පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය හා උපායමාර්ගික පාරිසරික ඇගයීමේ ක්‍රියාවලි දෙකෙහිම දැනුම වර්ධන වැඩසටහන් UN-REDD+ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලදි.

# 4.2. ස්වභාවික සම්පත් කළමනාකරණ හා පසුවිපරම් ඒකකය

ශ්‍රී ලංකාවේ පවතින ස්වභාවික සම්පත් කළමණාකරනය කිරීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වෙමින් කටයුතු කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන වගකීමය. මෙම සම්බන්ධීකරණ කටයුතු ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ මෙම අධිකාරියේ ස්වභාවික සම්පත් කළමණාකරන හා පසුවිපරම් ඒකකය විසිනි. ඒ අනුව ස්වභාවික සම්පත් කළමණාකරනය කිරීම හා ආදාලව සියලුම කාර්යයන් මෙම ඒකකයේ දායකත්වයෙන් සිදු කරනු ලබයි. එම කාර්යයන් අතරින් ස්වභාවික සම්පත් කළමණාකරනය සම්බන්ධයෙන් නීති රීති රෙගුලාසි සම්පාදනය කිරීම, මාර්ගෝපදේශය සකස් කිරීම, පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම හා එම ප්‍රදේශ තුල තුළ සිදු කළ හැකි අනුමත භාවිතයන්ට අදාල ව්‍යාපෘති යෝජනාවන් සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීම සහ ජාතික තෙත්බිම් ප්‍රතිපත්තියේ සඳහන් තෙත්බිම් සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම ප්‍රධාන වේ. මීට අමතරව ස්වභාවික සම්පත් කළමණාකරනයට අදාල තොරතුරු ඇතුළත් ප්‍රකාශන, පත්‍රිකා හා පොත් පිංච සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කර ඇති පරිසර ආරක්ෂණ ප්‍රදේශ සඳහා කළමණාකරන සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

2016 වර්ෂයේ දී ස්වභාවික සම්පත් කළමණාකරනයට අදාල පහත සඳහන් ක්‍රියාකාරකම් මෙම ඒකකය මඟින් සිදු කරන ලදී.

## 4.2.1 ස්වභාවික සම්පත් කළමණාකරනය

4.2.1.1 ස්වභාවික සම්පත් කළමණාකරනයට අදාල අන්තර් ආයතන සම්බන්ධීකරණ කමිටුව.

2016 වසරේ ස්වභාවික සම්පත් කළමණාකරනය හා සම්බන්ධව, මැටි කැනීම් සිදු කර අත්හරින ලද වළවල් පුනරුත්ථාපනය කිරීම සඳහා වන මාර්ගෝපදේශය සකස් කිරීම හා දේපල සංවර්ධනය කටයුතු හා සම්බන්ධයෙන් නීති රෙගුලාසි සකස් කිරීම සඳහා ආයතනික පාර්ශවකරුවන් සමඟ රැස්වීම් පහක් පවත්වන ලදී. මැටි කැනීම් වළවල් පුනරුත්ථාපනය කිරීම සඳහා වන මාර්ගෝපදේශයන් සහ දේපල සංවර්ධනය කටයුතු හා සම්බන්ධයෙන් නීති රෙගුලාසි සඳහා කෙටුම්පත් සකස් කරන ලදී.



a) ජෛව ස්කන්ධ බොයිලේරු සඳහා දැව ලබා ගැනීම, පස් සෝදා වැලි ලබා ගැනීම, සහ ඉදිකිරීම් කරනු ලබන ස්ථාන වල සුන්බුන් ඉවත් කිරීම සඳහා පාරිසරික නිර්දේශයන් හා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිසර අධිකාරියේ නිලධාරීන් අනුගමනය කළයුතු මාර්ගෝපදේශයන් සකස් කිරීම හා එම මාර්ගෝපදේශයන් සියලු පළාත් හා දිස්ත්‍රික් කාර්යාල වෙත ලබාදෙන ලදී.

b) අධිකරණය විසින් ලබා දුන් නියෝගයකට අනුව කටාන ප්‍රදේශයේ දැනට පවත්වාගෙන යනු ලබන පුනරුත්ථාපනය කරන ලද අත්හරින ලද මැටි කැනීම් වල වල් පිළිබඳ නිරීක්ෂණය කරන ලද අතර ඒ පිළිබඳ අධිකරණය වෙත ලබා දීම සඳහා වාර්තා පිළියෙල කරන ලදී.

මහ ඔය වැලි කැනීම පිළිබඳ කළමණාකරන සැලැස්ම සකස් කිරීම සම්බන්ධයෙන් භූ විද්‍යා කැනීම් හා පතල් කාර්යාංශය විසින් පවත්වන ලද රැස්වීම් ගණනාවකට සහභාගී වී, එම සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දෙන ලදී.

c) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මහවැලි ගඟට මායිම් වන ස්ථාන වල පවතින පාරිසරික ගැටලු හඳුනා ගැනීම හා වැලි කැනීම් සිදු කරනු ලබන පුද්ගලයින් හා වැලි කැනීම සඳහා බලපත්‍ර/අනුමැතීන් ලබා දෙන්නා වූ ආයතන සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන් සකස් කිරීම සඳහා පුළුල් සමීක්ෂණයක් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා ඒකාබද්ධ ව පවත්වන ලදී.

d) පුත්තලම දිස්ත්‍රික්කයේ මුන්දලම ප්‍රදේශයේ වැලි කඳු වලින් වැලි ගැනීමේ දී සිදුවන ගැටලු නිරීක්ෂණය කිරීම සඳහා භූ විද්‍යා හා පතල්

කැනීම් කාර්යංශය විසින් සංවිධානය කරන ලද ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සඳහා සහභාගී වන ලදී. ඒ සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ නිරීක්ෂයන් හා අදහස් එම කාර්යංශය වෙත යවන ලදී.





**4.2.1.2 ස්වභාවික සම්පත් කළමනාකරණය පිළිබඳව විස්තරාත්මක පොත් පිංච අත් පත්‍රිකා සහ මාර්ගෝපදේශ මාලාවන්** ස්වභාවික සම්පත් කළමනාකරණය සහ සංරක්ෂණය සම්බන්ධයෙන් මහජනතාව, පාසල් ප්‍රජාව, සහ රාජ්‍ය ආයතන දැනුවත් කිරීමේ අරමුණින් අත් පත්‍රිකා වර්ග 3 ක් සකස් කරන ලදී. එනම්

- කඩොලාන අත් පත්‍රිකාව
- ජල පෝෂක ප්‍රදේශ සම්බන්ධ අත් පත්‍රිකාව
- තෙත්බිම් අත් පත්‍රිකාව




FIGURE 0-6 ස්වභාවික සම්පත් කළමනාකරණය පිළිබඳව විස්තරාත්මක පොත් පිංච අත් පත්‍රිකා

## 4.2.1.3 දැනුවත් කිරීමේ වැඩසටහන්

**a)** ඉඩම් ගොඩ කිරීම් කටයුතු වලදී සහ නේවාසික භාවිතය සඳහා ඉඩම් අනුබෙදුම් සිදු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් පරිසර නිර්දේශ නිකුත් කිරීමේදී අනුගමනය කළ යුතු නිවැරදි ක්‍රියාපටිපාටිය පිළිබඳව දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් මාතලේ, කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්කයන් හි පළාත් පාලන ආයතන වල තාක්ෂණික නිලධාරීන් සහ එම දිස්ත්‍රික්ක වල මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය නිලධාරීන් සඳහා පවත්වන ලදී.

b) ස්වභාවික සම්පත් කළමනාකරණයේ වැදගත්කම සම්බන්ධයෙන් පුහුණු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු දැනුවත් කිරීමේ වැඩසටහනක් සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි කළුතර, ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ දී පවත්වන ලදී.

c) වෙනත් ආයතන විසින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහනන් සඳහා සම්පත් දායකත්වය ලබා දීමට කටයුතු කර ඇත. (උදා :- NAITA,කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය උපාධිය හදාරණ සිසුන් සඳහා, කොමර්ෂල් බැංකුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද "ව්‍යාපාර සායනය, පාරිසරික කළමනාකරණ පිළිබඳ ජාත්‍යන්තර සහතික පත්‍ර පාඨමාලාව")

**4.2.1.4 ජල මූලාශ්‍ර/ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම.**

**4.2.1.4.1 රක්ෂිත, ජල පෝෂක ප්‍රදේශ සහ ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීමේ ජාතික ප්‍රතිපත්තිය**

මෙම ප්‍රතිපත්තිය යටතේ මේ වන විටත් හඳුනාගෙන ලැයිස්තු ගත කර ඇති ජල මූලාශ්‍ර/ ජල පෝෂක ප්‍රදේශ, පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය විසින් ආරම්භ කර ඇත.

මෙම ජල පෝෂක ප්‍රදේශ විනාශ කිරීම සම්බන්ධයෙන් මහජනයාගෙන් සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි අනුව, අදාල රාජ්‍ය ආයතන ද සමඟ සම්බන්ධ වී ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ කිහිපයක් සිදු කර ඇත.





**4.2.1.4.2 හොරණ,සහ ඉංගිරිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල පවතින ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම.**

ඉංගිරිය ප්‍රාදේශිය ලේකම්තුමාගේ ද සහාය ඇතිව එම කොට්ඨාශ තුල පවතින හඳුනාගත් දිය පාරවල්, ජලාශ සහ ජල පෝෂක ප්‍රදේශ සඳහා සංරක්ෂණ හා කළමනාකරණ සැලැස්මක් පිළියෙල කරන ලදී. එයට සමගාමී ව ඉංගිරිය හා හොරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ජල

පෝෂක ප්‍රදේශ සඳහා සංරක්ෂණය හා කළමනාකරණ සඳහා කමිටු පිහිටුවන ලද අතර ඒ සඳහා

මාර්ගෝපදේශයන් මෙම ඒකකය විසින් සපයන ලදී.

**4.2.1.4.3 බදුල්ල දිස්ත්‍රික්කය තුල ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම.**

බදුල්ල දිස්ත්‍රික්කයේ තේ ඉඩම් හෙක්ටයාර් 1148 ක ප්‍රදේශයක් තුල (ඉඩම් කොටස් 1675 ක) පවතින ජල පෝෂක ප්‍රදේශයන් ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට යෝජනා වී ඇති අතර එහි පළමු අදියර යටතේ හාලි ඇළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පවතින ජල පෝෂක ප්‍රදේශ පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සිදු කරගෙන යනු ලැබේ.

ලබා ගත් GPS පාඨාංක වලට අනුව ඉඩම් පරිහරන ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ තාක්ෂණික මඟ පෙන්වීම ද යටතේ මෙම ප්‍රදේශ වල සීමා මායිම් සිතියම් ගත කරන ලද අතර අදාල ගැසට් නිවේදනයේ අවසන් කෙටුම්පත සකස් කර ඇත.



### 4.2.1.4.4 ශ්‍රී ලංකාවේ දිය ඇළි සංරක්ෂණය කිරීම.

දිය ඇළි සඳහා පවතින ඍජු හා වක්‍ර තර්ජනයන් සහ බලපෑම් සැලකිල්ලට ගනිමින් දිය ඇළි ආශ්‍රිතව කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතීන් සඳහා අනුමැතිය ලබා නොදීමේ ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත.

එම දිය ඇළි ලැයිස්තුව පහත සඳහන් පරිදි වේ

| පළාත | දිස්ත්‍රික්කය | දියඇළි සංඛ්‍යාව |
|---|---|---|
| දකුණ | ගාල්ල | 30 |
| | මාතර | 16 |
| | හම්බන්තොට | 4 |
| බස්නාහිර | කොළඹ | 05 |
| | කළුතර | 21 |
| | ගම්පහ | 02 |
| මධ්‍යම | මාතලේ | 22 |
| | මහනුවර | 38 |
| | නුවරඑළිය | 156 |
| සබරගමුව | කෑගල්ල | 40 |
| | රත්නපුරය | 171 |
| ඌව | බදුල්ල | 31 |
| | මොණරාගල | 10 |
| වයඹ | කුරුණෑගල | 01 |

දිය ඇළි 547 ක් ඇතුළත් ලැයිස්තුවක් පිළියෙල කර ඇති අතර එම දිය ඇළි ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කර ඇත.





### 4.2.1.5 රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා ස්වභාවික සම්පත් කළමනාකරණය සම්බන්ධ තාක්ෂණික මාර්ගෝපදේශ ලබා දීම.

මෙම ඒකකයේ නිලධාරීන් මධ්‍යම පරිසර අධිකාරිය නියෝජනය කරමින් සහ ස්වභාවික සම්පත් සංරක්ෂණය සහ කළමනාකරණය සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ, සංවර්ධනය කිරීමේ සංස්ථාව හා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්‍යාංශය, ජාතික ජල ජීවී සංවර්ධන අධිකාරිය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, ජාතික විද්‍යා පදනමේ මිනිසා සහ ජෛව ගෝල කමිටුව, තාක්ෂණික වැඩ කණ්ඩායම් ජාතික මෙහෙයුම් කමිටු, පාර්ලිමේන්තු උපදේශක කමිටු ආදී අනෙකුත් රාජ්‍ය ආයතනවල සැලසුම් කමිටු රැස්වීම් සහ තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් වැනි විවිධ කමිටු, රැස්වීම් සහ වැඩමුළු සඳහා තාක්ෂණික සහය ලබාදිම සිදුකර ඇත.2016 වර්ෂය තුල එවැනි රැස්වීම්, වැඩමුළු, කමිටු නියෝජනයන් එකසිය විස්සකට අධික ප්‍රමාණයකට මෙම ඒකකයේ නිලධාරීන් සහභාගී වී ඇත.

විවිධ අමාත්‍යාංශ / ආයතන මඟින් පාරිසරික අවධානය සඳහා එවන ලද කැබිනට් පත්‍රිකා වාර්තා, කළමනාකරණ සැලසුම් සඳහා අදහස් හා නිරීක්ෂණ අදාල ආයතන සඳහා ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

**4.2.2 පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම හා කළමනාකරණය කිරීම.**

**4.2.2.1 ප්‍රකාශයට පත් කරන ලද පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණය හා පසුවිපරම් කටයුතු සිදු කිරීම.**

**4.2.2.1.1 බොල්ගොඩ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය - (ගැසට් නිවේදන අංක 1634 /23,දිනය - 2009/12/30)**

බොල්ගොඩ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය සම්බන්ධ ගැසට් නිවේදනය පරිශෝධනය සියළු පාර්ශව ආයතනවල සහභාගීත්වයෙන් සිදු කරන ලද අතර නාගරික සංවර්ධන අධිකාරියේ අදහස් හා නිරීක්ෂන ලැබුනු පසුව අවසන් කිරීමට නියමිතය.බොල්ගොඩ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයේ මායිම් මැනුම් කටයුතු සිදු වෙමින් පවතී. බණ්ඩාරගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මැනුම් කටයුතු සම්පූර්ණ කර ඇත.අධිකරණ තීන්දුවකට අනුව ජල දේහයේ රක්ෂිතයේ සිදු කර ඇති අනවසර කටයුතු, සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම්ගේ ඉල්ලීම මත ගං ඉවුර දිගේ මායිම සලකුණු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

බොල්ගොඩ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය තුල සිදු කෙරෙන අනවසර කටයුතු පසුවිපරම් කිරීම සඳහා පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂන12 ක් සිදු කර ඇති අතර අනවසර කටයුතු සඳහා නීතිමය කටයුතු සිදු කර ඇත.





**4.2.2.1.2 මුතුරාජවෙල පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය - (ගැසට් නිවේදන අංක 1466 / 26,දිනය2006/10/13)** පාරිසරික ආරක්ෂිත ප්‍රදේශය පසුවිපරම් කිරීම සඳහා පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ 2ක් සිදු කර ඇත. මෙම පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුල කැළිකසල වලින් ශක්තිය ජනනය කිරීමට යෝජිත ව්‍යාපෘතියක් ප්‍රතික්ෂේප කරන ලදී.

**4.2.2.1.3 තලංගම පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය - ( ගැසට් නිවේදනය අංක 1487 / 10,දිනය2007/03/05)**

අදාල පාර්ශවකාර ආයතනවල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 2ක් පවත්වන ලදී.තලංගම පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තිරසාර බව සඳහා ක්‍රියාත්මක කල යුතු ක්‍රියාකාරකම් ඇතුලත් කරමින් කලමනාකරණ සැලැස්ම ප්‍රතිශෝධනය කරන ලදී.තලංගම පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුල සිදු කරන ලද අනවසර ඉදිකිරීම් වලට අදාල පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ 5ක් සිදු කරන ලදි.මෙම කටයුතු වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මූලික කටයුතු කර ඇත. පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුල සිදු කරනු ලබන මෙම අනවසර ක්‍රියා සම්බන්ධව ගැටළු පිළිබඳ සාකච්ඡා කර නිරාකරණය කර ගැනීම සඳහා අදාල ආයතන සමඟ පසුවිපරම් කමිටු රැස්වීමක් පවත්වන ලදි.මාදිවෙල නැගෙනහිර ජල බස්නාව යෝජිත ව්‍යාපෘතිය 1 වන කොටස තලංගම හා ඇවරියහේන වැව වැඩිදියුණු කිරීම. තලංගම පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීම සඳහා මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වෙත පාරිසරික නිර්දේශය නිකුත් කර ඇත.පාරිසරික නිර්දේශය ලබා දීමෙන් පසු අදාල සියළුම පාර්ශවකාර ආයතන සමඟ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ පසුවිපරම් කටයුතු ආරම්භ කරන ලදී.එක් පසුවිපරම් කමිටු රැස්වීමක් හා එක් පසුවිරම් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කරන ලදී.





**4.2.2.1.4 ග්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය - (ගැසට් නිවේදනය අංක 1487/10, දිනය2007/03/05 )**

උත්සව සමය 2016 වැඩ සටහන සඳහා ග්‍රෙගරි වැවේ වැදගත්කම සම්බන්ධව විශේෂ අත් පත්‍රිකාවක් සකස් කරන ලදී.උත්සව සමය තුළදී දැනුවත් කිරීමේ අත්පත්‍රිකා 90,000ක් දේශීය හා විදේශීය නරඹන්නන් අතර බෙදා හරින ලදී. උත්සව සමය වැඩසටහන අතරතුර පසුවිපරම් වැඩසටහන් 2ක් සිදු කරන ලදී.ග්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය තුල ඉහල වැව පාර අද්දර අදියර iv සංවර්ධන ව්‍යාපෘතියටඅනුමැතිය ලබා දෙන ලද අතර ඊට අදාල  අනුමැතිය ලබා දෙන අතර ඊට අදාල ක්ෂේත්‍ර පරීක්ෂණ 3ක් සිදු කරන ලදී.





**4.2.2.1.5 මරගල කඳු වැටිය - මොණරාගල -( ගැසට් නිවේදනය අංකය -1560/26 ,දිනය - 2008.08.01)**

පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති මරගල කඳු වැටියෙහි ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර, කළමනාකරණ කමිටු රැස්මීමක් ද පවත්වන ලදී. රැස්වීමේ දී සාකච්ඡා කර තීරණය කර ගත් පරිදි මාර්ගෝපදේශ ද සකස් කරන ලදී. ව්‍යාපෘති යෝජනා පහක් ලැබී ඇති අතර, ඉන් එකක් ප්‍රතික්ෂේප කළ අතර, ව්‍යාපෘති යෝජනා දෙකක් අනුමැතිය ලබා දීම සලකා බැලීම සම්බන්ධයෙන් කටයුතු සිදු කරමින් පවතී. මරගල පාරිසරික  ආරක්ෂක ප්‍රදේශය තුලට මරගල නගරය ද අයත් වූ බැවින්, එය ඉවත් කර නැවත මායිම් කණු සිටුවීම ද සිදු කරන ලදී.

4.2.2.16 **වලව්වේවත්ත වතුරාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය- (ගැසට් නිවේදනය අංකය - 1598/21**

**දිනය - 2009/04/24)**

බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී දැනුවත් කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදී. දැනුවත් කිරීමේ වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව රාජකාරි කටයුතු සිදු කරන සියළු ම ක්ෂේත්‍ර නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලදී. එදින විශේෂ දේශනයක් නීති උපදේශක ජගත් ගුණවර්ධන මහතා විසින් පවත්වන ලදී.





### 4.2.3 යෝජිත පාරිසරික ආරක්ෂක ප්‍රදේශවල තත්වය

#### 4.2.3.1 පන්සලාතැන්න, උකුවෙල (මාතලේ)

මෙම යෝජිත ප්‍රදේශය පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට අදාල ගැසට් නිවේදනයෙහි කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය පිණිස යොමු කර ඇත. අත්පත්‍රිකාවක් ද කෙටුම්පත් කර ඇත.

#### 4.2.3.2 වරාතැන්න - හක්කිඳ (මහනුවර)

පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට අදාල ගැසට් නිවේදනය පරිසර විෂය භාර අමාත්‍යවරයාගේ අත්සන් ලබා ගැනීම පිණිස, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය වෙත යොමු කර ඇත. ගැසට් නිවේදනය පරිසර විෂය භාර අමාත්‍යවරයාගේ අත්සන් ලබා ගැනීම පිණිස අමාත්‍යංශය වෙත යවන ලදී.





#### 4.2.3.3 දැඩිගමුව කන්ද (කඩුවෙල)

මෙම යෝජිත ප්‍රදේශය පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට අදාල ගැසට් නිවේදනයෙහි කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය පිණිස යොමු කර ඇත.

#### 4.2.3.4 ගිං ඔය (වෙන්නප්පුව)

ගිං ඔය යෝජිත පාරිසරික ආරක්ෂක ප්‍රදේශයෙහි ඉදිරි කටයුතු සිදු කිරීම පිණිස ආයතනික පාර්ශවකරුවන් සමඟ රැස්වීම් දෙකක් සහ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ දෙකක් සිදු කර ඇති අතර ගැසට් නිවේදනයෙහි කෙටුම්පත ද සකස් කර ඇත. නීත්‍යානුකූල නොවන ක්‍රියාකාරකම් ජල දේහය තුල පවත්වා ගෙන යනු ලබන්නේ ද යන්න පරීක්ෂා කිරීම මෙම ක්ෂේත්‍ර වල අරමුණ විය.





#### 4.2.3.5 කැබතිගොල්ලෑව ජල උල්පත් හා ගෝනුමැරියාව ජල බුබුල

උක්ත ස්ථාන අදාල ආයතන සමගින් පරිසර ආරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට අදාලව ම ක්ෂේත්‍ර පරීක්ෂණයක් පවත්වන ලදී. අදාල අධ්‍යයන වාර්තාව දැනටසකස් කරමින් පවතී. මිනුම්පති දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබා ගනිමින් මිණුම් සැලැස්මක් සකස් කරන ලෙස කැබතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම්තුමා දැනුම් දී ඇත.





### 4.2.3.5 කොරාකුලම් යෝජිත පාරිසරික ආරක්ෂක ප්‍රදේශය

මන්නාරම දිස්ත්‍රික් ලේකම්තුමාගේ සහභාගීත්වයෙන් මන්නාරම දිස්ත්‍රික්කය තුල පිහිටි කොරාකුලම් යෝජිත පාරිසරික ආරක්ෂක ප්‍රදේශය පිළිබඳ පළමු සාකච්ඡාව පවත්වන ලදී. එම සාකච්ඡාවේදී මෙම ප්‍රදේශය දැනටමත් වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ආරක්ෂක ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් තර ඇති බව අනාවරණය විය.

### 4.2.4 තෙත්බිම් කලමනාකරණය

### 4.2.4.1 ජාතික තෙත්බිම් මෙහෙයුම් කමිටුව (NWSC)

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික තෙත්බිම් කලමනාකරණ කමිටු රැස්වීමක් පවත්වන ලදී. එහි දී ජාතික තෙත්බිම් පනත හා උපායමාර්ග වල දක්වා ඇති පරිදි තෙත්බිම් සංරක්ෂණය හා කලමනාකරණය නිසි ලෙස පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වන වැදගත් තීරණ කිහිපයක් ගන්නා ලදී. තවද ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය වෙත පවරා ඇති බලතල ද නැවත සලකා බලා වෙනස් කල යුතු බවද තීරණය වී ඇත. ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සමඟ සාකච්ඡා කර කොළඹ මහ නගර සීමාව තුල තෙත්බිම් කලමනාකරණ උපාය මාර්ග සැලැස්මක් සකස් කළ යුතු බවත් සාකච්ඡා කර ඇත. ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හා මධ්‍යම පරිසර අධිකාරිය ඒකාබද්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර අනුමැතියට ඉදිරිපත් කල යුතු බවත් තීරණය වී ඇත.

### 4.2.4.2 තෙත්බිම් අසිරිය අත්පොත

දැනට පවතින තොරතුරු ඇතුළත් කරමින් සකස් කරන ලද "තෙත්බිම් අසිරිය" අත්පොත මුද්‍රණය කරන ලදී. එය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසල් සිසුන් සඳහා අතිරේක කියවීම් පොතක් ලෙස අනුමත කර ඇත.

### 4.2.4.3 ලෝක තෙත්බිම් දිනය 2016

වසරක් පාසා සමරනු ලබන ලෝක තෙත්බිම් දිනය සඳහා සෑම වසරකටම තේමාවක් හඳුන්වා දී ඇත. ඒ අනුව 2016 වසරේ ලෝක තෙත්බිම් දින තේමාව වූයේ "අනාගතය සඳහා තෙත්බිම්: තිරසර ජීවනෝපාය" යන්නයි. ලෝක තෙත්බිම් දින ජාතික වැඩසටහන 2016 පෙබරවාරි 02 වන දින කාක්කපල්ලිය, පම්බල පිහිටි සුළු ධීවර සම්මේලන මූලස්ථානයේ දී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු ඇමැතිවරුන්, මන්ත්‍රීවරුන් පළාත් පාලන නියෝජිතයින් හා රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මෙම උත්සවය පැවැත්වුණි.





### 4.2.4.3.1 ප්‍රධාන අංග

**i. චිත්‍ර තරඟය**

මධ්‍යම පරිසර අධිකාරිය විසින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව තෙත්බිම් සම්බන්ධව "තෙත්බිම් සිතුවම් 2016" සමස්ත ලංකා චිත්‍ර තරඟය පවත්වන ලදී. මෙහි දී ඉලක්කගත කණ්ඩායම ලෙස 1-13 ශ්‍රේණි දක්වා පාසල් දරු දැරියන් හා විවෘත අංශය ලෙස තරඟ පවත්වන ලදී. මෙම තරඟ සඳහා අනුග්‍රාහකත්වය හැටන් නැෂනල් බැංකුව,ශ්‍රී ලංකා සුළු ධීවර සම්මේලන මධ්‍යස්ථාන, ශ්‍රී ලංකා ජලනි සහ විජය පුවත්පත් සමාගම විසින් ලබා දෙන ලදී. මෙම තරඟ සිංහල හා දෙමළ මාධ්‍යයෙන් වෙන වෙනම පවත්වන ලදී. මෙම තරඟය සඳහා 10,000 කට ආසන්න තරඟකරුවන් පිරිසක් සහභාගී වූ අතර ජයග්‍රාහකයින් 130 දෙනෙකු වෙත වටින පොත්/ලිපි ද්‍රව්‍ය කට්ටලයක් ප්‍රධානය කරන ලදී. එම පොත් සහ ලිපි ද්‍රව්‍ය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, ලෝක සංරක්ෂණ සංගමය හා ජාත්‍යන්තර ජල කලමනාකරණ ආයතන විසින් ලබා දෙන ලදී. තරඟාවලියේ අවසාන වටයෙන් ප්‍රථම ස්ථානය ලබාගත් සියළු ජයග්‍රාහකයින්ට (1-13 ශ්‍රේණිවල) පවුලේ සමාජිකයෙකු සමඟ නොමිලේ ජාතික උද්‍යානයක

රයක් ගත කිරීමට පහසුකම් ලබා දීමට වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව එකඟ වන ලදී.





**ii) පැන විසඳුම් තරඟය**

සති 10 ක් පුරා විජය පුවත්පතේ පළ වූ තෙත්බිම් සම්බන්ධ විවිධ මාතෘකා/ ගැටළු සම්බන්ධ ලිපි ඇසුරින් සතිපතා අසන ලද පැන විසඳුම් තරඟයේ දී සතිපතා ජයග්‍රාහකයින් තිදෙනෙකු බැගින් තෝරා ගෙන වටිනා ත්‍යාග පිරිනමන ලදී.

**iii) ලෝක තෙත්බිම් දිනය සමරා මුද්දර 4 ක් නිකුත් කිරීම.**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා තැපැල් දෙපාර්තමේන්තුවේ මුලිකත්වයෙන් ශ්‍රී ලංකාවේ රම්සා තෙත්බිම් පිළිබඳ මුද්දර 4 ක් නිකුත් කරන ලදී.




ඊට අමතරව ලෝක තෙත්බිම් දිනය සැමරීම පිණිස මධ්‍යම පරිසර අධිකාරිය විසින් වැඩසටහන් 17 ක් පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලදී.

### 4.2.5 විශේෂ ව්‍යාපෘති

**4.2.5.1** පාරිසරික සංවේදී ප්‍රදේශවල ජෛව විවිධත්ත්ව සංරක්ෂණය වැඩිදියුණු කිරීම සහ පාරිසරික සේවා පෝෂණය කිරීමේ ව්‍යාපෘතිය - කලා ඔය ද්‍රෝණිය - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය.

මෙම ව්‍යාපෘතියේ සන්නිවේදන උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම මධ්‍යම පරිසර අධිකාරිය විසින් සකස් කරන ලදී. කොටස්කරුවන්ගේ රැස්වීම් සහ පුත්තලම හා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල දී පැවැත්වුණු උපදේශක වැඩමුළු දෙකක් මඟින් මෙම සැලැස්ම සකස් කෙරුණි.





### 4.2.5.2 වේලි ඔය ජල පෝෂක ප්‍රදේශය ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහය ඇතිව වේලි ඔය ජල පෝෂක ප්‍රදේශය සඳහා ඉඩම් පරිහරණ **සමාජීයය ව්‍යුහ අවදානම් දැක්වෙන සිතියම්** කලාපකරණ සැලැස්මක් පිළියෙල කිරීම ආරම්භ කරන ලදී. ඉදිරියේ දී පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා සුදුසු පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා මෙම සිතියම් සකස් කිරීමට නියමිත වේ.




**FIGURE 0-7** පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා සකස්කල සිතියම්

### 4.2.5.3 කැළණි ගංගා ද්‍රෝණිය සංරක්ෂණ හා කළමණාකරන ව්‍යාපෘතිය

කැළණි ගංගා ද්‍රෝණිය සංරක්ෂණ කිරීම හා කළමණාකරනය කිරීම සඳහා වන ප්‍රධාන සැලැස්ම,

ද්‍රෝණිය සඳහා සැකසූ ස්වභාවික සම්පත් පැතිකඩ, සිතියම් එකතුවක් සහ තාක්ෂණික පත්‍රිකා,

පුවත්පත් ලිපි ඇතුළත් සී.ඩී.තැටියක් IUCN උපදේශක ආයතනය වෙතින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත භාර දෙන ලදී.

කැළණි ගංගා ද්‍රෝණියේ වැදගත්කම පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමේ අරමුණින් ජනතාව දැනුවත් කිරීම සඳහා ඒ පිළිබඳ අත්පත්‍රිකාවක් සකස් කළ අතර එහි පිටපත් 2000 ක් මුද්‍රණය කරන ලදී. ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයේ සහයෝගය ඇති ව මෙම ද්‍රෝණිය තුළ පිහිටි පාසල් දෙකක් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වුණි




**FIGURE 0-8** කැලණි ගංගා ෙද්‍රාණිය

ප්‍රධාන සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම පිණිස, දෙන ලද ආකෘතියට අනුව සැකසූ ව්‍යාපෘති යෝජනාව, ක්‍රියාකාරී සැලැස්ම සහ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා කෙටුම් පත, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. එහි ඉදිරි කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය සමඟ රැස්වීම් දෙකක්සහ ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව සමඟ රැස්වීම් දෙකක් ද පැවැත්වුණි.

# 4.3 පර්යේෂණ හා සංවර්ධන ඒකකය

**පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ ප්‍රධාන අභිමථාර්තයන් වන්නේ,**

ඕනෑම ආකාරයකින් විය හැකි පරිසර හායනයන් වැළැක්වීම සඳහා අවශ්‍ය පර්යේෂණ /අධ්‍යයන /සමීක්ෂණ සිදුකිරීම හා ඒවා ප්‍රවර්ධනය, සම්බන්ධීකරණය සහ ඒම තොරතුරු ප්‍රචාරය. සහ

භූගෝලීය තොරතුරු තාක්ෂණය හා දුරස්ථ සංවේද තාක්ෂණය භාවිතයෙන් තිරසර ලෙස ස්වාභාවික සම්පත් කළමනාකරණය කිරීම වේ.

ඒ අනුව පර්යේෂණ හා සංවර්ධන ඒකකය පහත ක්‍රියාකාරකම් ඉටුකරන ලදී.

### 4.3.1 මධ්‍යම පරිසර අධිකාරියේ විෂය පථයට අදාලව පර්යේෂණ /අධ්‍යයන, සමීක්ෂණ ආරම්භ කිරීම, සම්බන්ධීකරණය, ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය

#### 4.3.1.1 පර්යේෂණ දත්ත පද්ධතියක් ගොඩ නැංවීම

මේ පිළිබඳව ජ්‍යොෂ්ඨ කළමණාකරණ මණ්ඩලය සමඟ සාකච්ඡා කරන ලද අතර එහිදී මධ්‍යම පරිසර අධිකාරියේ ජාතික තොරතුරු මධ්‍යස්ථානය මඟින් පවත්වාගෙන යනු ලබන විද්‍යුත් තොරතුරු ගබඩාවට පර්යේෂණ දත්ත පද්ධතිය ඇතුලත් කිරීමට තීරණය විය .

#### 4.3.1.2 පර්යේෂණ උපදේශන කමිටුව (RAC )

පර්යේෂණ හා සංවර්ධන ඒකකයට උපාය මාර්ගික මඟ පෙන්වීම සඳහා පිහිටුවන ලද මෙම කමිටුවේ (RAC ) රැස්වීම් 3ක් පවත්වන ලදී .

මධ්‍යම පරිසර අධිකාරියේ නිළධාරීන් විසින් හඳුනාගත් පාරිසරික ගැටලු සම්බන්ධයෙන් පර්යේෂණ වාර්තා 18ක් ඉදිරිපත් කරන ලද අතර එයින් මධ්‍යම පරිසර අධිකාරියේ අරමුණු වලට අදාල පර්යේෂණ වාර්තා 07ක් පර්යේෂණ උපදේශන කමිටුව (RAC ) මඟින් තෝරා ගන්නා ලදී .

ඒ අනුව පහත සඳහන් පර්යේෂණ 05 සඳහා අත්තිකාරම් ගෙවන ලදී. (පහත සෑම පර්යේෂණයක ම සම්පුර්ණ ඇස්තමේන්තුගත මුදලින් 25%ක්)

I. DRASTIC ක්‍රමය භාවිතා කර ගම්පහ දිස්ත්‍රික්කයේ භූගත ජලදරයන් දූෂණය වීමට ලක්වීමේ අවධානම සහ නැඹුරුතාවය අධ්‍යනය කිරීම

II. කළුතර දිස්ත්‍රික්කයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කළුගල් කැණීමේ ක්‍රියාකාරකම් හේතුවෙන් වෘක්ෂලතාවන්ගේ වෙනස්වීම් කෙරෙහි සිද්ධි අධ්‍යනය

III. ලවණ ජලය කළු ගඟට මිශ්‍රවීම නිසා කෙත්හේන ජල පවිත්‍රාගාරයට සිදුවන බලපෑම අධ්‍යනය කිරීම.

IV. කොළඹ ගංවතුර පාලන ප්‍රදේශයේ කාෂ්ඨීය ආක්‍රමණශීලි වෙල් ආතා ශාඛයේ (*Annona glabra*) පැතිරීම හා බහුලතාවය අධ්‍යනය.

V. ආක්‍රමණශීලී විදේශීය ශාඛ විශේෂයක් වන පර ශාකය (Dillenia surffruticosa) දකුණු අධිවේගී මාර්ගය දෙපස පැතිරීමේ වෙනස්කම් පිළිබඳ අධ්‍යනය

#### 4.3.1.3 බහුවිධ පර්යේෂණ කණ්ඩායම (Trans - Disciplinary research Team) ගොඩනැංවීම /ආරම්භ කිරීම.

Trans - Disciplinary research Team මධ්‍යම **පරිසර** අධිකාරියේ සේවයේ නියුතු නිළධාරීන්ගෙන් සමන්විත වේ. මේ කණ්ඩායම සඳහා පර්යේෂණ වාර්තා සකස්කිරීමේ හා ලිවීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩමුළුවක් 2016.06.16 දින **මධ්‍යම පරිසර** අධිකාරියේ ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී .

#### 4.3.1.4 මධ්‍යම පරිසර අධිකාරියේ විෂය පථයට (mandate) අදාලව පර්යේෂණ ප්‍රමුඛතාවයන් හඳුනා ගැනීම.

පර්යේෂණ උපදේශන කමිටු රැස්වීම් වලදී, පර්යේෂණ ප්‍රමුඛතාවයන් හඳුනා ගැනීමේදී අනුගමනය කලයුතු ක්‍රියා පිළිවෙත සාකච්ඡා කරන ලදී. එහිදී මධ්‍යම පරිසර අධිකාරියේ විෂය පථයට අදාල පර්යේෂණ වලට ප්‍රමුඛතාවය ලැබිය යුතු බව තීරණය කරන ලදී. 2017 දී නව පාරිසරික ප්‍රශ්න හා ගැටලු හඳුනාගැනීම සඳහා වැඩමුළුවක් සංවිධානය කිරීමට දළ සැලසුමක් ද සකස් කරන ලදී.

#### 4.3.1.5 කළු ගඟ ද්‍රෝණිය කළමණාකරණය සඳහා පොදු ආකෘතියක් ගොඩනැංවීම.

ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය (IWMI) සමඟ ඒකාබද්ධව ව්‍යපෘති යෝජනාවක් සකස් කරමින් පවතී. කළු ගඟ ද්‍රෝණියේ තිරසාර සංවර්ධන සැලැස්මට අදාල **පර්යේෂණ** සිදුකිරීමට බලාපොරොත්තුවේ.

#### 4.3.1.6 කටුපොල් (Oil Palm) වගාව මඟින් භූගත ජල මට්ටමට ඇති වන බලපෑම.

කටුපොල් වගාව හඳුන්වාදීමෙන් පසු භූගත ජල මට්ටම කෙරෙහි ඇති වන බලපෑම පිළිබඳව අධ්‍යනය කිරීම සඳහා ඉහත පර්යේෂණ යෝජනාව සකස්කර ඇත. මෙම පර්යේෂණය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ භෝග විද්‍යා සහ පාංශු විද්‍යා දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සිදු

කිරීමටත් එය 2017 වසරේ අධ්‍යනයන් ආරම්භ කිරීමටත් නියමිතය.

### 4.3.1.7 දුරස්ථ සන්වේදන තාක්ෂණය ආධාරයෙන් මධ්‍යම පළාතේ හායනයට ලක්වූ භූමි ප්‍රදේශ හඳුනාගැනීම

නුවරඑළිය හා මහනුවර දිස්ත්‍රික්ක වල හායනයට ලක්වූ භූමි ක්ෂේත්‍ර අධ්‍යයන හා දුරස්ථ සංවේදන තාක්ෂණය ආධාරයෙන් සිදුකර ඇත. ඉහත දිස්ත්‍රික්ක 02 හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හායනයට ලක්වූ භූමි ප්‍රමාණයන් ගණනය කිරීම සඳහා Landsat OLI චන්ද්‍රිකා ඡායරූප භාවිතා කරන ලදී. මෙම අධ්‍යනය මාතලේ දිස්තික්කයේ 2017 වසරේදී සිදුකිරීමට බලාපොරොත්තු වේ. දුරස්ථ සන්වේදන හා භූගෝලීය තොරතුරු තාක්ෂණය ආධාරයෙන් හායනයට ලක්වූ ඉඩම් හඳුනා ගැනීම යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ හායනයට ලක් වූ ඉඩම් හඳුනාගැනීම පිලිබඳ ජාතික විද්‍යා පදනමේ (NSF) වාර්ෂික පර්යේෂණ එළිදැක්වීමේ සමුළුවේ (summit) ප්‍රසිද්ධ කර ඇත.




**FIGURE 0-9** මහනුවර දිස්ත්‍රික්කයේ බාදනයට ලක්වූ ඉඩම්




**FIGURE 0-10** නුවරඑළිය දිස්ත්‍රික්කයේ බාදනයට ලක්වූ ඉඩම්



| | Province | Total | A | B | C | BOI |
|---|---|---|---|---|---|---|
| 1 | Western | 13883 | 4707 | 3392 | 5118 | 666 |
| 2 | Southern | 6945 | 1269 | 1631 | 3960 | 85 |
| 3 | Eastern | 3940 | 734 | 936 | 2221 | 49 |
| 4 | Uva | 3745 | 656 | 502 | 2566 | 21 |
| 5 | Central | 5690 | 1151 | 968 | 3483 | 88 |
| 6 | North Central | 3370 | 785 | 711 | 1838 | 36 |
| 7 | Sabaragamuwa | 5156 | 1065 | 1387 | 2655 | 49 |
| 8 | Northern | 3625 | 721 | 825 | 2063 | 16 |
| 9 | North Western | 693 | 339 | 354 | 0 | 0 |
| | Total | 47,047 | 11,427 | 10,706 | 23,904 | 1,010 |



**FIGURE 0-11 2016** වසර තුල දූෂක කර්මාන්තවල පිහිටීම

**4.3.1.8 පරිසර කළමනාකරණය සහ සැලසුම් 2016 පිළිබඳ ජර්නලය**

මධ්‍යම පරිසර අධිකාරිය මඟින් සංවිධානය කරන ලද පරිසර කළමනාකරණ හා සැලසුම් 2015 පිළිබඳ සම්මන්ත්‍රණයේදී (Symposium) පරිසර කළමනාකරණ සහ සැලසුම් 2016 ජර්නලය මුද්‍රණය කරන ලදී.

**4.3.2 පරිසර කළමනාකරණය සඳහා භූගොලීය තොරතුරු තාක්ෂණය යොදාගැනීම**

**4.3.2.1 භූගොලීය තොරතුරු තාක්ෂණය භාවිතයෙන් පාරිසරික තොරතුරු පද්ධතියක් නිර්මාණය හා සංවර්ධනය**

මෙය අප රටේ මධ්‍යගත පාරිසරික එකම තොරතුරු පද්ධතිය වන අතර එය මෙරට පාරිසරික සැලසුම් සකස්කිරීම කළමනාකරණය, අධීක්ෂණය, විශ්ලේශණ, සංවර්ධන ව්‍යාපෘති සඳහා සුදුසු ක්ෂේත්‍ර හඳුනාගැනීම, ආපදා සැලසුම් සකස් කිරීම සහ දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් යනාදිය සඳහා උපයෝගී කරගත හැකිවේ. මෙය අඛණ්ඩව පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම පර්යේෂණ හා සංවර්ධන ඒකකය මඟින් සිදුකරනු ලබයි.

පහත සඳහන් දත්ත සහ තොරතුරු 1:10,000 භූ ලක්ෂණ සිතියම් වල අඩංගු කරන ලදී. (භූමිභාග, පරිපාලන තොරතුරු, ඉඩම් භාවිතය, මහා මාර්ග, ජල සම්පත්, ගොඩනැගිලි)

| | | |
|---|---|---|
| 63 - බිබිල | 64 - තිරුක්කෝවිල් | 69 - බදුල්ල |
| 70 - මොණරාගල | 71 - පොතුවිල් | 77 - බුත්තල |
| 78 - පානම | 83 – කතරගම | |

**4.3.2.2 පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු නියමිත කර්මාන්ත පිළිබඳ භූගෝලීය අවකාශීය දත්ත පද්ධතිය යාවත් කාලීන කිරීම**

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත පිළිබඳ සකස් කර ඇති භූගෝලීය අවකාශ දත්ත පද්ධතිය මාසිකව යාවත්කාලීන කිරීම පර්යේෂණ හා සංවර්ධන ඒකකය විසින් කරනු ලැබේ.

ඒ අනුව 2016 වසරේ ශ්‍රී ලංකාවේ පිහිටි ඇති මහා පරිමාණ (A කාණ්ඩය), මධ්‍යම පරිමාණ (B

කාණ්ඩය) සහ සුළු පරිමාණ (C කාණ්ඩය) දූෂණ කාරක කර්මාන්ත සංඛ්‍යාව පිළිවෙලින් 11,427 , 10,706 , 23,904 ක් වේ.

මෙම තොරතුරු දත්ත පද්ධතිය ශ්‍රී ලංකාවේ පරිසර දූෂණ පාලනය කිරීමේ ක්‍රියාවලියට හා අළුතින් කර්මාන්ත ස්ථානගත කිරීමේ දී අතිශයින්ම වැදගත් වේ.

**2016 වසරේ ශ්‍රී ලංකාවේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු නියමිත කර්මාන්ත වල ව්‍යාප්තිය 2016 වසරේ ශ්‍රී ලංකාවේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු නියමිත කර්මාන්ත වල ව්‍යාපෘතිය.**

| | පළාත | දිස්ත්‍රික්කය | එක් එක් කාණ්ඩයේ කර්මාන්තවල මුළු එකතුව | ඒ කාණ්ඩයේ කර්මාන්ත වල එකතුව | බී කාණ්ඩයේ කර්මාන්ත වල එකතුව | සී කාණ්ඩයේ කර්මාන්ත වල එකතුව | ආයෝජන මණ්ඩල යේ කර්මාන්ත වල මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 1 | බස්නාහිර | ගම්පහ | 5841 | 2210 | 1407 | 1976 | 248 |
| | | කොළඹ | 5409 | 1774 | 1348 | 1977 | 310 |
| | | කළුතර | 2658 | 723 | 637 | 1165 | 133 |
| 2 | දකුණ | ගාල්ල | 2504 | 511 | 837 | 1124 | 32 |
| | | මාතර | 2106 | 410 | 505 | 1168 | 23 |
| | | හම්බන්තොට | 2335 | 348 | 289 | 1668 | 30 |
| 3 | නැගෙනහිර | ත්‍රිකුණාමලය | 1178 | 194 | 349 | 623 | 12 |
| | | අම්පාර | 898 | 241 | 199 | 439 | 19 |
| | | මඩකලපුව | 1864 | 299 | 388 | 1159 | 18 |
| 4 | ඌව | බදුල්ල | 1818 | 367 | 274 | 1169 | 8 |
| | | මොණරාගල | 1927 | 289 | 228 | 1397 | 13 |
| 5 | මධ්‍යම | මහනුවර | 3671 | 685 | 589 | 2347 | 50 |
| | | මාතලේ | 1266 | 305 | 242 | 697 | 22 |
| | | නුවරඑළිය | 753 | 161 | 137 | 439 | 16 |
| 6 | උතුරු මැද | අනුරාධපුරය | 2530 | 586 | 446 | 1473 | 25 |
| | | පොළොන්නරුව | 840 | 199 | 265 | 365 | 11 |
| 7 | | රත්නපුර | 2256 | 504 | 688 | 1038 | 26 |

| | පළාත | දිස්ත්‍රික්කය | එක් එක් කාණ්ඩයේ කර්මාන්තවල මුළු එකතුව | ඒ කාණ්ඩයේ කර්මාන්ත වල එකතුව | බී කාණ්ඩයේ කර්මාන්ත වල එකතුව | සී කාණ්ඩයේ කර්මාන්ත වල එකතුව | ආයෝජන මණ්ඩල යේ කර්මාන්ත වල මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | සබරගමුව | කෑගල්ල | 2900 | 561 | 699 | 1617 | 23 |
| 8 | උතුර | යාපනය | 1812 | 366 | 340 | 1102 | 4 |
| | | මන්නාරම | 450 | 101 | 118 | 228 | 3 |
| | | වව්නියාව | 441 | 124 | 75 | 236 | 6 |
| | | කිලිනොච්චි | 413 | 74 | 116 | 222 | 1 |
| | | මුලතිව් | 509 | 56 | 176 | 275 | 2 |
| 9 | වයඹ | කුරුණෑගල | 554 | 253 | 301 | 0 | 0 |
| | | පුත්තලම | 139 | 86 | 53 | 0 | 0 |
| | එකතුව | | **47,072** | **11,427** | **10,706** | **23,904** | **1,035** |
| | කාණ්ඩ ප්‍රතිශතය | | | **24** | **23** | **51** | **2** |

### 4.3.2.3 ආංශික (Digital) දිස්ත්‍රික් පාරිසරික පැතිකඩ ඇතුලත් CD සකස් කිරීම හා මුද්‍රණය කිරීම

ආංශික දිස්ත්‍රික් පාරිසරික පැතිකඩ වල ඒ ඒ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පාරිසරික තොරතුරු සහ සමාජ ආර්ථික තොරතුරු අඩංගු වේ. 2016 වසරේදී රත්නපුර, යාපනය සහ මහනුවර යන දිස්ත්‍රික්ක වල දිස්ත්‍රික් පාරිසරික පැතිකඩ සකස් කර CD මුද්‍රණය කරන ලදී.










**4.3.2.4 පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ / ප්‍රධාන කාර්යාලයේ / ප්‍රාදේශීය කාර්යාලවල නිළධාරීන්ගේ භූගෝලීය තොරතුරු තාක්ෂණය දැනුම වර්ධනය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්**

(i) නිරපේක්ෂ ස්ථානීය දත්ත ලබාගැනීම (GPS තාක්ෂණය) හා Google Earth Pro පුහුණු වැඩසටහන පහත සඳහන් පළාත් හා දිස්ත්‍රික් කාර්යාල වල නිළධාරීන් සඳහා පවත්වන ලදී.

දකුණු පළාත් කාර්යාලය, සබරගමුව පළාත් කාර්යාලය, , මධ්‍යම පළාත් කාර්යාලය, උතුරු මැද පළාත් කාර්යාලය, උතුරු පළාත් කාර්යාලය, ඌව පළාත් කාර්යාලය, නැගෙනහිර පළාත් කාර්යාලය සහ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය,කළුතර දිස්ත්‍රික් කාර්යාලය, මාතර දිස්ත්‍රික් කාර්යාලය, හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය , කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය

(ii) පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ නිළධාරීන් 2016-12-29 දින ArcGIS Online (Wed Based GIS) පුහුණු වැඩසටහන් වලට සහභාගී වන ලදී.

(iii) පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ කළමනාකරණ සහකාර 2016-05-24-30 දින වල GIS Solution (Pvt) Ltd ආයතනයේදී පවත්වන ලද ArcGIS මෘදුකාංග හා එහි යෙදීම් පිළිබඳ පුහුණු වැඩසටහනට සහභාගිවීම

### 4.3.2.5 GIS සේවා සැපයීම

පහත සඳහන් සේවාවන් ඉල්ලීම අනුව සපයා ඇත.

- එක් එක් ව්‍යපෘති සඳහා පරිසර සංවේදී කලාපයන්ට අයත් වන්නේ දැයි නිර්ණය කිරීම හා ඒවායේ භූමි පරිභෝජන රටාවන් පිළිබඳ සිතියම් සකස් කිරීම
- තෝරාගත් ප්‍රදේශ සඳහා පාරිසරික සංවේදී කලාප සිතියම් සැකසීම
- භූමි භාවිතය හා පරිභෝග රටාවන් පිළිබඳ සිතියම් සැකසීම
- චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේශණය
- නිරපේක්ෂ ස්ථානීය දත්ත ලබාදීම
- සිතියම් අංකනය සහ වර්ගීකරණය
- සිතියම් මුද්‍රණය හා පරිලෝකනය (Scanning)

**a) බාහිර ඉල්ලීම්**

බාහිර අයදුම්කරුවන් සඳහා සේවාවන් 105 ක් සැපයීමෙන් රු: 204,169.20 ක මුදලක් උපයා ඇත.

**b) මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල සඳහා සපයන ලද භූගෝලීය තොරතුරු සේවාවන්**

අධිකාරියේ අභ්‍යන්තර අවශ්‍යතාවයන් 57 ක් සඳහා සේවාවන් සපයා ඇත.

# 5.0 නීති ඒකකය

"අප එකිනෙකාගේ පැවැත්ම උදෙසා නීතිමය යාන්ත්‍රණය බලාත්මක කිරීම තුළින් පරිසර සංවර්ධනය කිරීමෙන් ද දැනුම ලබාදීමෙන් ද පරිසරයේ සුවදායී පැවැත්ම තහවුරු කරමු."

## 5.1 ජාතික පාරිසරික පනත යටතේ ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ග -

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ බලාත්මක වන නීති හා රෙගුලාසි ඔස්සේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ 2016 වසර තුළ නීති අංශය මඟින් සිදු කරන ලද නෛතික කාර්යයන් පහත පරිදි වේ.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් ගොනු කොට පවත්වා ලෙන යනු ලබන සහ අවසන් කරන ලද නඩු කටයුතු රාශියකි. ඒ අතර, 2016 වසර තුළදී මෙම අධිකාරිය විසින් ගොනු කරන ලද සහ මෙම අධිකාරියට එරෙහිව පවත්වා ගෙන යන ලද නඩු සංඛ්‍යාව එකසිය අසූ හතර (184) වන අතර, මෙම අධිකාරිය විසින් නඩු අසූ දෙක (82) ක් 2016 වර්ෂය තුළ අලුතින් පවරා ඇත.

එකී නඩුකාරයන් මඟින් 2016 වර්ෂයේ දඩ මුදල් ලෙස අයකරගෙන ඇති මුළු මුදල රු. 904,166.00 කි.

## 5.2 බස්නාහිර පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය -

2016 වර්ෂය තුළදී බස්නාහිර පළාත තුළ පවරා පවත්වාගෙන යන ලද නඩු සංඛ්‍යාව හැට හය (66)ක් පමණ වේ.

කොළඹ දිස්ත්‍රික්කය තුළ නඩු තිස්හතර (34)ක් පවරා පවත්වා ගෙන ගොස් ඇති අතර, ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03)ක් ද, අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03)ක් ද, කැස්බෑව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු හය (06)ක් ද, ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03)ක් ද, මොරටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01)ක් ද, කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු හත (07)ක් ද, හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01)ක් ද, කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු දහය (10)ක් ද වශයෙන් පවරා පවත්වාගෙන ගොස් ඇත.

ගම්පහ දිස්ත්‍රික්කය තුළ නඩු විසිහය (26)ක් පවත්වා ගෙන ගිය අතර, ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01)ක් ද, මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අට (08)ක් ද, වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03)ක් ද, මහර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු නමය (09)ක් හා මිනුවන්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පහ (05)ක් ද ලෙස පවත්වා ගෙන ගොස් ඇත. 2016 වසර තුළදී එකී නඩු වලින් හය (06)ක් අවසන් කර ඇත.

කළුතර දිස්ත්‍රික්කයේ නඩු හය (06)ක් පවත්වා ගෙන ගොස් ඇති අතර, එකී නඩු කළුතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03)ක් ද, මතුගම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01)ක් ද, පානදුර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු දෙක (02)ක් ද, පවත්වා ගෙන ගොස් ඇත.

## 5.3 මධ්‍යම පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය -

මධ්‍යම පළාත තුළ පසුගිය වසරේ නඩු හතළිස් අට (48)ක් පවත්වා ගෙන ගිය අතර, මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පහළොව (15)ක් ද, මාතලේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන(03)ක් ද, ගම්පොළ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු හතර (04)ක් ද, දඹුල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු දෙක (02)ක් ද, නාවලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01)ක් ද, තෙල්දෙණිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු හත (07)ක් ද, හැටන් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03)ක් ද, වලපනේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පහ (05)ක් ද, හෙල්බොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු දෙක (02)ක් ද, පන්විල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තුන (03)ක් ද, මහියංගනය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු එක (01)ක් ද වශයෙන් නඩු පවත්වා ගෙන ගිය අතර, ඉන් විසි දෙක (22)ක් අළුතින් පවරන ලද අතර, මුළු නඩු සංඛ්‍යාවෙන් විසි හත (27)ක් පසුගිය වසර තුළ අවසන් කරන ලද ඒවා වේ.

## 5.4 ඌව පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය -

ඌව පළාත තුළ වැලිමඩ, බණ්ඩාරවෙල, වැල්ලවාය සහ මහියංගනය යන අධිකරණ වල

නඩු දහඅට (18)ක් පවරා පවත්වාගෙන යන ලදී. ඒ අතරින් නඩු අට (08)ක් අළුතින් ගොනු කර තිබෙන අතර, 2016 වර්ෂයේ නඩු දහය (10)ක් අවසන් කර ඇත.

## 5.5 දකුණු පළාත තුළ නීතිය බලාත්මක කිරීමේ ප්‍රගතිය -

දකුණු පළාත තුළ බලපිටිය, ගාල්ල, තංගල්ල හා අඟුනකොලපැලැස්ස යන අධිකරණවල නඩු කටයුතු දාහතර(14)ක් පවත්වාගෙන ගොස් ඇත. ඉන් අට(08)ක් 2016 වසරේ දී අලුතින් පවරා ඇති අතර නඩු කටයුතු අට(08)ක් එම වසරේ දී අවසන් කර ඇත.

## 5.6 නැගෙනහිර පළාත තුළ නීතිය බලාත්මක කිරීමේ ප්‍රගතිය -

නැගෙනහිර පළාත තුළ 2016 වසරේ දී අධිකරණ කටයුතු නවය(09)ක් පවත්වාගෙන ගොස් ඇත. ඉන් එක(01)ක් අම්පාර මහේස්ත්‍රාත් අධිකරණයේද, ත්‍රිකුණාමලය අධිකරණයේ නඩු කටයුතු පහ(05) ක් ද, මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු තුන(03)ක් ද වශයෙන් පවත්වාගෙන ගොස් ඇති අතර ඉන් දෙක(02)ක් අවසන් කර ඇත.

## 5.7 සබරගමු පළාත තුළ නීතිය බලාත්මක කිරීමේ ප්‍රගතිය -

සබරගමුව පළාත තුළ 2016 වසරේදී නඩු දොළහ(12)ක් අලුතින් පවරා පවත්වාගෙන ගොස් ඇත. ඒවා රත්නපුර මහේස්ත්‍රාත් අධිකරණයේ අට(08)ක් ද, මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ එක(01)ක් ද, රුවන්වැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ තුන(03)ක් ද වශයෙන් පවත්වාගෙන ගොස් ඇති අතර ඉන් පහ(05)ක් එම වසරේදී ම අවසන් කර ඇත.

## 5.8 උතුරු මැද පළාත තුළ නීතිය බලාත්මක කිරීමේ ප්‍රගතිය -

උතුරු මැද පළාත තුළ 2016 වසරේදී නඩු දොළහ(12)ක් අලුතින් පවරා පවත්වාගෙන ගොස් ඇත. ඒවා අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණය, තඹුත්තේගම හා හිඟුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණවල පවත්වාගෙන යන ලදි. ඉන් නවය(09)ක් 2016 වසරේ දී අවසන් කර ඇත.

## 5.9 වයඹ පළාත තුළ නීතිය බලාත්මක කිරීමේ ප්‍රගතිය -

වයඹ පළාත තුළ 2016 වසරේදී නඩු පහ(05)ක් අලුතින් පවරා පවත්වාගෙන ගොස් ඇත. ඒවා කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ එක(01) ක් ද, පුත්තලම මහාධිකරණයේ දෙක(02)ක් ද, කුලියාපිටිය මහාධිකරණයේ දෙක(02)ක් ද වශයෙන් පවත්වාගෙන ගොස් ඇත.

## 5.10 මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව පවරන ලද නඩු -

මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව නඩු පනස් නමය (59)ක් 2016 වර්ෂයෙදී පවත්වා ගෙන ගිය අතර, ඒවා මහේස්ත්‍රාත් අධිකරණ, දිසා අධිකරණ, මහාධිකරණ, ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණයන්හී පවරන ලද නඩු වේ.

නීති ඒකකයට අනුයුක්තව සේවය කරනු ලබන නිලධාරීන් මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ, මහාධිකරණයේ, දිසා අධිකරණයේ හා මහේස්ත්‍රාත් අධිකරණවල පවරන ලද නඩු කටයුතු වලට සම්බන්ධව කටයුතු කරන ලදී.

තවද, නීති ඒකකයට අනුයුක්ත නීති නිලධාරින් විසින් අධිකරණයේ ගොනු කරනු ලබන ලේඛන කෙටුම්පත් කිරීම හා උපදේශන සාකච්ඡාවලට ද සහභාගී වේ.

## 5.11 ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය -

නීතිමය ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සමහර කර්මාන්තශාලා මධ්‍යයම පරිසර අධිකාරියේ ජාතික පාරිසරික පනතට අනුකූලව අපජලය පිරිපහදු පද්ධති සකස් කිරීමෙන්ද, සමහර කර්මාන්තශාලා ජාතික පාරිසරික පනතේ ප්‍රකාශිත ප්‍රමිති හා උපමාන වලට අනුකූලව ශබ්ද පාලනය කිරීමෙන්ද සහ අනෙකුත් නෛතික අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන්ද අනතුරුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදෙන ලදී.

## 5.12 පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීම / අත්හිටුවීම / නිකුත් කිරීම / ප්‍රතික්ෂේප කිරීම -

කර්මාන්තශාලාවල සිදු වන පරිසර දූෂණය සලකා බලා නිකුත්කොට ඇති පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීම සඳහා කර්මාන්තශාලා විසිනමය (29)ක් වෙත ද, පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් කර්මාන්තශාලා හැත්තහත (77)ක් වෙත ද ලිපියවා ඇත.

තවද, කර්මාන්තශාලා සම්බන්ධව නඩු පැවරීමට අදාළ පියවර ගැනීම සඳහා ශබ්ද මට්ටම් වාර්තා අපදියර විශ්ලේෂණ වාර්තා හා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා කැඳවීම සඳහා ලිපිගොනු ගණනාවෙක් පරිසර දූෂණ පාලන අංශය සහ අදාළ පළාත් කාර්යාල වෙත සහ අධිකාරියේ රසායනාගාර වෙත යොමු කොට ඇත.

## 5.13 ජාතික පාරිසරික පනතේ 24(ආ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන විධානයන් -

2016 වර්ෂයේ නීති ඒකකය මඟින් ජාතික පාරිසරික පනතේ 24(ආ) වගන්තිය යටතේ විධාන දෙක (02)ක් නිකුත් කර ඇත.

### 5.14 පාරිසරික ආරක්ෂණ බලපත්‍ර කොන්දේසි

නව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේදී එහි කොන්දේසි මධ්‍යම පරිසර අධිකාරියේ නීති ඒකකයේ නිලධාරීන් සහ පළාත් කාර්යාලවලට අනුයුක්ත කොට ඇති සහකාර නීති නිලධාරීන් විසින් පරික්ෂා කරනු ලබයි.

### 5.15 ජාතික පාරිසරික පනත යටතේ ඉදිරිපත් කර ඇති අභියාචනා (පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය) –

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අභියාචනා විභාග කිරීම් හැටහය (66)ක් සම්බන්ධයෙන් නීති ඒකකයේ නිලධාරීන් සහභාගී වී ඇත.

### 5.16 නොතාරිස් කටයුතු -

මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යයන් ඉටු කිරීමේදී විවිධ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ගොඩනැගිලි බදුදීම හා සේවා ලබා ගැනීම සඳහා බාහිර අංශ සමඟ එළඹෙන්නා වූ එකඟතා සහ ගිවිසුම්පත්‍ර පිළියෙළ කිරීම් සිදු කිරීම සහ එකී ගිවිසුම් පත්‍ර සඳහා අනුමැතිය ලබාදීම සිදු කෙරිණ.

### 5.17 රැස්වීම් -

නීති ඒකකයේ නිලධාරීන් පාරිසරික ගැටළු සම්බන්ධයෙන් වන රැස්වීම් එකසිය විස්ස(120) ක් සඳහා සහභාගී වී ඇත.

### 5.18 පැමිණිලි -

නීති ඒකකයේ නිලධාරීන් පරිසර දූෂණය සහ කරදරය සම්බන්ධයෙන් මහජනතාව, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ අනෙකුත් ආයතන වලින් යොමු කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් පියවර ගෙන ඇත.

### 5.19 සාකච්ඡාවලට සහභාගීවීම -

මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරන ලද නඩු සහ මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව අධිකරණයේ ගොනු කර ඇති නඩු සම්බන්ධයෙන් විරෝධතා, උත්තර, ලිඛිතදේශන සැකසීම සහ විභාග නඩු සම්බන්ධයෙන් උපදේශන සාකච්ඡා තිහ (30)ක් සඳහා නීති ඒකකයේ නිලධාරීන් සහභාගී වී ඇත.

### 5.20 උපදෙස් -

නීති ඒකකයේ නිලධාරීන් විසින් පළාත් පාලන ආයතන තනි පුද්ගලයින් සහ වෙනත් අංශවලින් යොමු කරන ලද ගැටළු පහ(05) ක් සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇත.

### 5.21 නීති නිවේදන -

පරිසර දූෂණකාරී කර්මාන්ත එකසිය හය (106)කට එරෙහිව නීති නිවේදන යවා ඇත.

### 5.22 ක්ෂේත්‍ර පරික්ෂණ වාර්තා -

අධිකරණ නියෝග වලට අදාළව අධිකරණයට ඉදිරිපත් කිරීම සහ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉදිරියේ පවත්වනු ලබන අභියාචනා විභාග වලට ඉදිරිපත් කිරීමට නියමිත නිලධාරීන් විසින් කරන ලද ක්ෂේත්‍ර පරික්ෂණ වාර්තා සඳහා නීති අංශයේ අනුමැතිය ලබා දී ඇත.

### 5.23 දැනුවත් කිරීම -

නීති අංශයේ නිලධාරීන් විසින් ජාතික පාරිසරික පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළ දේශන විසිහතර (24)ක් වෙනත් ආයතන වල නිලධාරීන් සඳහා පවත්වා ඇත. මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සඳහා පවත්වන වැඩමුළු සඳහා සම්පත් දායකයින් ලෙස සහභාගි වී ඇත.

තවද, නීති ශිෂ්‍යයින් සහ අනෙතුත් විශ්ව විද්‍යාල සිසු සිසුවියන්ගේඉල්ලීම් අනුව, පරිසර නීතිය හා පාරිසරික නියෝගයන් පිළිබඳව දැනුවත් කිරීම් සිදු කරන ලදී.

### 5.24 මානව හිමිකම් කොමිෂන් සභාවේ විමසීම්

මානව හිමිකම් කොමිෂම මඟින් කරනු ලබන පරිසර අදාළ කාරණා සම්බන්ධයෙන් හා සේවක ගැටළු සම්බන්ධ විමසීම් කිහිපයකට නීති අංශයේ නිලධාරීන් සහභාගී වී ඇති අතර, අවශ්‍ය අනුමැතීන් මත වාර්තා පිළියෙල කිරීම සහ නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

### 5.25 ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම -

“ Polluter Pays” වැනි මූලධර්ම ඇතුළත් කරමින් තෙත්බිම් සහ උපද්‍රවකාරී අපද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිපාදන ජාතික පාරිසරික පනතට හඳුන්වාදීමේ අරමුණින් පවතින අඩුපාඩු මඟහැරීමේ අරමුණින් පවතින දඩ මුදල් සංශෝධනය කිරීමේ අරමුණින් ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීට පියවර ගෙන ඇත.

මෙයට අදාළ යෝජිත නව සංශෝධන ඇතුළත් කැබිනට් පත්‍රිකාව මේ වන විට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත.

# 6.0 පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශ

1984 වර්ෂයේ සිට මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය පරිසරයේ යහපැවැත්ම උදෙසා ශ්‍රී ලංකාවේ බිම් මට්ටමේ විවිධ ඉලක්කගත කණ්ඩායම් සඳහා බහුවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් දියත් කරනු ලබයි.

මහජනතාවට පරිසරය පිළිබඳ දැනුම හා පරිසර අධ්‍යාපනය ලබා දීම අරමුණු කොට ගෙන විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කරමින් ඔවුන්ගේ ක්‍රියාශීලි සහභාගිත්වය පරිසරය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම සඳහා ලබා ගනී. 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් අමාත්‍යාංශ හා භාණ්ඩාගාර අරමුදල් භාවිත කරමින් පහත දැක්වෙන වැඩසටහන් දියත් කරන ලද අතර වෙනත් අරමුදල් භාවිත කරමින් අමතර වැඩසටහන් කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී.

01. අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

02. භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

03. වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 6.1 අංශය මඟින් ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන්

### 6.1.1 පරිසර පුවත්පත මුද්‍රණය

මාස 6කට වරක් පරිසර නියමු පුවත්පත ජාතික මට්ටමින් මුද්‍රණය කරන ලද අතර, ඒවා අදාළ ආයතනවලට යොමු කිරීම ද මේ යටතේ සිදු කරනු ලබයි. 2016 වර්ෂයේ දී මාධ්‍ය ඒකකය විසින් වෙළුම් 2ක් පළ කරන ලදී.

### 6.1.2 පාරිසරික ප්‍රදර්ශන සංවිධානය.

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් විවිධ ස්ථානවල පැවැත්වූ ප්‍රදර්ශන සඳහා මෙම අංශයේ නිලධාරීන් සහභාගි වූ අතර, මෙම ක්‍රියාකාරකමේදී පුළුල් ජනතා දැනුවත් කිරීමක් සිදු කිරීමට බලාපොරොත්තු වේ. ප්‍රදර්ශන ආකෘති, පෝස්ටර්ස් සහ පත්‍රිකා පාරිසරික ගැටලු ආමන්ත්‍රණය කිරීමට ඉතාමත් ප්‍රබල මාධ්‍යයක් වන බැවින් මෙම ක්‍රියාකාරකම යටතේ පත්‍රිකා, CD, පෝස්ටර්ස් යනාදිය පාසල්, කාර්යාල, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා නිකුත් කරනු ලබයි. පහත දැක්වෙන ප්‍රදර්ශන සඳහා ක්‍රියාකාරීව සහභාගි වන ලදී.

1. දින 03 ප්‍රදර්ශන 11
2. දින 02 ප්‍රදර්ශන 14
3. දින 01 ප්‍රදර්ශන 12

### 6.1.3 සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානවල ප්‍රායෝගික වැඩසටහන් පැවැත්වීම

ස්වභාවික පරිසරය තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවනු ලැබීමේ අවශ්‍යතාවය මත විවිධ පාරිසරික ක්‍රියාකාරකම් දියත් කිරීම සඳහා සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන වෙත ප්‍රතිපාදන ලබා දෙන අතර, එමඟින් ඉලක්කගත කණ්ඩායම් දැනුවත් කරනු ලැබේ. මධ්‍යම පරිසර අධිකාරිය යටතේ සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන 4ක් විවිධ පළාත්වල පළාත් කාර්යාල යටතේ පිහිටුවා ඇත. අදාළ වර්ෂය තුළ පහත පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

**TABLE 0.20** සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානවල ප්‍රායෝගික වැඩසටහන් පැවැත්වීම

| අ.අ | සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානය | පළාත් කාර්යාලය | දැනුවත් කිරීම් වැඩසටහන් ගණන |
|---|---|---|---|
| 1. | රුමස්සල | දකුණු පළාත් කාර්යාලය | 11 |
| 2. | කුණ්ඩසාලේ | මධ්‍යම පළාත් කාර්යාලය | 09 |
| 3. | කැගල්ල | සබරගමු පළාත් කාර්යාලය | (අක්‍රීයව පවතී) |
| 4. | අත්තිඩිය | මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය | 14 |

### 6.1.4 කාලීන ගැටලු පිළිබඳ අධ්‍යාපන හා දැනුවත් කිරීම් වැඩසටහන් දියත් කිරීම - මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරය

කාලීන පරිසර ගැටලු පිළිබඳ දැනුවත් කිරීම් අරමුණු කරගෙන පාසල් ළමුන් හා විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා මෙම දැනුවත් කිරීම් වැඩසටහන් පවත්වන ලදී. මෙම දේශනවල මාතෘකා ඍජුවම පරිසරය හා සම්බන්ධවන අතර පාසල් විෂය මාලාවට ගැලපෙන ලෙස සකසා ඇත.

මේ යටතේ 2016 වර්ෂයේ දී වැඩසටහන් 11ක් පවත්වන ලදී.

### 6.1.5 කාලීන ගැටළුවලට අදාළ දැනුවත් කිරීම් වැඩසටහන් - ඩෙංගු

ඩෙංගු රෝගය පැතිරීම පරිසරය සම්බන්ධ ප්‍රධාන සෞඛ්‍යමය ගැටළුවකි. පරිසරය කළමනාකරණය කිරීමෙන් ඩෙංගු පාලනය කළ හැකි බව පිළිගෙන ඇති බැවින් ඩෙංගු මර්දන වැඩසටහන් බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, රොබට් ගුණවර්ධන මාවත ආශ්‍රිතව පවතින රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධ කර ගනිමින් මාසිකව පවත්වනු ලබන අතර, විවිධ දිස්ත්‍රික්කවල විවිධ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබිය.

2016 වර්ෂයේ දී ඩෙංගු මර්දන වැඩසටහනක් අනුදෙනෙකුගේ සහභාගිත්වයෙන් බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, රොබට් ගුණවර්ධන මාවත ආශ්‍රිතව පවත්වන ලදී.

### 6.1.6 සංස්කෘතික දින සඳහා පරිසර දැනුවත් කිරීම් වැඩසටහන්

පරිසර නියමුවන් විසින් සංස්කෘතික උත්සවවලට සහභාගිවන්නන් සඳහා පරිසරය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම සහ පරිසර හිතකාමී ලෙස ඝන අපද්‍රව්‍ය බැහැරකරලීම පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් දැනුවත් කිරීම සිදුකරනු ලබයි. ඒ සඳහා පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශයේ සම්බන්ධීකරණයෙන් හා මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් හා දිස්ත්‍රික් කාර්යාලවල මෙහෙයවීමෙන් තලවිල ශාන්ත ආනා දේවාස්ථානය, මහනුවර ඇසළ පෙරහැර, කතරගම ඇසළ පෙරහැර සහ අනුරාධපුර පොසොන් උත්සවය සඳහා මූල්‍ය දායකත්වය ලබා දෙන ලදී.

### 6.1.7 ලෝක පරිසර දිනය

ලෝක පරිසර දින තේමාව යටතේ විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කරන ලදී. 2016 වර්ෂයේ දී අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ දී ජුනි 05 දින **“වනජීවී සම්පත් නිතී විරෝධී ලෙස අලෙවි කිරීමට එරෙහි වෙමු”** තේමාව යටතේ ලෝක පරිසර දින ප්‍රධාන වැඩසටහන පවත්වන ලද අතර, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් මෙම වැඩසටහන මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගය ඇතිව සිදු කරන ලදී. මෙම වැඩසටහනේදී පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

1. පරිසරය පිළිබඳ දැනුවත් කිරීම් වැඩසටහන් මාතලේ දිස්ත්‍රික්කයේ පාසල් 03ක පැවැත්වීම.

   ශ්‍රීනාග ජාතික පාසල, නාඋල

   අඹන මහා විද්‍යාලය, නාඋල

   නාලන්දා ජාතික පාසල, මාතලේ
2. මාතලේ දිස්ත්‍රික්කයේ පාසල් 25ක පැළ තවාන් ආරම්භ කිරීම.
3. මාතලේ දිස්ත්‍රික්කයේ පාසල් පරිසර ව්‍යාපෘති 49ක් ක්‍රියාත්මක කිරීම.

### 6.1.8 ජාතික රුක් රෝපණ වැඩසටහන

2016 වර්ෂයේ දී ජාතික රුක් රෝපණ වැඩසටහන් නව මුහුණුවරකින් විවිධ මාතෘකා යටතේ විවිධ ක්‍රියාකාරකම් මාසයක් තුළ න්‍යාය පත්‍රයකට අනුව පවත්වන ලදී. එම මාසය “වනරෝපා - රුක් රෝපණ මාසය ලෙස නම් කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේ “තුරු කැපකරු - අපි නිරතුරු” තේමාව යටතේ “වන අරණට - සිසු අරණ” පාසල් රුක් රෝපණ වැඩසටහන් පවත්වන ලදී. එම තේමාව යටතේ පහත සඳහන් වැඩසටහන් 3 ක්‍රියාත්මක විය.

- දිවයිනේ පාසල් 10000 ක පැළ 03ක් බැගින් රෝපණය කිරීම.
- දිස්ත්‍රික්ක 03ක තෝරාගත් පාසලක පැළ 50 බැගින් පැළ 1150ක් රෝපණය කිරීම.
- පුස්සැල්ලාව සැන්කුහාර් වතුයායේ පැළ 16000ක් සිටුවීම.

### 6.1.9 විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඵලදායි ලෙස භාවිතා කිරීම (මාධ්‍යය ඒකකය)

ජනමාධ්‍ය, පරිසරය හා සම්බන්ධ තොරතුරු ප්‍රචාරය කිරීමට ඇති ප්‍රබල මාධ්‍යයකි. එබැවින් මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය යටතේ වෙනම ඒකකයක් ලෙස මාධ්‍යය ඒකකය ස්ථාපනය කරන ලදී. මාධ්‍යය ඒකකය විසින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යය ඵලදායි ලෙස භාවිත කරන ලදී. 2016 වර්ෂයේ මාධ්‍යය ඒකකයේ ප්‍රගතිය පහත දක්වා ඇත.

### 6.1.10 ගුවන්විදුලි වැඩසටහන

1. **සොබාකෙත ගුවන්විදුලි වැඩසටහන**

පාරිසරික ගැටළු පිළිබඳව මහජනයාට දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මඟින් එෆ්. එම්. 94.3/ එෆ් එම් 94.5 ඔස්සේ සොබාකෙත ගුවන්විදුලි වැඩසටහන සෑම බ්‍රහස්පතින්දා දිනකම

සවස 6.30ට ප්‍රචාරය කරන ලදී. අසන්නන්ගෙන් පරිසරය හා සම්බන්ධ ප්‍රශ්න ඇසීමෙන් මෙම වැඩසටහනේ ප්‍රගතිය විමසීම සිදුකරනු ලබයි. එහිදී සෑම සතියකම ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා ත්‍යාග ලබා දෙයි. ප්‍රජාවගෙන් ලැබෙන ප්‍රතිචාරවලට අනුව, මෙම වැඩසටහන අසන්නන් අතර වඩාත් ජනප්‍රිය වැඩසටහනක් බැව් තහවුරු වේ. 2016 වර්ෂයේ දී සොබාකෙත ගුවන් විදුලි වැඩසටහන් 40ක් විසුරුවා හරින ලදී.

**2. රූපවාහිනී සාකච්ඡා**

SLRS, ITN, SLBC, ස්වර්ණවාහිනී, සිරස, සියස හා දෙරණ වැනි රූපවාහිනී/ ගුවන්විදුලි සාකච්ඡා හා විශේෂ ආවරණ වැඩසටහන් 20ක් පැවැත්වීම.

**3. මිස්ටර් ග්‍රීන් ඩීවීඩී තැටි නැවත නිෂ්පාදනය**

බාහිර ඉල්ලීම් සඳහා ඩීවීඩී තැටි 40ක් නිකුත් කර ඇත.

**4. විරිදු සීඩී තැටි බෙදාහැරීම.**

සීඩී තැටි 36ක් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත බෙදා හරින ලදී.

**5. සංහිත ග්‍රන්ථය බෙදාහැරීම.**

පෝස්ටර්ස් පොත් 17ක් සංහිත කවි පොත් 25ක් සංහිත කෙටිකතා පොත් 25ක් බෙදා හරින ලදී.

**6. මාධ්‍යය ආවරණය**

ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකය විශේෂ ව්‍යාපෘති, වැඩසටහන් සහ විශේෂ අවස්ථා ආවරණය කරමින් මධ්‍යම පරිසර අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීමට දායක වේ. 2016 වර්ෂයේ මෙවැනි වැඩසටහන් 99ක් ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකය විසින් ආවරණය කරන ලදී.

**7. දිනපතා පුවත්පත්වල පළ වන පාරිසරික ගැටළු**

මෙය මාධ්‍යය ඒකකය මඟින් ක්‍රියාත්මක කරන තවත් එක් ක්‍රියාකාරකමක් වේ. මෙහිදී දිනපතා පුවත්පත්වල පළවන පරිසරය හා සම්බන්ධ ගැටළු 1108 ක් අදාළ දෙපාර්තමේන්තු හා ආයතන වෙත යොමු කර ඇත.

**8. ප්‍රවෘත්ති හා මාධ්‍යය නිවේදන**

මාධ්‍යය මඟින් සමාජයේ පුළුල් පරාසයන් දැනුවත් කළ හැකිය. එබැවින් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රවෘත්ති හා ක්‍රියාකාරකම්, ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත් හා වෙබ් අඩවිය මඟින් බෙදා හරිනු ලබයි.

**TABLE 0.21 8.** ප්‍රවෘත්ති හා මාධ්‍යය නිවේදන

| පුවත්පත් නිවේදන සංඛ්‍යාව | වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම |
|---|---|
| 60 | 51 |

### 6.1.11 "නිල්වන පෙත" සහ "සොබාකෙත ඩීවීඩී තැටි" බෙදා හැරීම.

2014 වර්ෂයේ දී නිල්වනපෙත පාරිසරික සංගීත වැඩසටහන දියත් කරන ලද අතර, 2016 වර්ෂයේ ගීත අඩංගු සංගත තැටි ඉල්ලුම්කරන ලද පාර්ශවන්, පාසල්, පළාත් දිස්ත්‍රික් කාර්යාල, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා බෙදා හරින ලදී. එහිදී නිල් වනපෙත සංගත තැටි 25ක් සහ සොබාකෙත ඩීවීඩී සංගත තැටි 124ක් බෙදා හරින ලදී.







**FIGURE 0-13** නිල්වනෙපත ෙසාබාෙකත

**1. පරිසරාත්මක ගීත දෘශ්‍යකරණය කිරීම.**

වීඩියෝ දර්ශන 01ක් පටිගත කර අවසන් කිරීම.

**2. රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය**

මාධ්‍යය ඒකකය විසින් කරන ලද තවත් එක් කාර්යභාරයක් වන්නේ රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය කිරීමයි. 2016 වර්ෂයේ දී රාජ්‍ය නොවන සංවිධාන 28ක් ලියාපදිංචි කරන ලදී.

### 6.1.12 පිරිසිදු හා හරිත පරිසරයකින් යුක්ත හොඳම පාසල තේරීම (සුවසර තක්සලාව වැඩසටහන)

මෙහි අරමුණ වන්නේ හැකිතාක් පාසල් සිසුන් පරිසර ක්‍රියාකාරකම් සඳහා යොමු කර එමඟින්

සුවදායී පරිසරයක් පාසල තුළ නිර්මාණය කිරීමට අවස්ථාව සලසා දීමයි. මෙහිදී, සුවදායී හරිත පරිසරයකින් යුත් පාසල් තෝරා ගැනීම සිදු කරනු ලබයි. 2016 වර්ෂයේ දී දිවයින පුරා පාසල් අතරින් එක් දිස්ත්‍රික්කයකින් හොඳම හරිත පරිසරයකින් යුත් පාසල් තුන බැගින් දිස්ත්‍රික් 25 සඳහා පාසල් 75ක් තෝරා ගන්නා ලදී.

### 6.1.13 දිස්ත්‍රික් පාරිසරික හා පාසැල් පුස්තකාල ස්ථාපිත කිරීම.

පාරිසරික නියමු වැඩසටහනේ 05 අවුරුදු සැලැස්ම යටතේ ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය විසින් 2016 පාසැල් පුස්තකාල 05ක් තෝරා ගත් අතර එහි පාරිසරික අංශය සංවර්ධනය කිරීම සිදු කර ඇත. මේ සඳහා අවම පහසුකම් ඇති පාරිසරික නියමු වැඩසටහන ක්‍රියාකාරීව පවත්වාගෙන යන පාසැල් තෝරා ගැනීම සිදුකරන ලදී. මෙම වැඩසටහන යටතේ ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය මඟින් රු. ලක්ෂ 15 ක් වටිනා පොත් හා පුස්තකාල උපකරණ පහත සඳහන් පාසැල් පුස්තකාල සංවර්ධනය කිරීම සඳහා පරිත්‍යාග කරන ලද අතර, එම පුස්තකාල විවෘත කිරීමේ උත්සව පිළිවෙලින් 2016 ජුනි 27 හා ජූලි 04, 05, 07 සහ 22 දිනයන්හි අදාළ පාසැල් පරිශ්‍රයේදී සිදු කරන ලදී.

1. වෙල්ලවෙලි කලෙයිමංගල් විද්‍යාලය - මඩකලපුව
2. අඹගහහේන මහා විද්‍යාලය - හම්බන්තොට
3. සුමන සමන් මහා විද්‍යාලය - රත්නපුර
4. දිප්පිටිය ද්විතීක පාසැල, අලවතුගොඩ - මහනුවර
5. මදුරන්කුලිය ආදර්ශ මහා විද්‍යාලය - පුත්තලම




**FIGURE 0-14** පාසැල් පුස්තකාල ස්ථාපිත කිරීම.

**පුස්තකාල එකතුව ගොඩනැගීම.**

පරිසර විෂයට අදාළ පොත් 177, සඟරා 10 සහ දෘඩ තැටි 01ක් මිලදී ගැනීම සහ පොත් 205 ක් ප්‍රතිග්‍රහණය හා වර්ගීකරණය කිරීම සිදු කරන ලද අතර සඟරා 285 ක් පුස්තකාල නව එකතුවට ඇතුළත් කර ඇත.

**ප්‍රලේඛන සේවා හා පුස්තකාල පිරිසැකසුම්කරණය.**

1 ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානයේ දත්ත පදනම් 03 ක් (CEA දත්ත පදනම - පුස්තකාල පොත් පිළිබඳව, IND දත්ත පදනම - පුවත්පත් ලිපි හා සඟරා ලිපි පිළිබඳව සහ EIA / IEE දත්ත පදනම් - පාරිසරික බලපෑම් ඇඟයීම් වාර්තා /මූලික පාරිසරික සමීක්ෂණ වාර්තා පිළිබඳව) පවත්වාගෙන යනු ලබන අතර එයට දත්ත 1,075 ක් මෙම වසර තුළදී ඇතුළත් කර ඇත.

2 පරිසර අධිකාරියේ ප්‍රකාශන ඇතුළත් e-repository ය නව මුහුණුවරකින් පරිසර අධිකාරියේ වෙබ් පිටුවට ඇතුළත් කර දත්ත 10,400 ක් එයට මාරු කර ඇත. එමෙන්ම මෙතෙක් අභ්‍යන්තර ජාලයක පවත්වාගෙන ගිය පුස්තකාල සුචියද පරිගණක සුචියක් (web based) ලෙස ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. එයට පරිගණක ග්‍රන්ථ 10,400 ක් හා නව ග්‍රන්ථ 71 ක් ඇතුළත් කර ඇත. වර්ෂ 1991-2013 දක්වා පාරිසරික පුවත්පත් ලිපි ගොනු 160 ක් බාහිර දෘඩ තැටියට ඇතුළත් කර ඇත.

3 සඟරා පටුන පිටු ඇතුළත් "සඟරා ප්‍රවර්තනය" කලාප 06 ක් සහ "පාරිසරික පුවත්පත් ලිපි හා සඟරා ලිපි අනුක්‍රමණිකාව" කලාප 04 ක් 2016 වර්ෂය සඳහා සම්පාදනය කර මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යාල මණ්ඩලය වෙත බෙදා හැර ඇත.

### 6.1.15 පාරිසරික තොරතුරු හුවමාරු කිරීම

- ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානයෙන් පාඨකයින් 5105 ක් සඳහා පාරිසරික තොරතුරු ලබා දීම, අත්තිඩිය සහ රුමස්සල තොරතුරු මධ්‍යස්ථානය මඟින් තොරතුරු 2,538 ක් ලබා දීම සහ මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය

මණ්ඩලය වෙත පොත් සහ සඟරා 3,600 ක් බෙහෙරදීම සිදුකර ඇත.

- පොත් සහ අත් පත්‍රිකා 60 ක් පළුගස්දමන සේවාමුක්ත කඩවුර මහා විද්‍යාලයට පරිත්‍යාග කිරීම සිදුකරන ලදී.

**පුස්තකාල ජාල ක්‍රියාකාරකම්**

- HELLIS / SLLA / SLSTIC/AGRINET තොරතුරු ජාලවලට අවශ්‍ය තොරතුරු ලබාදීම, ශ්‍රී ලංකාවේ සමුළු අනුක්‍රමණිකාව සහ රජයේ ප්‍රකාශන නාමාවලිය සඳහා දත්ත සැපයීම සිදුකර ඇත. එසේම පුස්තකාල රැස්වීම් හා වැඩමුළු 11 කට සහභාගිවී ඇත.

### 6.2 වෙනත් වැඩසටහන්

**1. හරිත දරුවෝ වැඩසටහන**

2016 ඔක්තෝබර් මස 17 - 19 දින දක්වා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී අන්තර්ජාතික සම්මන්ත්‍රණය හා ප්‍රදර්ශනයට සමගාමීව සංවිධානය කරන ලද "හරිත දරුවෝ" වැඩසටහන සාර්ථකව පවත්වන ලදී. මීට සමගාමීව චිත්‍ර, කවීක, රචනා තරඟ දිවයින පුරා පාසල්වල සහභාගිත්වයෙන් පවත්වන ලද අතර ඒ යටතේ,

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය මඟින් රචනා තරඟය සිංහල, දෙමළ මාධ්‍ය 2න් පවත්වනු ලැබූ අතර කාණ්ඩ 02ක් යටතේ තෝරාගන්නා ලද පළාත් මට්ටමෙන් ජයග්‍රාහකයින් අතරින් ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් තෝරා ගන්නා ලදී. කවීක තරඟය සඳහා ජාතික මට්ටමෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය තුන සඳහා ජයග්‍රාහකයින් තෝරා ගන්නා ලදී. එසේම චිත්‍ර තරඟය පැවැත්වීම හා ප්‍රදර්ශනය සංවිධානය කිරීම සහ ජයග්‍රාහකයන් 58 දෙනෙකුගේ චිත්‍ර පරිලෝකනය කර මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් පිටුවට ඇතුළත් කරන ලදී.

**2. පුනරුදය වැඩසටහන**

පරිසර නියමුවන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහනක් 2016.10.18 වන දින 114කගේ සහභාගිත්වයෙන් ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

කුඩව සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයේ දී 2016.11.03,04 දෙදින 134කගේ සහභාගිත්වයෙන් ක්ෂේත්‍ර අධ්‍යයන වැඩසටහනක් පවත්වන ලදී.

# 7.0 සැලසුම් හා පසුවිපරම් ඒකකය

ජාතික පාරිසරික පනත යටතෙහි පැවරි ඇති බලතල ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය වන්නා වූ පසුබිම සැකසීම සඳහා අවශ්‍ය ඒ ඒ අංශ ඒකකයන්හි, හා පළාත් කාර්යයන්හි අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි අවශ්‍ය සැලසුම් සම්පාදනය හා ඒවා ක්‍රියාත්මක කරවිම සැලසුම් හා පසුවිපරම් ඒකකයෙහි ප්‍රධාන වගකීම වේ.

රජයෙහි පාරිසරික ප්‍රතිපත්ති වලට අදාලව ප්‍රමුඛතාවයන් හඳුනා ගැනිම වාර්ෂික මහ භාණ්ඩාගාරයෙන්, සපයන්නා වූ ප්‍රතිපාදන එම ප්‍රමුඛතාවයන් සඳහාම යෙදවිම පරිසර අංශය තුළ ඇති පෞද්ගලික අංශයට අදාල ප්‍රමුඛතාවයන් හඳුනා ගැනිම සහ විදේශ ආධාර කාර්යක්ෂම ලෙස සංවර්ධන ක්‍රියාවලිය සඳහා යොමු කිරිම මෙම ඒකකය මඟින් නිසි පරිදි සිදු කෙරේ.

පරිසර අංශයන්හි ප්‍රමුඛ ක්ෂේත්‍ර සඳහා සම්පාදනය කරන ලද ක්‍රියාකාරි සැලසුම් මධ්‍යම රජයේ ආයතනයන් ලෙස ප්‍රධාන කාර්යාලය මඟින්ද, ප්‍රාදේශිය වශයෙන් ප්‍රාදේශිය කාර්යාල හරහා ද සාර්ථක ලෙස ක්‍රියාත්මක කෙරේ.

2014-2018 වර්ෂයන්ට අදාලව මධ්‍යම පරිසර අධිකාරියෙහි සංයුක්ත සැලැස්මට අනුව, විවිධ ක්‍රියාකාරි සැලසුම් අධීක්ෂණ සැලසුම්, කාලීන ක්‍රියාකාරි සැලසුම් සම්පාදනය සහ ඒවා සම්බන්ධීකරණය කිරිමට අවශ්‍ය පහසුකම් සැලසීම සිදු කරනු ලැබූ අතර විවිධ ආයතනයන්ට අවශ්‍ය ප්‍රගති වාර්තා නියමිත දිනට සකසා ඉදිරිපත් කිරිම මෙම අංශය මඟින් සිදු කෙරේ.

අධිකාරිය මඟින් සිදු කරන ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව සම්බන්ධීකරණය අධීක්ෂණය ඒ ඒ විෂයානුබද්ධ සහ ප්‍රාදේශිය වශයෙන් පවතින ගැටළු සාකච්ඡා කිරිම සඳහා කළමණාකාරිත්වය සහ ප්‍රාදේශිය කාර්යාල සමඟ මාසික රැස්විම සංවිධානය කිරිම මඟින් සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය වන්නා වූ ක්‍රියාකාරි රාමුව සැකසිම මෙම අංශය මඟින් සිදු කරයි. ඒ අනුව,

## 7.1 පළාත් කාර්යාල සමඟ සම්බන්ධීකරණය

මධ්‍යම පරිසර අධිකාරියෙහි කටයුතු වඩා විමධ්‍යගත කරනු වස් පළාත් කාර්යාල පිහිටු වන ලද අතර ඒ සඳහා අවශ්‍ය වන්නා වූ විධිමත් සම්බන්ධීකරණ කටයුතු සහ පළාත් කාර්යාල සඳහා අවශ්‍ය ආයතන පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ දාමය ශක්තිමත් කිරිම වස් සුවිශේෂි මෙහෙයක් සැලසුම් හා පසුවිපරම් ඒකකය මඟින් සිදු කරයි.මෙයට අමතරව අදාල අංශය මඟින් ක්‍රියාත්මක සැලසුම් ප්‍රතිපාදනය, පරිසරයට අදාල ව්‍යාපෘති යෝජනා සැලසිම ඒවා ක්‍රියාත්මක කිරිම සහ ඒවා සම්බන්ධිකරණය මෙම අංශය මඟින් සිදුකරයි.

දිස්ත්‍රික්ක මට්ටමින් ව්‍යවසායකයින් සඳහා වඩා විධිමත් සේවා පහසුකම් ප්‍රවර්ධනය කිරිම සඳහා 2016 වර්ෂයේදි මධ්‍යම පරිසර අධිකාරිය යටතෙහි තෝරාගත් දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශිය කාර්යාල 15ක් පිහිටුවා ඇති අතර එම කාර්යාල ගම්පහ, කළුතර, මාතර, මහබන්තොට, නුවරඑළිය, මාතලේ, මොණරාගල, බුත්තල, රත්නපුර, පොලොන්නරුව, මඩකලපුව, අම්පාර, කිලිනොච්චිය, වව්නියාව, මුලතිව් සහ මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි පිහිටුවා ඇත.

## 7.2 පාර්ලිමේන්තු උපදේශන කමිටුව

මේ යටතේ මධ්‍යම පරිසර අධිකාරිය වෙත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් විවිධ අවස්ථා වල ගෙන එන පරිසරයට අදාල පැමිණිලි විමර්ශනය කිරිම සඳහා වූ විශේෂ ව්‍යාපෘති වාර්තා සැලසුම් හා පසුවිපරම් ඒකකය මඟින් සකස් කරයි. එලෙස සකස් කරන ලද වාර්තා පාර්ලිමේන්තු උපදේශන කමිටුව වෙත පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හරහා යොමු කරනු ලබන අතර, එම වාර්තා පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා මූලික වූ පාර්ලිමේන්තු උපදේශන කමිටුවක් හරහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එක්ව අදාල ගැටළු හා වාර්තාව පිළිබඳ සාකච්ඡා කරනු ලබයි.

## 7.3. “ආ” කාණ්ඩයෙහි කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම හා පවත්වාගෙන යාම.

ජාතික පරිසර පනත යටතෙහි විශේෂ ගැසට් ප්‍රකාශයෙහි අංක 1533/16 දරණ 25 16/01/ දින පනත යටතේ 2008 කර්මාන්ත ශාලා හිමියන් විසින් අනිවාර්යයෙන්ම පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම අනිනාර්යය වෙයි. පරිසර පනත යටතෙහි “අ” කාණ්ඩය ලෙස පරිසරයට වැඩි වශයෙන් අපද්‍රව්‍ය මුදාහරින කර්මාන්ත ශාලා ද “ආ” කාණ්ඩය යටතේ, මධ්‍යම ප්‍රමාණයෙන් පරිසරයට අපද්‍රව්‍ය මුදාහරින කර්මාන්ත ද, “ඇ” කාණ්ඩය යටතේ සුළු වශයෙන් පරිසරයට අපද්‍රව්‍ය මුදාහරින කර්මාන්ත ලෙස වර්ගීකරණය කොට ඇත.

මධ්‍යම පරිසර අධිකාරියෙහි පරිසර දූෂණ පාලන ඒකකය මින් “අ” කාණ්ඩයට අයත් කර්මාන්ත ශාලා සඳහා වූ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරිම සම්බන්ධ වූ දත්ත පද්ධතිය පවත්වාගෙන යයි. නමුත් “ආ” කාණ්ඩය යටතෙහි ද එවැනි දත්ත

පද්ධතියක් පවත්වාගෙන යාම ඉතා වැදගත් වෙයි. ඒ යටතෙහි "ආ" කාණ්ඩයෙහි කර්මාන්ත සහා මධ්‍යම පරිසර අධිකාරිය සහ ප්‍රාදේශීය කාර්යාල මින් නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍ර පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම මාසිකව සැලසුම් හා පසුවිපරම් අංශය මින් සිදුකරනු ලබයි. මෙලෙස දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම තුලින් ඉදිරියේ දී එවැනි කර්මාන්ත සහා පරිසර ආරක්ෂණ බලපත්‍ර (EPL) අළුත් කිරීම මෙන්ම පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ දී සහ අළුත් කිරීමේ දී වැදගත් වෙයි. 2016 වර්ෂය අවසන් වන විට පරිසර ආරක්ෂණ බලපත්‍ර 11,837 ක් දත්ත පද්ධතියට ඇතුළත් කිරිමට හැකි වු අතර බී බාණ්ඩයට අයත් දත්ත 1,663ක් දත්තපද්ධතියට ඇතුලත් කරණ ලදි.

## 7.4 තීරණ ගැනිමේ කමිටුව

පරිසර පනත අනුව මධ්‍යම පරිසර අධිකාරිය වෙත නෛතිකව පරිසර බලපෑම් තක්සේරු කිරිමෙහි වාර්තාව (EIA) හා පරිසර ආරක්ෂෂණ බලපත්‍ර (EPL) කර්මාන්තකරුවන් සඳහා නිකුත් කිරිමෙහි බලය පවරා දි ඇත. මිට අමතරව පරිසර ආරක්ෂෂණ බලපත්‍රය (EPL) හා පරිසර බලපෑම් තක්සේරු කිරිමේ වාර්තාව ලබා ගැනිම අනිවාර්ය නොවන නව කර්මාන්ත ස්ථානගත කිරිම සහ ස්වභාවික සම්පත් සම්බන්ධ ව්‍යාපෘති සඳහා නව පිහිටිම නිර්දේශ කිරිමේ ක්‍රියා පටිපාටියක් ද පවති.

පරිසර බලපෑම් තක්සේරු කිරිමෙහි ක්‍රියාවලිය (EIA)සහ පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL) නිකුත් කරන සහ අ කාණ්ඩයේ කර්මාන්ත හැර ඉහත සඳහන් කළ අනිකුත් ක්‍රියාකාරකම් සඳහා පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල මඟින් කටයුතු කරනු ලබයි.

පරිසර පනත යටතේ සපයා ඇති උපදෙස් මත මෙම ක්‍රියාවලියෙහිදි ප්‍රාදේශිය/ දිස්ත්‍රික් කාර්යාල මෙන්ම ප්‍රධාන කාර්යාල ද පොදු එක ආකෘතියක් භාවිතා කිරිමත් අදාල ආකෘති පරික්ෂාව සඳහා එකදු කලයක් යොදා ගැනිමත් අදාල ව්‍යාපෘති යෝජකයා ගෙවිය යුතු සහ ගෙවිමට නියමිත මුදල එක හා සමාන ගස්තුවකට යටත් වීමත් ඉතා වැදගත්වේ.

මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනිමේ ප්‍රධාන අපේක්ෂාව යටතේ මෙම තීරණ ගැනාමේ කමිටුව මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පිහිටුවා ලද අතර එම කමිටුවෙහි මුලිකත්වය අප පරිසර අධිකාරියේ සභාපතිවරයාද, අධ්‍යක්ෂ ජනරාල්වරයාද, පරිසර දූෂණ පාලන ඒකකයෙහි (EPC) හා පරිසර කළමණාකරණ හා ඇගයිම් අංශයෙහි නායෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් ද පරිසර දූෂණ පාලන ඒකකයෙහි (EPC) නීති අංශයෙහි සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශයෙහි අධ්‍යක්ෂවරුන්ද, ඌව, උතුරු මැද සහ උතුරු දිස්ත්‍රික්කයන්හි ස්ථානභාර නිලධාරින්ගෙන් සමන්විත වු කමිටුවක් යටතේ ක්‍රියාත්මක වෙයි.

මෙම කමිටුව සෑම සති දෙකකට වරක් රැස්වන අතර එහි දී පරිසර බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා (EIA) හා ආරම්භක පරිසර බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා (IEE) "අ" කාණ්ඩයෙහි වන ව්‍යාපාර සඳහා බලපත්‍රයක් ද "අ" කාණ්ඩයෙහි කර්මාන්ත සඳහා බලපත්‍රයක් ද, BOI කර්මාන්තශාලා සඳහා නව පරිසර ආරක්ෂණ බලපත්‍ර සඳහා හා නව කර්මාන්තශාලා ස්ථානගත කිරිම සඳහා අවශ්‍ය ස්ථාන අනුමැතිය සඳහා එකඟතාවයන් ද මෙම කමිටුව සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කාර්යාල අධ්‍යක්ෂවරුන්ගේ අවසාන අනුමැතියට යැවීමට පෙර මෙම කමිටුව වෙත යොමු කරනු ලබයි.

පසුගිය වසර තුල මෙවැනි රැස්වීම් 12 ක් සාර්ථක ලෙස පැවැත්වීම සඳහා සැලසුම් හා පසුවිපරම් ඒකකය මඟින් සම්බන්ධීකරණ සහ ලේඛන කටයුතු සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

## 7.5. රැස්වීම්

සැලසුම් හා පසුවිපරම් ඒකකය මඟින් විවිධ වූ රැස්වීම් සම්බන්ධීකරණයෙන් ඉතා සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

## 7.6. ව්‍යාපෘති සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගයීම.

මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන සහ විදේශ ආධාර නිසි පරිදි භාවිතා කිරීම හා ඉන් බලාපොරොත්තු වූ ඉලක්ක සපුරා ගැනීම සඳහා පහත ව්‍යාපෘති වැඩ සටහන් සැලසුම්කරණය හා සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදු කෙරේ.

### 7.6.1. මහා භාණ්ඩාගාර අරමුදල් මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති.

- පිළිසරු ව්‍යාපෘතිය (රු. මිලියන 190)
- මධ්‍යම පරිසර අධිකාරියෙහි විද්‍යාගාර නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (රු. මිලියන 30)
- පරිසර නියමු ව්‍යාපෘතිය රු. මිලියන (රු. මිලියන 20)

### 7.6.2. විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති

- ප්‍රධාන ජලාශ වල ජල තත්ව පසුවිපරම් කිරීමේ ව්‍යාපෘතිය (JICA) (මිලියන 26.5 ක් විදේශීය සහ මිලියන 5 ක් දේශීය)
- ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල යටතේ ක්‍රියාත්මක EDCF ව්‍යාපෘතිය (විදේශ රු. මිලියන 160, දේශීය රු.මිලියන 26)

# 8.0 පැමිණිලි ඒකකය

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමාගේ හා කළමනාකරණ කමිටුවේ අධීක්ෂණය යටතේ මෙම අධිකාරියේ අංශ, ඒකක පළාත් කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල විසින් පාරිසරික පැමිණිලි කළමනාකරණයට අදාල කටයුතු කරනු ලබන අතර, 2016 වසරේදී පැමිණිලි විසදීමේ ක්‍රියාවලියේදී අත්පත් කරගත් ජයග්‍රහණ පහත සාරාංශ ගත කොට ඇත. පැමිණිලි කළමනාකරණය සඳහා වන පරිගණක මෘදුකාංග පද්ධතිය වැඩි දියුණු කිරීමට 2016 වසරේදී සැලසුම් කලද මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා අපේක්ෂිත අරමුණ ඉටුකරගැනිමට නොහැකි විය.

මහජන පැමිණිලි විසදීමේ වගකීම අංශ, ඒකක, පළාත් කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල අතර බෙදී ගොස් ඇති ආකාරය පහත වගුවේ සාරාංශ ගතකොට ඇත.

**TABLE 0.22** පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් ලැබුන පැමිණිලි පිළිබඳ විස්තර

| | ඒකකය / කාර්යාලය | | ලැබුණු පැමිණිලි | | විසදන ලද පැමිණිලි | |
|---|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. | බස්නාහිර පළාත | කොළඹ දිස්ත්‍රික්කය | 499 | 33.2 | 314 | 63 |
| | | කළුතර දිස්ත්‍රික්කය | 431 | | 171 | 38 |
| | | ගම්පහ දිස්ත්‍රික්කය | 447 | 16.0 | 163 | 38 |
| 2. | දකුණු පළාත | ගාල්ල දිස්ත්‍රික්කය | 143 | 11.3 | 124 | 87 |
| | | මාතර දිස්ත්‍රික්කය | 123 | | 57 | 46 |
| | | හම්බන්තොට දිස්ත්‍රික්කය | 51 | | 31 | 61 |
| 3. | ඌව පළාත | බදුල්ල දිස්ත්‍රික්කය | 83 | 5.5 | 68 | 82 |
| | | මොණරාගල දිස්ත්‍රික්කය | 71 | | 64 | 90 |
| 4. | වයඹ පළාත | | 129 | 4.6 | 45 | 35 |
| 5. | සබරගමුව පළාත | රත්නපුර දිස්ත්‍රික්කය | 280 | 18.6 | 204 | 73 |
| | | කෑගල්ල දිස්ත්‍රික්කය | 241 | | 124 | 51 |
| 6. | උතුරු මැද පළාත | අනුරාධපුර දිස්ත්‍රික්කය | 46 | 2.3 | 25 | 54 |
| | | පොළොන්නරුව දිස්ත්‍රික්කය | 19 | | 6 | 32 |
| 7. | මධ්‍යම පළාත | නුවර / නුවරඑළිය දිස්ත්‍රික්ක | 105 | 4.6 | 21 | 20 |
| | | මාතලේ දිස්ත්‍රික්කය | 25 | | 4 | 16 |
| 8. | නැගෙනහිර පළාත | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | 15 | 1.1 | 3 | 33 |
| | | අම්පාර දිස්ත්‍රික්කය | 11 | | 0 | 0 |
| | | මඩකලපුව දිස්ත්‍රික්කය | 5 | | 1 | 20 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 9. | උතුරු පළාත | 14 | 0.5 | 5 | 36 |
| 10. | පරිසර දූෂණ පාලන ඒකකය | 28 | 1.0 | 20 | 71 |
| 11. | අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය | 3 | 0.1 | 0 | 0 |
| 12. | පරිසර බලපෑම් ඇගයීමේ ඒකකය | 27 | 1.0 | 19 | 70 |
| 13. | ස්වභාවික සම්පත් කළමනාකරණ ඒකකය | 6 | 0.2 | 4 | 66 |
| | එකතුව | **2,802** | **100.0** | **1473** | **53** |

**2016 වසරේ ඒකක හා පළාත් කාර්යාල අතර පැමිණිලි බෙදී ගොස් ඇති ආකාරය**




**FIGURE 0-15** ඒකක සහ පලාත් කාර්යාල වෙත ලැබුන පැමිණිලිවල ව්‍යාප්තිය

*සටහන* - 1. මුළු පැමිණිලි සංඛ්‍යාව : 2,802 2. ප්‍රතිශතය ආසන්න පළමු දශමස්ථානයට දක්වා ඇත.

3. 2017.01.13 දිනට අංශ, ඒකක, පළාත් කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල මගින් ලබාදී ඇති දත්ත වගුව හා ප්‍රස්ථාර සකස් කිරීමට භාවිතා කර ඇත.

*යතුර;*

WP-G : ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
SUP : දකුණු පළාත
NCP : උතුරුමැද පළාත
NW : වයඹ පළාත
SAP : සබරගමුව පළාත
EP : නැගෙනහිර පළාත
WP-C&K : කොළඹ හා කළුතර කාර්යාල
EPC : පරිසර දූෂණ පාලන ඒකකය
WM : අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය
NRM : ස්වභාවික සම්පත් කළමනාකරණ ඒකකය
EIA : පරිසර බලපෑම් ඇගයීම් ඒකකය
CP : මධ්‍යම පළාත
NP : උතුරු පළාත

පරිසර අධිකාරියේ ඒකක හා පළාත් කාර්යාල වෙත ලැබුණු පැමිණිලි හා විසඳා ඇති පැමිණිලි.



















Received
Resolved
In progress
#130
81%
19%
progress - CP


Received
Resolved
In progress
#31
87%
13%
progress -EP


Received
Rsolved
In progress
#36
61%
39%
NP


Received
Resolved
In progress
#28
71%
29%
progress - EPC


Received
Resolved
In progress
#27
70%
30%
progress - EIA


Received
Resolved
In progress
#3
100%
00%
progress - WM




**FIGURE 0-16** ඒකක සහ පලාත් කාර්යාල වෙත ලැබුණු සහ විසඳු පැමිණිලි

# 9.0 තොරතුරු තාක්ෂණ ඒකකය

මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය, විද්‍යුත් තැපැල් සේවා, අභ්‍යන්තර පරිගණක ජාලය, දත්ත ගබඩාවන්, පරිගණක දෘඩාංග හා මෘදුකාංග ආදී තොරතුරු තාක්ෂණික මූලාශ්‍ර සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සහ පවත්වාගෙන යාම තොරතුරු තාක්ෂණ ඒකකයේ වගකීම වේ.

**ක්‍රියාකාරකම්**

- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, ප්‍රධාන පරිගණක හා පරිගණක ජාල පද්ධති කළමනාකරණය
- පරිගණකය සහ ජාල සම්බන්ධ ආරක්ෂාව කළමනාකරණය
- මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය යාවත් කාල කිරීම සහ පවත්වාගෙන යාම
- පරිගණක මෘදුකාංග නිපැයුම් පද්ධති, ආයතනයට අනුගත ආකාරයෙන් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම
- පරිගණක දෘඩාංග සහ මෘදුකාං සැපයුම්කරුවන් සමග සම්බන්ධීකරණය සහ තොරතුරු තාක්ෂණය සම්බන්ධ ව්‍යාපෘති කළමනාකරණය
- අධිකාරියේ ව්‍යවසායික ඊමේල් සේවාව පවත්වාගෙන යාම
- අධිකාරියේ පරිගණක සඳහා දෘඩාංග සහ මෘදුකාංග සේවා සැපයීම සහ යාවත්කාල කිරීම
- අධිකාරියේ සමස්ත කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණයට අදාල පරිගණක මෘදුකාංග පද්ධති පිළිබඳව වැඩමුළු සහ සම්මන්ත්‍රණ මෙහෙයවීම.

**ජයග්‍රහණ**

- අධිකාරියේ කටයුතු කාර්යක්ෂම කර ගැනීමට අභ්‍යන්තර භාවිතය සඳහා පරිගණක ඒකකය මඟින් පරිගණක දත්ත පද්ධති හා මෘදුකාංගයන් නිර්මාණය කිරීම, පවත්වා ගෙන යාම හා ඒ ආශ්‍රිතව පැන නගින ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා සහය වීම. ( දුරකතන මාර්ග හරහා හෝ අදාල ස්ථානයට ගොස්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම )
- අධිකාරියේ නිලධාරීන්ගේ වෛද්‍ය රක්ෂණ ආවරණ පිළිබඳ මෘදුකාංගය
- අධිකාරියේ ඉහළ නිලධාරීන්ගේ දුරකතන ගෙවුම් ආශ්‍රිත මෘදුකාංගය
- පාරිසරික බලපෑම් ඇගැයීම් ආශ්‍රිත මෘදුකාංගය
- පරිසර ආරක්ෂණ බලපත් නිකුත් කිරීමේ ක්‍රියාවලියට අදාල මෘදුකාංගය

- අධිකාරියේ නිලධාරීන්ගේ වෛද්‍ය රක්ෂණ ආවරණ පිළිබඳ මෘදුකාංගය (Medical Insurance Claiming System)

අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල වල සේවයේ නියුතු සියළුම නිලධාරීන් හට සපයන වෛද්‍ය රක්ෂණ ආවරණ පිළිබඳ උසස් සේවයක් ලබා දීම හා එම කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාම මෙම මෘදුකාංගය නිර්මාණය කිරීමේ අරමුණ වශයෙන් දක්විය හැක. මෙමඟින් සියළුම නිලධාරීන් හට සිය වෛද්‍ය රක්ෂණ ආවරණ පිළිබඳ විස්තරයන් අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක ලබා ගැනීමේ හැකියාවද පවතී.

අධිකාරියේ ඉහළ නිලධාරීන්ගේ දුරකතන ගෙවුම් ආශ්‍රිත මෘදුකාංගය (Officers Telephone Payment System)

අධිකාරියේ ඉහළ නිලධාරීන්ගේ දුරකතන ගෙවීම් කටයුතු පහසුකර ගැනීම සඳහා මෙම මෘදුකාංගය නිර්මාණය කර ඇත.

- පාරිසරික බලපෑම් ඇගැයීම් ආශ්‍රිත මෘදුකාංගය (EIASYS : Environmental Impacts Assessment System)

ජාතික පරිසර පනත යටතේ පාරිසරික බලපෑම් ඇගැයීම ක්‍රියාත්මක කිරීම පහසු කර ගැනීමේ අරමුණින් පාරිසරික බලපෑම් ඇගැයීම ක්‍රියාත්මක කිරීමට අදාල ක්‍රියාවලිය ආශ්‍රය කරගනිමින් මෙම මෘදුකාංගය නිර්මාණය කර ඇත.

- පරිසර ආරක්ෂණ බලපත් නිකුත් කිරීමේ ක්‍රියාවලියට අදාල මෘදුකාංගය (EPL SYSTEM – Environmental Protection License System)

පරිසර දූෂණය වැළැක්වීම හා ඒ සම්බන්ධ ගැටළු පාලනය කිරීමේ අරමුණින් පරිසර ආරක්ෂණ බලපත් නිකුත් කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන අතර, එම කටයුතු පහසු කර ගැනීමේ අරමුණින් මෙම මෘදුකාංගය නිර්මාණය කර ඇත.

- අප ඒකකය මගින් සකස් කර හඳුන්වා දෙන ලද මෘදුකාංග පද්ධති අවශ්‍ය වූ විට යාවත්කාලින කිරීම හා පළාත් / ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ නිලධාරින් සඳහා පුහුණු වැඩමුලු පැවැත්වීම.
- වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම. (වෙබ් අඩවියේ පළවන පුවත් හා ආයතයට සම්බන්ධ වැඩසටහන් පිළිබඳව තොරතුරු හා අනෙකුත් විස්තර ඇතුලත් කිරීම.)
- අධිකාරියේ විද්‍යුත් තැපැල(Email) ස්ථාපිත කිරීම හා එය පවත්වාගෙන යාම.

- පරිගණක, ලැප්ටොප් හා මුද්‍රණ යන්ත්‍ර ජාලයට සම්බන්ධ කිරීම හා මුද්‍රණ කටයුතු ජාලය තුලින් ලබාගැනීමට සකස් කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ හා පලාත් කාර්යාලවල පරිගණක භාවිතා කරන්නන් විසින් භාවිතයේදී ඇතිවන දෝෂ විසඳීම.
- (දුරකතන මාර්ග හරහා හෝ අදාල ස්ථානයට ගොස්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම)
- පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර හා යුපිස් යන්ත්‍ර අලුත්වැඩියාව හා නඩත්තු කිරීම. නව පරිගණක හා ලැප්ටොප් සඳහා මෘදුකාංග ස්ථාපිත කිරීම.
- තොරතුරු තාක්ෂණ ඒකකය පුළුල් කිරීම -මීට ඉහත දී මෙම අංශයේ කටයුතු ඉතා සීමිත ඉඩක සිදුකරණුලැබූ අතර, එමගින් මෙම අංශයේ ඵලධායීතාවට දැඩි බලපෑමක් එල්ලවී තිබුණි. එබැවින් තොරතුරු තාක්ෂණ ඒකකය පුළුල් කිරීම ආරම්භකර ක්‍රියාත්මක වෙමින් පවතී.
- මීට අමතරව මීට ඉහත දී සර්ව කාමරයක් නොතිබුණු අතර එය සකස් කිරීම ද ආරම්භ කර ඇත. එය නවීන යූ.පී.එස් යන්ත්‍රයකින් සමන්විත වේ.

# 10.0 අභ්‍යන්තර විගණන ඒකකය

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති යටතේ ස්ථාපිත අභ්‍යන්තර විගණන ඒකකයේ කාර්ය හා විෂය පථය අධිකාරියේ සභාපති විසින් තීරණය කරනු ලබයි. අභ්‍යන්තර විගණන ඒකක විසින් සිදු කරනු ලබන මූල්‍ය මෙන්ම මූල්‍ය නොවන හා මෙහෙයුම් පිළිබඳව විගණන පරීක්ෂා කිරීම් මගින් සොයා ගැනීම් හා නිරීක්ෂණ සභාපති වෙත සෘජුවම වාර්තා කරනු ලබන අතර එහි කටයුතුවල පූර්ණ අධීක්ෂණයක් සභාපති මගින් සිදුකෙරේ.

## 10.1 අභ්‍යන්තර විගණක ඒකකයේ කාර්ය හා විෂය පථය

- ගණකාධිකරණ හා අභ්‍යන්තර පාලන ක්‍රියා පිළිවෙල පිළිබඳව සමාලෝචනය.
- මූල්‍ය හා මෙහෙයුම් තොරතුරු විමර්ෂණය කිරීම.
- ආයතනයේ මෙහෙයුම් කටයුතු වල ආර්ථික බව, කාර්යක්ෂමතාවය හා ඵලදායිතාව පිළිබඳව මූල්‍ය
- හා මූල්‍ය නොවන පාලනයන් පිළිබඳ සමාලෝචනය කිරීම.
- ආයතනයේ අභ්‍යන්තර හා භාහිර නීති රෙගුලාසි, කළමනාකරණ ප්‍රතිපත්ති හා මහ පෙන්වීම්
- ක්‍රියාත්මක කෙරේදැයි පරීක්ෂා කිරීම.
- කළමනාකරණය විසින් අවස්ථානුකූලව පවරන ලද විශේෂ විමර්ෂන.

## 10.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

1999 නොවැම්බර් මස 19 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ පී.එෆ්./පී.ඊ.3 අනුව මධ්‍යම පරිසර අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත. කාර්තුමය වශයෙන් කමිටුව රැස්වන අතර, 2016 වර්ෂයේ විගණන කමිටුවේ සභාපති ධුරය දරනු ලබුයේ භාණ්ඩාගාරයේ ව්‍යාපෘති කළමනාකරණ හා මෙහෙයුම් අංශයේ සහකාර අධ්‍යක්ෂිකා අනුෂියානාදන් මහත්මියයි. 2016 මුදල් වර්ෂය තුළ අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂිකා අනුෂියානාදන් මහත්මියගේ සභාපතීත්වයෙන් පවත්වන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්, පරිපාලන හා මුදල්), අධ්‍යක්ෂ (මුදල්), අධ්‍යක්ෂිකා (මෙහෙයුම් හා සැළසුම්) සකච්ඡා කෙරෙන විෂයයට අදාල අධ්‍යක්ෂවරුන් හා ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහකාර විගණකාධිපති, විගණන අධිකාරි සහ පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණනද සහභාගි විය. මධ්‍යම පරිසර අධිකාරියේ අභ්‍යන්තර විගණක මෙම කමිටුවේ කැඳවුම්කරු ලෙස ක්‍රියාකරයි. විගණන හා කළමනාකරණ කමිටුවේ නිරීක්ෂණ හා තීරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය තීරණ ගැනිම සඳහා යොමු කරන ලදී.

2016 වර්ෂයේ විගණන වාර්තා තුළින් පැන නැගුණු පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.

1. ප්‍රාදේශීය පරිසර නිලධාරීන්ගේ රාජකාරියේ යේදීම හා ඵලදායීතාවය පිළිබඳව පරීක්ෂා කිරීම.
2. අධිකාරියට යොමු කෙරෙන පරිසර පැමිණිලි විසඳීම සම්බන්ධයෙන් පළාත් කාර්යාල ක්‍රියාකර ඇති ආකාරය හා පරිසර පැමිණිලි වාර්තා කිරීම සඳහා පළාත් කාර්යාල හී ස්ථාපිත පරිගණක දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
3. අධිකාරියේ පරිසර බලපත්‍ර නිකුත් කිරීම හා කර්මාන්ත සම්බන්ධයෙන් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම පරීක්ෂා කිරීම.
4. මූලික පරිසරික පරීක්ෂණ පැවැත් විමේදි හා නිර්දේශ ඉදිරිපත් කිරිමේදි අඩු පාඩු පිළිබඳව අවධානය යොමු කිරීම
5. අධිකාරියේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු පිළිබඳව අවධානය යොමු කිරීම.
6. අධිකාරියේ අභ්‍යන්තර පරිපාලන හා අනෙකුත් දුර්වලතා පිළිබඳව මතුකර පෙන්විම.
7. විශේෂ විමර්ෂන වලින් හඳුනාගත් අභ්‍යන්තර පාළන ක්‍රම ඉදිරිපත් කිරීම.

# 11.0 මධ්‍යම පරිසර අධිකාරියේ විමධ්‍යගතකරණ වැඩ පිළිවෙල

## 11.1 මධ්‍යම පරිසර අධිකාරියේ බලය පළාත් කාර්යාල වෙත විමධ්‍යගතකරණය කිරීම.

මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රධාන කාර්යාලය වශයෙන්, ජාතික ප්‍රමිතීන්, මිනුම් දඬු ප්‍රකාශයට පත් කිරීම හා අවශ්‍ය මාර්ගෝපදේශ පිළියෙල කිරීම ජාතික වශයෙන් සිදු කරන අතර ප්‍රාදේශීය වශයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ඉලතල ක්‍රියාත්මක කිරීම සඳහා 2002 වසරේ දී මධ්‍යම හා දකුණු පළාත සඳහා ප්‍රාදේශීය කාර්යාල දෙකක් පිහිටුවිය.

2002 වසරේ එසේ ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමෙන් ලබා ගන්නා ලද අත්දැකීම මත එම වැඩ පිළිවෙල මුළු දිවයින පුරා ව්‍යාප්ත කරන ලද අතර, 2007 වසර වන විට සියළුම පළාත් පාදක කොට ගෙන පළාත් කාර්යාල පිහිටුවා, පරිසර කළමනාකරණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාවට නංවා ඇත.

ඒ අනුව, ජාතික පාරිසරික පනත යටතේ පැවරී ඇති බලතල වලින් කොටසක් මෙම පළාත් කාර්යාල ප්‍රධානීන් වෙත මධ්‍යම පරිසර අධිකාරිය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පවරන ලදි.

## 11.2. පළාත් පාලන ආයතන වෙත බලතල විමධ්‍යගත කිරීම

උප ප්‍රාදේශීය මට්ටමෙන් මධ්‍යම පරිසර අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලය පවරාදීමේ වගන්ති ජාතික පාරිසරික පනත මඟින් සම්පාදනය කොට ඇත.

ඒ අනුව, එකී පනතේ 26 වන වගන්තිය අනුව, මධ්‍යම පරිසර අධිකාරිය සතු බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට, පළාත් පාලන ආයතනයකට හෝ රජයේ යම් නිලධාරියෙකුට පවරා දෙනු ලැබිය හැකිය. 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතින් පවරා ඇති බලතල අනුව අනුව, අධිකාරියේ කටයුතු ප්‍රාදේශීය මට්ටමින් විමධ්‍යගත කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත.

මේ වගන්තිය අනුව, 1993 වසරේ දී මධ්‍යම පරිසර අධිකාරියේ බලතල වලින් යම් කොටසක් පළාත් පාලන ආයතන වලට පවරා දීමේ මූලික කටයුතු සිදු කරන ලද අතර, 1994.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි සුළු පරිමාණ කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල හා තවත් කටයුතු 12 ක් සඳහා බලතල පළාත් පාලන ආයතන වෙත එනම්, මහ නගර සභා, නගර සභා හෝ ප්‍රාදේශීය සභා වෙත පවරන ලදි.

1993 වසරේ දී සුළු පරිමාණ කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා විමධ්‍යත කරන ලද බලතල නැවත පවරාගෙන 2000 අංක 53 දරන සංශෝධිත පවතින් ප්‍රකාශයට පත් කරන ලද, 1159/22 දරන ගැසට් නිවේදනයට අනුව, එම ගැසට් නිවේදනයේ ‘ආ’ කාණ්ඩයට අයත් කර්මාන්ත / කටයුතු 45 ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල එම පළාත් පාලන ආයතන වෙත පවරා දෙන ලදි.

ඉන්පසු නැවතත්, අංක 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නියමිත කටයුතු ‘අ’ , ‘ආ’ සහ ‘ඇ’ වශයෙන් කාණ්ඩ තුනක් යටතේ ප්‍රකාශයට පත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස 2008 පෙබරවාරි 14 දින පළාත් පාලන ආයතන වෙතපවරා තිබූ බලතල නැවතත් මධ්‍යම පරිසර අධිකාරියට පවරා ගන්නා ලද අතර, 2008.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත ගැසට් නිවේදනයේ ‘ආ’ කාණ්ඩයට අයත් නියමිත කටයුතු සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල නැවතත්, පළාත් පාලන ආයතන වලට පවරා දෙන ලද අතර, එම ආයතන ඒ අනුව කටයුතු කරන ලදි.

## 11.3 දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීම් කමිටුව (DELEC)

- 1995 වසරේ දී දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීමේ කමිටුව නමින්, කමිටු සෑම දිස්ත්‍රික්කයක් පාසාම පිහිටුවීමේ පරිපාලනමය ක්‍රියාවට නංවන අතර, මෙම කමිටුවේ සභාපති වශයෙන් අදාල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කටයුතු කරයි.
- මෙම කමිටුවේ අනිකුත් සාමාජිකයන් වනුයේ;
- සෞඛ්‍ය සේවා පළාත් අධ්‍යක්ෂ
- ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
- දිසා වන නිලධාරී
- පළාත් පාලන සහකාර කොමසාරිස්
- වන ජීවී දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ප්‍රධානී
- දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන්
- එම පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන ප්‍රධානීන්
- එම පරිපාලන දිස්ත්‍රික්කයේ රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින්

මෙම කමිටුවේ ලේකම් වශයෙන් ප්‍රාදේශීය පරිසර නිලධාරියෙක් කටයුතු කරනු ඇත.

එසේම අවශ්‍යතාවය මත මෙම කමිටුව සඳහා වෙනත් සාමාජිකයන් හා නියෝජිතයන් පත් කළ හැකිය.

මෙම කමිටුවේ ප්‍රධාන කාර්ය භාරය වනුයේ, මහජනයාගෙන් ලැබෙන්නා වූ පාරිසරික වැරදි හෝ අක්‍රමිකතා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කර, ඊට අදාල ක්‍රියාත්මක කළ යුතු නිර්දේශයන් අදාල ආයතන වන පොලීසිය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ පළාත් ආයතන ලවා සිදුකරවීමය.

මෙම කමිටුවේ මූලික කර්තව්‍යය වනුයේ, මහජනයාගෙන් ලැබෙන්නා වූ පාරිසරික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීමය.

මෙම කමිටු රැස්වීම් සෑම මසකම, සෑම දිස්ත්‍රික්කයකම, දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබයි.

මධ්‍යම පරිසර අධිකාරියේ විමධ්‍යගතකරණ වැඩ සටහන

# 12.0 මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීයකරණ වැඩ පිළිවෙල

## 12.1. හැඳින්වීම

පරිසර ආරක්ෂණය සඳහා පළාත් කාර්යාල වෙත පවරා ඇති බලතල අතරින් ප්‍රධානතම නෛතික ක්‍රියාවලිය වනුයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේ. මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී ජාතික වශයෙන් පනවා ඇති, අපද්‍රව්‍ය පිට කිරීම සඳහා වූ ප්‍රමිතීන් හා උපමාන, වායු විමෝචන හා ශබ්ද මට්ටම් අනුව ක්‍රියාත්මක කිරීම තුලින් පාරිසරික ආරක්ෂාව මෙම බලපත්‍ර ක්‍රමය තුලින් තහවරු කෙරේ. ශ්‍රී ලංකාවේ වර්තමානය දෙස බැලීමේ දී පෙනී යන්නේ මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය හඳුන්වා දීමට ප්‍රථම එනම්, මීට දශක දෙකකට හෝ තුනකට පෙර ස්ථානගත කරන ලද කර්මාන්ත වලින් විශාල වශයෙන් පාරිසරික ගැටළු ඇතී වී තිබෙන බවය.

කාර්මික අපසායන්ද (පිලියම් කල හෝ නොකළ) ආසන්නතම ජල ප්‍රවාහ වන ගංගා, වැව් සහ මුහුද වැනි නිදහස් පරිසරයට මුදාහැරීම සාමාන්‍යයෙන් සිදු වේ. ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය විසින් පොදු මහජනතාවගේ ඉල්ලුම සඳහා අවශ්‍ය වන ජලය සපයා ගනු ලබන්නේ ගංගා වලිනි. එහෙයින් අපද්‍රව්‍ය ජල මූලාශ්‍ර වලට මුදා හැරීම විශාල ප්‍රශ්නයක් වී ඇත. පොදු ජනතාවගේ පානීය ජල ප්‍රභව අපවිත්‍ර වීම කෙරෙහි මතුපිට ජල දූෂණයට අමතරව භූගත ජල දූෂණය ද බලපානු ලබයි.

පරිසරයට අපද්‍රව්‍ය මුදා හැරීම සම්බන්ධව වර්තමානයේ පවතින ප්‍රමිතීන් මඟින් භූගත ජලය නැවත පිරීම සහ එහි ආරක්ෂාව යන කරුණු ආවරණය නොවේ.

නෛතිකව බැඳී පවතින නිකුත් කරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍රයන්හි නිර්දේශිත ක්‍රියාකාරකම් අඩංගු වී ඇත. එහෙයින් පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් තුලින් නිකුත් කරන්නා වූ කොන්දේසි කඩකිරීම ජාතික පාරිසරික පනත අනුව දඬුවම් ලැබිය හැකි වරදකි. නිර්දේශිත ක්‍රියාකාරකම් වලින් වැඩි සංඛ්‍යාවක් බස්නාහිර පළාත තුල පිහිටා ඇත. මධ්‍යම පරිසර අධිකාරිය සතුව ඇති දත්ත අනුව මහා පරිමාන හා මධ්‍යම පරිමානයෙන් පරිසර දූෂණයට දායක වන කර්මාන්තශාලා වලින් 37% ක් බස්නාහිර පළාත තුල පිහිටා ඇත. මධ්‍යම පළාතේ එම අගය 10% ක් වන අතර සහ දකුණු පළාතේ එම අගය 13% සහ 40% ක් වන ඉතිරිය අනකුත් පළාත් වන සබරගමුව, නැගෙනහිර, උතුරු මැද, ඌව, උතුර සහ වයඹ පළාත් වල පිහිටා ඇත. මෙම කර්මාන්ත සමීක්ෂණය අදාල පළාත් වල පරිසර නිලධාරීන් විසින් කරන ලද අතර, ඒ සඳහා මඟ පෙන්වීම් පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් ලබාදෙන ලදී.

නිර්දේශිත ක්‍රියාකාරකම් සඳහා නිකුත් කරන පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අළුත් කළ යුතු වේ. එමෙන්ම, යම් කර්මාන්ත කරුවෙක් තම බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට පටහැනි ලෙස ක්‍රියාකර ඇති බව ඔප්පු වුවහොත් එම බලපත්‍ර අවලංගු කිරීමේ බලතල ද අධිකාරිය සතු වේ. එම අවලංගු කිරීමකින් පසු යම් කෙනෙක් අභියාචනාවක් ඉදිරිපත් කරන්නේ නම්, පාරිසරික අමාත්‍යාංශයේ ලේකම්වරයාට එය ඉදිරිපත් කළ යුතු අතර, එතුමාගේ තීරණය ඒ සම්බන්ධයෙන් වූ අවසාන තීරණය වේ.

## 12.2 පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාපටිපාටිය

2016 වර්ෂයේ දී "අ" කාණ්ඩයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 1,240 ක් සහ "ආ" කාණ්ඩයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 969 ක් අලුතින් නිකුත් කර ඇති අතර "අ" කාණ්යේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 5,975 ක් සහ "ආ" වර්ගයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 1,180 ක් අළුත් කරන ලදී.

TABLE 0.23 පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාපටිපාටිය පලාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම

| පලාත | දිස්ත්‍රික්කය | නිකුත්කල බලපත්‍ර සංඛ්‍යාව | | | | | | අළුත්කල බලපත්‍ර සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2014 | | 2015 | | 2016 | | 2014 | | 2015 | | 2016 | |
| | | "A" | "B" | "A" | "B" | "A" | "B" | "A" | "B" | "A" | "B" | "A" | "B" |
| බස්නාහිර | කොළඹ | 525 | 341 | 311 | 218 | 219 | 91 | 932 | 226 | 834 | 181 | 1392 | 170 |
| | ගම්පහ | 305 | 315 | 231 | 161 | 226 | 83 | 407 | 40 | 716 | 115 | 598 | 160 |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කළුතර | 168 | 112 | 147 | 91 | 61 | 46 | 350 | 102 | 282 | 65 | 335 | 91 |
| මධ්‍යම | නුවර | 195 | 146 | 80 | 44 | 39 | 40 | 186 | 66 | 404 | 71 | 321 | 57 |
| | මාතලේ | 118 | 29 | 46 | 24 | 21 | 13 | 77 | 20 | 204 | 52 | 181 | 47 |
| | නුවරඑලිය | 25 | 38 | 06 | 10 | 04 | 02 | 54 | 9 | 41 | 04 | 65 | 02 |
| දකුණු | ගාල්ල | 125 | 135 | 50 | 60 | 32 | 64 | 178 | 56 | 161 | 74 | 246 | 65 |
| | මාතර | 131 | 77 | 15 | 17 | 36 | 54 | 156 | 36 | 167 | 101 | 327 | 92 |
| | හම්බන්තොට | 95 | 68 | 19 | 36 | 48 | 44 | 92 | 26 | 184 | 30 | 174 | 29 |
| සබරගමුව | කෑගල්ල | 108 | 202 | 109 | 101 | 42 | 67 | 76 | 50 | 348 | 95 | 218 | 70 |
| | රත්නපුර | 141 | 199 | 107 | 99 | 67 | 100 | 61 | 49 | 267 | 73 | 417 | 78 |
| උතුරුමැද | අනුරාධපුරය | 169 | 51 | 119 | 16 | 89 | 30 | 167 | 62 | 181 | 19 | 213 | 38 |
| | පොලොන්න | 119 | 105 | 09 | 08 | 22 | 21 | 26 | 8 | 99 | 14 | 86 | 31 |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 104 | 45 | 08 | 22 | 31 | 17 | 29 | 11 | 127 | 49 | 147 | 23 |
| | අම්පාර | 170 | 140 | 10 | 15 | 40 | 24 | 25 | 39 | 110 | 54 | 293 | 59 |
| | මඩකලපුව | 116 | 117 | 13 | 19 | 05 | 17 | 27 | 26 | 98 | 42 | 122 | 65 |
| | වවුනියාව | 145 | 50 | 21 | 31 | 39 | 40 | 62 | 19 | 151 | 34 | 193 | 25 |
| | මන්නාරම | 90 | 74 | 14 | 19 | 17 | 30 | 35 | 17 | 99 | 23 | 184 | 17 |
| ඌව | බදුල්ල | 138 | 76 | 25 | 11 | 47 | 44 | 73 | 30 | 106 | 11 | 226 | 31 |
| | මොනරාගල | 27 | 125 | 16 | 14 | 05 | 13 | 1 | 0 | 15 | 0 | 49 | 06 |
| උතුරු | යාපනය | 31 | 40 | 0 | 18 | 10 | 07 | 11 | 0 | 11 | 0 | 36 | 0 |
| | කිලිනොච්චිය | 57 | 15 | 0 | 0 | 14 | 19 | 33 | 11 | 0 | 0 | 70 | 0 |
| | මුලතිවු | 67 | 106 | 59 | 80 | 20 | 12 | 3 | 1 | 31 | 05 | 33 | 1 |
| වයඹ | කුරුණෑගල | 5 | 7 | 107 | 136 | 72 | 75 | 0 | | 0 | 01 | 40 | 20 |
| | පුත්තලම | 1 | 2 | 27 | 24 | 34 | 16 | 0 | | 01 | 01 | 09 | 3 |
| එකතුව | | 3175 | 2615 | 1549 | 1274 | 1240 | 969 | 3061 | 904 | 4637 | 1114 | 5975 | 1180 |

## 12.3 නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම

යම් ස්ථානයක නව කර්මාන්තයක් ස්ථානගත කිරීමට ප්‍රථම අධිකාරියේ නිර්දේශය ලබා ගැනීම මූලික අවශ්‍යතාවන් වන අතර එමගින් එම කර්මාන්තය නුසුදුසු ප්‍රදේශයක ස්ථානගත වීම වැළැක් වේ. මෙම පාරිසරික නිර්දේශ නිකුත් කිරීම තුලින් නුසුදුසු ස්ථානයන් හි නුදුසු කර්මාන්ත ස්ථානගත කිරීම වළක්වාගත හැකි වී තිබෙන අතර මේ නිසා කර්මාන්තකරුවන්ට නියම ස්ථානයේ නියම කර්මාන්තය අදාල පරිසර දූෂණ පාලන පිරිවිතරයන් අනුගමනය කිරීම තුලින් ස්ථානගත කිරීමට හැකියාව ලැබී ඇති නිසා ඔවුන්ටද විශාල වශයෙන් ප්‍රතිලාභ අත් වී තිබේ. එමෙන්ම සුදුසු ස්ථානයන්හි සුදුසු කර්මාන්ත ස්ථානගත කිරීම තුලින් අසල්වාසීන්ටද පරිසර දූෂණයෙන් හෝ මහජන පීඩාවන්ගෙන් තොරව වාසය කිරීමේ හැකියාව ලැබී ඇත. කෙසේ වෙතත් 2015 වර්ෂයේ දී නව කර්මාන්ත 80 ක් පමණ වන ක්‍රියාකාරකම්

සඳහා නිර්දේශ නිකුත් කලදි එය 2016 වසර වන විට සම්පූර්ණ නිර්දේශ කිරීම සඳහා ඉල්ලීම් 2ල291ක් ඉදිරිපත් වුව ද එයින් අනුමාන කිරිම් 1ල558 ක් ද ප්‍රතික්ෂේප කිරීම් 112 ක්ද වාර්ථාකල හැක. මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල ස්ථාපනය කිරීමෙන් පසු නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ ලබා දීම එම කාර්යාල මඟින් සිදු කරනු ලැබේ.නව කර්මාන්ත පිහිටුවීම සඳහා නිර්දේශ ලබා ගැනීම

**TABLE 0.24** නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම

| පලාත | දිස්ත්‍රික්කය | ලැබුන අයදුම්පත් ගණන | | | අනුමත කරන ලද ප්‍රමාණය | | | ප්‍රතික්ෂේප කළ ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2014 | 2015 | 2016 | 2014 | 2015 | 2016 | 2014 | 2015 | 2016 |
| බස්නාහිර | කොළඹ | 141 | 163 | 153 | 94 | 175 | 104 | 0 | 0 | 0 |
| | ගම්පහ | 199 | 176 | 202 | 11 | 45 | 136 | 0 | 01 | 5 |
| | කළුතර | 97 | 169 | 205 | 72 | 82 | 118 | 4 | 06 | 9 |
| මධ්‍යම | නුවර | 76 | 86 | 121 | 49 | 46 | 66 | 6 | 04 | 11 |
| | මාතලේ | 51 | 81 | 93 | 54 | 48 | 53 | 3 | 0 | 05 |
| | නුවරඑලිය | 12 | 05 | 15 | 9 | 03 | 04 | 0 | 0 | 0 |
| දකුණු | ගාල්ල | 98 | 76 | 112 | 75 | 67 | 67 | 6 | 06 | 14 |
| | මාතර | 65 | 40 | 63 | 64 | 29 | 32 | 8 | 07 | 06 |
| | හම්බන්තොට | 35 | 33 | 67 | 20 | 17 | 48 | 0 | 03 | 05 |
| සබරගමු | කෑගල්ල | 73 | 98 | 138 | 60 | 59 | 62 | 1 | 01 | 03 |
| | රත්නපුර | 40 | 77 | 118 | 53 | 44 | 118 | 0 | 0 | 34 |
| උතුරුමැද | අනුරාධපුරය | 78 | 79 | 128 | 25 | 26 | 65 | 4 | 01 | 02 |
| | පොලොන්නරුව | 34 | 29 | 33 | 9 | 13 | 13 | 0 | 0 | 07 |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 18 | 14 | 04 | 17 | 14 | 08 | 3 | 0 | 0 |
| | අම්පාර | 18 | 33 | 34 | 23 | 38 | 35 | 5 | 01 | 0 |
| | මඩකලපුව | 69 | 72 | 76 | 82 | 49 | 63 | 0 | 02 | 0 |
| | මන්නාරම | 63 | 37 | 70 | 32 | 32 | 45 | 7 | 05 | 02 |
| | වවුනියාව | 32 | 42 | 62 | 28 | 25 | 51 | 0 | 01 | 01 |
| | බදුල්ල | 72 | 74 | 58 | 47 | 35 | 32 | 0 | 02 | 0 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඌව | මොනරාගල | 66 | 124 | 111 | 60 | 110 | 85 | 0 | 04 | 02 |
| උතුරු | යාපනය | 145 | 67 | 83 | 136 | 66 | 71 | 0 | 0 | 0 |
| | කිලිනොච්චිය | 17 | 16 | 26 | 16 | 16 | 20 | 0 | 0 | 01 |
| | මුලතිවු | 40 | 34 | 53 | 27 | 17 | 39 | 1 | 0 | 0 |
| වයඹ | කුරුණෑගල | 23 | 214 | 188 | 10 | 194 | 182 | 0 | 01 | 02 |
| | පුත්තලම | 22 | 38 | 78 | 7 | 28 | 41 | 0 | 0 | 03 |
| එකතුව | | 1584 | 1877 | 2291 | 1080 | 1278 | 1558 | 48 | 45 | 112 |

## 12.4. පරිසර දූෂණය, ඉන් ඇතිවන පීඩාව සහ ස්වාභාවික සම්පත් අධිපරිභෝජනය සම්බන්ධ මහජන පැමිණිලි විසඳීම.

2016 වසරේ දී කර්මාන්ත වලින් සිදුවන්නා වූ දූෂණයට අදාල පැමිණිලි 2,120 ක් සහ ස්වාභාවික සම්පත් අනිසි ලෙස පරිහරණය කිරීමට අදාල පැමිණිලි 549 ක් වශයෙන් පැමිණිලි 2,579 ක් පළාත් කාර්යාල මඟින් හසුරුවා ඇත.

ඒ ඒ පළාත් කාර්යාල බල ප්‍රදේශය තුල සිටින්නා වූ මහජනායාගෙන් ලැබෙන පාරිසරික පැමිණිලි සම්බන්ධයෙන් එනම්, කර්මාන්තයක් පවත්වාගෙන යාමෙන් ඇති වන්නා වූ පාරිසරික දූෂණ හෝ වෙනත් යම් කටයුත්තක් පවත්වාගෙන යාමෙන් ඇතිවන්නා වූ පාරිසරික දූෂණ හෝ ස්වාභාවික සම්පත් අනිසි ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් ලැබෙන්නා වූ මහජන පැමිණිලි සම්බන්ධයෙන් පළාත් කාර්යාල විසින් කටයුතු කරනු ලැබේ. මෙසේ ලැබෙන පාරිසරික පැමිණිලි බෝහෝ විට සුදුසු පියවර ගැනීම සඳහා අදාළ ආයතනවලට යොමු කරන ලද අතර, මධ්‍යම පරිසර අධිකාරියට ඒ සම්බන්ධව පරීක්ෂණයක් කිරීමට අවශ්‍ය යැයි හැඟේ නම්, ඒ පිළිබඳව සිදු කරන්නා වූ ස්ථානීය පරීක්ෂණයකින් පසු අදාල පරිසර දූෂණය හෝ මහජන පීඩාව අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී.

Table 0.25 2016 වසර තුලදී හසුරුවන ලද පැමිණිලි

| දිස්ත්‍රික්කය | ලැබුන පැමිණිලි ප්‍රමාණය | | විසඳන ලද පැමිණිලි ප්‍රමාණය | | වෙනත් ආයතන සඳහා යොමුකල පැමිණිලි ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| | EPC | NRM | EPC | NRM | |
| කොළඹ | 501 | 22 | 0 | 0 | 0 |
| ගම්පහ | 393 | 53 | 57 | 08 | 24 |
| කළුතර | 335 | 66 | 11 | 03 | 14 |
| නුවර | 103 | 51 | 38 | 18 | 41 |
| මාතලේ | 16 | 02 | 02 | 02 | 01 |
| නුවරඑළිය | 07 | 01 | 02 | 02 | 01 |
| ගාල්ල | 87 | 48 | 58 | 39 | 24 |
| මාතර | 115 | 29 | 06 | 03 | 07 |
| හම්බන්තොට | 47 | 01 | 13 | 0 | 01 |
| කෑගල්ල | 168 | 61 | 79 | 33 | 0 |
| රත්නපුර | 79 | 138 | 39 | 54 | 18 |

| දිස්ත්‍රික්කය | ලැබුන පැමිණිලි ප්‍රමාණය | | විසඳන ලද පැමිණිලි ප්‍රමාණය | | වෙනත් ආයතන සඳහා යොමුකල පැමිණිලි ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| | EPC | NRM | EPC | NRM | |
| අනුරාධපුරය | 58 | 01 | 10 | 1 | 0 |
| පොලොන්නරුව | 1 | 0 | 0 | 0 | 0 |
| ත්‍රිකුණාමලය | 10 | 0 | 3 | 0 | 0 |
| අම්පාර | 13 | 02 | 3 | 0 | 0 |
| මඩකලපුව | 15 | 02 | 4 | 2 | 0 |
| මන්නාරම | 2 | 1 | 1 | 0 | 0 |
| වවුනියාව | 3 | 0 | 1 | 0 | 1 |
| බදුල්ල | 26 | 38 | 7 | 15 | 0 |
| මොනරාගල | 29 | 20 | 17 | 10 | 3 |
| යාපනය | 38 | 01 | 19 | 03 | 9 |
| කිලිනොච්චිය | 06 | 06 | 0 | 03 | 4 |
| මුලතිවු | 01 | 01 | 01 | 01 | 0 |
| කුරුණෑගල | 51 | 02 | 26 | 01 | 0 |
| පුත්තලම | 16 | 03 | 06 | 01 | 0 |
| එකතුව | 2,120 | 549 | 403 | 199 | 148 |

## 12.5. ISO 14000 තත්ත්ව සහතිකකරණය පිළිබඳ බස්නාහිර පළාත් කාර්යාලයේ දායකත්වය.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ලබාදෙන ISO 14000 ප්‍රමිති සහතිකය කර්මාන්තශාලා සඳහා ලබාදීම පිණිස, මධ්‍යම පරිසර අධිකාරියේ බස්නාහිර පළාත් කාර්යාලය තාක්ෂණික හා නීතිමය ගැටළු වලදී විශේෂඥ දැනුම ලබාදෙයි.

## 12.6. පරිසර කළමනාකරණය

### 12.6.1. මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය (IEE)

1993 වසරේ සිට සියළු ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියකට යටත්විය යුතුය. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති, කර්මාන්ත, උද්‍යාන වැඩි දියුණු කිරීම ආදී මහා පරිමාණ නියමිත කටයුතු මෙම ක්‍රියාවලියට අයත් වේ. පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලියේ දී මහා පරිමාණ ව්‍යාපෘතීන් පරිසර බලපෑම් මුල් අවධියේ ම හඳුනාගෙන එම බලපෑම් අවම කිරීමේ අවශ්‍ය නිර්දේශ සපයනු ලැබේ. මේ නිසා ව්‍යාපෘති යෝජකට ව්‍යාපෘතියේ මුල් අදියරේම පරිසර බලපෑම් අවම කර ගැනීමට හැකි වේ.

පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට හෝ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියකට යටත් ව්‍යාපෘති සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම පළාත් කාර්යාල මඟින් සිදු කරනු ලැබේ .

පහත දැක්වෙන්නේ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියට භාජනය වීමට යෝජනා වූ ව්‍යාපෘතීන් පිළිබඳ විස්තරය.

**TABLE 0.26** මූලික පාරිසරික පරීක්ෂණ (IEE) / පරිසර බලපෑම් ඇගයීම (EIA) නියමයන්ට අනුකූලව 2016 වසර තුළදී අනුමත වූ ව්‍යාපෘති ලැයිස්තුව.

| පලාත | දිස්ත්‍රික්කය | අයදුම්පත් ගණන | | | අනුමත කල ගණන | | | ප්‍රතික්ෂේප කළ | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2014 | 2015 | 2016 | 2014 | 2015 | 2016 | 2014 | 2015 | 2016 |
| බස්නාහිර | කොළඹ | 1 | 03 | 02 | 0 | 0 | 1 | | 0 | 0 |
| | ගම්පහ | 0 | 38 | 67 | 0 | 04 | 0 | | 01 | 1 |
| | කළුතර | 3 | 19 | 03 | 2 | 02 | 0 | | 0 | 0 |
| දකුණු | ගාල්ල | 10 | 04 | 0 | 2 | 07 | 0 | 1 | 01 | 0 |
| | මාතර | 0 | 02 | 2 | 4 | 02 | 1 | | 0 | 0 |
| | හම්බන්තොට | 1 | 03 | 1 | 2 | 03 | 0 | | 0 | 0 |
| මධ්‍යම | නුවර | 81 | 78 | 110 | 70 | 67 | 84 | 5 | 02 | 9 |
| | මාතලේ | 7 | 5 | 16 | 15 | 14 | 6 | | 0 | 0 |
| | නුවරඑළිය | 78 | 64 | 41 | 89 | 76 | 10 | | 17 | 1 |
| සබරගමුව | කෑගල්ල | 7 | 1 | 7 | 4 | 06 | 1 | | 0 | 0 |
| | රත්නපුර | 4 | 4 | 19 | 3 | 04 | 6 | | 0 | 1 |
| ඌව | බදුල්ල | 99 | 103 | 225 | 69 | 135 | 120 | | 02 | 19 |
| | මොනරාගල | 6 | 02 | 06 | 5 | 02 | 2 | | 0 | 0 |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 8 | 0 | 12 | 9 | 02 | 3 | | 0 | 0 |
| | අම්පාර | 0 | 1 | 0 | 0 | 0 | 2 | | 0 | 0 |
| | මඩකලපුව | 0 | 4 | 0 | 0 | 02 | 0 | | 0 | 0 |
| උතුරුමැද | අනුරාධපුරය | 2 | 3 | 5 | 0 | 0 | 0 | | 0 | 0 |
| | පොලොන්නරුව | 2 | 6 | 7 | 0 | 0 | 3 | | 0 | 0 |
| වයඹ | කුරුණෑගල | | | 0 | | | 0 | | | 0 |
| | පුත්තලම | | | 1 | | | 0 | | | 0 |
| උතුරු | යාපනය | 0 | 2 | 15 | 0 | 02 | 19 | | 0 | 6 |
| | කිලිනොච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | | 0 | 0 |
| | මුලතිවු | 0 | 0 | 0 | 0 | 0 | 0 | | 0 | 0 |
| | මන්නාරම | 0 | 0 | 3 | 0 | 0 | 2 | | 0 | 0 |
| | වවුනියාව | 0 | 0 | 8 | 0 | 0 | 3 | | 0 | 0 |
| එකතුව | | 309 | 342 | 550 | 272 | 328 | 263 | 6 | 23 | 37 |

2015 වසර තුල දී අයදුම්පත් 342ක් ලැබුණු අතර ඉන් 328ක් සඳහා අනුමැතිය ලබාදුන් අතර අපේක්ෂිත තත්වයේ නොවන හෙයින් අයදුම්පත් 23ක් (2014 වසරේ අයදුම්පත් ද ඇතුළුව) ප්‍රතික්ෂේප කරන ලදි.

## 12.6.2 ලැයිස්තුගතකොට නැති ක්‍රියාකාරකම් සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම.

ඒ ඒ ව්‍යාපෘති යෝජකයන් විසින් ඉදිරිපත් කරන්නා වූ ඉල්ලුම් පත්‍ර අනුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුලින් පරිසරයට සිදු වන්නා වූ අහිතකර බලපෑම් අවම කිරීමට අදාල කොන්දේසි සමඟ මෙම පාරිසරික නිර්දේශ නිකුත් කරනු ලැබේ. ඒ අනුව, ගත වූ වසර තුල හෝටල්, දැව හෙලීම්, විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම් හා ඉඩම් කට්ටි කිරීම ආදී වශයෙන් වූ ව්‍යාපෘතීන් 6,291 (පසුගිය වසරේ අයදුම්පත් ද ඇතුළුව) ක් සඳහා පහත දැක්වෙන පරිදි පාරිසරික නිර්දේශ පළාත් කාර්යාල විසින් නිකුත් කරන ලදි. සංවර්ධිත ක්‍රියාවලියේ මූලික සැලසුම් අවධියේ ම

පාරිසරික බලපෑම් හඳුනාගෙන ඒ සඳහා පිළියම් යෙදවීමට ඉහත සඳහන් ක්‍රියාවලිය පහසුකම් සලසයි.

**TABLE 0.27** 2016 වසරේදී ලැයිස්තුගතකොට නැති ක්‍රියාකාරකම් සඳහා ලබාදුන් පාරිසරික නිර්දේශ ලැයිස්තුව

| පලාත | දිස්ත්‍රික්කය | ලැබුන අයදුම්පත් ගණන | අනුමත කරන ලද | ප්‍රතික්ෂේප කළ | පැමිණිලි පසුවිපරම් |
|---|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 121 | 139 | 0 | 0 |
| | ගම්පහ | 375 | 253 | 0 | 0 |
| | කළුතර | 533 | 475 | 12 | 0 |
| දකුණු | ගාල්ල | 147 | 136 | 6 | 0 |
| | මාතර | 84 | 120 | 0 | 2 |
| | හම්බන්තොට | 142 | 116 | 9 | 2 |
| මධ්‍යම | නුවර | 83 | 497 | 1 | 5 |
| | මාතලේ | 96 | 649 | 3 | 0 |
| | නුවරඑළිය | 08 | 66 | 0 | 5 |
| සබරගමුව | කෑගල්ල | 06 | 168 | 0 | 2 |
| | රත්නපුර | 18 | 386 | 0 | 0 |
| ඌව | බදුල්ල | 880 | 772 | 1 | 5 |
| | මොනරාගල | 447 | 299 | 0 | 6 |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 679 | 675 | 0 | 0 |
| | අම්පාර | 245 | 198 | 0 | 0 |
| | මඩකලපුව | 118 | 182 | 8 | 3 |
| | මන්නාරම | 339 | 108 | 0 | 2 |
| | වවුනියාව | 50 | 64 | 0 | 0 |
| උතුරු මැද | අනුරාධපුරය | 45 | 15 | 1 | 0 |
| | පොලොන්නරුව | 30 | 15 | 0 | 0 |
| උතුර | යාපනය | 334 | 253 | 0 | 0 |
| | කිලිනොච්චිය | 21 | 201 | 0 | 1 |
| | මුලතිවු | 03 | 37 | 0 | 0 |
| වයඹ | කුරුණෑගල | 88 | 274 | 1 | 3 |
| | පුත්තලම | 22 | 193 | 6 | 2 |
| එකතුව | | **4914** | **6291** | **48** | |

# 13.0 මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති.

## 13.1 "පිළිසරු" ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

අදාළ අණපනත් මගින් ශ්‍රී ලංකාව තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ සම්පූර්ණ වගකීම පැවරී ඇත්තේ පළාත් පාලන ආයතන වලට වේ. මහ නගර සභා ආඥා පනත, නගර සභා සහ ප්‍රාදේශීය සභා පනත් මගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල සම්පූර්ණ වගකීම අදාල පළාත් පාලන ආයතන වෙත පවරා ඇති නමුත් ඔවුන්ගේ දැක්ම තුළ වැඩිමනත් අවධානය යොමු කර ඇත්තේ භෞතික සම්පත් දියුණු කිරීම කෙරෙහි වන අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි දැක්වෙන උනන්දුව සාපේක්ෂ වශයෙන් අවම තත්වයක පවතී. මේනිසා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය සම්පත් ප්‍රමාණයද සාපේක්ෂව අඩු තත්ත්වයක පවතී.

### 13.1.2 පිළිසරු ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම.

''ශ්‍රී ලංකාව තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රවේශයක් " පිළිසරු ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම යන මැයෙන් එවකට පැවති පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට 2007 දෙසැම්බර් මස 19 වන දින ලැබුණු අනුමැතිය අනුව 2008 ජනවාරි මස 01 වන දින සිට බල පැවැත්වෙන පරිදි පිළිසරු ව්‍යාපෘතිය මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථාපිත කෙරිණ.

2013 ජුලි 21 දින ගන්නා ලද කැබිනට් තීරණ අනුව 2014 සිට 2018 දක්වා පිළිසරු අදියර - II ලෙස වසර 5කට දිර්ඝ කරන ලදී.

### 13.1.3 ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය

පිළිසරු වැඩසටහනේ එක් ආරම්භයක් වශයෙන් පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් 2007 ඔක්තෝම්බර් මාසයේදී කෙටුම්පත් කරන ලදී. එසේම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ උපාය මාර්ගයන් කෙටුම්පත් කරන ලදී. අදාල ප්‍රදේශ වල තිරසාර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා පළාත් පාලන ආයතන වල පූර්ණ සහයෝගය ලබාගැනීම සඳහා උක්ත උපාය මාර්ග ක්‍රියාවෙහි නැංවීම වර්තමානයේ ඉතා අත්‍යාවශ්‍ය කරුණක් වී ඇත. පිළිසරු වැඩසටහන මෙම උපායමාර්ග ක්‍රියාවෙහි යෙදවීමේ අභියෝගය මනාව හඳුනාගෙන ඇත.

### 13.1.3 අරමුණු

පිළිසරු වැඩසටහනේ ප්‍රධාන අරමුණු පහකි.

- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම.
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික උපාය මාර්ග සැකසීම.
- සියළුම පාර්ශවයන් සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාලව ඵලදායී අධ්‍යාපනයන් හා දැනුමක් ලබාදීම. මේ සඳහා පුහුණු කිරීම් හා ධාරිතා වර්ධනය ඇතුලත් වේ.
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන වලට පහසුකම් සැපයීම.
- කාර්යක්ෂම ලෙස අණපනත් ක්‍රියාත්මක කිරීම සඳහා පවතින නීති රාමුව සවිබල ගැන්වීම.

ඉහත අරමුණු ගොඩනංවා ඇත්තේ ඝන අපද්‍රව්‍ය හා සබැඳිව පවතින ගැටළු සහ ඝන අපද්‍රව්‍ය හා සබැඳිව විවිධ පාර්ශවයන් විසින් මුහුණපාන ගැටළු සැලකිල්ලට ගැනීම තුලින් සහ දිවයින තුල පූර්ණ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීමට විශේෂයෙන් ප්‍රබල ගැටළු ලෙස සැලකෙන අතරමැදි ප්‍රතිකර්ම යෙදීම සහ අවශේෂ කසළ පරිසර හිතකාමී ලෙස අවසාන බැහැරලීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම පදනම් කරගෙනය.

### 13.1.5 විෂය පථය

මෙහිදී ඝන අපද්‍රව්‍ය ලෙස ගෘහස්ථ කසළ, නාගරික කසළ , වාණිජ කසළ, ආයතනික කසළ සහ සමහරක් කර්මාන්තශාලා කසළ මෙන්ම පළාත් පාලන ආයතන සහ පොදු ස්ථාන වලින් බැහැරලන කසළ අයත් වේ. පිළිසරු ව්‍යාපෘතියේ දැක්ම තුළ පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් ඇතුලත් වේ.

I. පළාත් පාලන ආයතන වලින් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධව තොරතුරු රැස් කිරීම.

II. ව්‍යාපෘති වාර්තා විශ්ලේෂණය කිරීම.

III. අපද්‍රව්‍ය වෙන් කිරීම සහ පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම පිළිබඳව පත්‍රිකා ,පුවත්පත්, ගුවන් විදුලිය සහ රූපවාහිනී මාධ්‍ය මඟින් පළාත් පාලන ආයතන මට්ටමින් අධ්‍යාපන හා දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම.

IV. තාක්ෂණික සහාය, ආයතනික ශක්තිය සහ ධාරිතා වර්ධනය.

V. ලෝහ, ප්ලාස්ටික්, වීදුරු සහ කඩදාසි කසළ සඳහා එකතු කිරීමේ ජාලයන් ඇති කිරීම තුලින් ප්‍රතිචක්‍රීකරණය ශක්තිමත් කිරීම.

VI. පළාත් පාලන ආයතන මට්ටමින් කොම්පෝස්ට් අංගන ඉදිකිරීම.

VII. අවශේෂ කසළ බැහැරලීම සඳහා අඩු වියදම් සනීපාරක්ෂක කසළ රඳවන ඉදිකිරීම.

VIII. ගෘහස්ථ කොම්පෝස්ට්කරණය ප්‍රචලිත කිරීම.

IX. පසුවිපරම් කිරීම හා නිසි ලෙස ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නොකරන පළාත්

පාලන ආයතනවලට එරෙහිව නීතිමය පියවර ගැනීම.

### 13.1.6 පිළිසරු ක්‍රියාකාරී සැලැස්ම

පිළිසරු ව්‍යාපෘතියේ 2008-2010, 2011-2013 සහ 2014-2018 වර්ෂ සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මවලට අමතරව, අදාල වර්ෂ සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් ද සකස් කර ඇත. ඒ අනුව 2016 වසර සඳහා පිළිසරු ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත්තේ අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කල යුතු ප්‍රමාණ හඳුනාගෙන ඇති ආකාරය අනුවය. මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී කාලයෙන් කාලයට හඳුනා ගන්නා ලද ක්‍රියාකාරකම් වලට අනුකූලව වරින් වර විවිධ වූ සංශෝධන වලට ලක් කරන ලදි. අවශ්‍ය අවස්ථාවල මෙලෙස ක්‍රියාකාරී සැලැස්මේ සිදු කරන ලද වෙනස්වීම් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදි.

### 13.1.7 පිළිසරු ව්‍යාපෘතියේ ප්‍රගතිය

13.1.7.1 ක්‍රමවත් අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් සැලසීම - පළාත් පාලන බල ප්‍රදේශවල කොම්පෝස්ට් අංගන ඉදිකිරීම.

අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් සඳහා තාක්ෂණික හා මුල්‍ය ආධාර ඉල්ලා පළාත් පාලන ආයතන සහ වෙනත් රාජ්‍ය ආයතන විසින් සිදු කරන ඉල්ලීම් පිළිසරු ව්‍යාපෘතිය විසින් ඇගයීමට ලක් කරනු ලබයි. අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ හා සකස් කිරීමේ අතරමැදි ක්‍රමයක් ලෙස සුළු,මධ්‍ය හා විශාල පරිමාණ කොම්පෝස්ට් අංගන ඉදිකිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිසරු ව්‍යාපෘතියේ මූලික ක්‍රියාමාර්ගයකි.

ඉදිරිපත් කර ඇති ඉල්ලීම් වලට අදාළව ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය සහ අවශ්‍ය යටිතල පහසුකම් සම්බන්ධව ඇගයීමක් සිදු කරන අතර ආධාර ලබා දීමට පෙර අදාළ වාර්තා සහ අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතුව ඇත. පිළිසරු ව්‍යාපෘතිය මගින් මූල්‍යාධාර හා තාක්ෂණික ආධාර ලබා දීමේ දී ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීම සඳහා සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන පියවර පහත පරිදි වේ.

- සංකල්ප ගොඩනැගීම.
- ව්‍යාපෘති වාර්තාව සැකසීම.
- පාරිසරික අනුමැතිය ලබාගැනීම.
- අදාළ පළාත් පාලන ආයතනයේ අනුමැතිය ලබා ගැනීම.
- ව්‍යාපෘති භූමියට අදාලව පාංශු පරීක්ෂණ වාර්තාව සහ අනෙකුත් හඳුනාගැනීමේ වාර්තා ලබා ගැනීම.
- ව්‍යාපෘති භූමියෙහි මානක සැලසුම් සකස් කිරීම.
- සැලසුම් සකස් කිරීම (සියළුම ගොඩනැගිලි වල සැලසුම් සකස් කිරීම).
- ගිවිසුම් සකස් කිරීම .
- ගිවිසුම් අත්සන් කිරීම.
- ප්‍රසම්පාදන පටිපාටිය සම්පූර්ණ කිරීම.
- ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.
- අධීක්ෂණ සහ ප්‍රගති සමාලෝචනය.
- ව්‍යාපෘති භූමිය භාර දීම.

මේ ආකාරයට පිළිසරු ව්‍යාපෘතිය මඟින් වර්ෂ 2008 සිට 2017 හි ආරම්භය දක්වා කාලය තුළ පළාත් පාලන ආයතන 136 ක් සහ වෙනත් රාජ්‍ය ආයතන (හමුදා කඳවුරු සහ අධ්‍යාපන ආයතන) ආවරණය වන ලෙස කොම්පෝස්ට් අංගන 133 ක් ඉදි කර ඇත. ඇතැම් කොම්පෝස්ට් අංගනවල ඉදිකිරීම් 2009, 2010, සහ 2012 වසරවල ආරම්භ කර තිබූ බැවින් ඒවා නඩත්තු කිරීම හෝ පහසුකම් වැඩිදියුණු කිරීම් සඳහා තාක්ෂණික හා මූල්‍යාධාර සැපයීම් පිළිසරු ව්‍යාපෘතිය මගින් 2016 වසර තුල සිදු කරනු ලැබීය.

13.1.7.2 වර්ෂ 2016 දෙසැම්බර් 31 වන විට සියලුම කොම්පෝස්ට් අංගනවල තත්ත්වය

ඉහත සියලුම කොම්පෝස්ට් අංගන 2016 වසරේ ආරම්භය සහ අවසානයේදී ක්‍රියාත්මක වූ තත්ත්ව දර්ශනය වන පහත සඳහන් පසු විපරම් සටහනෙහි දැක්වෙන ආකාරයට වර්ගීකරණය කරන ලදී. මෙය කොම්පෝස්ට් නිෂ්පාදනය සිදු කළ අංගන වල තත්ත්වය සතුටුදායක කිරීමටත් ගැටළු සහිත අංගනවල ගැටළු නිරාකරණය කිරීමට උපකාර කිරීම සහ ධෛර්යමත් කිරීමටත් පිළිසරු කාර්ය මණ්ඩලය සිදු කළ කාර්යයන්ගේ ප්‍රතිඵලයකි.

## TABLE 0.28 කොම්පෝස්ට් අංගන පසු විපරම් සටහන 2016

| පළාත | දිස්ත්‍රික්කය | 2016 වර්ෂයේ කාල පරිච්ඡේදය | කොම්පෝස්ට් නිෂ්පාදනය ඉතා සාර්ථකව ක්‍රියාත්මක ආයතන | කොම්පෝස්ට් නිෂ්පාදනය සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වන ආයතන | ඉදිකිරීම් නිම කර ඇති තවමත් කොම්පෝස්ට් නිෂ්පාදනය ආරම්භ කර නොමැති | ඉදිකිරීම් කටයුතු තවමත් නිමකර නොමැති ආයතන | අක්‍රීය අංගන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| උතුරුමැද | අනුරාධපුරය | 2016 වර්ෂය අරම්භයේදී | 7 | 2 | 4 | 3 | 1 | 17 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 14 | | | 3 | 1 | 18 |
| | පොළොන්නරුව | 2016 වර්ෂය අරම්භයේදී | 1 | | | 1 | | 2 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 1 | 1 | | 1 | | 3 |
| දකුණ | ගාල්ල | 2016 වර්ෂය අරම්භයේදී | 6 | 3 | | | | 9 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 4 | | | | 5 | 9 |
| | මාතර | 2016 වර්ෂය අරම්භයේදී | 7 | | 1 | 1 | | 9 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 9 | | | | 1 | 10 |
| | හම්බන්තොට | 2016 වර්ෂය අරම්භයේදී | 7 | | | 2 | | 9 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 8 | | | | 1 | 9 |
| මධ්‍යම | නුවරඑළිය | 2016 වර්ෂය අරම්භයේදී | 1 | 1 | | | | 2 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 2 | | | | | 2 |
| | මහනුවර | 2016 වර්ෂය අරම්භයේදී | 2 | 2 | | | | 4 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 4 | | | | | 4 |
| | මාතලේ | 2016 වර්ෂය අරම්භයේදී | 4 | | | | | 4 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 4 | | | | | 4 |
| සබරගමුව | රත්නපුර | 2016 වර්ෂය අරම්භයේදී | 1 | | | 2 | 1 | 4 |

| පළාත | දිස්ත්‍රික්කය | 2016 වර්ෂයේ කාල පරිච්ඡේදය | කොම්පෝස්ට් නිෂ්පාදනය ඉතා සාර්ථකව ක්‍රියාත්මක ආයතන | කොම්පෝස්ට් නිෂ්පාදනය සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වන ආයතන | ඉදිකිරීම් නිම කර ඇති තවමත් කොම්පෝස්ට් නිෂ්පාදනය ආරම්භ කර නොමැති | ඉදිකිරීම් කටයුතු තවමත් නිමකර නොමැති ආයතන | අක්‍රීය අංගන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | 2016 වර්ෂය අවසානයේදී | 2 | | | 1 | 2 | 5 |
| | කෑගල්ල | 2016 වර්ෂය අරම්භයේදී | 5 | 1 | | | | 6 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 5 | | | | 1 | 6 |
| පළාත | දිස්ත්‍රික්කය | 2016 වර්ෂයේ කාල පරිච්ඡේදය | කොම්පෝස්ට් නිෂ්පාදනය ඉතා සාර්ථකව ක්‍රියාත්මක ආයතන | කොම්පෝස්ට් නිෂ්පාදනය සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වන ආයතන | ඉදිකිරීම් නිම කර ඇති තවමත් කොම්පෝස්ට් නිෂ්පාදනය ආරම්භ කර නොමැති | ඉදිකිරීම් කටයුතු තවමත් නිමකර නොමැති ආයතන | අක්‍රීය අංගන | එකතුව |
| බස්නාහිර | කොළඹ | 2016 වර්ෂය අරම්භයේදී | 4 | | | | 1 | 5 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 4 | | | 1 | 1 | 6 |
| | ගම්පහ | 2016 වර්ෂය අරම්භයේදී | 8 | | 1 | | | 9 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 10 | | | | | 10 |
| | කළුතර | 2016 වර්ෂය අරම්භයේදී | 7 | | | | | 7 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 7 | | | | | 7 |
| ඌව | බදුල්ල | 2016 වර්ෂය අරම්භයේදී | 3 | 1 | | 1 | | 5 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 4 | | | 1 | | 5 |
| | මොනරාගල | 2016 වර්ෂය අරම්භයේදී | 1 | | 1 | | | 2 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 2 | | | 0 | 1 | 3 |
| නැගෙනහිර | අම්පාර | 2016 වර්ෂය අරම්භයේදී | 3 | 1 | | 2 | | 6 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 4 | | 1 | 1 | | 6 |
| | මඩකලපුව | 2016 වර්ෂය අරම්භයේදී | 1 | | | | | 1 |

| පළාත | දිස්ත්‍රික්කය | 2016 වර්ෂයේ කාල පරිච්ඡේදය | කොම්පෝස්ට් නිෂ්පාදනය ඉතා සාර්ථකව ක්‍රියාත්මක ආයතන | කොම්පෝස්ට් නිෂ්පාදනය සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වන ආයතන | ඉදිකිරීම් නිම කර ඇති තවමත් කොම්පෝස්ට් නිෂ්පාදනය ආරම්භ කර නොමැති | ඉදිකිරීම් කටයුතු තවමත් නිමකර නොමැති ආයතන | අක්‍රිය අංගන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | 2016 වර්ෂය අවසානයේදී | 1 | | | | | 1 |
| | ත්‍රිකුණාමලය | 2016 වර්ෂය ආරම්භයේදී | | | | 1 | | 1 |
| | | 2016 වර්ෂය අවසානයේදී | | | | 1 | | 1 |
| වයඹ | කුරුණෑගල | 2016 වර්ෂය ආරම්භයේදී | 12 | 4 | | | | 16 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 16 | | | | | 16 |
| | පුත්තලම | 2016 වර්ෂය ආරම්භයේදී | 3 | 1 | | 1 | | 5 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 4 | | | 1 | | 5 |
| උතුර | යාපනය | 2016 වර්ෂය ආරම්භයේදී | 2 | | 1 | | | 3 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 3 | | | | | 3 |
| මුළු ප්‍රගතිය | | 2016 වර්ෂය ආරම්භයේදී | 85 | 16 | 8 | 14 | 3 | 126 |
| | | 2016 වර්ෂය අවසානයේදී | 108 | 1 | 1 | 10 | 13 | 133 |

2016 වර්ෂයේ ආරම්භයේ සහ අවසානයේදී කොම්පෝස්ට් අංගනවල තත්ත්වය සංසන්දනාත්මකව ඉහත සටහනයෙහි අවසානයට දක්වා ඇති සමස්ථ ප්‍රගතිය මගින් පැහැදිලිව දක්වා ඇත.

### 13.1.7.3 කොම්පෝස්ට් අංගන ක්‍රමවත් කිරීම පිළිබඳ පළාත්-දිස්ත්‍රික් මට්ටමේ සැසිවාර/ ප්‍රගති සමාලෝචන සැසිවාර

පුනරුදය ජාතික පාරිසරික වැඩසටන යටතේ සංවිධානය කරනු ලැබූ 2016.03.17, 2016.06.05, සහ 2016.10.21 යන දිනයන්හි පිළිවෙලින් රත්නපුර, මාතලේ, සහ ත්‍රිකුණාමලය දිත්‍රිස්ත්‍රික්කයන්හිදි පවත්වනු ලැබූ දිස්ත්‍රික් පාරිසරික සමුළු සඳහා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සහභාගී වූ අතර එහිදි ජාතික වැදගත්කමක් සේ සලකා කොම්පෝස්ට් අංගන මනා ක්‍රියාකාරීත්වයෙන් යුතුව නඩත්තු කරන ලෙස අතිගරු ජනාධිපතිතුමා උපදෙස් දෙන ලදී. ඒ අනුව පළාත්/දිස්ත්‍රික් මට්ටමින් කොම්පෝස්ට් අංගන ක්‍රමවත් කිරීමේ වැඩසටහන් පහක් (05) පැවැත්වූ අතර එහිදි ඇතැම් ගැටළු සම්බන්ධව පළාත් පාලන ආයතන ලේකම්වරු සහ කොමසාරිස්වරුන් කරුණු ඉදිරිපත් කරන ලදී.

**TABLE 29** දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද ක්‍රමවත් කිරීමේ සැසිවාර පිළිබඳ විස්තර/ ප්‍රගති සමාලෝචන සැසිවාර

| අංකය. | පළාත/දිස්ත්‍රික්කය | ස්ථානය | දිනය | සහභාගීවූවන්ගේ වර්ගීකරණය | සහභාගී වූ ගණන |
|---|---|---|---|---|---|
| 1. | උතුරුමැද පළාත<br>අනුරාධපුරය<br>පොළොන්නරුව | පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ශ්‍රවණාගාරය | 2016.09.15 | සභාපති - ම.ප.අ<br>ප.පා.කො<br>නි. කළමනාකරු-පිළිසරු ව්‍යාපෘතිය<br>නි.අධ්‍යක්ෂ - ම.ප.අ<br>සංවර්ධන නිලධාරින්- ප.පා.කො කාර්යාල<br>සුපරීක්ෂකවරු<br>මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු<br>විෂය අනුබද්ධ නිලධාරීන්<br>තාක්ෂණික නිලධාරීන් | 156 |
| 2. | නැගෙනහිර පළාත<br>ත්‍රිකුණාමලය | කුලකෝට්ටම් ශාලාව ත්‍රිකුණාමලය නගර සභාව | 2016.09.05 | නි.අ.ජ(අපද්‍රව්‍ය කළමනාකරණ<br>සහකාර පළාත් පාලන කොමසාරිස්<br>අධ්‍යක්ෂ (නැගෙනහිර පළාත්) - ම.ප.අ<br>ලේකම්වරු<br>සුපරීක්ෂවරු<br>මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු<br>විෂය අනුබද්ධ නිලධාරීන්<br>තාක්ෂණ නිලධාරීන් | 80 |
| 3. | දකුණු පළාත<br>ගාල්ල<br>මාතර<br>හම්බන්තොට | වැලිගම නගර සභාව | 2016.04.25 | සභාපති - ම.ප.අ<br>නි.අ.ජනරාල් (අපද්‍රව්‍ය කළමනාකරණ)<br>ලේකම්වරු<br>මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු<br>විෂය අනුබද්ධ නිලධාරීන්<br>තාක්ෂණික නිලධාරීන් | 249 |
| 4. | මධ්‍යම පළාත<br>මහනුවර | නවයාලතැන්න පළාත් පුහුණු මධ්‍යස්ථානය | 2016.02.08 | සභාපති - ම.ප.අ<br>අධ්‍යක්ෂ - පිළිසරු ව්‍යාපෘතිය<br>අධ්‍යක්ෂ - ම.ප.අ<br>(මධ්‍යම පළාත් කාර්යාලය)<br>ලේකම්වරු<br>සුපරීක්ෂකවරු | 201 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>විෂය අනුබද්ධ නිලධාරීන්<br>තාක්ෂණික නිලධාරීන් | |
| 5. | වයඹ පළාත් කාර්යාලය | කුරුණෑගල මහා නගර සභාව ශ්‍රවණාගාරය | 2016.10.06 | නි. අ.ජනරාල්-(අපද්‍රව්‍ය කළමනාකරණ)<br>නි.අධ්‍යක්ෂ(පිළිසරු ව්‍යාපෘතිය)<br>ලේකම්වරු<br>සුපරීක්ෂකවරු<br>මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු<br>විෂය අනුබද්ධ නිලධාරීන්<br>තාක්ෂණ නිලධාරීන් | 77 |

13.1.7.4 දැනට පවතින කොම්පෝස්ට් අංගන සහ 2016 වසර තුළ ස්ථාපිත නව කොම්පෝස්ට් අංගන සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් ලබාදීම සහ අනෙකුත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් ලබාදීම.

2016 වසර තුළ පිළිසරු ව්‍යාපෘතියෙන් සහයෝගය සහ මූල්‍යාධාර අපේක්ෂාවෙන් පළාත් පාලන ආයතන වලින් බොහෝ ඉල්ලීම් ඉදිරිපත් වී තිබුණි. වර්ෂ 2016 ක්‍රියාකාරී සැලැස්ම යටතේ රුපියල් මිලියන 600ක් මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කර තිබුණද ලැබී තිබුණේ රුපියල් 190 ක් පමණි. අවශ්‍යතාවයන් සමාලෝචනය කිරීම සඳහා පළාත් පාලන ආයතන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් මට්ටමේ සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. 2016 වසර තුළ පහත වගුවේ සඳහන් පළාත් පාලන ආයතන ආවරණය කළ අතර ඔවුන්ගේ ඉල්ලීම් සහ ප්‍රමාණ පත්‍ර පළාත් ඉංජිනේරුවන්ගේ සහතිකය සහිතව ලබා ගන්නා ලදී.

ඉඩම්, පරිසර නිර්දේශය සහ පළාත් පාලන ආයතන කළමනාකාරිත්වයේ කැපවීම වැනි අවශ්‍යතාවයන් සහ 2016 ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන නව කොම්පෝස්ට් අංගන 06 ක්, ජීව වායු ඒකක 03 ක්, සනීපාරක්ෂක කසළ රැඳවුමක්, අඩු වියදම් කසළ දාහකයක්, ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන 03ක්, ප්ලාස්ටික්/පොලිතීන් ගබඩා කිරීමේ මධ්‍යස්ථාන 02 ක් පිහිටුවීම සඳහා මූල්‍යාධාර ලබාදී ඇත. පෙර වර්ෂවල ආරම්භ කරන ලද කොම්පෝස්ට් අංගන 21 ක් සහ ජීව වායු ඒකක 05 ක් අවසන් කිරීම සඳහා 2016 වසර තුළ මුදල් ලබා දෙන ලදී. එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වැය කරන ලද මුදල් හා ඒවායේ තත්ත්වය සැකෙවින් පහත වගුවේ දක්වා ඇත.

**TABLE 30 2016** වසර තුළ ප්‍රතිපාදන ලබාදුන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම්

| අංක | කොම්පෝස්ට් අංගන/ජීව වායු ඒකක | ඉදිකිරීම් අවසාන | ඉදිකිරීම් සිදුවන/වැඩිදියුණු කිරීම් | ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත | වැය කරන ලද මුදල් (රු) |
|---|---|---|---|---|---|
| | | | | මුදල(රු) | |
| **කොම්පෝස්ට් අංගන** | | | | | |
| 1 | දිවුලපිටිය ප්‍රා.ස. | √ | | 3,571,488.10 | 3,232,311.10 |
| 2 | පැල්මඩුල්ල ප්‍රා.ස | √ | | 6,092,080.80 | 5,149,425.90 |
| 3 | තමන්කඩුව ප්‍රා.ස | | √ | 6,278,909.31 | 3,795,283.08 |
| 4 | රත්නපුර ම.න.ස | | √ | 32,540,341.62 | 15,182,892.19 |
| 5 | ඉඹුල්පේ ප්‍රා.ස | √ | | 7,272,972.76 | 5,025,654.87 |
| 6 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>නිරාවිය ගොවිපල | | √ | 4,190,754.33 | 2,338,150.87 |

| අංක | කොම්පෝස්ට් අංගන/ජීව වායු ඒකක | ඉදිකිරීම් අවසාන | ඉදිකිරීම් සිදුවන/වැඩිදියුණු කිරීම් | ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල(රු) | වැය කරන ලද මුදල් (රු) |
|---|---|---|---|---|---|
| 7 | තිරප්පනේ ප්‍රා.ස | | √ | 5,572,025.61 | 4,507,455.66 |
| 8 | රුහුණු කතරගම දේවාලය | √ | | 4,922,456.83 | 4,492,250.63 |
| 9 | මාතලේ ම.න.ස. | | √ | 12,930,943.12 | 8,664,391.81 |
| 10 | අඹගමුව ප්‍රා.ස | | √ | 7,498,067.90 | 6,287,004.24 |
| 11 | නාමල්ඔය ප්‍රා.ස | | √ | 4,284,956.92 | 3,782,531.57 |
| 12 | මාතලේ ප්‍රා.ස | √ | | 3,119,876.22 | 2,975,111.12 |
| 13 | හබරාදුව ප්‍රා.ස | √ | | 1,095,949.52 | 1,077,005.20 |
| 14 | යක්කලමුල්ල ප්‍රා.ස | √ | | 2,368,636.20 | 2,299,642.06 |
| 15 | නාගොඩ ප්‍රා.ස | √ | | 2,743,466.59 | 2,363,647.45 |
| 16 | නියාගම ප්‍රා.ස | √ | | 1,476,753.55 | 1,201,655.42 |
| 17 | ඇල්පිටිය ප්‍රා.ස | √ | | 1,493,023.90 | 1,252,311.08 |
| 18 | ඉපලෝගම ප්‍රා.ස | √ | | 6,042,336.98 | 5,231,137.44 |
| 19 | තලාව ප්‍රා.ස | √ | | 5,760,735.00 | 2,984,588.72 |
| 20 | ලුණුගම්වෙහෙර ප්‍රා.ස | √ | | 5,171,134.00 | 1,649,362.00 |
| 21 | තණමල්විල ප්‍රා.ස | √ | | 1,801,506.27 | 1,602,394.98 |
| 22 | සෙවනගල ප්‍රා.ස | √ | | 2,595,822.19 | 1,132,858.35 |
| 23 | තිස්සමහාරාම ප්‍රා.ස | √ | | 5,092,861.90 | 4,677,047.29 |
| 24 | කටුවන ප්‍රා.ස | √ | | 5,342,134.65 | 2,490,509.83 |
| 25 | පනාගොඩ යුධ හමුදා කඳවුර | | √ | 3,571,538.83 | 917,304.50 |
| 26 | වැලිගම නගර සභාව | √ | | 9,896,319.09 | 8,670,960.10 |
| 27 | තලවකැලේ -ලිඳුල නගර සභාව | √ | | 6,910,472.63 | 5,280,936.53 |
| ජීව වායු ඒකක | | | | | |
| 1 | ජාතික පාංශු සංවර්ධන මණ්ඩලයේ ගොවිපල ( ජීව වායු ඒකක 04) | √ | | 4,224,900.00 | 2,663,689.49 |
| 2 | කටුනායක ගුවන් හමුදා කඳවුර (2 ජීව වායු ඒකක) | √ | | 2,686,203.61 | 2,521,830.01 |
| 3 | වන්නි ගුවන් හමුදා කඳවුර | √ | | 750,590.00 | 711,417.00 |
| 4 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | | √ | 1,056,225.00 | 211,245.00 |
| **ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථාන** | | | | | |
| 1 | යාපනය මහ නගර සභාව | √ | | 5,500,000.00 | 2,414,867.18 |
| 2 | රත්නපුර මහ නගර සභාව (කණාදොළ) | | √ | 52,116,593.80 | 11,182,892.19 |
| **ප්ලාස්ටික් /පොලිතීන් අපද්‍රව්‍ය ගබඩාකිරීමේ මධ්‍යස්ථාන** | | | | | |
| 1 | තමන්කඩුව ප්‍රා.ස | √ | | 6,278,909.31 | 3,795,283.08 |
| 2 | රත්නපුර ප්‍රා.ස | √ | | 2,000,000.00 | 2,314,853.00 |

ආයතන සඳහා අවශ්‍ය උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර ලබාදීමට රුපියල් මිලියන 35 ක් සහ ඉලක්ක ගත කාණ්ඩායම් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 7.6423 ක් ව්‍යාපෘතිය විසින් වැය කර ඇත. තාක්ෂණික, ආර්ථික, මෙහෙයුම් සහ පාරිසරික ශක්‍යතාව හඳුනා ගැනීම සඳහා දෙමුහුම් පොහොර නිපදවීමේ ශක්‍යතා අධ්‍යයනය සඳහා රුපියල් මිලියන 14.677 ක් ගෙවන ලදී.

## 13.1.7.5 පළාත් පාලන ආයතන සඳහා උපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ ඝන අපද්‍රව්‍ය ප්‍රවාහන රථ ලබාදීම.

ඉදිරිපත් වූ ඉල්ලීම් සළකා බලා 2016 වසර අවසානයේ පිළිසරු ව්‍යාපෘතිය විසින් ප්ලාස්ටික් කැබලි කිරීමේ යන්ත්‍ර 04 ක්, පොලිතීන් කැබලි කිරීමේ යන්ත්‍ර 04ක්, ට්‍රැක්ටර් 03 ක් ට්‍රේලර් 03 ක්, ස්කිඩ් ස්ටියර් ලෝඩර් යන්ත්‍ර 02ක්, කම්පැක්ටර් රථ 02 ක් මිලදී ගෙන පළාත් පාලන ආයතන වෙත ලබා දෙන ලදී.

**TABLE 31** පළාත් පාලන ආයතන වෙත ලබා දුන් උපකරණ

| අංක | පළාත් පාලන ආයතනය | උපකරණ/ යන්ත්‍ර සූත්‍ර | වැය කරන ලද මුදල |
|---|---|---|---|
| 1. | යාපනය ම.න.ස. | ප්ලාස්ටික් කැබලි කරන යන්ත්‍ර/පොලිතීන් කැබලි කරන යන්ත්‍ර | 35.0014 |
| 2. | නුවරඑළිය ම.න.ස. | ප්ලාස්ටික් කැබලි කරන යන්ත්‍ර/පොලිතීන් කැබලි කරන යන්ත්‍ර | |
| 3. | බදුල්ල ම.න.ස | ප්ලාස්ටික් කැබලි කරන යන්ත්‍ර/පොලිතීන් කැබලි කරන යන්ත්‍ර | |
| 4. | රත්නපුර ම.න.ස | ප්ලාස්ටික් කැබලි කරන යන්ත්‍ර/පොලිතීන් කැබලි කරන යන්ත්‍ර | |
| 5. | තමන්කඩුව ප්‍රා.ස | ට්‍රැක්ටර් - 01, ට්‍රේලර් - 01 | |
| 6. | පොල්ගහවෙල ප්‍රා.ස | ට්‍රැක්ටර් - 01, ට්‍රේලර් - 01 | |
| 7. | ගම්පොල ප්‍රා.ස | ට්‍රැක්ටර් - 01, ට්‍රේලර් - 01 | |
| 8. | කඩුවෙල ම.න.ස. | ට්‍රැක්ටර් - 01, ට්‍රේලර් - 01 | |
| 9. | මාතලේ ම.න.ස. | ස්කිඩ් ස්ටියර් ලෝඩර් යන්ත්‍රය | |
| 10. | කරදියාන - බස්නාහිර පළාත | ස්කිඩ් ස්ටියර් ලෝඩර් යන්ත්‍රය | |
| 11. | කඩුවෙල ම.න.ස. | ගාබේජ් කම්පැක්ටර් | |
| 12. | මහනුවර ම.න.ස. | ගාබේජ් කම්පැක්ටර් | |

## 13.1.7.6 ජංගම අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථාන (සම්පත් පියස)

ජංගම අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථාන (සම්පත් පියස) ස්ථාපිත කිරීමේ මූලික අරමුණ වූයේ නාගරීක ඝන අපද්‍රව්‍යවල අඩංගු ප්‍රතිචක්‍රීයකරණය කළහැකි කොටස් නිසි පරිදි එකතු කර ප්‍රතිචක්‍රීයකරණය සඳහා යොමු කරන තුරු ගබඩා කර තැබීමයි. පිළිසරු ව්‍යාපෘතිය බස්නාහිර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ සහයෝගය ඇතිව කොළඹ දිස්ත්‍රික්කය සඳහා සම්පත් පියසි 50 ක් ගම්පහ දිස්ත්‍රික්කය සඳහා 60 ක් සහ කළුතර දිස්ත්‍රික්කය සඳහා 15 ක් ආදි වශයෙන් සම්පත් පියස් 125 ක් ස්ථාපිත කිරීම සඳහා සැලසුම් කර ඇත. එහි ඉදිකිරීම් කටයුතු සඳහා පිළිසරු ව්‍යාපෘතිය 2016

වසර වන විට මුළු ගෙවීම් ලෙස රුපියල් මිලියන 12.953 ක් ගෙවා ඇත.

**TABLE 32** ජංගම අපද්‍රව්‍ය එකතුකිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ ප්‍රගතිය

| අංකය | ප්‍රගතිය | මුළු වටිනාකම | වැය කරන ලද (රු.මි) |
|---|---|---|---|
| 01. | සම්පත් පියස 125 ක් බස්නාහිර පළාත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වෙත ලබා දෙන ලදී. | 18.00 | 12.953 |




### 13.1.7.7 ප්‍රාදේශියව නිපදවන කොම්පෝස්ට් භාවිතා කර දෙමුහුම් පොහොර නිපදවීමේ ව්‍යාපෘතිය

නාගරික ඝන අපද්‍රව්‍ය භාවිතා කර නිපදවන කොම්පෝස්ට් පොහොර අලෙවිය සම්බන්ධව පිළිසරු ව්‍යාපෘතිය මෙන්ම පළාත් පාලන ආයතනද දිගු කලක සිට ගැටළුකාරී තත්ත්වයකට මුහුණදී තිබුණි.

භාවිතා කරන නාගරික ඝන අපද්‍රව්‍යවල ස්වභාවය අනුව එම නිසා නිපදවන කොම්පෝස්ට්වල තත්ත්වයද වෙනස්වන බැවින් එම කොම්පෝස්ට්වල තත්ත්ව පාලනය කිරීම ගැටළුවකි. එබැවින් එම කොම්පෝස්ට් සඳහා ගොවීන්ගේ අඩු ඉල්ලුමක් ඇත. දෙමුහුම් පොහාර නිපදවීම සම්බන්ධව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාව (SLLR&DC)ඉදිරිපත් ව්‍යාපෘති යෝජනාව තුළ කොම්පෝස්ට් අලෙවිය හා එහි තත්ත්ව පාලන ගැටළු වලට විසඳුම් ලබා දී තිබුණි.

ශක්‍යතා අධ්‍යයනය සඳහා රුපියල් මිලියන 24.25 ක් හා නියමු ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 17.3 ක් යනාදී වශයෙන් මුළු ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුව රුපියල් මිලියන 41.55 ක් විය. ශක්‍යතා අධ්‍යයනය 2016 දෙසැම්බර් අවසන් කිරීමටත් ව්‍යාපෘතියේ ඊළඟ පියවර 2017 වසරේ ආරම්භ කර දෙමුහුම් පොහොර නිපදවීමටත් බලාපොරොත්තු වේ.



**TABLE 33** දෙමුහුම් පොහොර ව්‍යාපෘතියෙහි ප්‍රගතිය

| අංකය | ප්‍රගතිය | මුළු වටිනාකම | වැය කරන ලද (රු.මි) |
|---|---|---|---|
| 01. | • ශක්‍යතා අධ්‍යයනය සිදු කර අවසන්.<br>• බත්තරමුල්ල දියත උයන පරිශ්‍රයේදී 2016.09.02 දින කොම්පෝස්ට් අලෙවි කුටිය විවෘත කෙරිණි. | 41.55 | 14.677 |

### 13.1.7.8 ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය කළමනාකරණ ගැටළු සහ විසඳුම් සම්බන්ධව අධ්‍යයනය

ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ගැටළු සහ ඒ සඳහා විසඳුම් පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා කැලණිය විශ්ව විද්‍යාලයීය විද්‍යා පීඨයේ සමාජ විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය, පිළිසරු ව්‍යාපෘතිය මගින් තෝරා ගෙන ඇත. එහි පළමු කෙටුම්පත 2015.12.15 දින ව්‍යාපෘතියට භාර දී ඇත. තවදුරටත් වැඩිදියුණු කරන ලෙස දැනුම්දීමෙන් අනතුරුව අවසන් වාර්තාව 2016.12.27 ලබාදී ඇත. මෙම අධ්‍යයනයේ මූලික අරමුණු වූයේ පවතින කොම්පෝස්ට් අංගනවල කාර්යක්ෂමතාව උපරිම කිරීම, පවතින වෙළඳපොල වැඩිදියුණු කිරීම, භාවිතා කරන්නන් අතර කොම්පෝස්ට් ප්‍රචලිත කිරීම,කොම්පෝස්ට්කරණයේ අවශේෂ අපද්‍රව්‍ය සඳහා විකල්ප විසඳුම් ලබාදීම පිළිබඳ ක්‍රමෝපාය සොයා බැලීමයි. පළාත් පාලන ආයතන 21 ක් ආවරණය වන පරිදි නියැදි පරීක්ෂාවක් සිදු කර ඇත.

### 13.1.7.9 ජන මාධ්‍ය ප්‍රචාරණය සහ ගෘහස්ථ මට්ටමින් අපද්‍රව්‍ය වෙන් කිරීම සහ කොම්පෝස්ට්කරණය දිරිමත් කිරීම

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා “මිටියාවත” ගුවන්විදුලි වැඩසටහන ප්‍රචාරය කෙරෙණි. “මිටියාවත” ගුවන්විදුලි වැඩසටහන් 35 ක් ප්‍රචාරය කළ අතර ජයග්‍රහකයන් සඳහා ත්‍යාග ප්‍රදානය කිරීමක් ද සිදු කෙරිණි.

පොලිතීන් ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සඳහා පුවත්පත් දැන්වීම් 9 ක් පළ කෙරිණි.

- ශ්‍රී පාදස්ථාන අපද්‍රව්‍ය එකතුකිරීමේ වැඩසටහන, ගංවතුර ඇති වූ ස්ථානවල ශ්‍රමදාන ව්‍යාපාර, උතුරුමැද පළාත් සභාව සහ මධ්‍යම පරිසර අධිකාරිය සාමුහිකව සංවිධානය කළ පාරිසරික වැඩසටහන්, රුහුණු කතරගම මහා දේවාලය ඇසළ උත්සවය, නුවර පෙරහැර, අනුරාධපුර පොසොන් වැඩසටහන, අනුරාධපුර පිච්ච මල් පූජාව, තලවිල ශාන්ත ආනා දේවස්ථානයේ උත්සව 2 ක් ඉලක්ක කර සිදු කළ පරිසර ආරක්ෂණ වැඩසටහනක් සඳහා ව්‍යාපෘති හතරක් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හරහා ස්ටිකර් 5000 ක් බෙදා හැරීම සහ මහජන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව දැනුවත් කිරීම සඳහා අත් පත්‍රිකා 750000 ක් බෙදා හැරීම.

### 13.1.7.10 ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන් ලබාදීම.

ගෘහස්ථ කොම්පෝස්ට්කරණ බඳුන මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය පරිසර හිතකාමී සහ පහසුවෙන් කළමනාකරණ කළ හැකි ක්‍රමයකි. රටේ පවතින ඉහල නිශ්පාදන පිරිවැය සහ ප්‍රවාහන වියදම නිසා වෙළඳපලෙහි පවතින අධික මිල මත කොම්පෝස්ට් බඳුන් මිලදී ගැනීමට ජනතාව හෝ පළාත් පාලන ආයතන උනන්දු කරවීමට නොහැකි වී තිබුණි. මෙයට පිළියමක් ලෙස 2016 ක්‍රියාකාරී සැලැස්ම යටතේ පිළිසරු ව්‍යාපෘතින් කොම්පෝස්ට්කරණ බඳුන් මිලදී ගන්නා ලදී. 2016.12.31 වන විට තත්ත්වය පහත වගුවෙන් පෙන්නුම් කරන අතර මෙම බඳුන් සඳහා පළාත් පාලන ආයතන, වෙනත් ආයතන හා පුද්ගලික අවශ්‍යතාවයන් සඳහා ඉහළ ඉල්ලුමක් ඇති බව හඳුනා ගත හැකි විය.

**TABLE 34 2016** වසර තුළ බෙදා හරින ලද කොම්පෝස්ට් බඳුන් සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය බඳුන්

| පළාත් පාලන ආයතනය/වෙනත් ආයතන/පුද්ගලික | නිකුත් කළ ප්‍රමාණය | වටිනාකම (රු.) |
|---|---|---|
| දීප ව්‍යාප්ත දුම්රිය ස්ථාන | 1200 | 3,800,000.00 |
| රාජ්‍ය ආයතන | 600 | 1,900,000.00 |

### 13.1.7.11 අවශේෂ කසළ සඳහා අඩුවියදම් කසළ දාහක සහ සනීපාරක්ෂක කසළ රැඳවුම් සඳහා ආධාර කිරීම.

**මොන්රෝවියාවත්ත තාවකාලික බිම් පිරවුම**

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති විශේෂ රැස්වීමකදී සාමුහික දායකත්වයෙන් මොන්රෝවියාවත්ත කොම්පෝස්ට් අංගනය සඳහා තාවකාලික බිම් පිරවුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රධාන පර්ශවකරුවන් එකඟවිය. කොම්පෝස්ට් අංගනය අවට වාසය කළ ජනතාව මුහුණු දුන් පාරිසරික ගැටළු විසඳීම සඳහා මෙම බිම් පිරවුම සකස් කිරීමට රුපියල් මිලියන 4 ක් ලබාදීමට 2015 දී පිළිසරු ව්‍යාපෘතිය එකඟ වූ අතර එම ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 0.482 ක් වූ අතරැඳවුම් මුදල 2016 වසරේදී නිදහස් කෙරිණි.



මොන්රෝවියාවත්ත තාවකාලික බිම් පිරවුම පිරවුම




TABLE 34 සනීපාරක්ෂක කසළ රැඳවුම් සහ අඩු වියදම් කසළ දාහක ඉදිකිරීමේ ප්‍රගතිය

| අංකය | පළාත් පාලන ආයතනය | ප්‍රගතිය | වැය කරන ලද රු.මි. |
|---|---|---|---|
| 01. | දොම්පේ සනීපාරක්ෂක කසළ රැඳවුම | ක්‍රියාත්මක වේ | 2.03 |
| 02. | මොන්රෝවියාවත්ත - ගාල්ල දිස්ත්‍රික්කය | ඉදිකිරීම්වල අතරැඳවුම්වල මුදල | 0.482 |
| 03. | මාතලේ ම.න.ස (සනීපාරක්ෂ කසළ රැඳවුම සඳහා ශක්‍යතා අධ්‍යයනය සහ සංකල්පිත සැලැස්ම | සංකල්පිත සැලැස්ම සහ ශඛ්‍යතා අධ්‍යයනය තාක්ෂණික මට්ටටම් | 0.4 |
| 04. | මාතලේ ප්‍රා.ස ( අඩු වියදම් කසළ දාහකය) | ඉදිකිරීම අවසානය | 3.882 |

13.1.7.12 මහා පරිමාණ කොම්පෝස්ට් අංගනවල සේවය කරන නිලධාරින් සහ කම්කරුවන් මෙහෙයුම් සහ නඩත්තු කටයුතු පිළිබඳ පුහුණු කිරීම

පිළිසරු ව්‍යාපෘතිය මගින් පහත සඳහන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

TABLE 36 පළාත් පාලන ආයතන සේවකයින් සහ වෙනත් අය සඳහා ලබා දුන් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ

| අංක. | පළාත | ඉලක්කගත කාණ්ඩායම් | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව | මුළු වියදම (රු) |
|---|---|---|---|---|---|
| 1. | ඌව පළාත | කම්කරුවන්/ක්ෂේත්‍ර කළමනාකරුවන්/රාජ්‍ය නිලධාරීන්/ස්වේඡා සේවකයින් | 1 | 57 | 969,184.00 |
| 2. | උතුරුමැද පළාත | | 2 | 133 | |
| 3. | වයඹ පළාත | | 2 | 138 | |
| 4. | සබරගමුව පළාත | | 2 | 86 | |
| 5. | මධ්‍යම පළාත | | 1 | 62 | |
| 6. | නැගෙනහිර පළාත | | 1 | 65 | |
| 7. | දකුණු පළාත | | 3 | 217 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8. | බස්නාහිර පළාත | | 2 | 141 | |
| | එකතුව | | 14 | 899 | |

### 13.1.8 ව්‍යාපෘතිය සම්බන්ධීකරණය මෙහෙයුම් හා කළමනාකරණය

පරිසර සහ මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ සියලු පාර්ශවකරුවන්ගේ උපදෙස් මත නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී. ඒ අනුව 2016 සඳහා ව්‍යාපෘති සම්බන්ධීකරණය මෙහෙයුම් සහ කළමනාකරණය සඳහ රුපියල් මිලියන 30.6083 ක් වෙන් කරමින් එය අනුමත වූ අතර වර්ෂය තුලදී එම කටයුතු ඉෂ්ඨ කිරීම සඳහා රුපියල් මිලියන 30.25 ක් වැය කෙරිණි. පිළිසරු ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා 2016 වසර තුළ නව නිලධාරීන් කාර්ය මණ්ඩලයට බඳවා ගන්නා ලදී. 2016 වසර දෙසැම්බර් මස අවසානයේදී කාර්ය මණ්ඩලය පහත පරිදි වූ අතර ඇතැම් අත්‍යවශ්‍ය තනතුරු දිර්ඝ කාලයක් පුරප්පාඩු වී තිබුණි.

**TABLE 37 2016** වසර තුළ පැවති තනතුරු හා පත්කිරීම්

| තනතුර | අනුමත කාර්ය මණ්ඩල ප්‍රමාණය | බඳවා ගත් ප්‍රමාණය | බඳවා ගන්නා ලද අවුරුද්ද සහ මාසය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | 01 | 01 | දෙසැම්බර් 2016 | -- |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 | 01 | - | -- |
| නියෝජ්‍ය කළමනාකරු | 01 | 01 | ජුලි 2016 | -- |
| ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | 01 | 01 | ඔක්තෝම්බර් 2016 | -- |
| ගණකාධිකාරී | 01 | 01 | සැප්තැම්බර් 2016 | -- |
| ව්‍යාපෘති නිලධාරී | 04 | 01 | ජුලි 2014 | 01 |
| | | 01 | අප්‍රේල් 2015 | |
| | | 01 | අප්‍රේල් 2015 | |
| පරිපාලන නිලධාරි | 01 | - | - | 01 |
| ප්‍රමාණ සමීක්ෂක | 01 | - | - | 01 |
| ව්‍යාපෘති ඉංජිනේරු | 02 | - | - | 02 |
| ව්‍යාපෘති සහකාර | 04 | 02 | - | 02 |
| | | 01 | අප්‍රේල් 2015 | -- |
| | | 01 | අප්‍රේල් 2015 | -- |
| ව්‍යාපෘති ලේකම් | 01 | -- | - | 01 |
| සැලසුම් ශිල්පී | 01 | 01 | අප්‍රේල් 2015 | -- |
| ප්‍රසම්පාදන නිලධාරී | 01 | 01 | ජුලි 2016 | -- |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රසම්පාදන සහායක | 01 | 01 | - | 01 |
| නීති සහකාර | 01 | 01 | ජුලි 2014 | 01 |
| ගිණුම් සහකාර | 01 | 01 | - | 01 |
| ලිපිකරු | 05 | 01 | දෙසැම්බර් 2013 | -- |
| | | 01 | දෙසැම්බර් 2013 | -- |
| | | 01 | අප්‍රේල් 2015 | -- |
| | | 01 | අප්‍රේල් 2015 | -- |
| කාර්යාලය සහායක | 02 | 02 | - | -- |
| එකතුව | 30 | 21 | | 11 |

පි13.1.9 ළිසරු ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය

තේරුම් ගැනීමේ පහසුව සහ පැහැදිලි බව සඳහා 2016 ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් සහ ඉලක්ක අනුව පිළිසරු ව්‍යාපෘතියේ ප්‍රගතිය දක්වා ඇත. ව්‍යාපෘතියේ අත්‍යවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය නොමැති තත්ත්වයකදී වුවද 2016 වසර තුළ 99.87% සාර්ථක ප්‍රගතියක් පෙන්වා තිබුණි. 2016 ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අරම්භයේදී රුපියල් මිලියන 190 ක් වෙන් කර දී තිබුණි. “පුනරුදය ජාතික පාරිසරික වැඩසටහන” යටතේ වූ ව්‍යාපෘති 04 ක් එම වසර තුළ ක්‍රියාත්ම කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් රුපියල් මිලියන 11.575 ක් ලබා දුනි. ඒ අනුව 2016 වසර වෙන් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය වූයේ රුපියල් මිලියන 201.575 කි. මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් 99.88% වූ රුපියල් මිලියන 189.7659 ක් සහ පුනරුදය ප්‍රතිපාදන වලින් 94.30% ක් වූ රුපියල් මිලියන 10.91486 ක් භාවිතා කිරීමට ව්‍යාපෘතිය සමත් විය. එක් එක් ක්‍රියාකාරම් සඳහා මූල්‍ය ප්‍රගතිය වගුව:11 සහ වගුව :12 මගින් දක්වා ඇත.

**TABLE 38** මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ වූ ක්‍රියාකාරකම් තුළ මූල්‍ය ප්‍රගතිය

| | සංරචක/ක්‍රියාකාරම් | වෙන් කළ මුදල | අරමුදල් |
|---|---|---|---|
| | | (රු.මි) | භාවිතය |
| | | | (රු.මිලි) |
| 1 | **නිසි අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම** | **6.6724** | **6.6731** |
| 1.1 | ඉලක්ක ගත කාණ්ඩායම් සඳහා දැනුවත් කිරීමේ වැඩසටනක් පැවැත්වීම | **0.8011** | **0.8261** |
| 1.2 | ජන මාධ්‍ය වැඩසටහන් (රූපවාහිනී සහ ගුවන්විදුලි) | **2.5195** | **2.5195** |
| 1.3 | වර්ෂයේ එන විශේෂ උත්සව සඳහා වැඩසටහන් | **1.0365** | **1.0123** |
| 1.4 | බැනර් සහ අත් පත්‍රිකා මුද්‍රණය (සිංහල,දෙමළ) | **2.3153** | **2.315** |

| | | | |
|---|---|---|---|
| **2** | **පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම** | **1.0548** | **0.9692** |
| 2.1 | අදාළ පුද්ගලයන්ට පුහුණු වැඩසටහන් පැවැත්වීම | **1.0548** | **0.9692** |
| **3** | **නාගරික අපද්‍රව්‍ය ප්‍රවාහනයට එකතුවන ප්‍රමාණය අවම කිරීම** | **9.063** | **8.5699** |
| 3.1 | කසළ වෙන් කිරීමට දිරිමත් කිරීම,ගෘහස්ථ අපද්‍රව්‍ය කළමනාකරණ සහ කොම්පෝස්ට්කරණය ප්‍රචලිත කිරීම | **2.112** | **1.2887** |
| 3.2 | 3R සංකල්පය ප්‍රචාරණය කිරීම | **6.951** | **7.2812** |
| **4** | **පළාත් පාලන ආයතන සඳහා නිසි අපද්‍රව්‍ය කළමනාකරණය පහසුකම් සැපයීම සඳහා** | **139.1671** | **140.7421** |
| 4.1 | ඉල්ලීම් අනුව අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ස්ථාන හඳුනා ගැනීමට පළාත් පාලන කොමසාරිස්වරුන්ට පහසුකම් සැලසීම | **0.27336** | **0.2734** |
| 4.2 | අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ස්ථාපිත කිරීම (නව ව්‍යාපෘති) | **62.793** | **53.8212** |
| 4.3 | අවශ්‍ය වැඩිදියුණු කිරීම් ලබාදීම. | **8.8263** | **7.6663** |
| 4.4 | කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පළාත් පාලන ආයතන වෙත අවශ්‍ය උපකරණ සහ පහසුකම් සැපයීමට | **24.08** | **35.0014** |
| 4.5 | පවතින කොම්පෝස්ට් අංගන සහ ජීව වායු ඒකක වලට කළ යුතු ගෙවීම් සිදු කිරීම | **43.1945** | **43.9798** |
| **5** | **පුද්ගලික අංශ වෙත** | **1.25** | **-** |
| **6** | **ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත පද්ධතිය සැකසීම.** | **0.1238** | **0.1238** |
| **7** | **දොම්පෙ සනීපාරක්ෂක කසළ රඳවුමේ මෙහෙයුම් කටයුතු** | **1.6553** | **2.0304** |
| **8** | **පිරිවැය - ප්‍රතිලාභ විශ්ලේශනය** | **0.4053** | **0.4053** |
| **9** | **ව්‍යාපෘති සම්බන්ධීකරණ, මෙහෙයුම් සහ කළමනාකරණය** | **30.6083** | **30.25** |
| 9.1 | **ව්‍යාපෘති සම්බන්ධීකරණ, මෙහෙයුම් සහ කළමනාකරණය** | **30.6083** | **30.2521** |
| **එකතුව** | | **190** | **189.7659** |
| | | | **99.88%** |

**TABLE 39** පුනරුදය ජාතික පාරිසරික වැඩසටහන යටතේ ප්‍රතිපාදන භාවිතා කිරීමේ ප්‍රගතිය

| | | | |
|---|---|---|---|
| **1** | **පුනරුදය ජාතික පාරිසරික වැඩසටහන යටතේ සැලැසුම් කර තිබූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසැල් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම** | **4.2** | **4.2** |
| 1.1 | ගුරුවරුන්ට සහ ළමුන්ට වැඩමුළු පැවැත්වීම. | **0.6** | 0.6 |
| 1.2 | කසළ වෙන් කරන බඳුන්,පෝස්ටර් සහ සහරා බෙදා දීම. | **3.6** | 3.6 |
| **2** | **මාතලේ මහා නගර සභාවේ සනීපාරක්ෂක කසළ රැඳවුමේ සංකල්පිත සැලැස්ම සහ තාක්ෂණික ශක්‍යතා අධ්‍යයනය** | **0.8** | **0.4** |
| **3** | **පුනරුදය ජාතික පාරිසරික වැඩසටහන යටතේ සැලසුම් කළ රත්නපුර මහා නගර සභාවේ ප්‍රතිචක්‍රීයකරණ අපද්‍රව්‍ය ගබඩා කිරීමේ මධ්‍යස්ථානය** | **2.575** | **2.3149** |
| **4** | **පුනරුදය ජාතික පාරිසරික වැඩසටහන යටතේ සැලසුම් කළ රත්නපුර කණාදොළ සමෝධානික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය** | **4** | **4** |
| **එකතුව** | | **11.575** | **10.9149** |
| | | | **94.30%** |

## 14.3 පාසල් පරිසර නියමු වැඩසටහන

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව පාසල් සිසුන්, පරිසර සංරක්ෂණ ක්‍රියාවලියට දායක කර ගැනීම සඳහා පරිසර නියමු වැඩසටහන පාසල් පද්ධතිය තුළ හඳුන්වා දී ඇත. දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය මඟින් පරිසර හිතකාමී අනාගත තීරකයන්, නායකයන් හා පාලකයන් බිහි කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ.

දිවයින පුරා සෑම පාසලකම පරිසර නියමු වැඩසටහන ව්‍යාප්ත කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද 2015-2019 පස් අවුරුදු සැලැස්මේ ව්‍යාපෘති වාර්තාව කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

පස් අවුරුදු සැලැස්මට අනුව 2016 වර්ෂයේ දී ප්‍රගතිය පහත පරිදි වේ.

**TABLE 40 දිවයිනේ මුළු පාසල් සංඛ්‍යාව 10042 (සිංහල හා දෙමළ)**

| වැඩසටහන | මාධ්‍යය | පවතින පාසල් සංඛ්‍යාව | 2016 වර්ෂයේ ආරම්භ කරන ලද සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|---|
| ළමා සමාජ වැඩසටහන | සිංහල | 1357 | 878 | 2235 | 3429 |
| | දෙමළ | 891 | 303 | 1194 | |
| පරිසර නියමු වැඩසටහන | සිංහල | 2486 | 457 | 2943 | 3739 |
| | දෙමළ | 765 | 31 | 796 | |

පරිසර නියමු වැඩසටහන ශක්තිමත් කිරීම වෙනුවෙන් 2016 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

### 13.2.1 පරිසර නියමු වැඩසටහනට අවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය

**TABLE 41 2015 වර්ෂයේ පරිසර නියමු ද්‍රව්‍ය නිෂ්පාදනයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.**

| අ.අ | ද්‍රව්‍ය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය |
|---|---|---|---|
| 1. | පරිසර නියමු සටහන් පොත | 24500 | 6500 |
| 2. | පරිසර නියමු හිස්වැසුම් | 3750 | 1000 |
| 3. | පරිසර නියමු පදක්කම් | 24500 | 6500 |
| 4. | හරිත සහතික | 5600 | 1100 |
| 5. | හරිත පදක්කම් | 5600 | 1100 |
| 6. | රජත සහතික | 1500 | 250 |
| 7. | රජත පදක්කම් | 1500 | 250 |
| 8. | ස්වර්ණ සහතික | 625 | |
| 9. | ස්වර්ණ පදක්කම් | 625 | |

| | | | |
|---|---|---|---|
| 10. | පරිසර නියමු ගුරු උපදෙස් පොත | 1000 | |
| 11. | පරිසර කොඩි | 375 | |

පළාත්/ දිස්ත්‍රික් කාර්යාලවලින් ඉදිරිපත් කරනු ලැබූ නව පරිසර නියමු කණ්ඩායම් ලියාපදිංචියට අදාළ ලකුණු ලේඛනවලට අනුව පරිසර නියමු කණ්ඩායම් ලියාපදිංචි කළ අතර, පළාත් කාර්යාලවලින් පරිසර නියමු ද්‍රව්‍ය බෙදාදීමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

### 13.2.2 ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම.

2004 වර්ෂයේ දී කරන ලද ස්වාධීන ඇගයීමට අනුව පරිසර නියමු වැඩසටහන මඟින් පාසල් සිසුන් හට පරිසර අධ්‍යාපනය හා දැනුවත් භාවය ලබාදීම පිළිබඳව සැලකිය යුතු සාර්ථකත්වයක් ලබා ඇති නමුත් මෙහි බලාපොරොත්තු වූ බලපෑම ආයතනික හා සංවිධානාත්මකබවේ ගැටලු නිසා ඵල දරා නැත. එබැවින් මෙම වාර්තාවේ යෝජනාවකට අනුව ජාතික පරිසර නියමු මෙහෙයුම් කමිටුවක් පරිසර හා අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් හා අදාළ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පිහිටුවීමට තීරණය කරන ලදී. ඒ අනුව, 2016 වර්ෂයේ දී ජාතික මෙහෙයුම් කමිටු රැස්වීමක් 2016.02.09 දින පවත්වන ලද අතර විශේෂ තීරණ ගනු ලැබීය.

### 13.2.3 තෝරාගත් පාසල් සිසුන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන්

පරිසර නියමුවන්ගේ නායකත්ව ගුණාංග වර්ධනය කිරීම සඳහා තෝරාගත් පරිසර නියමු නායකයන්ට නායකත්ව පුහුණු වැඩසටහන් පහත පරිදි පවත්වන ලදී.

**TABLE 42** නායකත්ව පුහුණු වැඩසටහන

| අ.අ. | දිනය | දිස්ත්‍රික්කය | ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | 2016.06.02 | කොළඹ | ශාන්ත ජෝන් විද්‍යාලය, කොළඹ 14 | 100 |
| 2. | 2016.06.03 | මඩකලපුව | මහජන විද්‍යාලය, මඩකලපුව | 84 |
| 3. | 2016.07.15 | පොළොන්නරුව | මනම්පිටිය ප්‍රතිබා ශාලාව, දිඹුලාගල | 100 |
| 4. | 2016.08.11 | යාපනය | තරුණ සම්මේලන මධ්‍යස්ථානය | 85 |
| | **එකතුව** | | | **369** |

### 13.2.4 කලාප මට්ටමින් පරිසර නියමු ගුරු පුහුණු වැඩසටහන්

පරිසර නියමු වැඩසටහන වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම අරමුණෙන් අධ්‍යාපන කලාප මට්ටමින් ගුරු පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

**TABLE 43** පරිසර නියමු ගුරු පුහුණු වැඩසටහන්

| අ.අ | දිනය | දිස්ත්‍රික්කය | අධ්‍යාපන කලාපය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | 2016.03.30 | නුවරඑළිය | නුවරඑළිය | 105 |
| 2. | 2016.04.05 | | වලපනේ | 80 |
| 3. | 2016.05.19 | අම්පාර | තිරුක්කෝවිල් | 47 |
| 4. | 2016.06.09 | කුරුණෑගල | ගිරිඋල්ල | 62 |

| අ.අ | දිනය | දිස්ත්‍රික්කය | අධ්‍යාපන කලාපය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 5. | 2016.06.24 | යාපනය | යාපනය | 54 |
| 6. | 2016.06.25 | පොළොන්නරුව | පොළොන්නරුව | 100 |
| 7. | 2016.07.02 | | හිඟුරක්ගොඩ | 100 |
| 8. | 2016.07.15 | ගම්පහ | මීගමුව | 95 |
| 9. | 2016.10.31 | මුලතිව් | මුලතිව් | 60 |
| | **එකතුව** | | | **703** |

### 13.2.5 කලාප මට්ටමින් විදුහල්පති පුහුණු වැඩසටහන්

පරිසර නියමු වැඩසටහන වඩාත් ශක්තිමත්ව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

**TABLE 44** විදුහල්පති පුහුණු වැඩසටහන්

| අ.අ | දිනය | දිස්ත්‍රික්කය | අධ්‍යාපන කලාපය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | 2016.03.29 | නුවරඑළිය | නුවරඑළිය | 100 |
| 2. | 2016.05.26 | යාපනය | යාපනය | 81 |
| 3. | 2016.05.26 | කුරුණෑගල | මහව | 80 |
| 4. | 2016.05.31 | මාතලේ | මාතලේ | 83 |
| 5. | 2016.07.12 | ගම්පහ | මීනුවන්ගොඩ | 100 |
| | **එකතුව** | | | **444** |

### 13.2.6 පරිසර නියමු සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා තෙදින නේවාසික පුහුණු වැඩසටහන

පරිසර නියමු සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් 2016 ජූලි 16, 17 හා 18 යන දිනවලදී සිංහරාජ කුඩව සංරක්ෂණ මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.



**13.2.7 පරිසර නියමු කොමසාරිස්වරුන් හා පරිසර නියමු වැඩසටහනේ විශිෂ්ට කාර්ය සාධනයක් දක්වන ලද කාර්යභාර ගුරුවරුන් සඳහා තෙදින නේවාසික පුහුණු වැඩසටහන**

2016 මැයි 05,06 හා 07 දිනවලදී පරිසර නියමු කොමසාරිස්වරුන් හා විශිෂ්ට කාර්යසාධනයක් දැක්වූ ගුරුභවතුන් ඇගයීම අරමුණු කරගනිමින් පැවැත්වූ නේවාසික පුහුණු වැඩසටහනක් කන්නෙලිය වනසංරක්ෂණ මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.



**ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පවත්වන ලද වැඩසටහන්**

2016 වර්ෂයේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ගුරු අභ්‍යාසලාභීන් සඳහා පුහුණු වැඩසටහන් 6ක් පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන්වලදී "මානෙල් දිවයිනේ මහජන විනිශ්චය" නම්වූ චරිත රංග අභ්‍යාසයක් විද්‍යාපීඨ ශික්ෂණලාභීන් විසින් රඟ දක්වනු ලැබිය.

**TABLE 45** දැනුවත්කිරීෙම් වැඩසටහන්

| අ.අ | දිනය | ස්ථානය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | 2016.02.27 | හාපිටිගම | 169 |
| 2. | 2016.03.12 | සියනෑ | 80 |
| 3. | 2016.03.19 | දඹදෙනිය, සාරිපුත්ත | 80 |
| 4. | 2016.04.30 | නිල්වලා | 213 |
| 5. | 2016.05.14 | පස්දුන්රට | 206 |
| 6. | 2016.06.11 | යාපනය | 177 |
| | **එකතුව** | | **925** |

**13.2.9 පරිසර ළමා සමාජ වැඩසටහන**

පිරිසිදු හා හරිත පරිසරයක් ඇති කිරීම අරමුණු කර ගෙන ප්‍රාථමික අංශයේ 1 සිට 5 ශ්‍රේණිය දක්වා සිසුන්ගේ චර්යා හා ආකල්ප වැඩිදියුණු කිරීම වෙනුවෙන් පරිසර ළමා සමාජ වැඩසටහන හඳුන්වා දී ඇත. මෙම ක්‍රියාකාරකම් මඟින් ප්‍රාථමික සිසුන් කුඩා කාලයේ දී පටන් පරිසර හිතකාමී ලෙස හැඩගැසීම මෙන්ම 6 වන ශ්‍රේණිය සිට ඔවුන් පරිසර නියමු වැඩසටහන සඳහා සම්බන්ධ කර ගැනීමට ඉඩ සලසා දෙනු ලබයි.

**TABLE 46 2016 වර්ෂයේ දී පරිසර ළමා සමාජ ද්‍රව්‍ය නිෂ්පාදනයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වාර්තා විය**

| අ.අ | ද්‍රව්‍ය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය |
|---|---|---|---|
| 1. | තුරුලතා සහතික | 20000 | - |
| 2. | සොබා සහතික | 4000 | 1000 |
| 3. | පරිසර ළමා සමාජ ගුරු අත්පොත | 1000 | 500 |

**13.2.10 දිස්ත්‍රික් පරිසර නියමු පුවත්පත මුද්‍රණය (එක් දිස්ත්‍රික්කයකින් පරිසර නියමු පුවත්පතක් බැගින්)**

පරිසර නියමු වැඩසටහන සඳහා සම්බන්ධ වන පාර්ශවයන් හා පාඨකයින් උදෙසා අත්දැකීම් සමගින් දැනුම ලබාගැනීම හා දැනුම බෙදා දීම අරමුණු කරගනිමින් පරිසර නියමු දිස්ත්‍රික් පුවත්පත ප්‍රකාශයට පත් කරන ලදී. 2016 වර්ෂයේ දී පරිසර නියමු දිස්ත්‍රික් පුවත්පත දිස්ත්‍රික් 22ක මුද්‍රණය කරන ලදී. (බෙදා හරින ලද මුළු පිටපත් ගණන 44000 කි).

**13.2.11 පරිසර නියමු ජාතික කඳවුර පැවැත්වීම.**

පරිසර නියමුවන්ට අත්දැකීම් හා දැනුම හුවමාරු කිරීමට අවස්ථාවක් උදාකරලීම සඳහා පරිසර නියමු ජාතික කඳවුර පවත්වන ලදී. 2016 වර්ෂයේ පරිසර නියමු ජාතික කඳවුර සැප්තැම්බර් 21 දින සිට 24 දක්වා සිසුන්, ගුරුවරුන් ඇතුළු නිලධාරින් 350කගේ සහභාගීත්වයෙන් පේරාදෙනිය ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ දී පවත්වන ලදී.

**13.2.12 ජනාධිපති පදක්කම් ප්‍රදානය**

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016 ඔක්තෝබර් 18 වෙනි දින කොළඹ, බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී පරිසර නියමු ජනාධිපති පදක්කම් ප්‍රදානෝත්සවය පවත්වන ලදී. එහිදී පරිසර නියමු ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලද පරිසර නියමුවන් 41 දෙනෙකු සඳහා ජනාධිපති පදක්කම් ප්‍රදානය කරන ලද අතර මෙහිදී කැපවීමෙන් සේවය කළ ගුරුභවතුන් තිදෙනෙක් සඳහා ගුරු උපහාර ප්‍රදානය කරන ලදී.



**13.2.13 පළාත් මට්ටමින් ප්‍රගති සමාලෝචන වැඩසටහන් පැවැත්වීම.**

2016.02.01 දින ඌව පළාත් පරිසර නියමු කලාප හා කොට්ඨාශ කොමසාරිස්වරුන් 36 දෙනෙකු දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් බදුල්ල ඕනික්ස් හෝටලයේ දී පවත්වන ලදී.

2016 වර්ෂයේ දී පරිසර නියමු වැඩසටහනේ ලබාදුන් ඉලක්කවල ප්‍රගතිය අධීක්ෂණය මධ්‍යම පරිසර අධිකාරියේ දී 2016.11.01 දින පවත්වන ලදී.

**13.2.14 දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාල සඳහා පරිසර නියමු දත්ත පද්ධතිය සකස් කිරීම සඳහා පරිගණක යන්ත්‍ර ලබාදීම.**

2016 වර්ෂයේ දී පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් පරිසර නියමු වැඩසටහනේ දත්ත පද්ධතිය පවත්වා ගෙන යාම සඳහා පරිගණක යන්ත්‍ර 4ක් බෙදා දෙන ලදී.

**13.2.15 ඉහළ දක්ෂතා දැක්වූ ජනාධිපති පදක්කම් ලාභීන් සඳහා විදේශ අත්දැකීම් හා පුහුණුව ලබා දීම.**

ජනාධිපති පදක්කම් දිනා ගැනීමට සිසු සිසුවියන් උනන්දු කරවීම හා විදේශ රටවල ක්‍රියාත්මක වන පරිසරය සංරක්ෂණය සහ දැනුවත් කිරීමේ ක්‍රමවේද දැන හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. එහිදී මෙම වැඩසටහන වඩාත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට බලාපොරොත්තු වේ. මෙම වාරිකාවේදී 2016

වර්ෂයේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරිනියක්, පරිසර නියමු කාර්යභාර ගුරුවරුන් 3දෙනෙකු, පළාත් හා දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරින් 3 දෙනෙකු, මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ නිලධාරින් 2 දෙනෙකු සහ ඉහළ කුසලතාවයන් දැක්වූ ජනාධිපති පදක්කම් ලාභීන් 24 දෙනෙකු, කණ්ඩායම් නායකයෙකු ඇතුළු 34 දෙනෙකු නවදිල්ලියේ විද්‍යාව හා පරිසරය පිළිබඳ ආයතනයේදී (Center for Science &Environment) 2016 දෙසැම්බර් 05 දින සිට දෙසැම්බර් 11 දක්වා පැවති පුහුණු වැඩසටහනට සහභාගි විය.





**භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ප්‍රාග්ධන හා පුනරාවර්තන නොවන)**

## 13.3 මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරයන් බල ගැන්වීම සහ එමගින් දිවයින පුරා සිදු කරනු ලබන පසු විපරම් ක්‍රියාවලියේ ශක්‍යතාවය ප්‍රවර්ධනය කිරීම

2014 වර්ෂයේ ආරම්භ කල මෙම ව්‍යාපෘතිය ප්‍රධාන අංශ 3කින් සමන්විතවේ. එනම් පරිසර අධිකාරියේ වර්තමාන අවශ්‍යතාවයට අනුකූලව අවශ්‍ය වන සම්පත් ලබාගැනීම, සේවක මණ්ඩල ධාරිතා වර්ධනය සහ පළාත් හා ගම්පහ දිස්ත්‍රික් රසායනාගාර ස්ථාපිත කිරීම.

2016 වසර තුළ ජල සාම්පල පරික්ෂා කිරීමට අවශ්‍ය වන මූලික පහසුකම් සහිතව ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය ස්ථාපිත කරන ලදී. එමෙන්ම ගම්පහ දිස්ත්‍රික් රසායනාගාරය සඳහා සාම්පල විශ්ලේෂණට සිදුකල හැකි නිලධාරියෙක් පත්කල අතර ඔහුට අවශ්‍ය පුහුණු වැඩසටහන් ප්‍රධාන කාර්යාලයේ රසායනාගාරය තුළදී ලබාදෙන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ඇති ප්‍රධාන ගැටළුවක් වනුයේ නිපුණතාවයෙන් හෙබි කාර්ය මණ්ඩලයක් නොමැති වීමයි. 2016 වසරේදී මෙම ගැටළුව විසඳීම සඳහා රසායනඥයින් 09 දෙනෙක් සහ රසායනාගාර සහයකයින් 07 දෙනෙක් බඳවා ගන්නා ලදී. එම නව පත්වීම්ලාභීන් සඳහා විශේෂිත වූ ආරම්භයක පුහුණු වැඩසටහනක් ද සැලසුම් කොට ඇත.

රසායනාගාරය ශක්තිමත් කිරීම සඳහා වෙන්කොට තිබූ මුදලින් රුපියල් මිලියන 28.5ක් වැය කර පහත සඳහන් උපකරණ මිලදීගන්නා ලදී. මීට අමතරව මිලියන 1.5ක් වැය කොට රසායනාගාර ද්‍රව්‍ය හා විදුරු උපකරණ මිලට ගෙන ප්‍රාදේශිය රසායනාගාර සඳහා ලබාදෙන ලදී.ලබා ගත් උපකරණ

- B & K 2270 ශබ්ද මට්ටම් විශ්ලේෂකය
- හයිඩ්‍රොකාබන් විශ්ලේෂකය
- චිමිනි විමෝචන පසු විපරම් උපකරණය
- වාතයේ අවලම්භිත අංශු මැනීමේ උපකරණ කට්ටලය
- කාබන් මොනොක්සයිඩ් විශ්ලේෂකය
- ඕසෝන් විශ්ලේෂකය

## ලබා ගත් උපකරණ




High Volume Samplers







Stack Monitoring Equipment

Hydrocarbon Analyzer




Air quality analyzers



Sound Level Analyzer

## අලුත් වැඩියා කරන ලද උපකරණ

- වාතයේ අවලම්භිත අංශු මැනීමේ උපකරණ කට්ටලය
- B & K 2250 ශබ්ද මිනුම් උපකරණය වටිනාකම රුපියල් මිලියන 0.65

# 13.4 ශ්‍රී ලංකායේ ඝන අපද්‍රව්‍ය බැහැරලීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (EDCF ව්‍යාපෘතිය)

## 13.4.1 හැඳින්වීම

### 13.4.1.1 දළ විශ්ලේෂණය

වර්තමානයේ අවිධිමත් ලෙස නාගරික ඝන අපද්‍රව්‍ය බැහැර කරීම තුලින් පාරිසරික හා සෞඛ්‍යමය ගැටළු රාශියක් උත්ගතවී ඇත. මේ සඳහා විසඳුමක් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඒකාබද්ධ කසල කළමනාකරණ ක්‍රමවේදයන් ඉදිකිරීමට සැලසුම් කර ඇත.

මධ්‍යම පරිසර අධිකාරිය ඉල්ලීම පරිදි තෝරා ගත් නගර සඳහා සනීපාරක්ෂක බිම් පිරවුම් හතරක් ඉදිකිරීමට කොරියානු ජනරජයේ අපනයනආනයන බැංකුව- මගින් ණය මුදලක් ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය විසින් විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

එම සනීපාරක්ෂක බිම් කැබලි අනුරාධපුර, කීරික්කුලම, හික්කඩුව/ මොන්රෝවියාවත්ත, පානදුරේ/ මානමුල්ල, සහ උඩුනුවර/ ගෝනදිකවත්ත යන ප්‍රදේශ වල ඉදිකරනු ලබන අතර, අදාළ පළාත් පාලන බල ප්‍රදේශ වල ජනනය වන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පොකුරු පාදක කරගත් පොදු අවසන් බිම් පිරවුමක් ඉදි කිරීමට කටයුතු කරනු ඇත.

ව්‍යාපෘතිය සඳහා ඇස්තෙම්න්තුගත මුළු වියදම ඇ මිලියන.ඩො.41.886 ක් වන අතර ඇ ඩො. මිලියන33.536 ක් EDCF මගින් ලබා ගැනීමට අපේක්ෂිතයඇ .මෙරිකා ඩොලර් මිලියන 8.350 ක මුදලක් ශ්‍රී ලංකා රජය විසින් ලබා දෙනු ඇත .EDCF ණය වල අදාළ නියමයන් සහ කොන්දේසි තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ලබන රටවල් වලිනි.

### 13.4.1.2 විෂය පථය

එක් එක් ස්ථානවල සනීපාරක්ෂක බිම් පිරවුම්හලක් නිර්මාණය කිරීම හා ඉදිකිරීම:

මීගස්වැව, මැදිරිගිරිය (විකල්ප ලෙස ලෙස පානම, මානමුල්ල)

කීරික්කුලම, අනුරාධපුරය

කීරිමලයි, යාපනය (විකල්පයක් ලෙස ගෝනදිවත්ත, උඩුනුවර(

මොන්රෝවියාවත්ත, හික්කඩුව

ක්ෂරණය වූ ජලය පිරිපහදුව සඳහා සැලසුම් සකස් කිරීම

ගෑස් කළමනාකරණය සඳහා සැලසුම් සකස් කිරීම

අපද්‍රව්‍ය තක්සේරු කිරීම

අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රම සහ ධාරිතාව තක්සේරු කිරීම

### 13.4.1.3 අපේක්ෂිත ප්‍රථිපල සහ ප්‍රතිලාභ

මෙම ඝන අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය හරහා ශ්‍රී ලංකාව තුල නගර වල පිරිසිදු භාවය සහ යටිතල පහසුකම් ගොඩනැගෙනු ඇත.

ව්‍යාපෘතිය අවසන් වූ පසු, ජාතික ප්‍රතිරූපය වැඩිවන අතර , රැකියා අවස්ථාවන් නිර්මාණය වීම සහ ආර්ථික සංවර්ධනය වර්ධනය සඳහා උපකාරී වනු ඇත නාගරික ඝන .අපද්‍රවය නිසි ලෙස බැහැර කිරීම සහ කළමනාකරණය කිරීම මගින් වඩා හොඳ මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සහතික කරනු ඇත එමගින් . රෝගී තත්ත්වයන් අඩු වන අතර ආර්ථික සුරක්ෂිතාවය තහවුරු වේ.

ව්‍යාපෘතිය අවසානයේ අපේක්ෂාවන් :ව්‍යාපෘති ස්ථාන වටා පාරිසරික තත්ත්වයන් වැඩි දියුණු කිරීම.

ප්‍රදේශයේ ජනතාව සඳහා මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම.

අපජල පවිත්‍රාගාර වල සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීම.

පස, ජලය සහ වාතය දූෂණය වීම සහ අනෙකුත් පාරිසරික හා සමාජ ආර්ථික ගැටළු අවම කිරීම.

ඒකාබද්ධ ඝණ අපද්‍රවය පිරිපහදු කිරීමේ ක්‍රියාකාරිත්ව පිළිබඳ තාක්ෂණික දැනුම හුවමාරුව

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් අපේක්ෂිත විශේෂිත පාරිසරික, තාක්ෂණික සහ සමාජ ආර්ථික ප්‍රතිලාභ පහත දැක්වේ.

**පාරිසරික ප්‍රතිලාභ**

ප්‍රතිචක්‍රීකරණය කළ හැකි සම්පත් භාවිතය උපරිම කිරීම.

සනීපාරක්ෂක පිරිපහදු කිරීමේ පද්ධතිය මගින් පදිංචිකරුවන් සඳහා සුවදායී ජීවන පරිසරයක් ලබා දීම.

සනීපාරක්ෂක පිරිපහදු කිරීමේ පද්ධතිය මගින් පදිංචිකරුවන් සඳහා මහජන සෞඛ්‍යමය තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා දායක වීම.

ක්‍රමවත් සහ විද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රමයන් අනුගමනය කරමින් ද්විතියික පරිසර ගැටලු ගැටළු අවම කරමින් , භූමි අලංකරණය වැඩිදියුණු කිරීම.

අහඹු, අනවසර අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් දූෂණය වන ප්‍රදේශ ආරක්ෂා කිරීම.

විවිධ සිවිල් පැමිණිලිවල නඩු විසඳීම හා පැමිණිලි අවම වීම මෙන්ම පුරවැසියන්ගේ පොදු සෞඛ්‍ය ආරක්ෂා කිරීම.

ජාතික ඉඩම් පරිහරණ සැලැස්ම තුළ විවේක සහ විනෝද කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩක් ලබා ගැනීමට පුරවැසියන්ට ඉඩ ලබා දීම.

**තාක්ෂණික ප්‍රතිලාභ**

පුළුල් කළමණාකරණය මගින් විශ්වසනීය හා සකසුරුම් අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.

කසල සෞඛ්‍ය සම්පන්නව හා දිගු කාලීනව බැහැර කිරීම.

ගොඩබිම් ක්‍රියාකාරකම් හා නඩත්තු කිරීමේ තාක්ෂණය දායක කර කිරීම .

ක්ෂරය වූ ජලය පිරිසිදු කිරීම හා කළමණාකරණ තාක්ෂණය දායක කරගැනීම .

**ආර්ථික ප්‍රතිලාභ**

ඉඩම් භාවිතය සාධාරණීකරණය කිරීම.

ඉදිකිරීම් සහ මෙහෙයුම් කටයුතු සඳහා රැකියා අවස්ථා නිර්මාණය කිරීම.

බිම් පිරවුම් ගොඩකිරීමේ කටයුතු පිලිබඳව පුරවැසියන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම.

සමෝධානික අන්තර් ක්‍රියාකාරකම් කාර්යයන් ඇති කිරීම මගින් පරිසර හිතකාමී වටපිටාවක් ඇති වීම.

ගෘහස්ථ අපද්‍රව්‍ය කළමනාකරණය හා බැහැර කිරීමේ පිරිවැය අවම වීම.

ද්‍රව්‍යමය සම්පත් ප්‍රතිචක්‍රීකරණය කිරීම තුළින් පිරිවැය කාර්යක්ෂමතාව.

**සමාජ ප්‍රතිලාභ**

විශ්වසනීය හා සනීපාරක්ෂක කසළ පිරිපහදු පහසුකම් සැපයීම.

අවට පරිසර සඳහා ගැලපෙන කසළ කළමනාකරණය මගින් හිතකර ආකල්පයන් වර්ධනය වීම.

පාරිසරික හිතකාමී සංකල්පය ක්‍රියාවට නැංවීමෙන් පරිසරයට හා අපද්‍රව්‍ය කසළ රඳවනයට සම්බන්ධ පුරවැසියන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම.

සනීපාරක්ෂක බිම් පිරවුම්හල් ඉදිකිරීම මගින් දිගුකාලීන සංවර්ධනයට දායක වීම.

### 13.4.2 ව්‍යාපෘති ස්ථාන




FIGURE 0-17 ව්‍යාපෘති ස්ථාන

#### 13.4.2.1 කිරියක්කුලම් /අනුරාධපුර සහ මොන්රෝවියවත්ත /හික්කඩුව

ඉහත ස්ථාන දෙකට අදාල විස්තරාත්මක නිර්මාණ සටහන් සම්පූර්ණ කර 2016 මාර්තු මස ලැබී ඇති අතර ඒ සඳහා කුන්වා ඉංජිනේරු සහ උපදේශන ආයතනයට ඇ.ඩො 426 623 මුදලක් ගෙවා ඇත.

බිම් පිරවුම් දෙකක් ඉදිකිරිම සඳහා කොන්ත්‍රාත්කරු ප්‍රසම්පාදනය සම්බන්ධ ලන්සු ප්‍රධානය කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව ලන්සු සහ අදාල ඇමුණුම් සකස් කර අවසන් කර ඇත. මහවැලි සංවර්ධන අමාත්‍යංශයේ කැබිනට් මණ්ඩල මගින් පත් කරනු ලබන තාක්ෂණික විගණන කමිටුව විසින් මෙම ලියකිවිලි නිර්ක්ෂණය කරන ලබන අතර කොරියානු ආනයන අපනයන බැංකුවේ එකගතාවයන් සඳහා ඉදිරිපත් කරන ලදී.

#### 13.4.2.2 යුදගනාව /මැදිරිගිරිය

කාල සීමාව , ඉඩම් සපයා ගැනීම හා ව්‍යාපෘතියේ පරිමාව හේතුවෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය, යුගගනවා ප්‍රදේශයේ පිහිටි භූමිය පයාගල ව්‍යාපෘති භූමියට විකල්පයක් ලෙස හඳුනා ගෙන ඇත. යෝජිත ස්ථානය පිලිසරු ව්‍යාපෘතිය මගින් ඉදිකරන ලද කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමට සැලසුම් කර ඇත . මුලික විමර්ශනයන් සිදු කරන ලද්දේ කුන්වා උපදේශකවරුන් ආයතනය විසිනි. කසල රදවනය ඉදි කිරීම සඳහා අදාල භූමිය යෝග්‍ය බව උපදේශන ආයතනය විසින් නිර්දේශ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉඩම ලබා දී ඇති අතර පරිසරය මුදාහැරීම හා පාරිසරික නිර්දේශ ලබා ගැනීම සඳහා සමාන්තර ක්‍රියාකාරකම් සිදු කර ඇත එම .භූමිය සඳහා ශක්‍යතා අධ්‍යනය සම්පූර්ණ කර ඇත. මැදිරිගිරිය ව්‍යාපෘති භූමිය සඳහා මුලික සැලසුම් වාර්තාව 2016 මැයි 31 දින ලැබුණු අතර එම වාර්තාව සඳහා අදහස් ලබා ගැනීමට අදාල පාර්ශව සමග ජුනි 9 දින

රැස්වීමක් පවත්වන ලදී. මහජනතාව මගින් ඇති වූ විරෝධතාව නිසා විරෝධතාවය මග හරවා ගැනීමට දොම්පේ සනීපාරක්ෂක පිරවුම් ව්‍යාපෘතිය නැරඹීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන ලැබූ අතර ඒ මගින් සනීපාරක්ෂක බිම් පිරවුම් ව්‍යාපෘතිය පිළිබඳව අවබෝධයක් ලබා දෙන ලදී. පාර්ශව කරුවන් මෙම ව්‍යාපෘතිය සඳහා එකග වූ නමුත් එහි ඉදිකිරිම කටයුතු යුදගනාව ව්‍යාපෘති භූමිය තුල සිදු කිරීමට විරෝධතාවය දැක්වූ අතර එබැවින් වන සංරක්ෂණ දෙපර්තුමෙන්තුවලට අයත් මැදිරිගිරිය මීගස්වැව ප්‍රදේශයේ භූමියක් තුල ඉදිකිරීමට තීරණය කරන ලදී.

ඉඩම් නිරවුල් කිරීම සහ පරිසර අනුමැතිය ලබා ගැනීම ආරම්භ කරන ලද අතර ව්‍යාපෘතියේ ප්‍රමාදය මගහරවා ගැනීමට ක්ෂේත්‍ර පරීක්ෂණ හා සැලසුම් එකවර ක්‍රියාත්මක කරන ලදී.

සැලසුම් කරන ලද වැඩ නිමකරන ලද අතර ව්‍යාපෘතියට අදාල අවසන් විස්තරාත්මක සැලසුම් 2016 දෙසැම්බර් මාසයේ ලබා ගන්නා ලදී.

කෙසේ වෙතත්, යුගගනාව ව්‍යාපෘති භූමිය සම්බන්ධයෙන් සිදු කරන ලද වැඩ සඳහා උපදේශකයින්ට අමතර බිල්පත් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත් කරන ලද කමිටුවේ සමාලෝචනයක් තවමත් පවතී.







රූප සටහන 1: මැදිරිගිරිය ක්ෂේත්‍ර පරීක්ෂාව



රූප සටහන 2 : රැස්වීම මැදිරිගිරිය

### 13.4.2.3 කීරිමලෙයි යාපනය

යාපනයයේ එවැනි පහසුකමක් තිබිය යුතු බවට යාපන කාර්යාලයෙන් යෝජනාවක් ඉදිරිපත් කර ඇත.ව්‍යාපෘති භූමිය උතුරු වලිකාමම් ප්‍රදේශයෙහි කීරිමලෙයි. මෙම ව්‍යාපෘතියෙහි මූලික ක්ෂේත්‍ර පරික්ෂාව කුන්වා උපදේශන ආයතනය , වලිකාලම් උතුර ප්‍රදේශිය සභාවේ නිලධාරීන් සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් ( යාපනය කාර්යාලය )මගින් සිදු කරන ලදී . යාපනය දිස්ත්‍රික් ලේකම්වරයා සමහද පැවති රැස්වීමේදී ව්‍යාපෘතිය සම්බන්දයෙන් මූලික එකගතාවයන් සහ ඉඩම නිදහස් කර ගැනීම සඳහා ඇති කර ගන්නා ලදී.

යෝජිත ව්‍යාපෘති භූමිය සනීපාරක්ෂක බිම පිරවුම් සඳහා මූලික ලක්ෂණ අතින් යෝග්‍ය වන අතර

අතහරින ලද හුණුගල් වළකි. එම නිසා මෙම භූමිය නිදහස් කර ගැනීම සඳහා අදාල ශක්‍යතා අධ්‍යනය සහ මැනුම් කටයුතු සිදු සිදු කරන ලදී.

සියලුම භූමි අධ්‍යනයන් සිදු කරන ලද අතර යාපනයෙහි පවතින භූමි සංවේදීතාවය නිසා විශේෂ ජල රසායනික අධ්‍යනයක්ද සිදු කරන ලදී.

සිදු කරන ලද සොයා ගැනීම් මත මූලික සැලසුම් නිර්මාණය සම්පූර්ණ කරන අතර ඒ පිලිබඳව අදාල පාර්ශවයන් සමග 2016 ජුනි 10 දින සාකච්චා කරන ලදී.එමෙන්ම විස්තරාත්මක ආකෘති 2016 අගෝස්තු 11 දින සාකච්චා කරන ලදී.

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රදේශීය දේශපාලන අධිකාරිය දැනුවත් කිරීම සඳහා විශේෂ රැස්වීමක් ප්‍රධාන අමාත්‍ය තුමන්ගේ ප්‍රධානත්වයෙන් සහ අදාල නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිද කරන ලදී.

.




රූප සටහන 18 කිරිමලයි යාපනය

### 13.4.3 ව්‍යාපෘති කාර්යමණ්ඩල

ඉංජිනේරු එම්.බී හේමදාස මහතා 2016 දෙසැම්බර් 16 දින ව්‍යපෘති අධ්‍යක්ෂක ලෙස වැඩ භාර ගන්නා ලදී. සරෝජනී ජයසේකර මහත්මිය නියෝජ්‍ය ව්‍යපෘති අධ්‍යක්ෂක ලෙස 2015 දෙසැම්බර් 1 දින සිට ව්‍යපෘතියේ වැඩ බලන ලදී.

**TABLE 47** ව්‍යාපෘති කාර්ය මණ්ඩලය

| | තනතුර | නම | සිට | දක්වා |
|---|---|---|---|---|
| 01 | ව්‍යාපෘති අධ්‍යක්ෂ | වැඩ ආවරණය | 2016.01.01 | 13.12.2016 |
| | | ඉංජි. එම්.බී හේමදාස මහතා | 14.12.2016 | මේ දක්වා |
| 02 | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | සරෝජනී ජයසේකර මිය | 01.06.2012- | මේ දක්වා |
| 03 | කළමණාකරු ක්‍රමසම්පාදන හා සැලසුම් | ජේ.එම්.යු ඉන්ද්‍රරත්න මහතා | 01.09.2012 | මේ දක්වා |
| 04 | කළමණාකරු ප්‍රසම්පාදන හා සැලසුම් සංවිධාන | ගාමිණී මධුරආරච්චි මහතා | 08.08.2016 | මේ දක්වා |
| 05 | ව්‍යාපෘති ගණකාධිකාරි | ප්‍රදිප් වක්වැල්ල මහතා (වැඩ ආවරණය ) | 15.02.2015 | 18.10.2016 |
| | | ලංකා ධර්මක්‍රම මහතා | 19.10.2016 | මේ දක්වා |
| 06 | ව්‍යාපෘති නිලධාරි | කේ.ඩබ්ලිව් ගුණවර්ධන මහතා | 11.07.2014 | මේ දක්වා |
| 07 | ව්‍යාපෘති ඉංජිනේරු | පුරප්පාඩු | | |
| 07 | පරිපාලන නිලධාරි | ජී.එම්.ලියනගේ මිය | 17.03.2014- | 20.05.2016 |
| 08 | ප්‍රසම්පාදන නිලධාරි | කේ.ඩී.සී.පී ජයවික්‍රම මහතා | 25.07.2016 | මේ දක්වා |
| 09 | ගිණුම් ලිපිකරු | කේ.එල්.ඒ බිමාලි වත්සලා | 03.12.2012 | මේ දක්වා |
| 10 | සාමාන්‍ය ලිපිකරු | එච්.එච් . ටී සඳරුවන් | 01.08.2013 | මේ දක්වා |
| 11 | කාර්යාල සහයක | වයි.ජී.එන් ගුණරත්න | 14.11.2013 | මේ දක්වා |

**TABLE 48** මුලා ප්‍රගති වාර්තාව **-2016**

| ආදායම | වෙන් කිරිම | ලැබීම් | වියදම |
|---|---|---|---|
| | | | |
| විදේශිය දායකත්වය | 160,000,000 | 59,834,000.00 | 59,834,000.00 |
| දේශිය දායකත්වය | 26,027,134 | 26,027,134.00 | 26,027,134.00 |
| අමතර ලැබීම් | | 127,004.74 | 127,004.74 |
| එකතුව | 186,027,134 | 85,988,138.74 | 85,988,138.74 |
| * kunhwa උපදේශක සමාගමට මෙම ගණුදෙනු ගෙවීම් මාරුව නිර්දේශ කර සහතික කර ඇත. | | | 60,000,000.00 |
| මුලු එකතුව | | | 145,988,138.74 |
| වියදම් | | | |
| | | | |
| බදු ගාස්තු සහ සේවා ගාස්තු | | | 11,067,881.29 |
| යටිතල පහසුකම් සංවර්ධනය | | | 2,466,773.14 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | 13,534,654.43 |
| ප්‍රවාහනය | | | | 1,166,866.29 | |
| ව්‍යාපෘති සැපයුම් | | | | 42,825.18 | |
| වැටුප් | | | | 7,176,262.01 | |
| සංනිවේදනය | | | | 113,672.53 | |
| පුහුණු කිරිම හා හැකියා වර්ධනය | | | | 179,376.00 | |
| කාර්යාල කුලි | | | | 3,145,983.32 | |
| ව්‍යාපෘති සමායෝජනය | | | | 193,115.96 | |
| අනෙකුත් | | | | 601,383.02 | 12,619,484.31 |
| | | | | | |
| **මුලු වියදම** | | | | | **26,154,138.74** |
| | | | | | |

## 13.5 ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජලාශ වල ජල තත්ව පසුවිපරම් කිරීමේ හා මධ්‍යම පරිසර අධිකාරියේ බලාත්මක කිරීමේ කාර්ය මණ්ඩලය බලගැන්වීමේ JICA ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියක් ලෙස සැලකෙන අතර, JICA ව්‍යාපෘති ප්‍රවීනයන් විසින් සැලසුම් කල ආකාරයට ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නියැලෙනු ලබයි. මධ්‍යම පරිසර අධිකාරිය දේශීය පාර්ශවකරුවා ලෙස ක්‍රියා කරයි. ව්‍යාපෘති ලේකම් හැරුණු කොට වෙනත් කාර්ය මණ්ඩලයක් බඳවාගෙන නොමැති අතර, JICA ආයතනය උපදේශන සේවාවන් සපයන CTI ඉංජිනියරින් ඉන්ටර්නැෂනල් ආයතනය සහ ඔරියන්ටල් කන්සල්ටන්ට් ග්ලෝබල් ආයතනය යන ආයතන දෙකේ සේවාවන් ලබාගනී. කැළණි ගඟ ආශ්‍රිත ජල තත්ව කළමනාකරණය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සහ ප්‍රාදේශීය කාර්යාල වල බලාත්මක කිරීමේ ක්‍රියාවලිය බල ගැන්වීම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කරයි. 2015 මාර්තු මස ආරම්භ කල මෙම ව්‍යාපෘතිය වසර 3 ක කාලයක් පුරා ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රධාන නිමැවුම් 04 ක් අපේක්ෂා කෙරේ.

ජල මූලාශ්‍ර වර්ගීකරණය සහ සංසරණ ජල තත්ව සකස් කිරීම

ජල තත්ව විශ්ලේෂණය සඳහා රසායනාගාර කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය

ඉලක්කගත පාර්ශවකරුවන්ගේ විමර්ශණය කිරීම් ඇතුළු ජල තත්ව පසුවිපරම් කිරීමේ හා බලාත්මක කිරීමේ ධාරිතාවන් ශක්තිමත් කිරීම, දූෂකාරක නාමාවලියක් සැකසීම සහ පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීම

රට අභ්‍යන්තරයේ ඇති ජල මූලාශ්‍ර සඳහා විමර්ශන තොරතුරු, පරිසර ආරක්ෂණ බලපත්‍ර තොරතුරු සහ දූෂකාරක නාමාවලියේ ඇතුලත් දත්ත ද ඇතුලත්ව ජල තත්ව පසුවිපරම් කිරීම සඳහා තොරතුරු කළමනාකරණ පද්ධතියක් සැකසීම හා එය ඵලදායී ලෙස භාවිතා කිරීම

මෙම නිමවුම් වෙනුවෙන් ස්ථාපිත කර ඇති ක්‍රියාකාරී කණ්ඩායම් 04 ක් මඟින් මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සිදුකරගෙන යනු ලබයි. ජල මූලාශ්‍ර වර්ගීකරණය, නියැදි ලබාගැනීම සහ විමර්ශන කටයුතු කිරීම සඳහා මාර්ගෝපදේශයන් සඳහා කෙටුම්පතක් සකස් කිරීම, රසායනාගාරය සඳහා ISO තත්ව සහතිකය ලබාගැනීම සහ දූෂකාරක නාමාවලිය සැකසීමෙහිලා මෙම ක්‍රියාකාරී කණ්ඩායම් ක්‍රියා කරමින් සිටී. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ජයග්‍රහනයන් පහතින් දක්වා ඇ.

සමස්ථ ව්‍යාපෘති කණ්ඩායම මෙම ව්‍යාපෘතිය ක්‍රමානුකූලව, කාර්‍යක්ෂමව සහ අදාල කාල පරාසය තුල අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගැනීමට ක්‍රියාකරමින් සිටී. පසුගිය මාස 12 ක කාලය තුල මෙම කණ්ඩායම වැඩි කාලයක් ක්ෂේත්‍රය තුල ජල තත්ව පසුවිපරම් හා ක්ෂේත්‍ර පරීක්ෂාවල නිරත විය. එහිදී කාර්යාලය තුල රැස්වීම් හා ලිපිගොනු රාජකාරී සඳහා අවම කාලයක් වෙන් කරන ලදි. මෙමඟින් ලඟාකරගත් ජයග්‍රහනයන් පහතින් දැක්වේ.

2016 අගෝස්තු මාසයේ දී පවත්වන ලද ඇගයීමේ දී යම් පසුබෑමක් පෙන්නුව ද, නැවත ප්‍රකෘති තත්වයට පැමිණීම සිදු කරන ලදි. මෙයට හේතුව වූයේ නව උපදේශක වරයෙක් රසායනාගාර ප්‍රතිකරන වැඩසටහනට අනුයුක්ත කිරීමත් මාර්ගෝපදේශ සැකසීම සඳහා නව ප්‍රවේශයක් භාවිතා කිරීමත්, තොරතුරු කළමනාකරණ පද්ධතියේ ගැටළු සඳහා නව විශේෂඥයෙක් පත් කිරීමත් යන කරුණු පෙන්වාදිය හැක.

මෙම කාලය තුල මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය සඳහා උපකරණ 23 ක් මිලදී ගැනීම සැලසුම් කළ අතර ඉන් 22 ක් මිලදී ගැනීමට හැකි විය. මින් 23 වන අයිතමය වන්නේ නිර්දේශිත සහතික කරන ලද භාණ්ඩ 03 කි. එම භාණ්ඩ 13 ලැබීම ප්‍රමාද වී ඇත. එයට හේතුව වන්නේ මෙම භාණ්ඩ වල සැපයුම්කරු රසායනාගාර පාරිභෝගික කළමනාකරණය සඳහා ලියා පදිංචිවී නොතිබීමයි. ව්‍යාපෘතිය මේ සඳහා විශේෂයෙන් මැදිහත් වී එම ක්‍රියාවලිය වේගවත් කිරීමට අපේක්ෂා කරයි.

දෙවන විදේශ පුහුණු වැඩසටහන කාර්යය මණ්ඩල සාමාජිකයින් 12 ක් සඳහා 2016 මැයි මස 29 දින සිට ජුනි මස 11 දින දක්වා ජපානයේ දී පවත්වන ලදි. මෙහිදී

රසායනාගාර විශ්ලේෂණය රසායනාගාර අපජලය කළමනාකරණය කර්මාන්ත සඳහා සිදුකරන ක්ෂේත්‍ර පරීක්ෂා ජල තත්ව වැඩිදියුණු කිරීම පිළිබඳ පුහුණු ලබාදෙන ලදි.

යෝජිත ජල තත්වයන් සමාලෝචනනයට ලක්කිරීම හා සංශෝධනය කිරීම වර්ෂයේ පළමු මාස 06 තුල කණ්ඩායම් රැස්වීම් වලදී සිදු කළ අතර ඒ සඳහා කෘමිනාශක, රසායනික ඔක්සිජන් ඉල්ලුම්, නිකල් සින්ක් සහ ඇලුමිනියම් යන සංඝටක අවධානයට ලක්කරන ලදි. ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අනුමැතිය ලබා ගන්නා ලදි. එය තව දුරටත් අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර එමඟින් එය ක්‍රියාත්මක කිරීමේ බලය ලබා ගැනීම අපේක්ෂා කෙරේ.

එමෙන්ම එය දැනට අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට යොමුකොට ඇත. මීට අමතරව වාර්ෂික පසුවිපරම් සැලැස්මට අනුකූලව කැළණි ගංගාවේ ජල තත්ව පසුවිපරම් කිරීම ද සිදු කරන ලදි. එමෙන්ම යෝජිත ගංගා වර්ගීකරණය සිදු කිරීම දැනට සමාලෝචනය කරමින් පවතින අතර එය වැඩිදියුණු කළ ජල තත්ව කළමනාකරණයේ ප්‍රතිඵල වල වලංගුභාවය හා සක්‍යතාව මත සිදු කරති.

රසායනාගාර ප්‍රතීතකරණ වැඩපිළිවෙල පිළිබඳ සැකසීමේ දී ගුණාත්මක අත්පොත් සැකසීම, ක්‍රියාපටිපාටියට අදාල අත්පත්‍රිකා සැකසීම SOPs සැකසීම එහි අවසන් අදියරේ පවතී. එමෙන්ම 2017 ජනවාරි මස ISO/IEC 17025 ප්‍රතීතකරණ සහතිකය ලබා ගැනීමට ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට අදාල කටයුතු සකස් කරමින් පවතී. මේ සඳහා වූ ප්‍රධානතම අභියෝගය වූයේ රසායනාගාර අධ්‍යක්ෂවරිය හා රසඥවරුන් තාවකාලික නිවාඩුගෙන සිටීමයි. ඔවුන් 2017 ජනවාරි මස සේවයට වාර්තා කිරීමත් සමඟ මෙම ක්‍රියාවලිය වේගවත් කිරීමට අපේක්ෂා කරයි. ආයතනයේ සාමාන්‍යයන් සිදු කරනු ලබන ස්ථාන මාරුකිරීම් අනුව ප්‍රතීතකරණ ක්‍රියාවලියේ ලිපි ලේඛන සැකසීම සඳහා සක්‍රියව දායක වූ පරිසර නිලධාරී, රසඥ ලෙස රත්නපුර කාර්යාලයට අනුයුක්ත කිරීම මහත් ගැටළුවක් වූ අතර එම නිලධාරියා සති දෙකක කාලයක් ප්‍රධාන කාර්යාලය තුල ප්‍රතීතකරණ ඉල්ලුම්පත් ඉදිරිපත් කරන තෙක් සේවයේ යොදවා ගැනීමට මානව සම්පත් සංවර්ධන අංශයෙන් අවසර ලබාගෙන ඇත.

ක්‍රියාකාරකම් අංක 3 – 1 යටතේ ක්‍රියාත්මක වන කණ්ඩායම පසුගිය මාස කිහිපය තුල සීඝ්‍රයෙන් ක්‍රියාත්මකවීම නිසා ජල තත්ව පසුවිපරම් මාර්ගොපදේශය සැදීමේ ක්‍රියාවලියේ අතපසුව තිබූ කටයුතු නැවත යථාතත්වයට පත්කර ගැනීමට හැකි විය. එමෙන්ම නියමු පරීක්ෂණයක් කැළණි ගඟ ආශ්‍රිතව සිදු කිරීමට ද සමත් විය. තවද, අනුකූලතා ක්ෂේත්‍ර පරීක්ෂණ හා ISO තත්ව සහතිකය පිළිබඳ ප්‍රවීනයන් තිදෙනෙකු මෙම මාර්ගෝපදේශය සැකසීම අවසන් කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටී.

PSI - දූෂකාරක නාමාවලිය සැකසීම පිළිබඳ පැවසීමේ දී එය ජූලි මස වන විට ක්‍රියාකාරීත්වයට පත්කරන ලදි. නමුත් එහි සංස්කරණයන් සහ වෙනස්කම් වලට භාජනය විය යුතුව ඇත. මෙය සම්පූර්ණයෙන් ක්‍රියාකාරී තත්වයට ගෙනඒම සඳහා පියවර හතක් හඳුනාගෙන ඇති අතර ඒ සඳහා ගතවන කාලය තක්සේරු කර ඇත.

දැනට පවතින EPL පද්ධතියේ ක්‍රියාකාරීත්වය

EPL/PSI සඳහා සර්වර් පද්ධතියක් මිලට ගැනීම

අත්හදාබැලීමේ වාරයක් ලෙස PSI මධ්‍යම පරිසර අධිකාරිය තුල ක්‍රියාත්මක කිරීම

EPL/PSI පද්ධතිය දියත් කිරීම

පළාත් කාර්යාල වල නියෝජිතයින් පුහුණු කිරීම

සෑම පළාත් කාර්යාලයකටම ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා සහභාගී වන නිලධාරීන් පුහුණු කිරීම

අවසාන පරීක්ෂාවට ලක්කිරීම

මෙම පියවරයන් 7 ඇතුලත පියවරයන් 02 ක් ඉතාමත් වැදගත් වන බව හඳුනාගෙන ඇත. එනම්, පියවර 02 EPL/PSI පද්ධතිය සඳහා සර්වර් පරිගණක මිලදී ගැනීම සහ පියවර 04 EPL/PSI පද්ධතිය සැලසුම් කර ඇති පරිදි 2017 අප්‍රේල් මස දියත් කිරීම. එසේම මෙම මිලදී ගැනීමේ ක්‍රියාවලිය ඒකාබද්ධව අධීක්ෂණය කිරීම හා

යම් අවහිරතාවක් ඇත්නම් එය මගහැරවීම සිදු කළ යුතුව ඇත.

එමෙන්ම, නව EPL/PSI පද්ධතිය දියත් කිරීමේ කාලය සිංහල හා හින්දු අළුත් අවුරුදු සමයේ දී තිබීම ද ගැටළුවක්ව ඇත. එහිදී මේ සම්බන්ධයෙන් ක්‍රියාකරන විශේෂඥවරුන් සැලසුම්සහගතව යොදා ගැනීම මෙම පියවර සාර්ථක කරගැනීමට ගතහැකි පියවරයි.

ක්‍රියාකාරකම් 3 – 1 සඳහා දායකවන ප්‍රවීනයන් 2016 මුල් මාස කිහිපය තුල එම මාර්ගෝපදේශයන් සැකසීම අවසන් කිරීම සඳහා අවධානය යොමු කරන ලදි. නමුත් ක්‍රියාකාරකම් 3 – 3 එනම් EPL ක්‍රියාවලිය ප්‍රචලිත කිරීම හා අපජල ප්‍රමිතීන් සැකසීමේ ක්‍රියාවලිය මිනිස් ශ්‍රමය හිඟවීම හේතුකොටගෙන ගැටළු සහගත විය. 2016 වසර අවසන්වන විට මධ්‍යම පරිසර අධිකාරිය හා ව්‍යාපෘති කණ්ඩායම අතර දුරස් බවක් දක්නට ලැබුණි. මෙම තත්වය මගහරවාගෙන ව්‍යාපෘති ක්‍රියාකාරකම් අඛන්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා කණ්ඩායම් නායක හා උප නායක දෙපළ 2017 වසරේ මුල සිට ක්‍රියාත්මක වනු ඇත.

ක්‍රියාකාරකම් අංක 4 වන තොරතුර කළමනාකරණ පද්ධතිය සැකසීම ක්‍රියාකාරකම් අංක 3 – 2 වන දූෂකාරක නාමාවලිය සෑදීම හා සම්බන්ධව ක්‍රියාත්මක කරනු ලබයි. PSI පද්ධතිය සෑදීමේ ප්‍රගතියක් සමගම තොරතුරු කළමනාකරණ පද්ධතිය සඳහා කටයුතු කරයි. ව්‍යාපෘති ප්‍රවීනයා එම ක්‍රියාවලිය සඳහා දත්ත පද්ධතිය යොදා ගැනීම සඳහා කටයුතු සිදු කරයි. මෙහිදී තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධානියාගේ ඉල්ලා අස්වීම මෙම ක්‍රියාවලියේ ප්‍රගතියට බලපෑ එක් කරුණක් විය.

එමඟින් අදාල ක්‍රියාවන් සම්බන්ධීකරණය හා සම්පත් වෙන්කර ගැනීම පිළිබඳ ගැටළු මතුවිය. එහිදී ව්‍යාපෘති ප්‍රවීනයා අමතර පැය ගණනක් සේවයේ යෙදීම හේතුවෙන් ඉහත තත්වය මැඩපැවැත් වීමට හැකි විය. එමෙන්ම මානව සම්පත් සංවර්ධන අංශය තොරතුරු තාක්ෂණ අංශයට ප්‍රධානියෙක් ලබා ගැනීමට කටයුතු යොදමින් සිටී. පාරිසරික තොරතුරු පද්ධතිය භාවිත කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ සම්පූර්ණ කිරීම සිදු නොකරන අතර එය පළාත් කාර්යාල වලදී ක්‍රියාත්මක කර අවසන් කිරීම වඩාත් ඵලදායී වේ. එමෙන්ම මෙම ව්‍යාපෘතිය අවසානයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය නායකත්වය ගැනීම ඉතාමත්ම වැදගත් කරුණකි. මනා කළමනාකරුවෙකු බඳවා ගැනීම ඒකාබද්ධව අධීක්ෂණය කිරීම කළ යුතුය.

ව්‍යාපෘතියේ එක් ප්‍රතිඵලයක් වන PSI පද්ධතිය තවත් වැඩිදියුණු කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය බලාපොරොත්තු වන අතර ඒ සඳහා වායු තත්ව කළමනාකරණයේ ඇති ස්ථාවර වායු විමෝචන කාරක ද ඇතුලත් කිරීමට අපේක්ෂා කොරේ. එමෙන්ම මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා පළාත් කාර්යාල වල දායකත්වයෙන් දත්ත ඇතුලත් කිරීම සඳහා මනා සහායක් ලබාදිය යුතුව ඇත. එමඟින් අංශ ප්‍රධානීන් හා ඒකක ප්‍රධානීන් මේ පිළිබඳ දැනුවත්භාවයක් ලබාගනු ඇත.

## 13.6 ග්‍රීන් පාර්ක් කසල කළමනාකරණ මධ්‍යස්ථානය

ග්‍රීන් පාර්ක් කසළකළමනාකරණ මධ්‍යස්ථානය මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වලින් එකකි. මෙම මධ්‍යස්ථානය සනීපාරක්ෂක බිම් පිරවුමකින්, කොම්පෝස්ට් අංගනයකින් සහ පුහුණු මධ්‍යස්ථානයකින් සමන්විත වේ. මෙම බිම්පිරවුම සහ පුහුණු මධ්‍යස්ථානය කොරියානු සහයෝගීතා ඒජන්සිය මඟින් ලබාදුන් මූල්‍ය හා තාක්ෂණික සහයෝගය මත ඉදිකරන ලදි.

මෙම බිම් පිරවුම දිනකට ටොන් 90 ක කසළ ප්‍රමාණයක් රැඳවීමට සමත් වන අතර මුලිකව දිනකට ටොන් 10 ක කසළ ප්‍රමාණයක් කළමනාකරණය දොම්පේ ප්‍රාදේශීය සභාවේ කසළ සඳහා අවසන් බැහැර කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි. නමුත් ගම්පහ දිස්ත්‍රික්කයේ අනෙකුත් පළාත් පාලන ආයතන වල කසළ ද රැඳවීමට අවශ්‍ය ධාරිතාව මෙම පිරවුම සතුව ඇත. මීට අමතරව කසළ බර කිරීම් හා පටිගත කිරීමේ උපකරණ, කසළ බැහැර කිරීමේ පහසුකම්, කාන්දු වන ජලය එක්රැස් කරනයක්, කාන්දු ජලය පිරිපහදු පහසුකම්, වායු පිරිපහදු පහසුකම්, ජලය අපවිත්‍රවීම වැළැක්වීමේ පද්ධතියක්, භූගත ජලය පසුවිපරම් කිරීමේ ළිඳක්, පස ආරක්ෂා කරන ආවරණයක්, බිම් පිරවුමට අවශ්‍ය උපකරණ (ඩෝසර්, හැරුම් යන්ත්‍ර, ටිපර් යන්ත්‍ර) පරිපාලන හා CCTV පද්ධතියක් යන පහසුකම් වලින් සමන්විත වේ.

මෙම මධ්‍යස්ථානයේ කටයුතු 2015 මැයි මස ආරම්භ කරන ලදි. 2015 වසරේ දී දොම්පේ ප්‍රාදේශීය සභාව විසින් එක්රැස් කළ ටොන් 1000 ක පමණ කසළ භාරගත් අතර 2016 වසරේ දී එය ටොන් 1500 ක් විය. මීට අමතරව දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කර්මාන්ත වලින් අහිතකර නොවන කසළ ද 2016 වසර තුල භාර ගන්නා ලදි. එහිදී එක් කාර්මික අපද්‍රව්‍ය ටොන් එකක් සඳහා රුපියල් 5000 ක මුදලක් අයකර ගන්නා ලදි.

2016 වසරේ දී සාලාව හමුදා කඳවුර තුල සිදු වී ආපදා තත්වය වැනි ආපදා තත්වයක් හා ගංවතුර තත්වයන් වලදී ද මෙම මධ්‍යස්ථානයේ තේමාව ලබාදෙන ලදි. 2016 ජූලි සහ අගෝස්තු යන මාස තුල කඩුවෙල ප්‍රදේශයේ ගංවතුර නිසා ඇති වූ කසළ ටොන් 1400 ක් මෙම මධ්‍යස්ථානයට භාරගන්නා ලදි. එමෙන්ම සාලාව කඳවුර තුල ජනනය වූ කසළ ටොන් 250 ක් ද මෙම පිරවුම සඳහා භාරගන්නා ලදි.

සනීපාරක්ෂක බිම්පිරවුමට අමතරව කසළ වල කාබනික ද්‍රව්‍ය කොම්පෝස්ට් බවට පත්කිරීමේ කොම්පෝස්ට් අංගනයක් ද මෙම භූමිය තුලම පිහිටා ඇත. එහිදී වෙන් කරන ලද කාබනික අපද්‍රව්‍ය වටිනා පාංශු සත්කාරයක් බවට පත් කරයි. මෙම කොම්පෝස්ට් අංගනයේ ධාරිතාව දිනකට ටොන් 05 කි. තවද, දොම්පේ ප්‍රාදේශීය සභාව මඟින් ලබාදෙනු ලබන සියළුම ජෛව හායනයට ලක්වන කසළ කොම්පෝස්ට් බවට පත්කරනු ලබයි. 2016 වසරේ දී කොම්පෝස්ට් ටොන් 23 ක් නිෂ්පාදනය කළ අතර එමඟින් රුපියල් 185,000/- ක මුදලක් උපයා ගන්නා ලදි. එහිදී එක් කිලෝවක් රුපියල් 8 ක් වැනි මුදලකට අලෙවිකොට ඇත. තවද මෙම කොම්පෝස්ට් සඳහා ගොවීන්ගෙන් ඉතා ඉහළ ඉල්ලුමක් ද පවතී.

කසළ කළමනාකරණ ක්ෂේත්‍රෙය් කටයුතු කරන විශ්ව විද්‍යාල සිසුන් පාසල් සිසුන් හා වෙනත් පාර්ෂවයන් වෙත දැනුම ලබාදීම සඳහා මෙහි ස්ථාපිත කර ඇති පුහුණු මධ්‍යස්ථානය මහත් පිටුවහලක් වී ඇත. මෙහිදී කසළ බැහැර කිරීම, කොම්පෝස්ට් සෑදීම වැනි අංශයන්ගේ දැනුම ලබාගත හැක. 2016 වසරේ දී කැළණිය, ශ්‍රී ජයවර්ධනපුර, යාපනය හා වයඹ විශ්ව විද්‍යාල වල සිසුන් හා පාසල් සිසුන් බොහෝ පිරිසක් මෙම මධ්‍යස්ථානය නැරඹූ අතර එමඟින් කසළ කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගන්නා ලදි. එමඟින් කසළ බැහැර කිරීම සහ කොම්පෝස්ට් සෑදීම සම්බන්ධයෙන් අත්දැකීම් ලබා ගැනීම සඳහා බුලත්කොහුපිටිය, දෙහිඕවිට, කිලිනොච්චිය සහ කැළණිය යන ප්‍රාදේශීය සභාවල නිලධාරීන් මෙම මධ්‍යස්ථානය නිරීක්ෂණය කරන ලදි.

2016 වසරේ දී කැළණිය විශ්ව විද්‍යාලයේ සිසුන් 02 ක් හා රුහුණු විශ්ව විද්‍යාලයේ සිසුන් තිදෙනෙක් ඔවුන්ගේ පර්යේෂණ ග්‍රීන් පාක් කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සම්බන්ධයෙන් සිදු කරන ලදි.

තවද, ජල තත්ව විශ්ලේෂණය සඳහා රසායනාගාරයක් සහ පරිපාලන ගොඩනැගිල්ලක් 2016 වසරේ දී මෙම මධ්‍යස්ථානයට එක් කරන ලදි.



FIGURE 19 විශ්වවිද්‍යාල සිසුන් සුදුකල පරීක්ෂණයක්




FIGURE 20 සනීපාරක්ෂක බිම්පිරවුම

# 14.0 ආයතනික යහපාලන වාර්තාව

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ ස්ථාපනය කරන ලද මධ්‍යම පරිසර අධිකාරිය, වාර්ෂිකව සපයනු ලබන මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත පවත්වාගෙන යනු ලැබේ .

2016.12.31 වන දිනට අනුමත කාර්ය මණ්ඩලය 1,159 ක් වන අතර, දැනට 879 ක කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ .

## 14.1 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්.

අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය) සමාජිකයින් ( අමාත්‍යවරයා විමසා ජනාධිපති තුමා විසින් පත් කරනු ලබන සමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ .

සෑම මසකට ම වරක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලබන අතර, 2015 වසර තුල මෙවැනි රැස්වීම් 11 ක් පවත්වා ඇත .මෙම රැස්වීම් වලදී පාරිසරික කළමනාකරණයට අදාල ප්‍රධාන ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය මහපෙන්වීම් කරනු ලබන අතර, ආයතනයේ මුදල්මය හා පරිපාලනමය ව්‍යුහය කෙරෙහි අවධානය යොමු කරනු ලැබීය .

## 14.2 විගණන කමිටු රැස්වීම්

1999 නොවැම්බර් මස 19 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ පී.එෆ්/.පී.ඊ.3 අනුව මධ්‍යම පරිසර අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත .කාර්තුමය වශයෙන් කමිටුව රැස්වන අතර, විගණන කමිටුවේ සභාපති ධූරය දරනු ලබන්නේ භාණ්ඩාගාර නියෝජිතය.

2015 මුදල් වර්ෂය තුළ අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂිකා අනුෂියානාදන් මහත්මියගේ සභාපතීත්වයෙන් පවත්වන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්) මානව සම්පත්, පරිපාලන හා මුදල්(, අධ්‍යක්ෂ) මුදල්(, අධ්‍යක්ෂිකා) මෙහෙයුම් හා සැළසුම් (සකච්ඡා කෙරෙන විෂයයට අදාල අධ්‍යක්ෂවරුන් හා ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරි සහ පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණනද සහභාගි විය .මධ්‍යම පරිසර අධිකාරියේ අභ්‍යන්තර විගණක මෙම කමිටුවේ කැඳවුම්කරු ලෙස ක්‍රියාකරයි .විගණන හා කළමනාකරණ කමිටුවේ නිරීක්ෂණ හා තීරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය තීරණ සඳහා යොමු කරන ලදී.

2015 වර්ෂයේ විගණන වාර්තා තුලින් පැන නැගුණු පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.

01. ප්‍රාදේශීය පරිසර නිලධාරීන්ගේ රාජකාරියේ යේදීම හා ඵලදායීතාවය පිළිබඳව පරීක්ෂා කිරීම.

02. අධිකාරියට යොමු කෙරෙන පරිසර පැමිණිලි විසඳීම සම්බන්ධයෙන් පළාත් කාර්යාල ක්‍රියාකර ඇති ආකාරය හා පරිසර පැමිණිලි වාර්තා කිරීම සඳහා පළාත් කාර්යාල හී ස්ථාපිත පරිගණක දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

03. අධිකාරියේ පරිසර බලපත්‍ර නිකුත් කිරීම හා කර්මාන්ත සම්බන්ධයෙන් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම පරීක්ෂා කිරීම.

04. පිළිසරු ව්‍යාපෘතිය මගින් මූල්‍ය අනුග්‍රහය ලබාදුන් කසළ කළමනාකරණ ව්‍යාපෘති වල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව පරීක්ෂා කිරීම.

05. පසුභාවිත ප්ලාස්ටික් ව්‍යාපෘතිය මගින් සිදුකෙරෙන ප්‍රතිචක්‍රියකරණ ක්‍රියාවලියේ ප්‍රගතිය පරීක්ෂා කිරීම.

06. පසුභාවිත ප්ලාස්ටික් ව්‍යාපෘතිය මගින් මූල්‍ය අනුග්‍රහය ලබා දුන් පසුභාවිත ප්ලාස්ටික් ගබඩා කිරීමේ මධ්‍යස්ථාන වල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව පරීක්ෂා කිරීම.

07. අධිකාරියේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු පිළිබඳව අවධානය යොමු කිරීම.

08. විශේෂ විමර්ෂන වලින් හඳුනාගත් අභ්‍යන්තර පාළන ක්‍රම ඉදිරිපත් කිරීම.

## 14.3 අධිකාරියේ කාර්යසාධන හා අධීක්ෂණ ක්‍රියාවලිය

මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, සංයුක්ත සැලැස්ම පාදක කොටගෙන සකසන අතර, එය අනුමැතිය සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පිළිගන්වනු ලැබීය . අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු එම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ඒ ඒ අංශ වලට ඉදිරිපත් කරනු ලැබේ .ඉන්පසු ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සහ අරමුණු සපුරාගත හැකි පරිදි එය ක්‍රියාත්මක කරන්නේ ද යන්න මාසිකව ප්‍රගතිය විමසන අතර, තෛයි මාසික ප්‍රගති වාර්තා සහ විචල්‍යන් අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය උපදෙස් සඳහා ඉදිරිපත් කරනු ලැබේ .

මේ ආකාරයේ මාසික, තෛයි මාසික, වාර්ෂික ප්‍රගති වාර්තා, මුදල් සංසරණ වාර්තා, මූල්‍යමය ප්‍රගතිය, මිලදී ගැනීම් පිළිබඳ විස්තරාදිය අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් හා අනුමැතිය පිණිස ඉදිරිපත් කරනු ලැබේ .

මෙම කාර්ය සාධන ඇගයීමේ ප්‍රධාන අරමුණ වන්නේ, ආයතනයේ මානව සම්පත් සංවර්ධනය

තුලින් ආයතනයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම වේ .

තවද, අධිකාරියේ කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම සඳහා ගරු පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සෑම මසකට වරක් ප්‍රගති සමාලෝචන රැස්වීමක් පවත්වන අතර, මෙහිදී සෑම ඒකකයකම, සෑම පළාත් කාර්යාලයකම ප්‍රගතිය සියුම් ලෙස සමාලෝචනයට ලක් කෙරේ.

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අධ්‍යක්ෂ ජනරාල් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහභාගිත්වය ඇතිව මසකට වරක් කළමනාකාරීත්ව කමිටු රැස්වීම පවත්වන අතර, මෙම රැස්වීමේ දී අධිකාරියේ සැබෑ ප්‍රගතිය පිළිබඳ විමසීමට භාජනය කරන අතර, ඒ ඒ මාසයේ ඉලක්කයන්ට එරෙහිව ලබාගත් ප්‍රගතිය හා යම් ආකාරයකින් ඉලක්කයන් සපුරාගත නොහැකි වී තිබේ නම්, ඊට හේතුව සොයාබලා, එම බාධකයක් මගහැරීම සඳහා විසඳුම් යෝජනා කෙරේ .

## 14.4 කාර්ය සාධන ප්‍රගතිය

අධිකාරියේ සෑම නිලධරයෙකු හා සේවකයෙකු ම වාර්ෂිකව කාර්ය සාධන ඇගයීමට ලක්කෙරෙන අතර, මෙම ඇගයීම හුදෙක් ඒ ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ වාර්ෂික වැටුප් වර්ධකය ලබා දීමේ අරමුණින් ක්‍රියාත්මක වන්නකි .මේ සඳහා නිර්නායකයන් කිහිපයක් එනම්, දැනුම, ආකල්ප, කුසලතා, ඉලක්ක සපුරා ගැනීම, මහජන සම්බන්ධතාවය, පැමිණීම හා අවංකභාවය යන නිර්නායකයන් සැලකිල්ලට භාජනය වන අතර, ඒ ඒ අංශයේ අධ්‍යක්ෂ හෝ ප්‍රධානීන් විසින් මෙම ඇගයීම සිදු කෙරේ .

මෙම කාර්යසාධන ඇගයීමේ අනෙක් අරමුණ වනුයේ ආයතනයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩි කිරීම හා මානව සම්පත් සංවර්ධනය කිරීම වේ .

## 14.5 සංයුක්ත සැලැස්ම

සංයුක්ත සැලැස්ම මඟින් මධ්‍යම පරිසර අධිකාරියේ අනාගත උපක්‍රම හා දැක්ම ඉදිරිපත් කරයි . එමෙන්ම එමඟින් පාලක මණ්ඩලය සහ විධායක නිලධාරීන් ආයතනයෙහි ඉදිරි පැවැත්ම සඳහා යොදා ගන්නා වූ උපක්‍රම ද හඳුන්වා දෙනු ලබයි . තවදුරටත් ආයතනයෙහි සංයුක්ත සැලැස්ම මඟින් ආයතනයෙහි ව්‍යූහය, ශක්තීන්, දුර්වලතා මෙන්ම ආයතනයෙහි බාහිර තර්ජන සහ අවස්ථා) SWOT) ඉදිරිපත් වෙයි .පසුගිය වසර තුන තුල ඇති වූ ප්‍රගතිය සාරාංශගත කිරීම සහ ආරම්භක ප්‍රතිඵල උපාය මාර්ග ප්‍රතිලඵල අදාල කාල රාමුව තුල සමාලෝචනය කිරීම මෙමඟින් ඉටුවන තවත් ප්‍රධාන කාර්යයකි .

ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශනය සත්‍ය ආදායම් මාර්ග සහ වියදම් ද, මූලික වර්තමාන ප්‍රාග්ධනයද, ඒ යටතේ ආයතනයේ අභ්‍යන්තර සහ බාහිර සාධක වල බලපෑම ද ආයතනයෙහි ක්‍රියාකාරිත්වයට බලපාන ආකාරය පිළිබඳ දක්වාලයි .ආයතනයේ වාර්ෂික වාර්තාව සැකසීම සඳහා උපකාරී වන්නා වූ මූලික සටහන් හා විස්තර වාර්තා ද මෙම සංයුක්ත සැලැස්ම තුල අන්තර්ගත වෙයි .

ඒ අනුව වර්ෂ 2016 සිට 2020 දක්වා වූ සංයුක්ත සැලැස්මක් 2015 වසරේ දී අධිකාරිය විසින් සකස් කරනු ලබූ අතර 2016 වාර්ෂික සැලැස්ම එය පාදක කරගෙන සාදන ලදි.

මෙම සැලැස්ම අනෙකුත් සැලැස්මන්ට අනුගතව වර්තමාන තත්වයන් පරීක්ෂා කිරීමත් ආයතනයෙහි ක්‍රියාකාරකම් උපාය මාර්ග සහ ආයතනයෙහි වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම සහ ආයතනයෙහි සතු සම්පත් ප්‍රධාන ලෙස මූල්‍ය හා මානව සම්පත්වල තත්වයන් පිළිබඳව ඉදිරිපත්වේ .

සංයුක්ත සැලැස්ම මඟින් අදාල කාලය තුල ආයතනය මඟින් යෝජනා කරන ලද ප්‍රධාන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ද ඉදිරිපත් වෙයි .මෙම ව්‍යාපෘති ඉදිරි ක්‍රියාකාරකම් සඳහා ගන්නා වූ ප්‍රතිපත්තිමය තීරණවලට සහ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා සහ ආයතනයෙහි සභාපතිවරුන් ගන්නා වූ තීරණද සඳහන් කරයි .

2016 වර්ෂයට අදාල වාර්ෂික ක්‍රියාකාරකම් සටහන සංයුක්ත සැලැස්මට අනුව සකසා ඇති අතර එය මධ්‍යම පරිසර අධිකාරියෙහි පාලන මණ්ඩලය මඟින් අනුමත කොට ඇත.

## 14.6 වාර්ෂික වාර්තාව

